It is seen that there is no specific criteria that would govern the decision-making process of the minister and unfettered and unguided discretion is conferred on the Minister when taking decisions on the (a) imposition, (b) revocation, and (c) grant of exemptions of the SGST. Thus, it is necessary to observe that (i) there is no guarantee that the Minister would be required to take objective and reasonable decisions which would be in consonance with the objectives of the proposed law, and (ii) this scheme leaves room for subjective, manifestly unreasonable and arbitrary decision making by the Minister which may have the distinct consequence of frustrating the objectives pertaining to the enactment of the proposed law. Therefore, this Court must hold that clauses 2(3), 2(4), and 3(1) of the Bill are inconsistent with Article 12(1) of the Constitution.

It is thus seen from the afore-stated features that the individual as well as collective impact of clauses 2(1), 2(3), 2(5), 2(6), 2(7), 2(8), 3 and 4 of the Bill would result in the Parliament loosing 'full control' over the imposition and enforcement of the SGST, which undoubtedly is to form a significant component of State revenue which is a part of 'public finance'.

It is also necessary to point out that Article 152 of the Constitution provides *inter alia* that no motion for the imposition of any tax or the repeal, augmentation or reduction of any tax for the time being in force shall be introduced in Parliament except by a Minister, unless such motion has been approved either by the Cabinet of Ministers or in such manner as the Cabinet of Ministers may authorize. It is to be noted that, clauses 2(7) and 3(6) do not impose such a requirement on the Minister prior to placing an Order made in terms of either clause 2(3) or 3(1) before Parliament. Therefore, to that extent, clauses 2(7) and 3(6) are inconsistent with Article 152 of the Constitution.

**Separate fund to which the SGST should be paid directly by taxable persons**

As pointed out earlier, clause 9(1) of the Bill seeks the establishment of a separate account in 'the name of the Designated Officer' for the purposes of the Act. Payments made to this account opened in the name of the Designated Officer shall be '**deemed** to be a credit to the **Consolidated Fund**'. The SGST imposed under clause 2 and payable by a taxable person shall be paid directly to this account by such taxable person, by way of an electronic fund transfer. It is thus evident that a separate and distinct fund is to be established through the creation of a separate bank account. Such account shall be in the name of the Designated Person.

Learned DSG citing provisions of certain Financial Regulations and structural and administrative arrangements said to be prevailing at the Treasury submitted that the reference in clause 9(1) is a reference to 'an account' within the broader system of bank accounts system pertaining to the Consolidated Fund. His position was that the fund sought to be created in terms of clause 9(1) would be 'a part of the Consolidated Fund, which consists of multiple bank accounts'.

However, notwithstanding the fact that the Consolidated Fund may comprise of multiple bank accounts, learned DSG's submission in this regard is not reflected in the language contained in clause 9(1). Further, if the SGST revenue were to be credited to the Consolidated Fund, there

would not have been any necessity for the draftsman to have used the term *'shall be **deemed** to be a credit to the Consolidated Fund'*. As pointed out by learned Counsel for the Petitioners, in the context the term 'deemed' being used in clause 9(1), it is evident that it was used to denote that though the account to which the SGST is to be credited would be separate and distinct from the Consolidated Fund and not a part of it, for certain purposes (unspecified in the Bill) it should be deemed that 'payments' to the account (and not the account itself) should be treated as credits as if made to the Consolidated Fund.

The ordinary linguistic construction of this clause reveals that (a) the afore-stated bank account shall be created in the name of the person who is appointed as the Designated Officer, (b) the corresponding fund shall be distinct from the Consolidated Fund, and (c) credits to this account shall not be (because it is a separate account) actual credits directly made to the Consolidated Fund. Nevertheless, such credits shall be **'deemed'** to be credits to the Consolidated Fund. In this regard, this Court has applied the ordinary meaning that may be attributed to the term 'deem' when used in legislation. When used in legal texts, the term 'deem' may have multiple meanings. However, in the context in which the term 'deem' has been used in clause 9(1), it is clear that it has been used to denote the creation of a statutory fiction. That being, that the fund referred to in clause 9(1) is not the Consolidated Fund or a part thereof, but for certain purposes, credits to this fund may be recognized / considered as having been made to the Consolidated Fund. This interpretation is strengthened when one considers the contents of clauses 17(1) and 17(2) which refer clearly to debits from and credits to the Consolidated Fund only under circumstances specified in the said clause, which indirectly makes the account / fund referred to in clause 9(1) a distinct fund and not a part of the Consolidated Fund. Thus, this Court is unable to accept learned DSG's submission in this regard.

It is a matter of concern that the Bill does not provide for onward transmission of the monies in the separate account opened in the name of the Designated Officer to the Consolidated Fund. For example, section 17(3) of the Customs Ordinance provides that customs duties collected by the Director-General of Customs shall be paid by him to the Consolidated Fund. The SGST Bill does not contain a clause to such effect.

Though the Bill contains specific reference to the manner in which money shall be credited to this account, it makes no mention as to how monies shall be debited from the account. The Bill does not state that the monies in the account shall be debited only in terms of the provisions of the law which regulate the spending of money contained in the Consolidated Fund. Unlike in other revenue legislation relating to specified goods and services, the SGST Bill makes no reference to the onward transfer of monies credited to the account referred to in clause 9(1) being transferred to the Consolidated Fund.

Articles 149(1) of the Constitution provides as follows:

> *"The funds of the Republic not allocated by law to specific purposes shall form one Consolidated Fund into which shall be paid the produce of all taxes, imposts, rates and duties and all other revenues and receipts of the Republic not allocated to specific purposes."*

It is necessary to note that, Article 149 of the Constitution does not bar a separate fund for a specific declared purpose. However, the SGST Bill does not state the specific purpose for which the monies lying in the account created in terms of clause 9(1) is to be used. Nor does the SGST Bill state the manner in which the revenue arising out of the collection of the SGST is to be used. Thus, it is abundantly clear that the establishment of a separate account to credit the revenue to the State arising out of the collection of the SGST is violative of Article 149(1) of the Constitution which insists that all such proceeds be credited to the Consolidated Fund.

Article 150(1) which regulates withdrawal of sums from the Consolidated Fund, provides as follows:

> *"Save as otherwise expressly provided in paragraphs (3) and (4) of this Article, no sum shall be withdrawn from the Consolidated Fund except under the authority of a warrant under the hand of the Minister in charge of the subject of Finance."*

The Bill does not provide any provision that regulates the withdrawal of monies from the account opened under clause 9(1) in the name of the Designated Officer. Thus, there is no guarantee that withdrawal of monies from this account shall be in compliance with Article 150(1).

Article 150(2) highlights the manner in which the Parliament seeks to retain full control over public finance contained in the Consolidated Fund. It provides as follows:

> *"No such warrant shall be issued unless the sum has by resolution of Parliament or by any law been granted for specified public services for the financial year during which the withdrawal is to take place or is otherwise lawfully, charged on the Consolidated Fund."*

In contrast with the monies in the Consolidated Fund, as regards the monies in the afore-stated separate fund, the Parliament has not retained for itself any such control over withdrawals from the account. Furthermore, the inbuilt safeguards pertaining to the withdrawal of monies from the Consolidated Fund are not found with regard to the funds in the afore-stated separate fund. Thus, it is seen that the Parliament is to deprive itself of the constitutional responsibility to ensure that tax revenue is utilized only for public purposes and for other purposes approved by Parliament. This is another manifestation of Parliament losing control over public finance.

It is therefore seen that, what is contemplated in the Bill is the creation of a system which is not in conformity with Articles 149(1) and 150(1) of the Constitution. To that extent, clause 9(1) of the Bill is inconsistent with Articles 149(1) and 150(1) of the Constitution.

**Appeal against a determination made by the Designated Officer**

The Bill contains provision that would confer a right on a taxable person who is aggrieved by a determination made by the Designated Officer specifying the 'Special Goods and Services Tax in default' to present an Appeal against such determination to the Court of Appeal. Provided however, prior to the lodging of the Appeal, on the same day of the determination, the taxable person is required to submit (i) 50% of the determined amount to the account specified in clause 9, and (ii) a bank guarantee issued by any licensed commercial bank issued in favour of the Designated Officer to cover the remaining 50%. [clause 11(1)] It was submitted on behalf of the Petitioners that these two conditions would in effect require the aggrieved taxable person to mobilize and thereby temporarily forfeit the full amount determined by the Designated Officer and keep it as security pending the determination of the Appeal. It was submitted on behalf of the Petitioners that this condition was draconian in nature, oppressive and would render the conferred

right of appeal virtually nugatory. Furthermore, in terms of clause 11(3), if the Court of Appeal were to dismiss the Appeal, the Designated Officer shall be entitled to forthwith make a claim on the bank guarantee to recover the sum due. It was submitted by learned counsel for the Petitioners that this scheme would in effect render nugatory general the right conferred by law on a person who is aggrieved by a judgement of the Court of Appeal seeking either leave to appeal against such judgment from the Court of Appeal and / or seeking special leave to appeal from the Supreme Court and thereby prosecuting a substantial Appeal in the Supreme Court against the judgment of the Court of Appeal.

Judicial power is the sovereign power of the People to cause the resolution of disputes in terms of the law through institutions of justice by invoking the jurisdiction of Courts and causing the adjudication of their disputes in terms of the law and the pronouncement of a binding order (judgment). It is the judicial power of the People that has been vested in Parliament in terms of Article 4(c) to be exercised by Parliament through Courts. Exercise of judicial power involves jurisdiction being conferred by law on Courts and other institutions referred to in Article 4(c) empowered to administer justice. Such Courts and tribunals are to be manned by an independent, impartial and neutral judiciary. Administration of justice entails adjudication of disputes both at trial and appellate level. To enable Courts to exercise judicial power on behalf of the People in terms of jurisdiction vested in Courts through laws enacted by Parliament, persons seeking justice must have free and unrestricted access to Courts to enable such persons to seek dispensation of their disputes through adjudication. Furthermore, the People must have access to the entire justice system, which would include the right to pursue an Appeal up to the Supreme Court, having obtained prior leave.

It is the considered view of this Court that any statutory or other mechanism that would obstruct, restrict or inhibit such access to the judicial system or render access nugatory or futile, would thereby obstruct the course of justice and would tantamount to an infringement of Article 4(c) read with Article 3 of the Constitution.

It would be seen that both clauses 11(1) and 11(3) of the SGST Bill have the effect of obstructing access to justice and rendering nugatory the aggrieved party's desire to seek justice, by imposing

a heavy burden on the taxable person by having to, immediately following a determination being made by the Designated Officer, pay 50% of the determined tax to him and submitting a bank guarantee to the value of the remaining 50%. The proposed law requires this to be done prior to filing the Appeal. Furthermore, clause 11(3) has the effect of disentitling the aggrieved party from appealing to the Supreme Court against a judgment of the Court of Appeal. As pointed out by Justice Mark Fernando in ***Sebastian Fernando v. Katana Multipurpose Cooperative Society*** *[1990] 1 Sri L.R. 342,* schemes of this nature may discourage and even prevent Appeals made *bona fide* and upon good grounds, solely because an appellant does not have the means of submitting the required deposit, which serves as a condition precedent to the filing of an Appeal.

The Law confers a right of appeal, recognizing that human judgments are fallible. A Rule, the necessary consequence of which is to prevent a good and valid appeal, solely by reason of financial incapacity to make the appeal deposit, does not seem necessary for the purpose of carrying out or giving effect to the principles and provisions of the Law. Rather, such requirements seem to conflict with legal norms.

In the circumstances, this Court holds that clauses 11(1) and 11(3) are inconsistent with Article 4(c) read with Article 3 of the Constitution.

**Conclusions**

For the reasons set out above, this Court makes the following determination in terms of Article 120 read with 123 of the Constitution:

(i) Clauses 2, 3 and 4 of the Bill are jointly and severally inconsistent with Article 148 read with Article 76(1) of the Constitution.

(ii) Clauses 2, 3 and 4 of the Bill are inconsistent with Article 3, read with Article 4(a) and 4(d) of the Constitution.

(iii) Clauses 2, 3 and 4 of the Bill are inconsistent with Article 12(1) read with Articles 3 and 4(d) of the Constitution.

(iv) Clauses 2 and 3 of the Bill are inconsistent with Article 152 of the Constitution.

(v) Clause 9(1) is inconsistent with Article 148 of the Constitution.

(vi) Clause 9(1) is inconsistent with Articles 149(1) and 150(1) of the Constitution.

(vii) Clauses 11(1) and 11(3) are inconsistent with Article 4(c) read with Article 3 of the Constitution.

(viii) In view of the analysis contained in this Determination and the foregoing conclusions, and –

(a) in view of the inseparable nature of clauses 2, 3, and 4 of the Bill,

(b) the compelling need to consider such clauses of the Bill both individually and as a whole,

(c) as it is necessary to view clauses 2, 3, and 4 of the Bill in conjunction with the remaining clauses of the Bill, and

(d) the finding arrived at by this Court that clauses 2, 3, and 4 are irremediably inconsistent with Article 3 read with 4(a) and 4(d) of the Constitution and Articles 12(1), 76(1) and 148 of the Constitution,

acting in terms of Article 123(2)(c) of this Constitution, this Court holds that the Special Goods and Services Bill requires to be passed as required by Article 84(2) of the Constitution, by not less than two-thirds of the whole number of Members of Parliament (including those not present) voting in favour thereof and approved by the People at a Referendum by virtue of the provisions of Article 83 of the Constitution.

Since it would be impracticable to suggest clause specific amendments to the clauses of the Bill that have been found to be inconsistent with the Constitution as it would fundamentally alter the basic nature and structure of the Bill and become inconsistent with the declared objectives of the Bill, this Court while exercising discretion conferred on it by the Constitution will refrain from determining the manner in which the afore-stated clauses 2, 3, 4, 5 and 9(1) could be amended so as to alter such clauses to become consistent with the Constitution.

**Possible amendments to the Bill to be moved in Parliament**

There is one more matter that requires to be referred to in this Determination. In view of the need to submit this Determination within the time period stipulated in Article 121(3), during the hearing, Counsel were informed by Court that hearings into the several Petitions would have to be concluded by the end of Thursday, 3rd February 2022. On 2nd February 2022, following the learned DSG concluding his submissions, the responses of the counsel for the Petitioners began. When proceedings resumed at 10.00 am on Thursday, 3rd February 2022, learned DSG brought the following matter to the attention of Court. He submitted to Court that he is in receipt of a written communication from the Secretary to the Treasury to the Honourable Attorney General, and brought its contents to the attention of Court. It reads as follows:

*"The Honourable Minister of Finance is in agreement that the authority of collection of the tax with regard to the following goods and services will be vested with the following revenue collection agencies.*

1. *SGST on Liquor: Excise Department of Sri Lanka*
2. *SGST on Cigarettes: Sri Lanka Customs*
3. *SGST on Motor Vehicles: Sri Lanka Customs*
4. *SGST on Betting and Gaming: Inland Revenue Department*
5. *SGST on Telecommunication: Telecommunication Regulatory Commission of Sri Lanka"*

This Court inquired from the learned DSG as to the clauses of the Bill that are sought to be amended, the exact nature of the amendments that will be introduced, and whether such proposed amendments have been drafted by the Legal Draftsman. He said that he was unable to provide definite responses to those queries raised by Court, other than informing this Court that the Legal Draftsman has not submitted to the Honourable Attorney General any amendments to the Bill. At that stage, the Court adjourned proceedings to enable learned DSG to obtain further instructions if any, in this regard. When Court resumed proceedings, learned DSG submitted to Court that he had no further instructions on the matter, nor did he have any further information to convey to Court pertaining to the proposed amendments that are to be presented to Parliament.

In response, learned counsel for the Petitioners submitted that, as provided by the Constitution, this Court should proceed to consider the Bill (in the form published in the *Gazette*), arrive at findings and forward the Determination. They also submitted that in view of the submission made by the learned DSG, they now apprehend that certain amendments may be introduced to the Bill during the 'committee stage' in Parliament, the exact nature and wording of which is not known by them. They complained to Court that the citizenry of this country including the Petitioners will not have the opportunity to consider such amendments and if necessary, challenge the constitutionality of such proposed amendments before the Supreme Court.

Consequently, this Court made order that in view of the time constraints, it will proceed to consider the constitutionality of the Bill published in the *Gazette*, and therefore will continue with the hearing.

It must be noted that, in terms of Articles 123(3) and the proviso to Article 123(4), the duty conferred on the Supreme Court is to consider the constitutionality of the Bill impugned in these proceedings. In the circumstances, this Determination is confined to the opinion of this Court regarding the constitutionality of the Bill (as contained in the *Gazette*) and reasons therefor. This Court refrains from arriving at any finding on the proposed amendments to the SGST Bill.

In any event, it is necessary to point out that in terms of Article 78(3) of the Constitution (as amended by the 20th Amendment to the Constitution), any amendment proposed to the Bill in Parliament shall not deviate from the merits and principles of such Bill. Thus, should the amendments which were referred to by the learned DSG be introduced during the 'committee stage' of Parliament, the Parliament would have to satisfy itself that the proposed amendments would not deviate from the merits and principles of the Bill. This is of significant importance, because it was submitted to this Court by the learned DSG that one objective of the Bill was to reduce human interaction by relieving routine tax enforcement officials from the task of collecting taxes and instead provide for taxes to be paid upfront directly to the fund to be established for the purposes of the SGST through an online electronic fund transfer mechanism.

This Court wishes to place on record its deep appreciation regarding the assistance provided and cooperation extended to Court by learned counsel for the Petitioners and to the learned Deputy Solicitor General who appeared for the Respondents. Their submissions provided invaluable assistance to this Court towards the formulation of this Determination.

**Vijith K. Malalgoda, PC**
Judge of the Supreme Court

**Murdu N. B. Fernando, PC**
Judge of the Supreme Court

**Yasantha Kodagoda, PC**
Judge of the Supreme Court

## II

## කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2022 පෙබරවාරි 14 දින මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) නමැති පනත් කෙටුම්පතෙහි ද, 2022 පෙබරවාරි 17 දින අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන), පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම, අධිකරණ සංවිධාන (සංශෝධන), සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) නමැති පනත් කෙටුම්පත්වල ද මවිසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## III

## ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
பயங்கரவாதத் தடுப்பு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
PREVENTION OF TERRORISM (TEMPORARY PROVISIONS) (AMENDMENT) BILL : PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් හයක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

## IV

## වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் பதிலீடு
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON WILDLIFE AND FOREST CONSERVATION : SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127(3) හි විධිවිධාන ප්‍රකාරව 2022 පෙබරවාරි 17 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කිංස් නෙල්සන් මහතා එම කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## V

## පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
சுற்றாடல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு : உறுப்பினர் பதிலீடு
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON ENVIRONMENT : SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කිංස් නෙල්සන් මහතා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127(3) හි විධිවිධාන ප්‍රකාරව 2022 පෙබරවාරි 17 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා එම කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## VI

## ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත" සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළවන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මිවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப்படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)

ගරු කථානායකතුමනි, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියෝග සහ වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) (437 අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අගෝස්තු මස 18 දිනැති අංක 2241/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනතේ 9 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 2වන වගන්තියේ (4) වන සහ (6) වන උපවගන්ති යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අප්‍රේල් මස 08 දිනැති අංක2222/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) 2018 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2019 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(v) 2019 වර්ෂය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2019 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව;

(vii) 2017/2018 වර්ෂය සඳහා සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(viii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම සභාව වෙත යොමු කරන ලද 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ගැන කියැවෙන ස්ථාවර නියෝග 121 උපුටා දක්වන්න මම කැමැතියි. ඒ යටතේ 121(2)(ඊ) හි සඳහන් වනවා, "පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම" කියලා. ඒ යටතේ පාර්ලිමේන්තුවට වාර්තාවක් දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊයේ රාත්‍රියේ රුසියාව යුක්රේනයට ඇතුළු වී තිබෙනවා. මේ නිසා බොරතෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 115ක් පමණ වෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි. එම නිසා අපි පළමුවෙන්ම පැමිණ තිබෙන තෙල් නැව් දෙකට මුදල් ගෙවන එක හොඳයි. දෙවනුව, ඩොලර් එකයි, බ්‍රිතාන්‍ය පවුමයි, යුරෝ එකයි දැන් රූබල් එකක පවතින මිල පිළිගන්නේ නැත්නම්, සම්පූර්ණයෙන්ම මුදල් අතර තිබෙන - the whole balance will change. තුන්වැනි කාරණය මේකයි. දැන් යුරෝපා රටවල් රුසියාවෙන් LNG ගන්නේ නැත්නම් කටාර්වල LNG යුරෝපයට යවන්න වෙනවා.

එතකොට අපිට LNG අඩු වනවා. ආපසු LNG මිලත් වැඩි වනවා. ඒ නිසා අපේ ආර්ථිකයට විශාල ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන්. හෙට විපක්ෂය විසින් සිදු කරන විවාදයට පෙර මුදල් ඇමතිතුමා ප්‍රකාශයක් කරනවා නම් මම කැමතියි. ඊට අමතරව, අර රුපියල් බිලියන 229ක යෝජනාවලට මුදල් ලබා ගන්න එකත් නැහැ. ඒ වාගේම අධිභාර බද්දෙන් සේවක අර්ථසාධක අරමුදල නිදහස් කරනවා නම් තවත් රුපියල් බිලියන 50ක් නැති වනවා. ඒ නිසා මේ කාරණා දෙකෙන්ම විශාල ප්‍රශ්නයක් අපට ඇති වෙන්න පුළුවන්. මේ ගැන මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමතියි. විශේෂයෙන්ම විදේශ අමාත්‍යාංශයට අයිති කොටස විදේශ ඇමතිතුමා කරයි. එහෙත්, මේ නිසා ආර්ථිකයට සිදු වන බලපෑම පිළිබඳව හෙට උදේ පුළුවන් නම් මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට වාර්තාවක් ඉදිරිපත් කරනවා නම් හොඳයි. එතකොට අපට පුළුවන් ඒ විවාදය හෙට වඩාත් හොඳට පවත්වාගෙන යන්න.

මම විශේෂයෙන්ම අපේ ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ තෙල් නැව් තුනම පරණ මිලට අපි අරගෙන තිබෙන්නේ. කෙසේ හෝ ඒ තෙල් නැව් තුනට මුදල් ගෙවන්න. මොකද, ඊළඟ වතාවේ මේවා අලුත් මිලට එන්නේ. මේ තෙල් නැව් තුනට කොහෙන් හරි හොයාගෙන අපි මුදල් ගෙවමු. මම දන්නේ නැහැ, කොහෙන්ද ඒ මුදල් හොයන්නේ කියලා. ඒ වුණත්, පරණ මිලට ආපු ඒ තෙල් නැව් තුනට අපි ගෙවලා දමමු. අපි තවත් අරගෙන තිබෙනවා, පරණ මිලට. ඒ හැම එකකටම අපි ගෙවලා දමමු. ඊට පස්සේ අනික් ඒවා ගැන අපි බලමු.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of Water Supply)
ඔබතුමා ආණ්ඩු පක්ෂයට එන්නද හදන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, රටේ මූල්‍ය පාලනය පිළිබඳ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඇත්ත වශයෙන්ම අපේ රටේ ආර්ථික ව්‍යසනය ගැන මුදල් ඇමතිතුමා අන්තිමට කථා කළේ පසුගිය දෙසැම්බර් 10 වන දා -මීට මාස දෙකකට කලින්. මේ රට මෙච්චර ව්‍යසනයකට පත්වෙලා තිබුණත් එතුමා පාර්ලිමේන්තුව දැනුවත් කරලා නැහැ. ඒක හරිම අසාධාරණයි. අපිට මේ තොරතුරු පත්තරවලින් ලැබෙන්නේ. මුදල් ඇමතිතුමා මේ රටේ ආර්ථික තත්ත්වය ගැන මාස දෙකකින් පැහැදිලි කිරීමක් කරලා නැහැ.

I think, it is very unfair. Parliament has the control over finance and we have the right to know what is happening.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
You bring in a Motion.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ජයන්ත සමරවීර මහතා (ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயந்த சமரவீர - களஞ்சிய வசதிகள், கொள்கலன் முனையங்கள், துறைமுக வழங்கல் வசதிகள், இயந்திரப் படகுகள் மற்றும் கப்பற்றொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Jayantha Samaraweera - State Minister of Warehouse Facilities, Container Yards, Port Supply Facilities and Boats and Shipping Industry Development)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පානදුර, වලාන, ගැමුණු මාවත, අංක 272/බී/01 දරන ස්ථානයෙහි පදිංචි ලියනගේ සුරංග පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අගලවත්ත, සඳගිරිකන්ද, ඕමත්ත පාර යන ලිපිනයෙහි පදිංචි එස්.එච්. රත්නපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, වෙන්නප්පුව, හලාවත පාර, අංක 218 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ඒ. අනිල් නිශාන්ත දිනරත්න මහතාගෙන් සහ තවත් 13දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, පොකුණුවිට, වැලිගම්පිටිය, අංක 150/1 දරන ස්ථානයෙහි පදිංචි සමන්ත තුෂාර ගල්පායගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, පන්නිපිටිය, පැලන්වත්ත, කනත්ත පාර, අංක 217/1/4 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී. සරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
ගරු කථානායකතුමනි, කන්තලේ, පරාක්‍රම මාවත, අංක 15 දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ.ජී. මාලනී ගුණවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් මම මේ කාරණය මීට මාස 6කට කලිනුත් ඔබතුමාගේ අවධානයට යොමු කළා.

අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා හරහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරන්නේ ඉතාම අසරණ තත්ත්වයට පත්වුණු අය. තමන්ගේ ප්‍රශ්නය ගැන කියන්න වෙන යන්නම තැනක් නැති මිනිස්සු තමයි සාධාරණයක් ඉටු කර ගැනීමේ අරමුණින් මේ කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරන්නේ. හැබැයි, ඒ අය සම්බන්ධයෙන් අපේ පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් නිර්දේශ ලබා දුන්නාට ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කිසිම ආයතනයක් යුහුසුළු වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. කාලය නැති නිසා මම එක උදාහරණයක් විතරක් කියන්නම්. මෙම කාරක සභාවෙන් මීට මාස හයකට කලින් දුන් නිර්දේශයක් තවම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ පුද්ගලයා හැම දාම අපේ මහජන හමුවට ඇවිල්ලා නැවත ඒ ගැන කථා කරනවා. එම නිර්දේශ ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ගරු සභානායකතුමා එදා පැහැදිලිව ප්‍රකාශ කළා, මේ සම්බන්ධයෙන් නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා. නමුත් තවම එය ක්‍රියාත්මක වන බවක් පෙනෙන්න නැහැ. එක්කෝ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු අහෝසි කරන්න ඕනෑ. එහෙම නැත්නම්, එම කාරක සභාවේ කටයුතු කරගෙන යනවා නම්, ඒ පුද්ගලයන්ට සාධාරණයක් වෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මට විතරක් නොවෙයි, මේක අපේ මන්ත්‍රීවරු ගණනාවකටම තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකර මේ ගැන අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ ආයතනයේ නම කියන්න. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ නියෝගය ක්‍රියාත්මක නොකරන ඒ ආයතනයේ නම සඳහන් කළා නම් හොඳයි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
දොඩම්ගස්ලන්දේ සිරිල් මහත්මයා ඉදිරිපත් කළ පෙත්සම සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව නිර්දේශයක් ලබා දුන්නා, නිවාස අමාත්‍යාංශයට. නමුත් තවම එය ක්‍රියාත්මක වෙලා නැහැ. මම මේ එක උදාහරණයක් විතරයි කිව්වේ, ගරු කථානායකතුමනි. මම කැමැති නැහැ, එක් එක් අමාත්‍යාංශ ගැන කියන්න. මොකද, ගරු අමාත්‍යතුමන්ලාට සහ ඒ අමාත්‍යාංශවලට එය හොඳ නැති නිසා. මම කියන්නේ මෙච්චරයි. පොදුවේ ගත්තාම, මේක එක ආයතනයකට විතරක් බලපාන ප්‍රශ්නයක් නොවෙයි. මේ ගැන සමාලෝචනයක් කෙරෙන්න ඕනෑ. කොහෙන්ද මේවා ගැන පසු විපරම් කරන්නේ? මේ නිර්දේශ ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියලා කොතැනින්ද පසු විපරමක් කරන්නේ? නමුත්, එහෙම කටයුත්තක් කෙරෙන්නේ නැහැ.

ඒ නිසා මම කියන්නේ, මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු ඉදිරිපත් කරන පෙත්සම් සම්බන්ධව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කරන්න නෛතික වැඩ පිළිවෙළක් කරුණාකර හදන්න කියලා, ගරු කථානායකතුමනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 24 හා 25 කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම, මේ ගැන ගරු සභානායකතුමාගේත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේත් අවධානය යොමු කරවනවා.

ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනා ගරු සභාවට ගෙනෙන්නේ නැතුව වෙනම කමිටුවකට යොමු කරන්න පාර්ලිමේන්තු පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡාවක් වුණාය, ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නවාය කියලා දැන ගන්න ලැබුණා. ඒක ඔබතුමන්ලා ගන්න තීන්දුවක්. එහෙම කමිටුවකට යොමු

කරනවා නම්, ඒ කමිටුව තුළ සාකච්ඡා කරලා ඒ යෝජනා ටික අදාළ මන්ත්‍රීවරයාට මේ සභා ගර්භය තුළ විවාදයට ගන්න ඉඩ ලැබෙන විධියට ක්‍රමවේදයක් හදන්න කියලා මම යෝජනා කරනවා. මොකද, පෞද්ගලික මන්ත්‍රී යෝජනා හැම දාම ඉදිරිපත් වෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් මාසයේ පාර්ලිමේන්තුව රැස්වෙන පළමුවැනි සතියේ; පළමු Sitting week එකේ, සිකුරාදා තමයි පෞද්ගලික මන්ත්‍රීන යෝජනා ගැනෙන්නේ. ඒ ගන්නෙත්, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් වෙන්නේ නැත්නම් විතරයි. හුඟක් වෙලාවට ඒ දෙක මාරුවෙන් මාරුවට ගන්නේ. හැබැයි, දැන් මේ පාර්ලිමේන්තුවට අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගතවෙලාත්, තවම එකම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක්වත් විවාදයට අරගෙන නැහැ. පෞද්ගලික මන්ත්‍රී යෝජනාවල තිබෙන වැදගත්කම තමයි, පසු පෙළ මන්ත්‍රීවරුන්ට තිබෙන ජාතික අරමුණු හෝ ප්‍රාදේශීය, පළාත් සම්බන්ධයෙන් තිබෙන දැක්ම සහ වැඩ පිළිවෙළ පිළිබඳව ජාතික අවධානයක් යොමු කරවීම. ඒක සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන යෝජනාවකට වඩා වෙනස් දෙයක්. මේ ගැන මම සොයා බැලුවා. වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු ක්‍රමය ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවලත් මේ කටයුත්ත වෙනස් ක්‍රමයකට ක්‍රියාත්මක වනවා. පවතින ක්‍රමවේදය වෙනස් කරනවා නම්, අපේ පරමාදර්ශය වන වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු ක්‍රමවේදය සහ අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තුවල ක්‍රමවේදත් අධ්‍යයනය කරලා ඒ යාවත්කාලීන කිරීම කළාට කිසි ගැටලුවක් නැහැ, ගරු කථානායකතුමනි.

මොකද, මේක දීර්ඝ කාලයක් තිස්සේ පසුපෙළ මන්ත්‍රීවරුන්ට තිබෙන අවස්ථාවක්. මම නම් අවුරුදු 12ක් පමණ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. හැබැයි, දෙපැත්තේම නවක මන්ත්‍රීවරුන්ට සහ අනාගතයේ පත්වන මන්ත්‍රීවරුන්ට යෝජනාවක් ඉදිරිපත් කරන විධිය ඉගෙන ගන්න පුළුවන් මේ හරහා. විශේෂයෙන්ම පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම ගත්තාම, ඒක නම් මේ ප්‍රස්තුත කාරණයට අදාළ වන්නේ නැහැ. නමුත්, ඒ තුළින් පවා මන්ත්‍රීවරුන්ට එක් පැත්තකින් පුහුණුවක් ලැබෙනවා. අනෙක් පැත්තෙන්, ජාතික මත ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබෙනවා. මේ සම්බන්ධව ලෝකයේ අනෙකුත් පාර්ලිමේන්තුවල තිබෙන සම්ප්‍රදායනුත් සලකා බලා දියුණු ක්‍රමවේදයකට යෑම ගැටලුවක් නැහැ. හැබැයි, මේ ක්‍රමය නැති කරන්න එපා කියන එකයි මගේ යෝජනාව.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ම අදාළව කාරණයක් කියන්න -, *[බාධා කිරීමක්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මතු කළේ ඉතාම වැදගත් කාරණයක්. පාර්ලිමේන්තුවේ වාර අවසාන කිරීමට පෙර පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා විශාල සංඛ්‍යාවකට විවාද කිරීමට දිනයක් ගැනීමට බැරිව ගියා. ගරු කථානායකතුමාත්, ඔබතුමන්ලාත් දන්නා පරිදි අපේ පක්ෂ නායක කමිටුවෙන් තමයි පාර්ලිමේන්තුව රැස් වන දින පිළිබඳ තීරණය ගන්නේ. සභාව කල් තැබීමේ යෝජනා විශාල ප්‍රමාණයකට අපි ඉඩ ලබා දුන්නා. තවමත් අපට ශෝක ප්‍රකාශ යෝජනා සියල්ල පිළිබඳ කටයුතු හමාර කර ගන්න බැරි වී තිබෙනවා. ඊට අතිරේකව, එතුමා සඳහන් කළ පරිදි ස්ථාවර නියෝග යටතේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවලට එක් දිනයි ලැබෙන්නේ. ගරු කථානායකතුමාගේ එකඟතාවෙන් පක්ෂ නායකයනුත් එකඟ වෙලා ඒ අවුරුදු දෙකේම ඉතිරි වෙලා තිබුණු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම අපි දින දෙකකදී සම්පූර්ණයෙන් අවසන් කළා. දැන් මේ පිළිබඳවත් අලුත් ක්‍රමවේදයක් ගැන අපි සාකච්ඡා කරමින් ඉන්නවා.

ඒ ගැන කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා, ලේකම් මණ්ඩලයෙන්. අපි ඒ පිළිබඳව සාකච්ඡා කරනවා. විශේෂ කාරක සභාවක් රැස්වෙලා පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා සම්බන්ධ විවාදය රටට දැනගන්න පුළුවන් ආකාරයට ඒ කාරක සභාවේදී පවත්වන්න පුළුවන් ද කියලා අපි සාකච්ඡා කරනවා. ඒ ගැන අවසන් නිගමනයකට පැමිණීමේදී ඔබතුමන්ලාගේත් අදහස් ලබා ගන්න ගරු කථානායකතුමා කටයුතු කරයි. දැනට ඒක සාකච්ඡා වෙමින් තිබෙනවා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, පෞද්ගලික යෝජනා ඉදිරිපත් කර ඇති මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාට දීර්ඝ කාලයක් යනතුරු බලා නොසිට අවුරුද්දක් තුළදී හරි තමන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට පුළුවන් වැඩ පිළිවෙළක් සකසා දෙන්න අපි කටයුතු කරනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අදාළයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපට වෙනත් මාර්ගවලින් විසඳුමක් සොයා ගන්න බැරි වුණු මහජන පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීමේ අවකාශය තිබුණා. ඒවා විභාග කරලා බොහෝ අවස්ථාවල සාධාරණයත් ඉටු වුණා. නමුත්, මෑතකදී මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව තීන්දුවක් අරගෙන තිබෙනවා, වසර 10කට අඩු කාරණා පමණක් ඒ පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන්න කියලා. ඒ කියන්නේ ගරු කථානායකතුමනි, වසර දහයයි දවසක් පහුවුණත් ඒ පෙත්සම සලකා බලන්නේ නැහැ කියන එක. මම කියන්නේ, එහෙම තීන්දුවක් ගන්නේ නැතිව, ඉදිරිපත් කරන පෙත්සම් හැම එකක්ම විභාග කරලා පුළුවන් ඒවාට විසඳුම් දෙන්න පුළුවන් ආකාරයට ඒ කාලය විවෘතව තබන්න කියලායි.

ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මතු කරපු කාරණයත් මෙතැනට අදාළයි. පෙත්සම් විභාගයෙන් පසුව දෙන තීරණ ක්‍රියාත්මක වෙනවාද කියලා පසු විපරම් කිරීමේ ක්‍රියාවලියකුත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඇතුළත් කරන්න කියලා මම මේ වෙලාවේ යෝජනා කරනවා. වසර 10කට වඩා පැරණි පෙත්සම් වුණත් සලකා බැලීමේ අවකාශයත් ඉතුරු කරන්න කියන යෝජනාවත් මේ අවස්ථාවේදී කරනවා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, මමත් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක්. අපේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණාව ඇත්තයි. මහජන පෙත්සම් කාරක

[ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා]

සභාවෙන් විවිධ ආයතනවලට දුන්නු නියෝග පිළිබඳව අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා දන්නේවත් නැතුව ඇති. ඒ විවිධ ආයතනවලට දුන්නු නියෝග ක්‍රියාත්මක කරලා නැහැ. අපි පසුගිය දිනවල සාකච්ඡා කළේ, ඔබතුමාත් සමඟ මේ ගැන සාකච්ඡා කරලා, ඒ ගන්නා තීන්දු හැල්ලුවට, විහිළුවට ලක් නොවී ක්‍රියාත්මක කරන්න ඔබතුමා හරහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන එක. ඒ ජනතාව රට පුරා විවිධ ආයතනවලට ගිහින් ඉතා පීඩාවට පත්වෙලා, අවසානයේ තමයි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඒ පෙත්සම ඉදිරිපත් කරන්නේ. ඒ පෙත්සම් විභාග කරන්නත් විශාල කාලයක් ගතවෙනවා. සමහර පෙත්සම්වල ඇති යම් යම් කාරණා සම්බන්ධයෙන් එකඟතාවකට එන්න පැය 7ක් හෝ පැය 8ක් ගතවෙනවා. එසේ එකඟතාවකට පැමිණි තීන්දු පවා හරියාකාරව ක්‍රියාත්මක කරන්නේ නැත්නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි. අනික් පැත්තෙන්, කාලය පිළිබඳව ප්‍රශ්නයකුත් අපට තිබෙනවා. ඒ සමහර පෙත්සම්වලට අවුරුදු 20ක් හෝ අවුරුදු 25ක් ගතවෙලා තිබෙනවා. ඒවාට තීන්දු දීමේදී ඒ ඒ අදාළ ආයතනවල විශාල ගැටලු තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන තමයි ඒ ගරු මන්ත්‍රීතුමාත් කථා කළේ. ඒ නිසා ඒ කාරණය දෙවරක් කියන්න අවශ්‍ය නැහැ.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, ඒ කාරණයේ අනික් පැත්ත ගැනයි මා කියන්නේ. ඒ තීන්දු ගන්න හේතු වුණේ, විවිධ ගැටලු මතු වුණු නිසායි. ඒ නිසා ඔබතුමා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් සමඟ මේ ගැන සාකච්ඡා කරලා, මේ කටයුතු තවත් විධිමත් කරන්න කියන ඉල්ලීමයි මා ඉදිරිපත් කරන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ මේ කාරණය, සෑම පාර්ලිමේන්තුවකම ඇති වී තිබෙන, සාකච්ඡා වී තිබෙන, එයට ප්‍රතිකර්මයක් ගැනීමට හරියාකාරව පියවර නොගත් කාරණයක්. මේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සම්බන්ධයි. ඒ බලතල අනුව තීරණයක් අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න රාජ්‍ය නිලධාරින්ට භාර දුන්නාම, ඒ එකඟතා පරිදි ක්‍රියාත්මක වීම අපි බලාපොරොත්තු වෙනවා.

ඇත්ත වශයෙන්ම එය ඉටු විය යුතුයි. එකඟතාවක් නැතිව නිලධාරීන් ඉවත්ව යනවා නම්, ඒ පිළිබඳව කටයුතු කරන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, උදාහරණයක් ගත්තොත්, කෝප් වාර්තා සෑම පාර්ලිමේන්තුවකදීම ඉදිරිපත්කොට තිබෙනවා. ඒ වාර්තාවලින් නිර්දේශත් ඉදිරිපත්කොට තිබෙනවා. නමුත්, ඒ නිර්දේශ ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ මොකද? යම්කිසි නීතිමය සහ ව්‍යවස්ථාමය බලතල ප්‍රමාණයක් අඩු නිසා. මේක හැම පාර්ලිමේන්තුවකම දිගටම ආ ප්‍රශ්නයක්. ඒ නිසා ඒ ගැන අලුතෙන් අපේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ තත්ත්වය විසඳන්න 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විශේෂයෙන් 'ඔම්බුඩ්ස්මන්වරයෙකු' පත් කළා. ඒ අනුව, ඔම්බුඩ්ස්මන් වෙනම රැස්වනවා. පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් වන සමහර පෙත්සම් ඔම්බුඩ්ස්මන්වරයාට යවනවා. සමහර පෙත්සම් ඔම්බුඩ්ස්මන්වරයාට මුලින්මත් යවනවා. ඒ නිසා නිලධාරියෙකු හැටියට ඔම්බුඩ්ස්මන්වරයාට යම්කිසි බලතල ප්‍රමාණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දීලා තිබෙනවා. අපි දැනට මේ ප්‍රශ්නය සාකච්ඡා කරමින් සිටිනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා එක්කත් අපි ඒ ගැන සාකච්ඡා කළා. ඒ නිසා මේ ප්‍රශ්නයට ඒ ආකාරයෙන් මැදිහත්වීමක් කරමින් තමයි අපට කටයුතු කරන්න වෙන්නේ.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන අදියර ඉදිකිරීම: කොන්ත්‍රාත් ලබා දීම
### மத்திய அதிவேக நெடுஞ்சாலையின் மூன்றாம் கட்ட நிர்மாணம்: ஒப்பந்தம் வழங்கல்
### CONSTRUCTION OF THIRD PHASE OF CENTRAL HIGHWAY: AWARD OF CONTRACT

4/2022

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, පොතුහැර සිට ගලගෙදර දක්වා වූ තුන්වන අදියර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු පිරිනමා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එසේ නම්, එම එක් එක්-

(i) කොන්ත්‍රාත්තුවේ වටිනාකම කොපමණද;

(ii) කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) කොන්ත්‍රාත් ආයතනයේ නම කවරේද;

(iv) කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එම කොන්ත්‍රාත්තු සඳහා මුදල් ගෙවීමේදී අනුගමනය කරනු ලබන මූල්‍යමය ක්‍රමවේදය;

(ii) එම ගෙවීම් සඳහා ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மத்திய அதிவேக நெடுஞ்சாலையின் பொத்துஹெர தொடக்கம் கலகெதர வரையிலான மூன்றாம் கட்ட நிர்மாணப் பணிகளுக்கான ஒப்பந்தங்கள் வழங்கப் பட்டுள்ளனவா என்பதை அவர் இச்சபைக்கு அறிவிப் பாரா?

(ஆ) ஆமெனில், அந்த ஒவ்வொரு -

(i) ஒப்பந்தத்தின் பெறுமதி எவ்வளவு என்பதையும்;

(ii) ஒப்பந்தம் வழங்கப்படும்போது பின்பற்றப்பட்ட முறையியல் யாதென்பதையும்;

(iii) ஒப்பந்த நிறுவனத்தின் பெயர் யாதென்பதையும்;

(iv) ஒப்பந்தத்தை நிறைவுசெய்வதற்கு உத்தேசிக்கப் பட்டுள்ள திகதி யாதென்பதையும்;

அவர் வெவ்வேறாக இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி ஒப்பந்தங்களுக்காக நிதி செலுத்தப்படும் போது பின்பற்றப்படுகின்ற நிதிசார் முறையியல் யாதென்பதையும்;

(ii) மேற்படி செலுத்தல்களுக்கான நிதியைப் பெற் றுக்கொள்ளும் விதம் யாதென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Will he inform this House whether the contract relevant to the third phase constructions of the Central Highway from Pothuhera to Galagedara has been awarded?

(b) If so, will he also inform this House, separately-

(i) the value of the contract;

(ii) the methodology followed with regard to awarding the contract;

(iii) the name of the contract company; and

(iv) the date proposed for the termination of the contract?

(c) Will he further inform this House-

(i) the financial methodology followed with pertinence to releasing money for the aforesaid contracts; and

(ii) the manner in which funds would be procured for the aforesaid payments?

(d) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) 2020.12.18 වන දින ඉදිරිපත් කරන ලද අංක 20/2072/319/021 දරන අමාත්‍ය මණ්ඩල සටහන හා එයට 2021.01.11 වන දින ලබා දුන් අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මධ්‍යම අධිවේගී මාර්ග 03 වන අදියරේ ආරම්භ කොටස වන පොතුහැර සිට රඹුක්කන දක්වා වූ (කි.මී. 0+840) - කි.මී. 12+890) 1 වන පැකේජය, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සෘජුවම හෝ උප කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉදිකිරීම් ආරම්භ කරන ලදී. ඒ අනුව, එම කොටස උප කොන්ත්‍රාත් පැකේජ 17කට බෙදා එම පැකේජවල පස් පිරවීම හා ව්‍යුහ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 14 දෙනෙකුට ප්‍රදානය කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, (ආ) (i), (ii) සහ (iii) ප්‍රශ්නවලට අදාළ පිළිතුරු එකම වගුවක දක්වා තිබෙනවා.

(ආ) (i)

| කොන්ත්‍රාත් පැකේජය | වටිනාකම රු.මිලියන) | කොන්ත්‍රාත්කරු | අවසන් කිරීමට නියමිත දිනය |
|---|---|---|---|
| 1A | 859.3 | Edward and Christie (Pvt) Ltd | 19.08.2022 |
| 1B | 743.6 | Edward and Christie (Pvt) Ltd | 19.08.2022 |
| 1C | 912 | Edward and Christie (Pvt) Ltd | 19.08.2022 |
| 1D | 3,587.3 | K.D.A. Weerasinghe & Company (Pvt) Ltd | 23.06.2023 |
| 1E | 997.5 | Edward and Christie (Pvt) Ltd | 05.12.2022 |
| 1F | 992.8 | Tudawe Brothers (Pvt) Ltd | 05.12.2022 |
| 1G | 944.7 | Senura Civil Engineering (Pvt) Ltd | 05.12.2022 |
| 1H | 872.5 | PND Construction (Pvt) Ltd. | 02.12.2022 |
| 1I | 938.4 | K.D. Ebert And Sons Holdings (Pvt) Ltd. | 05.12.2022 |
| 1J | 3,963.4 | NEM Construction (Pvt) Ltd | 23.06.2023 |
| 1K | 961.4 | Ruhunu Development Contractors & Engineering (Pvt) Ltd | 22.11.2022 |
| 1L | 621.4 | Nawaloka Construction Company (Pvt) Ltd | 29.11.2022 |
| 1M | 3,884.1 | Access Engineering PLC | 02.07.2023 |
| 1N | 4,497.8 | International Construction Consortium (Pvt) Ltd | 22.06.2023 |
| 1O | 851.9 | RR Construction (Pvt) Ltd | 02.01.2023 |
| 1P | 508.8 | Selltec Group (Pvt) Ltd | 22.11.2022 |
| 1Q | 2,757.9 | Maga Engineering (Pvt) Ltd | 26.06.2023 |

(ii) සියලුම උප කොන්ත්‍රාත් පැකේජ දේශීය තරගකාරී ලංසු ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගන්නා ලදී.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(iii) අදාළ විස්තර (ආ) i යටතේ ඇත.

(iv) අදාළ විස්තර (ආ) i යටතේ ඇත.

(ඇ) (i) සහ (ii) කොටස් සඳහා එක පිළිතුරක් තිබෙන්නේ.

මෙම කොන්ත්‍රාත්තු සඳහා දේශීය අරමුදල් භාවිත කර ගෙවීම් කටයුතු කිරීමට නියමිතය. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් දේශීය බැංකු ණය මුදලක් ද ලබාගෙන ඇති අතර, කොන්ත්‍රාත් පැකේජවල මූලික ගෙවීම් එමඟින් සිදුකර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමනි, මම මේ ඔක්කොටම ගන්නේ විනාඩි එකහමාරයි. මුලින්ම, ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ ප්‍රශ්නයට ලැබුණු උත්තරය අනුවත් අපිට පෙනෙනවා, අධිවේගී මාර්ග කියන්නේ විශාල මුදල් ප්‍රමාණයක් වැය වන ව්‍යාපෘති බව. අධිවේගී මාර්ග හදනවාට අපි විරුද්ධ නැහැ. නමුත්, මේ මොහොතේ ජනතාවට තිබෙන ප්‍රශ්නත් එක්ක බොහෝ දෙනෙකු නඟන ප්‍රශ්නයක් තමයි, අධිවේගී මාර්ග කන්න ද කියන එක. අද තෙල් නැහැ; විදුලිය නැහැ; ගෑස් නැහැ; සිමෙන්ති නැහැ; සංචිත නැහැ; ඩොලර් නැහැ. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපි ඉස්සර කළා වාගේ, මේ සම්බන්ධයෙන් කථා කරන්න දිනයක විවාදයක් අපිට ලබා දෙන්න. මොකද, අධිවේගී මාර්ග ගැන අතුරු ප්‍රශ්න අහලා අරහෙන් මෙහෙන් උත්තර ගන්න බැරි නිසා.

මම ඔබතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා ජනවාරි මාසයේ 16වන දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලිය අවලංගු කරලා -මෙම මාර්ගයේ දෙවැනි කොටස කළා වාගේ- දේශීය කොන්ත්‍රාත්කරුවන්ට මෙය පිරිනමන්න කියලා. ඊට පස්සේ දින දහයක් යනකොට ඒක එහෙමම reverse කරලා ඔබතුමා ජනවාරි 27 වනදා කැබිනට් අනුමැතිය ඉල්ලනවා, "නැවත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියට යන්න ඕනෑ" කියලා. මේ ගැන අද රටේ ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමාත් උත්තර දෙනවා, තව අයත් ප්‍රශ්න කරනවා. මේකේ තාක්ෂණ කමිටුවේ සාමාජිකයන් පවා ඒ ටික කාලය ඇතුළත වෙනස් කළා. මේ ගැන ඔබතුමාගේ පැහැදිලි කිරීම මොකක්ද කියන ප්‍රශ්නය විතරක් මම අහනවා.

දෙවන අතුරු ප්‍රශ්නය ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අහනවා, ගරු කථානායකතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා පළමුවෙන්ම අහපු ප්‍රශ්නයට මම උත්තර දෙන්නම්. එතුමා ඇහුවා, අධිවේගී මාර්ග කන්න ද කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මම කිව්වේ ජනතාව අහනවා කියලා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ජනතාව අහන දේ තමයි එතුමා ඇහුවේ, ගරු කථානායකතුමනි. හැබැයි, විවිධ පක්ෂවල දේශපාලනඥයෝ කියන දේවලුත් අපි අහලා තිබෙනවා. ඊයේත් මම දැක්කා දේශපාලනඥයෙක් එහෙම අහනවා.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගයේදී තමයි අධිවේගී මාර්ග සංස්කෘතිය මේ රටට හඳුන්වා දීලා ඒවා ඉදිකළේ. මම ඒක ඔබතුමාට ඉතාම ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලාත් ඒවා ආරම්භ කළා; හැදුවා. අපි ඒ දේවල් විවේචනය කරන්නේ නැහැ. ඒවා අවශ්‍ය දේවල්. ඉතිහාසයේ බොහෝ අය කිව්වා කිරි, පැණි ගේන්න, ඇඹුල්තියල් ගේන්න තමයි අධිවේගී මාර්ග හැදුවේ කියලා. ඔබතුමා නම් එහෙම කිව්වේ නැහැ. කොයි පැත්තේ හිටියත් ගයන්ත මන්ත්‍රීතුමා කියන්නේ බොහොම වැදගත් දේශපාලනඥයෙක්; මම බොහොම ගරු කරන දේශපාලනඥයෙක්. අපිට ආර්ථික ප්‍රශ්න තිබෙනවා. හැබැයි, අපේ රටේ සංවර්ධනය අපි නතර කරලා නැහැ, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමනි, වැඩ ලක්ෂයේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න අපේ මුදල් ඇමතිතුමා තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ටත් සල්ලි වෙන් කරලා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, කොවිඩ් වසංගතය ආවත් අධිවේගී මාර්ග විතරක් නොවෙයි, මාර්ග කිලෝමීටර ලක්ෂයේ වැඩසටහන විතරක් නොවෙයි, අනෙක් සංවර්ධන කටයුතු පවා අපි නතර කළේ නැහැ කියන එක මම ඉතාම ගෞරවයෙන් මේ වේලාවේ මතක් කරනවා. අපේ රජය 'කොවිඩ්, කොවිඩ්, කොවිඩ්" කියලා ආපස්සට යන රජයක් නොවෙයි. අපේ ජනාධිපතිතුමා vaccine ගෙන්වලා, ජනතාවට ඒ vaccine ලබා දීලා ඔවුන් ආරක්ෂා කරගෙන මේ රට ඉදිරියට ගෙන යනවා. හැබැයි, අපිට ආර්ථික ප්‍රශ්න තිබෙනවා. අපි නැහැ කියන්නේ නැහැ. අපිට තිබෙන්නේ ඩොලර් ප්‍රශ්නයක්. අපි ඒක නැහැ කියන්නේ නැහැ. ලෝකයේ අනෙක් රටවල් එක්ක ගත්තාම, අද හැම අතින්ම සාර්ථක වැඩ පිළිවෙළක් අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ගෙන යනවා කියන එක අපි පිළිගන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, දේශීය කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් දෙනවා කියලා පස්සේ ඒවා වෙනස් කළා කියලා. ඔව්. අපිට සල්ලි හොයා ගන්න බැරි නම් අපි ඒවා වෙනස් කරනවා. ඒකට තමයි රජයක් තිබෙන්නේ. ඒවා වෙනස් කරන්න කැබිනට් එකට යන්න ඕනෑ නම්, කැබිනට් මණ්ඩලයේ එකඟතාව අරගෙන වෙනස් කළ යුතුයි. ඔබතුමා ඒ ගැන කථා කරන්න දවසක විවාදයක් ඉල්ලුවා නේ. මම ඔබතුමාට එක දෙයක් කියන්නම්. ඊයේ ජාතික පුවත් පත්වල පළ කර තිබුණු කාරණාවලට මම ඊයේ හවස උත්තර දුන්නා. මම ඒවාට උත්තර දෙන්න නොවෙයි සිටියේ. සති දෙකක් තිස්සේ මේවා පළ වුණා. මම උත්තර දුන්නේ නැත්තේ මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුවන නිසායි. එතකොට අපි ඇවිල්ලා උත්තර දෙනවා නම්, ඒක වැරදියි. මොනවාද, ඒවායේ කියා තිබුණේ? කෝටි එක්දහස්හයසිය ගණනක් හොරකම් කරලා ලු. මම දැක්කා, එක දේශපාලනඥයෙක් කියලා තිබුණා, මේ ඇස්තමේන්තු අනුව රත්තරන්වලින් පාරවල් හදන්න පුළුවන් කියලා. *[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ නායකයා හැටියට ඉඳලා අද පැරදිලා ගෙදර ඉන්නේ. මම නම කියන්නේ නැහැ. ඔබතුමා මේ වාගේ ඒවාට බෙල්ල තියන්න එපා. එතුමන්ලා කරපු හැටි මතකයි නේ. ඔබතුමා දන්නවා නේ, මීරිගම ඉඳලා කඩවතට, නැත්නම් කඩවත ඉඳලා මීරිගමට ඉදිකිරීම් කළේ කවුද කියලා. මේ කියන්නේ ඒ සමාගම ගැන නේ. ඔබතුමන්ලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ කොහොමද කිව්වේ? මං තීරු හයක් සහිත වටරවුම් පාර බිලියන 66කට දෙනවා කිව්වා. මේ ඇස්තමේන්තු අනුව රත්තරන්වලින් පාරවල් හදන්න පුළුවන් නේද

කියලා එදා මඩ ගැහුවා. එහෙම මඩ ගහලා නේ, ඡන්දය දිනා ගත්තේ. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිල්ලා මොනවාද කළේ? ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇවිල්ලා බිලියන 66කට මං තීරු හයක් වශයෙන් දීලා තිබුණු එක මං තීරු දෙකක් අඩු කරලා බිලියන 66ට දුන්නා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
අර, ඇමතිතුමා ඉස්සරහා ඉන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මම හිටපු ඇමතිවරු කාටවත් ඇඟිල්ල දිගු කරන්නේ නැහැ, ඇමතිතුමා. මේවාට හුඟාක් අය හවුල්. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා හවුල් නැහැ. එතුමා පිරිසිදු දේශපාලනඥයෙක්. ඒක මම කියනවා. එතුමා කොයි පැත්තේ හිටියත් මම ඒක කියනවා. මම ඒක හැම දාම කියපු දෙයක්. ගරු මන්ත්‍රීතුමනි, මෙතැන හිටියා නම් අද මේක අහන්නේ වජිර අබේවර්ධන මහත්මයා, ඔබතුමා නොවෙයි. කොහොමද දුන්නේ? ලක්ෂ 25,000 ටෙන්ඩර් එක ලක්ෂ 43,000ට දුන්නේ කඩවත ඉඳලා මීරිගම දක්වා කොටස හදන්න. ලක්ෂ 18,000ක් හොරා ගැහුවා මාස තුනක් යන්න ඉස්සෙල්ලා. යහ පාලන ආණ්ඩුව ඇවිල්ලා අගෝස්තු මාසය වෙනකොට තමුන්නාන්සේලා ආරම්භ කළා, ගයන්ත මන්ත්‍රීතුමනි. අදට අවුරුදු හතයි, ඒ සමාගම අරගෙන. අවුරුදු හතයි! අඩුම ගණනේ තමුන්නාන්සේලා මේක ටෙන්ඩර් එකකින්වත් නොවෙයි දුන්නේ; unsolicited දුන්නේ. ඒකේත් බිලියන 36ක් ගෙව්වේ අපේ ආණ්ඩුවෙන් කියන එක මම මතක් කරන්න කැමැතියි. අපිටත් ඕක cancel කරන්න තිබුණා. හැබැයි, අපි බැලුවේ අධිවේගී මාර්ග සෑදීම නතර කරන්නේ නැතුව ඉක්මනින් මේ රටේ මිනිසුන්ට ඒවා හදා දෙන්නයි.

ඊළඟට, මොකක්ද වුණේ? දෙවැනි package එක වුණේ, මීරිගම ඉඳලා කුරුණෑගල දක්වා වන කොටස සෑදීමයි, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා ඒකත් දීපු විධිය මම කියන්නම්. මේ බලන්න, අපේ කිරිඇල්ල හිටපු ඇමතිතුමා කියපු දෙයක් මේ පුවත් පතේ තිබෙන්නේ. එතුමාටත් ඒ තරම් දේවල් කරන්න බැරි වුණා. අපි කියන්නම්, වෙච්ච දේවල් ඔක්කෝම. *[බාධා කිරීමක්]* ඉන්න. ඉන්න. ඔබතුමා අහපු ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්න එපා යැ. ඔබතුමා නම් මඩ ගැහුවේ නැහැ. හැබැයි, මම උත්තර දුන්නේ නැත්නම් මේකෙන් භාගයක් තමයි හවස ටීවී එකේ පෙන්වන්නේ.

මෙහි සඳහන් වනවා, "දයා ගමගේ හරියට කළා නම්, කුරුණෑගල අධිවේගයේ වැඩ ඉවර කරන්නේ අපි" කියලා. දයා ගමගේ කවුද? දයා ගමගේ කියන්නේ තමුන්නාන්සේලාගේ කැබිනට් එකේ හිටපු ඇමතිවරයෙක්. කැබිනට් එකේ හිටපු ඇමතිට ටෙන්ඩර් දුන්නා කියලා කැබිනට් එකේ හිටපු තව ඇමති කෙනෙක් පත්තරේට කියනවා. මම නොවෙයි කියන්නේ. මමත් කිව්වා තමයි.

එහෙමයි ඒ කාලයේ හොරකම වුණේ. ඒ අවස්ථාවේ පාරක් හදන්න දුන්නේ කීයටද? අපි දීලා තිබුණේ රුපියල් ලක්ෂ 24,000ට. නොවැම්බර් මාසයේ 13 සහ 14 මුල්ගල් තිබ්බා, ගලගෙදර දක්වා සහ ගලේවෙල දක්වා කොටස්වලට. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඒ වැඩ දේශීය කොන්ත්‍රාත්කරුවන්ට දීලා තිබුණේ. නමුත්, ඔබතුමන්ලා ඒවා දුන්නා, රුපියල් ලක්ෂ 33,000 ගණනේ. කිලෝමීටරයකට ලක්ෂ 8,000ක් වැඩියෙන් දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කෙටියෙන් කියන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අපට ඇඟිල්ල දිගු කළාට, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපි රාජ්‍ය නිලධාරින් හරහා ප්‍රසම්පාදන කටයුතු ඉතාම නිවැරදිව කරන බව මම කියනවා. එතුමා දූෂණයට විරුද්ධයි. අපේ රජය දූෂණයට විරුද්ධයි. අපි දූෂණයට ඉඩ දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, එතුමන්ලා දැන් මේ කියන ගණන් හිලව් මොනවාද? විවෘත නොකළ ටෙන්ඩරයක ගණන් හිලව් තමයි ඒ දේශපාලනඥයන් කියන්නේ. ගණන් හිලව් ඉදිරිපත් වුණේ නැති, අඩු ගණනේ ලියුම් කවරයවත් ගලවපු නැති ටෙන්ඩරයක් ගැන තමයි කථා කරන්නේ. ගරු කථානායකතුමනි, අපි හැම දෙයක්ම කරන්නේ දූෂණයෙන් තොරවයි කියලා පැහැදිලිව කියනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මා කියන්න කැමැතියි, මේ ටෙන්ඩර් දුන්නාම ඕනෑ අභියෝගයක් ඉදිරිපත් කරන්න කියලා. ඒවා ගැන උසාවි යන්න පුළුවන්, පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන්. හැබැයි, එදා මීරිගම ඉඳලා කඩවත දක්වා හදන්න ලක්ෂ 18,000ක් වැඩියෙන් දුන්න සමාගමක් වෙනුවෙන් තමයි තමුන්නාන්සේලා කථා කරන්නේ කියන එක මම මේ වෙලාවේ කනගාටුවෙන් වුණත් සඳහන් කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමා ගැන නොවෙයි මම කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළා.*[බාධා කිරීම්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේ සමාගම් නියෝජනය කරන්න යන්න එපා කියලා අපි තමුන්නාන්සේලාට කියනවා. මහ බැංකු හොරකමට වැඩිය හොරකමක්ලු දැන් වෙන්නේ. මහ බැංකුව හොරා කෑවා. අද ඒ අය ඒ සමාගම් නියෝජනය කරනවා. ඒ පක්ෂයත් ඉවර වුණා. ඒ පක්ෂයේ පාර්ලිමේන්තු නියෝජනය එකට බැස්සා. ඒ නිසා

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

කල්පනා කර බලා කටයුතු කරන්න. හොරුන් නියෝජනය කරන්න එපා කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. අපි ඉතාම නිවැරදිව කටයුතු කරනවා. කිසිම අකටයුත්තක් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. හරි දේ කරන නිලධාරින් අපි රකිනවා. තමුන්නාන්සේලා නිලධාරින් හිරේ දමලා කරපු විනාශය අපට මතකයි. ඒ නිසා තමුන්නාන්සේලා කරපු හොරකම් ගැන කථා කරන්න දවසක් නොවෙයි, මාසයක් හෝ ගනිමු. එතකොට අපි කියන්නම්, තමුන්නාන්සේලා හොරකම් කරපු ඒවා එකින් එක. මලික් සමරවික්‍රමලා බෑග්වල දමලා සල්ලි දුන්නේ කොහොමද කියලා අපි කියන්නම්. අපි කියන්නම්, ඒ කාලයේ හිටපු ඇමතිවරු වැඩ කටයුතු කරපු ආකාරය. ඒ නිසා කරුණාකර මඩ ගහන්න එපා.

තමුන්නාන්සේලා ඊළඟට මොනවාද කියන්නේ? "ආණ්ඩුවක් තිබුණා, ඒ ආණ්ඩුව මොනවාද කෙරුවේ" කියලා අහයි. එහෙම නේද? ඡන්දයක් ආපුවාම එහෙම අහයි. ආණ්ඩුව මොනවාද කෙරුවේ කියලා අහයි.අපි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ රටේ සංවර්ධනය නැති කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මොන අභියෝග ආවත් ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ රටේ ජනතාවට අවශ්‍ය ඒ සංවර්ධනය අනිවාර්යයෙන්ම අපි ඉටු කරන බව ඉතා ගෞරවයෙන් මම සඳහන් කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා මගේ නම සඳහන් කළා. ඒ නිසා මට මේ කාරණය කියන්න ටිකක් වෙලාව ඕනෑ.

ගරු කථානායකතුමනි, 2015දී අපි බලයට පත් වෙනකොට මහින්ද රාජපක්ෂ මහත්මයා මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටස MCC එකට දෙන්න ගිවිසුම අත්සන් කරලායි තිබුණේ. අපි නොවෙයි ඒක කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මෙන්න හොරු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Please, do not disturb. MCC එකේ දේශීය නියෝජිතයන් දෙදෙනා කවුද? එක්කෙනෙක් ප්‍රභාත් නානායක්කාර. අනෙක් කෙනා ඩිල්ශාන් වික්‍රමසිංහ. කවුද ඩිල්ශාන් වික්‍රමසිංහ කියන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා නේ? ඩිල්ශාන් වික්‍රමසිංහ කියන්නේ කවුද කියලා ඔබතුමා දන්නවා නේද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, විවාදයකට යන්නේ නැතුව ඔබතුමාට කියන්න තිබෙන දේ කියන්න. *[බාධා කිරීම්]*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. නැහැ. Please!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය බලාගෙන ඉන්නවා. ඔබතුමාට කියන්න තිබෙන දේ කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි 2015දී බලයට පත් වුණාම චීනයේ අය ඇවිල්ලා "මහින්ද රාජපක්ෂ මේක අපට දෙන්න පොරොන්දු වෙලා තිබුණා" කියලා ලියුමක් පෙන්නුවා. එතකොට අපට මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත - මීරිගම කොටස දෙන්න සිද්ධ වුණා. ඒ ගිවිසුම අත්සන් කරලා තිබුණේ නැත්නම් අපි දේශීය කොන්ත්‍රාත්කරුවන් දාලා කඩවත-මීරිගම කොටස හදනවා. මොකද, අපට ඒ කාලයේ හොඳට සල්ලි තිබුණා. *[බාධා කිරීම්]* ඊළඟට, ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා කිව්වා, මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම-කුරුණෑගල කොටස ගැන. *[බාධා කිරීම්]* එතුමන්ලා තමයි එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ හැම දාම චීන්නු පස්සේ ගියේ. අපි තමයි මීරිගම - කුරුණෑගල- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි හරි. ඔබතුමා ඒකට වෙනම විවාදයක් ඉල්ලන්න. එතකොට ඉවරයි නේ. *[බාධා කිරීම්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. මම කථා කරනකොට ඔබතුමාට හදිසියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට හදිසි නැහැ. තව මන්ත්‍රීවරු කථා කරන්න ඉන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මීරිගම- කුරුණෑගල කොටස දේශීය කොන්ත්‍රාත්කරුවන්ට දුන්නේ අපි. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවටයි ඒක කළේ. ගරු කථානායකතුමනි, එතුමන්ලා හැම පාරක්ම ඉදි කරන්න දුන්නේ චීනුන්ට. *[බාධා කිරීම්]* එතුමා හිටපු අමාත්‍ය දයා ගමගේ ගැන කිව්වා. මම ඒ කාරණය පාර්ලිමේන්තුවේදී පිළිගෙන තිබෙනවා. අපි 16 දෙනෙකුට ඒ කොන්ත්‍රාත් දුන්නා. ඒ එක්කෙනෙක් වැඩ කළේ නැහැ. අපේ රජය කාලයේ මීරිගම - කුරුණෑගල මාර්ගයේ කිලෝමීටර 41න්, 37ක් හැදුවා. ඔබතුමන්ලා පසුගිය අවුරුදු දෙකටම හැදුවේ කිලෝමීටර 4යි. *[බාධා කිරීම්]* කිලෝමීටර 4ක් හදලා උත්සවයක් පැවැත්වුවා. ඔබතුමාට MCC එක ගැන අහන්න ඕනෑ නම් ඩිල්ශාන් වික්‍රමසිංහගෙන් අහන්න. ඩිල්ශාන් වික්‍රමසිංහ කියන්නේ, ශිරන්ති රාජපක්ෂ මහත්මියගේ අයියාගේ පුතා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා ගැන කථා කරන්න වෙනම විවාදයක් ගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
MCC එකට දුන්නේ ඒ ගොල්ලන්, අපි නොවෙයි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, please. අපේ රජය බලයට පත් වුණාම චීනයේ අය ඇවිල්ලා ලියුම පෙන්නුවා. එතකොට අපේ අගමැතිතුමාත් කිව්වා, අත්සන් කර තිබෙනවා නම් කොටසක් දෙන්න කියලා. ගරු කථානායකතුමනි, මේ ගොල්ලන් බලයට ආවාට පසු මහාමාර්ග අමාත්‍යාංශයේ දේවල් ගැන මාසයක් හෙව්වා මොකක් හරි පටලවා ගන්න. කිසිම දෙයක් හොයා ගන්න බැරි වුණා. අපේ හේරත් සභාපතිතුමා ඉන්නවා. කිසිම අක්‍රමිකතාවක් සිදු කර නැහැ, audit query එකක් නැහැ. මොනවා හරි තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. නිකම් මඩ ගහන්න එපා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, එතුමාගේ නම කියලා මම එක කාරණයක් ගැන විතරයි කිව්වේ. එතුමා ඊට වඩා දේවල් කිව්වා, විනාඩි නවයක් අරගෙන. ඉතින් මමත් රජය හැටියට උත්තර දිය යුතුයි. ඊට පසුව දෙවන අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]* ඇයි, අහගෙන ඉන්න භයද? *[බාධා කිරීම්]* ඇයි, අහගෙන ඉන්න බැරිද?

ගරු කථානායකතුමනි, කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉන්නේ 'බබා උකුං' පාටි එකෙන් වාගේ. එතුමා කියනවා, ඒ කාලේ දුන්නු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කොළයක් ගෙනැල්ලා දුන්නා ලු, ඒ කොළය බලලා ටෙන්ඩර් එක දුන්නා ලු; කොන්ත්‍රාත් එක දුන්නා ලු. *[බාධා කිරීම්]* අනේ, ඔය වාගේ මෝඩ කථා කියන්න එපා. ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කිව්වේත් ඔබතුමා නේ. මෝඩ කථා කියන්න එපා. දයා ගමගේ හිටපු ඇමතිතුමාට කොන්ත්‍රාත් දුන්නා කියලා දෙවැනි වතාවටත් කිව්වා. ගරු කථානායකතුමනි, එතුමා කිව්වා, අපි මහාමාර්ග අමාත්‍යාංශයේ දේවල් ගැන මාසයක් තිස්සේ හෙව්වා කියලා. එක දවසක්වත් අපි හොයලා නැහැ. අපි පළිගන්න කටයුතු කළේ නැහැ. නමුත්, අපි දැක්කා නේ එතුමන්ලා අපෙන් පළිගත්ත හැටි. අපි එක file එකක් ගැනවත් හොයලා නැහැ. ඔබතුමන්ලා බොරු කතන්දර කියන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, හොයන්නේ නැත්තේ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
හොයනවා. හොයන්නම්. ඔබතුමන්ලා ඉල්ලනවා නම් අපි හොයනවා. [බාධා කිරීම්] අපි බිලියන 66ට දුන්නු කොන්ත්‍රාත් එක කොහොමද දුන්නේ? මං තීරු දෙකක් අඩු කරලාත්, මහින්ද රාජපක්ෂ මහත්මයා කියපු නිසාද බිලියන 66ට දුන්නේ. [බාධා කිරීම්] ශිරන්ති රාජපක්ෂ මැඩම්ගේ නම ඇදගෙන නිකරුණේ, බොරුවට මඩ ගහනවා. මතකයි නේද, තමුන්නාන්සේලා කිව්ව රත්තරන් අශ්වයෝ, හෙලිකොප්ටර්, ලැම්බොගිනි ගැන? ඒවා ගැනනේ කිව්වේ. අහගන්න ඕනෑ නම් අපි කියන්නම්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, අපි මිරිගම- කුරුණෑගල අධිවේගී මාර්ගයේ කිලෝමීටර හතරයි හැදුවේ කියලා. එතුමන්ලා දීලා අවුරුදු හතයි. අඩුම ගානේ සියයට පහළොවවත් දුන්නේ නැහැ, MCC එකට. දැන් කියනවා, "චීන්නු-චීන්නු-චීන්නු" කියලා. අපට කියනවා, චීන කොලනියක් කරන්න හදනවා කියලා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අද නියෝජනය කරන්නේ කාවද? දේශීය සමාගම්ද? අපි ලැහැස්තියි ඕනෑම විවාදයකට. අපි කියන්නම් ගත්ත තැන්, හොරකම් කරපු විදිය, කිලෝමීටර ගණන, මොන තරම් හොරකමක් කරලා තිබෙනවාද කියලා. හැබැයි, අභියෝග කරලා නිකම් අසත්‍ය කියන්න එපා. මහාමාර්ග අමාත්‍යාංශයේ දේවල් ගැන මාසයක් හෙව්වා කියලා අසත්‍ය කියන්න එපා.

ජොන්ස්ටන් ප්‍රනාන්දු ඒ වාගේ පුද්ගලයෙක් නොවෙයි. හැබැයි, ඔබතුමා අභියෝග කරනවා නම් අපි ඒවා පිළිබඳවත් හොයන්න ලැහැස්තියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය, ඔබතුමිය දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]* ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් නැවතත් විවාදයකට යනවා. *[බාධා කිරීම්]* මොකක්ද ඔබතුමා කියන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා. ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු දෙකක් ගියාට පස්සේ තමයි කියන්නේ, හොයන්න පටන් ගන්නවා කියලා. COPE එක මාසයක් තිස්සේ හෙව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය, ඔබතුමිය දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉතිහාසය අරගෙන බැලුවාම, අපි අවුරුදු 73ක් තිස්සේ දෙපැත්තට චෝදනා කර ගන්නවා, "එයා හොරා, මෙයා හොරා" කියලා. හැබැයි, අද තමුන්නාන්සේලාට බලය තිබෙනවා නේ, ගරු ඇමතිතුමනි. ඒ නිසා, ඔබතුමා හොරා කවුද කියලාත් දන්නවා නම්, හොරකම් කරපු විදියත් දන්නවා නම්, මේ පාර්ලිමේන්තුවේ කාලය ගන්නේ නැතුව ඒ අයට නීතිය ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියලා මම හිතනවා. හැබැයි, ඒ වරදකරුවන් නිදොස් කොට නිදහස් කරන්න නම් එපා. හොරකම් කරපු මිනිස්සු ඉන්නවා නම්, කොයි කාලයේ කළත් ඒ හොරකමට දඬුවම ලැබෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, කවුරු හොරකම් කළත්, කවුරු ගසා කෑවත්, අධිවේගී මාර්ග ඉදිකිරීම නිසා වින්දිතයන් වුණු අයට, පීඩාවට පත් වුණු අයට, අවතැන් වුණු අයට අසාධාරණයක් සිද්ධවෙලා තිබෙනවා. මම මීට කලිනුත් දඹුල්ල අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී වින්දිතයන් වූ අයගේ තක්සේරුව පිළිබඳව තිබෙන ගැටලු ඔබතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. දඹුල්ල නගර සීමාවේ සිදු වන අත්පත් කර ගැනීම්වල තක්සේරුව මේ වෙනකල් ඇවිල්ලා නැහැ.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණාව මේකයි. මේ වෙනකොට හත්අඩුක්කුව සහ බෙලිගමුව කියන ග්‍රාම නිලධාරි වසම්වල තක්සේරු කිරීම් කරලා අවතැන් වන අය සම්බන්ධයෙන් සමීක්ෂණයක් කරනවා, ඒ අය කැඳවලා කථා කරනවා. එතැනදී මෙන්න මෙහෙම අසාධාරණයක් වෙනවා. ඉවත් කරන ගම්මිරිස් වැලක් සඳහා රුපියල් 178යි, එහෙම නැත්නම් රුපියල් 200යි ලැබිලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ගම්මිරිස් වැලකින් එක් වරකට කිලෝ 5ක් කැඩුවත්,- මේ දවස්වල නම් අමු ගම්මිරිස් කිලෝ එකක් රුපියල් 450යි.- එක සැරේකට රුපියල් 2,250ක් ලැබෙනවා. අවුරුදු 20කදී ලබන පාඩුව සලකලා තක්සේරුව කරනවාය කියනවා. එහෙම නම් එක ගම්මිරිස් වැලක් සඳහා රුපියල් 45,000ක් හම්බවෙන්න ඕනෑ. පොල් ගහක් වෙනුවෙන් රුපියල් 3,500ක වන්දියක් තමයි දීලා තිබෙන්නේ. කුරුණෑගල පොල් තිබෙන නිසා ඔබතුමා දන්නවා, අවුරුද්දකට හතර පස් සැරයක් පොල් කඩන්න පුළුවන් බව. එක ගසකින් එක සැරේකට පොල් ගෙඩි 10ක් කැඩුවත් කිහිප වතාවක් කඩන විට විශාල ප්‍රමාණයක් කඩන්න පුළුවන්. අවුරුදු 20කට තක්සේරු කළාම එක පොල් ගහක් වෙනුවෙන් රුපියල් 70,000ක්වත් ලැබෙන්න ඕනෑ.

මම හිතන විධියට, මේ ගහක් දැව සඳහා විකුණුවත් රුපියල් 3,500කට වඩා ගන්න පුළුවන්. මේ හත්අඩුක්කුව කියන ප්‍රදේශය හොඳ සශ්‍රීක ප්‍රදේශයක්, ගරු ඇමතිතුමා. ඒ ප්‍රදේශයේ හොඳට වවලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ පර්චස් එකක් සඳහා දීලා තිබෙන්නේ රුපියල් 25,000යි. සමහර ඉඩම්වලට -අල්ලපු ඉඩමටයි, අනෙක් ඉඩමටයි- ඉලක්කම් දෙකක් -තක්සේරු දෙකක්- තිබෙන්නේ.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මම එක ඉඩමක් උදාහරණයකට ගන්නම්. ගම්මිරිස් සහ පොල්වලට අමතරව වෙනත් ගස් වර්ග 22ක් තිබෙන ඉඩමක් තිබෙනවා. නමුත් ඒ එක ගහකටවත් තක්සේරුවක් දීලා නැහැ. ඒ ප්‍රදේශවල ජනතාවට මේ වාගේ අසාධාරණයක් දිගින් දිගටම සිදු වනවා. ඒ අයට ඒ ලැබෙන මුදලින් තමයි තව ඉඩමක් ගන්න වෙන්නේ. මොකද, ඔබතුමන්ලා ඒ අයට ඉඩම් දෙන්නේ නැහැ. ඒ ජනතාව දැන් ලොකු ගැටලුවකට මුහුණ දීලා ඉන්නේ. ඒ නිසා, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ සිදු වන මේ කාර්යය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා තමයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි,. ඇත්ත වශයෙන්ම 2015ට කලින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ යුගයේදී තමයි අවුරුදු 30ක් දක්වා කාලයකට එළඳාව තක්සේරු කරලා වන්දි ලබා දෙන්න කටයුතු කළේ. ජනතා විරෝධයක් නැතිව අධිවේගී මාර්ග හදන්න උදවු කළේ එතුමාගේ කාලයේ. පසුව ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. කුරුණෑගල අධිවේගී මාර්ගය විවෘත කරපු දවසට කලින් දවසේත් සියදෙනෙකු විතර මා හමුවෙලා කිව්වා, "මේ තක්සේරුකිරීම් කර තිබෙන්නේ ඉතා අඩු ගණන්වලට. නැවත ඒවා නිවැරදි කර දෙන්න" කියලා. මම ඒ කාරණය පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියපු කාරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශය හැටියට කරන්න පුළුවන් හැම දෙයක්ම මම කරනවා. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත්, ව්‍යාපෘති අධ්‍යක්ෂතුමා සහ ලේකම්තුමාත්, ඔබතුමියගේත් -අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කීප දෙනෙකුත් මේ ගැන කථා කරලා තිබෙනවා.- සහභාගිත්වයෙන් රැස්වීමක් පවත්වලා, අපි ඔය ප්‍රශ්න ටික එතැනදී කථා කරමු, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ගලගෙදර ප්‍රදේශය සම්බන්ධයෙන් දීපු තක්සේරු පත්‍රිකාවක් මා ළඟ තිබෙනවා. ඒ පත්‍රිකාවට අනුව පොල් ගහකට රුපියල් 90,000ක් දීලා තිබෙනවා. දෙපැත්තක එහෙම දෙවිධියක් වෙන්න විධියක් නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

එහෙම වෙන්න බැහැ. ඔබතුමිය කියන කාරණයට මම එකඟ වනවා. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව -Government Valuation Department- තමයි ඒ තක්සේරු කටයුතු කරන්නේ, ගරු මන්ත්‍රීතුමියනි. ඒක කරන්නේ අමාත්‍යාංශයෙන් නොවෙයි. ඒ නිසා මම ඊළඟ පාර්ලිමේන්තු සතියේදී රැස්වීමක් කැඳවන්නම්. අපි ඒ නිලධාරීන් කැඳවලා, වාඩිවෙලා, ඔබතුමියගේ ඔය ප්‍රශ්නය පිළිබඳව කෙළින් කථා කරමු. ජනතාවට අසාධාරණයක් වනවාට පෞද්ගලිකවම අකමැති දේශපාලනඥයෙක්, මම.

ගරු කථානායකතුමනි, අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ නම කියන්නත් බැහැ. මොකද, එතුමා ආපසු නැඟිටින නිසා. ඔක්කොම අය කිව්වා, "ඇයි, මේ බලාගෙන ඉන්නේ, පරීක්ෂණ කරන්න" කියලා.

අපේ ගරු මන්ත්‍රීතුමියත් කිව්වේ ඒකමයි. "පරීක්ෂණ කරලා දඬුවම් කරන්න" කියලා එතුමියත් කිව්වා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාට විරුද්ධව තමයි කථා කරන්නේ. හරි ද? අපි දැන් අවුරුදු දෙකක් තිස්සේ කොවිඩ්-19 වසංගතයට මුහුණ දෙමින් ඉන්නේ. මිනිස්සු කරපු වැරදි හොයලා ඒ අයගේ පස්සෙන් හඹා යන්න අපට අවශ්‍ය නැහැ. අපට ඕනෑ, මේ රටේ ජනතාව ජීවත් කරවන්න. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, හැබැයි, ඔබතුමන්ලා අපට අභියෝග කරනවා නම්, 2015ට පෙර කාලය ගැන කියමින් ආපහු අපට මඩ ගහන්න හදනවා නම්, ඔබතුමන්ලා කරන ඉල්ලීමට අනුව අපිත් ලැහැස්තියි මේවා ගැන හොයන්න. හැබැයි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි මම ඔබතුමාට කියන්න ඕනෑ, ඔබතුමා ඒ කාලයේ රස්සා දුන්නු ඔබතුමාගේ හිතවත් අයත් තවම ඉන්න බව. අපි ඒ අය ඉවත් කළේ නැහැ. තවම ඒ අය රැකියා කරනවා. ඔබතුමා රැකියා ලබා දුන්නු අය තමයි තවම reception එකේ ඉන්නේ. ඒ නිසා මේවා ගැන හොයන්න ඕනෑ නම් ඒ ගොල්ලන්ගෙන් අහන්න. නිකම් බොරු චෝදනා කරන්න එපා. අපේ තිබෙන මනුස්සකම, ජනාධිපතිතුමාගේ තිබෙන මනුස්සකම ප්‍රයෝජනයට අරගෙන තමුන්නාන්සේලා නිකම් වීරයෝ වෙන්න, චණ්ඩි වෙන්න හදන්න එපා කියලා මම මේ වෙලාවේ මතක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -33/2022- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -246/2022- (1), ගරු හේෂා විතානගේ මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රාග්ධන සමුපකාර බැංකුව සතු වාහන: විස්තර
மூலதன கூட்டுறவு வங்கிக்குச் சொந்தமான வாகனங்கள்: விபரம்
VEHICLES BELONG TO CAPITAL COOPERATIVE BANK : DETAILS

567/2022

**4. ගරු චමින්ද විජේසිරි මහතා**
( மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රාග්ධන සමුපකාර බැංකුව සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතරින් ඉහත බැංකුවේ හා නිලධාරින්ගේ කටයුතු සඳහා යොදවා ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත බැංකුව සතු වාහන බාහිර පුද්ගලයන් වෙත ලබා දී තිබේ නම්, එම එක් එක් පුද්ගලයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மூலதன கூட்டுறவு வங்கிக்குச் சொந்தமான வாகனங்களின் எண்ணிக்கை எத்தனையென் பதையும்;

(ii) அவ்வாகனங்களில் மேற்குறிப்பிட்ட வங்கியி னதும் உத்தியோகத்தர்களினதும் நடவடிக்கை களுக்காக ஈடுபடுத்தப்பட்டுள்ள வாகனங் களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) மேற்படி வங்கிக்குச் சொந்தமான வாகனங்கள் வெளியாட்களுக்கு வழங்கப்பட்டிருக்கும் பட்சத்தில், அந்த ஒவ்வொரு நபரினதும் பெயர் மற்றும் முகவரி என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade:

(a) Will he inform this House-

(i) of the number of vehicles that belong to the Capital Cooperative Bank;

(ii) of the number of vehicles, out of the above vehicles, that have been deployed for the use of the above bank and its officers; and

(iii) if vehicles belonging to the above bank have been given to outside persons, the name and address of each such person?

(b) If not, why?

**ගරු ලසන්ත අලගියවන්න මහතා (සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection)
ගරු කථානායකතුමනි, වෙළඳ ඇමතිතුමා වෙනුවෙන් මා කියා සිටිනවා, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අදත් පිළිතුර ලෙස ලබා දෙන්න සිද්ධ වෙන්නේ "අදාළ නොවේ" කියලායි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සමුපකාර සමිතියේ නම නිවැරදිව සටහන් කරලා නැවතත් හෙට දිනයේදී මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කියන්නේ, "ප්‍රාග්ධන සමුපකාර සමිතිය" නමින් තමයි මෙය ලියා පදිංචි වෙලා තිබෙන්නේ. නමුත්, ඔබතුමා අද මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, "ප්‍රාග්ධන සමුපකාර බැංකුව" කියලා. රේඛීය අමාත්‍යාංශයේ හෝ පළාත් නවයේම "ප්‍රාග්ධන සමුපකාර බැංකුව" නමින් ආයතනයක් ලියා පදිංචි කර නැහැ. නමුත්, මම හෙට දිනයේදී ඔබතුමා කලින් අහපු ප්‍රශ්නයටත්, අද අහපු ප්‍රශ්නයටත් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දෙන්නම්. ඔබතුමා මේ ආයතනයේ නිවැරදි නමින් මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ හෙට දිනයේදීයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා හෙට පිළිතුර ලබා දෙනවා කිව්වා නේ. ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ රාජ්‍ය ඇමතිතුමා ප්‍රශ්නයට උත්තරයක් දුන්නා නම් නේ. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ඇයි කියන එක කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඉක්මනට කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියනවා වාගේ රටේ ව්‍යවස්ථාපිත නීතිය අනුව ලියා පදිංචි වෙච්ච මෙවැනි බැංකු නැහැ.

[ගරු චමින්ද විජේසිරි මහතා]

හැබැයි, මේ වාගේ නම තිබෙන බැංකු ශාඛා 130ක් රට පුරා තිබෙනවා. හැබැයි, "බැංකුව" කියලා නම දාලා තිබුණාට මේවා සමුපකාර සමිති, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේම, රටේ පවතින නීතිය අනුව "බැංකුව" නමින් එහෙම ආයතනයක් ක්‍රියාත්මක කරන්න බැරි නිසා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. අන්න ඒකයි හොයන්න කියන්නේ. ඒකේ ශාඛා ඔබතුමාගේ ගමේත් තිබෙනවා; ගරු කථානායකතුමාගේ ගමේත් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අන්න ඒකයි වැදගත් කාරණය. සමිතියක් විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට, හොර ජාවාරමක් කරන විධියට "බැංකුව" කියා නම ගහලා මේ ආයතන පවත්වා ගෙන යනවා. හැබැයි, එය බැංකුවක් නොවෙයි. ඔබතුමා කියන එක හරි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඒකයි මම මේ ප්‍රශ්නය මේ විධියටම ඇහුවේ. රටේ ඒ වාගේ බැංකු ශාඛා 130ක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මම අද අහලා තිබෙන්නේ ඒ ශාඛා 130 සතු වාහන සම්බන්ධව. ඌව පළාත් ප්‍රාග්ධන කෝප් සොසයිටි ලිමිටඩ්. *[බාධා කිරීමක්]* අන්න හරි, සමිතිය. එහි නීත්‍යානුකූල නාමය මේක. හැබැයි, "බැංකුව" නමින් තමයි පවත්වාගෙන යන්නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඔබතුමා එම ප්‍රශ්නය හෙට දිනයේත් අහන්න ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක තමයි. හෙට අහන ප්‍රශ්නයේදී මම ඒ කාරණය අහන්නම්. මට අද දැන ගන්න ඕනෑ වෙන්නේ මේකයි. ගරු කථානායකතුමනි, ඔබ අප සියලු දෙනා රටේ සිටියදී, 2001 සිට එම සමුපකාර සමිතියේ කාර්යභාරය වංචාසහගතව, බැංකුවක් හැටියට කරගෙන යනවා. එහි බරපතළ කාරණය මේකයි. බැංකුවක් හැටියට පවත්වාගෙන ගියාම පොලියට සල්ලි දෙනවා; මිනිසුන්ගෙන් සල්ලි ගන්නවා. මේක බැංකුවක් නොවන නිසා එ් අවස්ථාවලදී වංචනික වැඩ වෙනවා. ගරු කථානායකතුමනි, එහෙම කරන නිසා තමයි මම ඒ ආයතනයේ දැන් පවතින නම දාලා මේ ප්‍රශ්නය ඇහුවේ. මම වගකීමෙන් කියනවා, බැංකුව කියන නම සඳහන් කරපු මෙවැනි සමුපකාර සමිති 130ක් රට පුරා තිබෙන බව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙය හොර බැංකුවක් කියන කාරණය මම අද ඔප්පු කර තිබෙනවා නම්, ඔබේ ආණ්ඩුව ඒකට විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා පසුගිය 09 වැනිදාත් මේ ප්‍රශ්නය යොමු කර තිබෙනවා. අදත් -22 දිනටත්- යොමු කර තිබෙනවා; 23 වැනිදාත් අහන්න මේ ප්‍රශ්නය යොමු කර තිබෙනවා; 24 වැනිදා අහන්නත් යොමු කර තිබෙනවා. මේ ආයතනය පිළිබඳව නම් 4කින් තමයි ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ. ටිකක් හෝ ළඟින් ගන්න පුළුවන් නම තිබෙන්නේ හෙට දිනයට අහන්න නියමිත ප්‍රශ්නයේ. ඒක තමයි, "ප්‍රාග්ධන සමුපකාර සමිතිය" කියන නම ඇතුළත් ප්‍රශ්නය. දවස් හතරෙම යොමු කර තිබෙන ප්‍රශ්නවලට හෙට දිනයේ මම පිළිතුරු ලබා දෙන්නම්. කුමන හෝ වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඔබතුමා කරුණාකර කියන්න. ඒ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා. අපට මෙහි හංගන්න කිසිම දෙයක් නැහැ. ඔබතුමා අහන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙන්න පුළුවන්. ඕනෑම දෙයක් තිබෙනවා නම් කියන්න. ඒවාට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම අපි භාර ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රාජ්‍ය ඇමතිතුමා වගකීමෙන් කිව්වා, හෙට දිනයේ උත්තරයක් දෙනවා කියලා. ඒ නිසා හෙට දිනයේ අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න අහන්න ප්‍රශ්නයට උත්තරයක් දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]* හරි කියන්න කෝ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමා අහගන්න. මට හොරකම් වහන්න අවශ්‍ය නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළමු අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. දෙවැනි එක අහන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම ප්‍රාග්ධන සමුපකාර සමිති පිළිබඳව නීත්‍යානුකූල ලිපි ලේඛන තිබෙනවා. ඔබතුමාට ඒ විස්තර දෙන්න පුළුවන්. එවැනි බැංකු ශාඛා 130ක් ඇති කරලා, සමිතියේ පොත නිකුත් කරලා, සල්ලි ගන්න බැංකු පිළිබඳව තමයි මම මේ පුන පුනා කියන්නේ. එවැනි සමිතියක තිබෙන වාහනයක් පිළිබඳව තමයි මම දැන් ඔබතුමාට කිව්වේ. එම වාහනයේ අංකය up PI - 4008. වාහනය ලියා පදිංචි කර තිබෙන ලිපිනය, අංක 187, ප්‍රධාන වීදිය, බණ්ඩාරවෙල. එම වාහනයේ පින්තූරය සහිත ඡායා පිටපතක් මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, ප්‍රාග්ධන සමුපකාර සමිතියේ අරමුදලින් ලබාගත් මේ ජීප් රථය තිබෙන්නේ, අංක 4 යටතේ පොහොට්ටුවෙන් ඡන්දය ඉල්ලපු මන්ත්‍රීවරයෙකු ළඟ. එතුමා මේ වාහනයෙන් තමයි ඡන්දය කාලයේ ගමන් බිමන් ගියේ; පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුවට ආවේ-ගියේ. මේවා තමයි වංචනික කටයුතු. එවැනි වංචා තව බොහෝ තිබෙනවා. මම ඒවා හෙළි කරනවා. ගරු කථානායකතුමනි, මේ වාහනය දේශපාලන කටයුතු සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පාවිච්චි කරලා තිබෙනවා. බැංකුව විධියට ව්‍යාජ නම් දාගෙන, සමිතියේ කටයුතු කෙරෙනවා. එවැනි හොර බැංකු පවත්වාගෙන යන අයට දඬුවම් දෙන්න පුළුවන් ක්‍රමවේදයක් ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ තිබෙනවාද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු බැංකු පළාත් කොමසාරිස්වරයා යටතේ ලියා පදිංචිවෙලා තිබෙනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සමුපකාර විෂයය සම්පූර්ණයෙන් අයිති පළාත් සභාවලට. එම විෂයය තිබෙන්නේ රේඛීය අමාත්‍යාංශය යටතේ නොවෙයි. එහි යම්කිසි අකටයුත්තක්, වංචාවක්, වැරැද්දක් සිදුවෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම පමණයි අපට කරන්න පුළුවන්. ඊට අමතරව ඔබතුමාට හෝ මේ පිළිබඳව උනන්දුවක් දක්වන තවත් පාර්ශ්වයකට රටේ නීතියට අනුව පොලිස්පතිතුමාට හෝ පොලීසියකට පැමිණිල්ලක් කරලා, ඒ පැත්තෙන් පරීක්ෂණයක් කරන්න පුළුවන්කමක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, දැනුවත් වීමක් කර ගන්නයි මේක අහන්නේ. මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් ඇති, කාලය ගත වනවා. එතුමා හෙට උත්තර දෙනවා නේ. ඔබතුමා හෙට අහ ගන්න.

## බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ජල යෝජනා ක්‍රමය
## பிங்கிரிய பிரதேச செயலகப் பிரிவு: நீர் விநியோகத் திட்டம்
## BINGIRIYA DIVISIONAL SECRETARY'S DIVISION: WATER SUPPLY SCHEME

1020/2022

5. **ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත්වන ජනතාව උග්‍ර පානීය ජල හිඟයකින් පීඩා විඳින බවත්;

(ii) මේ වනවිට බිංගිරිය - හලාවත ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ජල යෝජනා ක්‍රමයේ ජලය ගෙන යනු ලබන නළ මාර්ගය දෙපස පිහිටි ගම්මාන සඳහා එම ජල යෝජනා ක්‍රමයෙන් ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ගම්මාන සඳහා ජලය ලබා දීමට වෙනත් ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தின் பிங்கிரிய பிரதேச செயலகப் பிரிவில் வசிக்கும் மக்கள் கடும் குடிநீர் தட்டுப்பாடு காரணமாக பாதிக்கப்பட்டுள்ளனர் என்பதையும்;

(ii) இன்றளவில் பிங்கிரிய - சிலாபம் நீர் விநியோகத் திட்டம் செயற்படுத்தப்படுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட நீர் விநியோகத் திட்டத்துக்கான நீரைக் கொண்டுசெல்லும் குழாய் பாதையின் இருமருங்கிலும் அமைந்துள்ள கிராமங்களுக்கு மேற்படி நீர் விநியோகத் திட்டத்தின்மூலம் நீர் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) இன்றேல், மேற்படி கிராமங்களுக்கு நீர் வழங்குவதற்காக வேறு நீர் விநியோகத் திட்டமொன்றை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply:

(a) Is he aware that -

(i) the people in the Bingiriya Divisional Secretary's Division in Kurunegala District suffer due to a severe dearth of drinking water; and

(ii) at present Bingiriya - Chilaw water supply scheme is being implemented?

(b) Will he inform this House -

(i) whether measures will be taken to provide water from the aforesaid water scheme to the people who reside in villages on both sides of the pipeline which carries water of the above water scheme; and

(ii) if not, whether steps will be taken to start another water supply scheme to provide water to the aforesaid villages?

(c) If not, why?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත් වන ජනතාව උග්‍ර පානීය ජල හිඟයකින් පීඩා විඳින බව පිළිබඳ දැනුවත්ය.

(ii) මේ වන විට බිංගිරිය-හලාවත ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මත කරනු ලබන බව පිළිබඳ දැනුවත්ය.

(ආ) (i) ඔව්.

දැනට ක්‍රියාත්මක වන හලාවත-බිංගිරිය ජල යෝජනා ක්‍රමය මඟින් ප්‍රධාන නළ මාර්ගය දෙපස

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

බොහෝ ප්‍රදේශ ආවරණය කර ඇති අතර ජලය ඉල්ලා ඇති, පයිප්ප නොමැති මීටර් 500ට අඩු දුර ප්‍රමාණයක පදිංචිකරුවන් සඳහා ජලසම්පාදන මණ්ඩලයේ ප්‍රතිපාදන මඟින් ජල නළ දීර්ඝ කිරීම් සිදු කර ජලය ලබා දීම මේ වන විට ඉටු කරමින් පවතී.

(ii) අනෙකුත් ප්‍රදේශ ආවරණය කිරීම සඳහා ඇමුණුමෙහි සඳහන් පරිදි ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

ගරු මන්ත්‍රීතුමනි, මා එම ඇමුණුම ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්. එම ඇමුණුමේ තිබෙනවා, කුමන යෝජනා ක්‍රමය අනුවද අනෙකුත් ප්‍රදේශවල ජල සම්පාදනය සිදු වන්නේ කියලා.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| **Water Supply Project** | | | |
|---|---|---|---|
| **Bingiriya Divisional Secretary's Division** | | | |
| **No** | **Grama Niladhari Division** | **GND No.** | **Covered Project** |
| 01 | Madulupitiya | 1428 | Bingiriya - Udubaddawa IWSP (Phase II) |
| 02 | Konkadawala | 1429 | |
| 03 | Hamannapahuwa | 1430 | |
| 04 | Kurundupotha | 1431 | |
| 05 | Kelegedara | 1432 | |
| 06 | Thorabichchiya | 1433 | |
| 07 | Tharana | 1434 | |
| 08 | Udawela | 1435 | |
| 09 | Padiwela | 1436 | |
| 10 | Meladeniya | 1437 | |
| 11 | Kudaklawa | 1438 | Chilaw Stage II |
| 12 | Nithalawa | 1439 | |
| 13 | Hendiyapura | 1440 | |
| 14 | Karandanayagama | 1441 | |
| 15 | Kosgama | 1442 | Chilaw Stage III |
| 16 | Manelembuwa | 1443 | |
| 17 | Bandarigalgoda | 1444 | |
| 18 | Weerapokuna | 1445 | |
| 19 | Pahala Thalampola | 1446 | |
| 20 | Puwakgahakadawala | 1447 | |
| 21 | Ihala Konkandawala | 1448 | |
| 22 | Pahala Kiniyama | 1449 | |
| 23 | Kiniyama East | 1450 | |
| 24 | Kiniyama West | 1451 | |
| 25 | Pahala Galwewa | 1452 | |
| 26 | Ihala Galwewa | 1453 | |
| 27 | Koshenagara | 1454 | |
| 28 | Molaeliya | 1455 | |
| 29 | Getulawa | 1456 | |
| 30 | Brahmanayagama | 1457 | Chilaw Stage II |
| 31 | Urapotta | 1458 | Chilaw Stage III |
| 32 | Bingiriya | 1459 | ADB 5th (Chilaw) Project |
| 33 | Murukandiya | 1460 | |
| 34 | Mukalanhena | 1461 | |
| 35 | Maunawa | 1462 | Chilaw Stage II |
| 36 | Bowaththa | 1463 | ADB 5th (Chilaw) Project |
| 37 | Panawewa | 1464 | |
| 38 | Pahala Koswaththa | 1465 | Chilaw Stage II |
| 39 | Ihala Koswaththa | 1466 | Bingiriya-Udubaddawa IWSP - Phase II |
| 40 | Wandurassa | 1467 | Chilaw Stage II |
| 41 | Wellarawa | 1468 | Bingiriya-Udubaddawa IWSP - Phase II |
| 42 | Bakmeeruppa | 1469 | |
| 43 | Horagasagara | 1473 | |
| 44 | Pahala Mandakondana | 1474 | |
| 45 | Hiruwalpola | 1475 | |
| 46 | Ihala Kalugama | 1476 | |
| 47 | Kaduruwewa | 1477 | |
| 48 | Vilattawa pahala | 1478 | ADB 5th (Chilaw) Project |
| 49 | Aluthgama | 1479 | Bingiriya-Udubaddawa IWSP - Phase II |
| 50 | Ihala Kadigamuwa | 1480 | |
| 51 | Heenpannawa | 1481 | |
| 52 | Pahala Kadigamuwa | 1482 | |

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා.

විශේෂයෙන්ම බිංගිරිය, උඩුබද්දාව ප්‍රදේශය කියන්නේ ඉතා දැඩි පානීය ජල හිඟයක් තිබෙන ප්‍රදේශයක්. ගරු අමාත්‍යතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමා ප්‍රකාශ කළා, එම ජල යෝජනා ක්‍රමයෙන් මීටර් 500ක පමණ දුර ප්‍රමාණයකට ජල සම්පාදන මණ්ඩලය යටතේ ජලය ලබා දෙනවා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ජල සම්පාදන මණ්ඩලයේ වියදමින්.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

නමුත්, මේ වන විට වැල්අරාව, කදුරුගහවත්ත, මූකලන්හේන, බෝවත්ත ආදී ප්‍රදේශ ගණනාවකට ජලය ලබා ගැනීම සඳහා ඉල්ලීම් විශාල ප්‍රමාණයක් සිදු කර තිබෙනවා, ගරු අමාත්‍යතුමනි.

ඒකට ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රතිපාදන අවශ්‍ය නැහැ. ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රතිපාදන නැතිව, අපේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන යටතේ හෝ එහෙම නැත්නම් ඒ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රතිපාදනවලින් ඒ ඉල්ලීම් ඉටු කරන්න. නමුත්, ප්‍රශ්නය වන්නේ මේ අවට ප්‍රදේශ ගණනාවකටම ජලය ලබා ගැනීමට ඉල්ලීම් කර තිබුණත් තවම ඒවාට ප්‍රතිචාර දක්වා නැති එක. ඒ නිසායි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. උදාහරණයක් හැටියට ගත්තොත්, බිංගිරිය ආසන්නයේම තිබෙනවා බෝවත්ත ප්‍රදේශය. මේ ප්‍රදේශවල ජනතාව දීර්ඝ කාලයක සිට පානීය ජලය ලබා ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔබතුමාගේ නායකත්වයෙන් ඒකට ක්‍රමවේදයක් සකස් කර දෙන්න කියන ඉල්ලීම කරනවා. ඒ සඳහා කටයුතු කරන්න පුළුවන් නේද, ගරු ඇමතිතුමනි?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බෝවත්ත අදාළ වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මොකක්ද?

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු අමාත්‍යතුමනි, බෝවත්ත කියන්නේ බිංගිරිය ආසන්නයේ තිබෙන ඊළඟ ප්‍රධාන නගර සීමාව.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බිංගිරිය-උඩුබද්දාව ජල යෝජනා ක්‍රමය යටතට බෝවත්ත ඇතුළත් වෙනවා. ඒ වාගේම වැල්අරාව ඇතුළත් වෙනවා, බිංගිරිය-උඩුබද්දාව දෙවැනි අදියරට.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මේ ගැන අවධානය යොමු කර මේ ප්‍රශ්න ටික කඩිනමින් විසඳා දෙන්න කියා මා නැවතත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අමාත්‍යතුමනි. විශේෂයෙන් ජල බිල්පත්වල විනිවිදභාවය පිළිබඳ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන සමාජ කතිකාවක් තිබෙනවා. මේ බිල් ගෙවපුවාම ඊළඟ මාසයේ එන බිල්පත්වල ඒ ගෙවීම සම්බන්ධ තොරතුරු ඇතුළත් වෙලා නැහැ. අපි දන්නවා, අද තාක්ෂණයේ දියුණුවත් එක්ක බැංකු ගනුදෙනුවක් කළොත්, ඒ ගනුදෙනුව සිදුවන වෙලාවේම ඒ ගනුදෙනුව සිදු වුණා කියලා අපේ ජංගම දුරකථනයට ඒ පිළිබඳ පණිවුඩයක් ලැබෙන බව.

ඒ වාගේ, ජල සම්පාදන මණ්ඩලයටත් පාරිභෝගිකයෙක් මුදල් බැන්දාට පසු, ඒ මුදල් බැඳීම සම්බන්ධව සහ හිඟ මුදල් සම්බන්ධව නිවැරදි ක්‍රමවේදයක් ඔස්සේ ජංගම දුරකථනය මඟින් ක්ෂණිකව දැනුවත් කිරීමේ යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න අමාත්‍යාංශය හැටියට මැදිහත් වීමක් කරන්න පුළුවන් ද කියන කාරණය මම අහනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමා කියන කාරණය මම පිළිගන්නවා. බිල්පත් ගෙවීමේදී එම ගෙවීම් වහාම නිවේදනය කිරීමේ ක්‍රමයක් සකස් කරන්න අපි සූදානම් බව මම පිළිතුරු වශයෙන් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1176/2022- (1), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මම හිතන විධියට මේ ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ වැරදි අමාත්‍යාංශයකට. ඒ නිසා එය නිවැරදි කර, මෙම ප්‍රශ්නය වැවිලි අමාත්‍යාංශයට යොමු කළා නම් හොඳයි කියලා මම හිතනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ලංකා විදුලිබල මණ්ඩලය සතු සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර: විස්තර
## இலங்கை மின்சார சபைக்கு உரித்தான சூரிய சக்தி மற்றும் காற்றாலை மின்னுற்பத்தி நிலையங்கள்: விபரம்
SOLAR POWER AND WIND POWER PLANTS OWNED BY CEYLON ELECTRICITY BOARD: DETAILS

1190/2022

**7. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සතු සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ ධාරිතාව;

(ii) මේ වනවිට ඉදිකරමින් පවතින සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ ධාරිතාව;

(iii) ඉදිරියේදී ඉදිකිරීමට යෝජිත සූර්ය බල හා සුළං බල විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ ධාරිතාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபைக்கு உரித்தான சூரிய சக்தி மற்றும் காற்றாலை மின்னுற்பத்தி நிலை யங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் கொள்ளளவு;

(ii) தற்போது நிர்மாணிக்கப்பட்டு வருகின்ற சூரிய சக்தி மற்றும் காற்றாலை மின்னுற்பத்தி நிலை யங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் கொள்ளளவு;

(iii) எதிர்காலத்தில் நிர்மாணிக்க உத்தேசித்துள்ள சூரிய சக்தி மற்றும் காற்றாலை மின்னுற்பத்தி

நிலையங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் கொள்ளளவு;

தனித்தனியே யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power:

(a) Will he inform this House, separately -

(i) the number of solar power and wind power power plants owned by the Ceylon Electricity Board and the capacity of those power plants;

(ii) the number of solar power and wind power power plants that are being constructed at present and their capacity; and

(iii) the number of solar power and wind power power plants proposed to be constructed in future and their capacity?

(b) If not, why?

**ගරු දුමින්ද දිසානායක මහතා (සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - சூரிய சக்தி, காற்று மற்றும் நீர் மின்னுற்பத்திக் கருத்திட்ட இராஜாங்க அமைச்சர்)
(The Hon. Duminda Dissanayake -State Minister of Solar Power, Wind and Hydro Power Generation Projects Development)

ගරු කථානායකතුමනි, විදුලිබල අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සූර්ය බල විදුලි බලාගාර කිසිවක් නොමැත.

සුළං බල විදුලි බලාගාර 01කි. එහි ධාරිතාව මෙගාවොට් 103කි.

(ii) සූර්ය බල විදුලි බලාගාර 77කි. (බිම සවිකර ඇති) ඒවායේ ධාරිතාව මෙගාවොට් 237කි.

සුළං බල විදුලි බලාගාර 05කි. ඒවායේ ධාරිතාව මෙගාවොට් 35කි.

(iii) සියඹලාණ්ඩුව, මන්නාරම සහ පුනරීන් යන ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති උද්‍යාන ස්ථාපනය කිරීම ඇතුළත්ව, 2022 වසරේ සිට 2030 දක්වා වන ඉදිරි වසර 08ක කාලය තුළ පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 9,000කට වඩා වැඩි ප්‍රමාණයක් (සූර්ය බලය: මෙගාවොට් 5,000, සුළං බලය: මෙගාවොට් 3,500 හා අනෙකුත් ප්‍රභව: මෙගාවොට් 500 පමණ) ජාතික පද්ධතියට එකතු කර ගැනීමට සැලසුම් කර ඇත.

ඒ සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන්ගෙන් යෝජනා කැඳවන ලද අතර, ඊට ප්‍රතිචාර වශයෙන් යෝජනා 500කට අධික ප්‍රමාණයක් ලැබී ඇත.

(ආ) පැන නඟින්නේ නැත.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මේ දිනවල විදුලිය විසන්ධි කරනවා බව ඔබතුමා දන්නවා. කනගාටුවට කාරණය, ඔබතුමාගේ දකුණු පළාතේ වැඩිපුර විදුලිය විසන්ධි කරන එක. අපේ රටේ මෙගාවොට් 4,000කට වැඩි විදුලිබල පද්ධතියක් තිබෙනවා. ඒකෙන් සියයට 52ක් පමණ thermal oilවලින් ක්‍රියාත්මක වෙනවා. සියයට 22ක් පමණ ගල් අඟුරුවලින් ක්‍රියාත්මක වෙනවා. සියයට 30ක් ඉන්ධනවලින් ක්‍රියාත්මක වෙනවා. සියයට 42.9ක් hydropower සහ සියයට 4ක විතර ප්‍රමාණයක් renewable energyවලින් එකතු කරනවා. අපි දන්නා කාරණය හැටියට, අද වෙන කොට විදුලිය විසන්ධි කිරීමට හේතුවෙලා තිබෙන්නේ, විදුලි බලාගාරවල යම් අඩු පාඩුවක් නිසා නොවෙයි.

සාමාන්‍යයෙන් විදුලි ඉල්ලුම වාර්ෂිකව සියයට 6කින් පමණ වැඩි වෙනවා. නමුත් 2020 වර්ෂයේදී සහ 2021 වර්ෂයේදී විදුලි ඉල්ලුම වැඩි වීම ඉතාම අවම වුණා. මා හිතන හැටියට එයට හේතුව, රටේ තිබුණු කොවිඩ් වසංගතය. 2020 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය වන විට රටේ විදුලි අවශ්‍යතාව බරපතළ විධියට වැඩිවෙලා නැහැ. අද විදුලිය කපන්න හේතුවෙලා තිබෙන්නේ, අපේ රටේ තිබෙන thermal විදුලි බලාගාරවලට සහ ඉන්ධනවලින් ක්‍රියාත්මක වන විදුලි බලාගාරවලට කලට වේලාවට ඉන්ධන ලබා දීමට නොහැකි වීමයි. ආණ්ඩුව හැම තිස්සේම අපට ඇඟිල්ල දිගු කරනවා, "බලාගාර හදලා නැහැ" කියලා. බලාගාර තිබෙනවා. විදුලිබල අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරයා වන ඔබතුමාගෙන් මා අහනවා, විදුලිය කප්පාදුවට අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා ඉදිරියේදී කඩිනම්ව ගන්නා විසඳුම මොකක්ද කියලා. මේ දවස්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වෙනවා. එසේ තිබියදීත් විදුලිය කපනවා. ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම අහනවා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු කථානායකතුමනි, එතුමාගේ මුල් ප්‍රශ්නයට මේ අතුරු ප්‍රශ්නය අදාළ වන්නේ නැහැ. එම නිසා ඔබතුමා විදුලිය කප්පාදුව සහ ඉන්ධන පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවොත් එයට උත්තර දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න නේ මා අහන්නේ. අතුරු ප්‍රශ්න අහනකොට අමාත්‍යාංශයට අදාළ ඕනෑම කාරණයක් ගැන අහන්න පුළුවන්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගිය වතාවේදීත් මේ ප්‍රශ්නය මේ විධියටම මඟ හැරියා. මා දන්නවා, මෙයට කර ගහන්න ඕනෑ ඔබතුමා නොවෙයි, ඔබතුමාගේ ඇමතිවරයා වන ගාමිණී ලොකුගේ මහත්මයා බව. එතුමා මේ දිනවල පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. එතුමා හැංගිලා ඉන්නේ. එතුමා ඇඳ යට ඉන්නේ; කළුවරේ ඉන්නේ. ඔබතුමා මේ ප්‍රශ්නය මඟ හරින්න එපා. ඔබතුමා මේ ප්‍රශ්නය ගාමිණී ලොකුගේ ඇමතිතුමාගේ කරේ හෝ ගහන්න.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු මන්ත්‍රීතුමා, අහන ප්‍රධාන ප්‍රශ්නයට අදාළවයි අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්කම තිබෙන්නේ. විදුලිය කප්පාදුව සම්බන්ධව, ඉන්ධන සම්බන්ධව ඔබතුමා වෙනම ප්‍රශ්නයක් ඇහුවොත් අපට එයට පිළිතුරක් දෙන්න පුළුවන්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, කළුවරේ ඉන්න එක කාටත් අදාළයි. ඒක අදාළ නැහැයි කියන්න බැහැ. ඔබතුමාටත් කළුවරේ ඉන්න බැහැ, මටත් කළුවරේ ඉන්න බැහැ, රටේ ජනතාවටත් කළුවරේ ඉන්න බැහැ. අපේ ගාමිණී ලොකුගේ ඇමතිතුමාට විතරයි කළුවරේ ඉන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ තිබෙනවා වාගේ රටේ මිනිසුන්ට generators නැහැ නේ.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, අපේ ජල විදුලි බලාගාර පද්ධතියට අදාළ විශාල ජලාශ පද්ධතියක් තිබෙන බව. විශේෂයෙන්ම මහවැලි ජලාශ පද්ධතියට අදාළව කොත්මලේ ජලාශය, රන්ටැඹේ ජලාශය, රන්දෙනිගල ජලාශය හා වික්ටෝරියා ජලාශය තිබෙනවා. ජලය කළමනාකරණය කිරීමේදී ප්‍රමුඛතාවන් තිබෙනවා.

ජලය කළමනාකරණයේදී පළමු ප්‍රමුඛතාව දෙන්නේ පානීය ජලයට. දෙවැනි ප්‍රමුඛතාව දෙන්නේ කෘෂිකර්මයට. තුන්වැනි ප්‍රමුඛතාව දෙන්නේ ජල විදුලි බලයට. නමුත්, අද මේ ප්‍රමුඛතා පැත්තකට දමා තිබෙනවා. මහවැලි ගඟ ආශ්‍රිත ජල මූලාශ්‍ර පද්ධතියේ තිබෙන ජලය කළමනාකරණය කිරීමේදී මහ කන්නයට, යල කන්නයට සහ අපේ වැව් පද්ධතිය ඇතුළු වාරි පද්ධතියට අවශ්‍ය ජලයට ප්‍රමුඛතාව දීලා තමයි විදුලිය නිෂ්පාදනය කිරීමට ජලය යොදා ගන්නේ. මට මතකයි, මීට මාස හතරකට, පහකට කලින් වික්ටෝරියා ජලාශය, රන්දෙනිගල ජලාශය සහ කොත්මලේ ජලාශය වැනි ජලාශ වාන් දැම්මා. ඒ කියන්නේ, එම ජලාශවල ධාරිතාව සියයට සියයක් උපරිම තත්ත්වයට ආවා. නමුත්, අද ආණ්ඩුවට දැවි තෙල් ඇතුළු ඉන්ධන ගේන්න ඩොලර් නැති නිසා වික්ටෝරියා ජලාශය ඇතුළු මහා පරිමාණ ජලාශ පද්ධතිය අවභාවිත කරනවා. ඔබතුමන්ලා කෘෂිකර්මයට ප්‍රමුඛතාව දෙන්නේ නැතිව තමන්ට තිබෙන ඩොලර් හිඟය නිසා ජල විදුලි බලාගාර පද්ධතිය උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක කරනවා, අපේ ජලාශ ටික හිස් කරමින්. ඒ නිසා තමයි අද වික්ටෝරියා, රන්දෙනිගල, කොත්මලේ, සමනල වැව ආදී ජලාශ ටික හිස් වෙමින් තිබෙන්නේ. මේ විධියට ප්‍රමුඛතාවකින් තොරව ජලාශ පරිහරණය කිරීම නිසා ඉදිරියේදී අපේ යල කන්නයට අවශ්‍ය වතුර ටික නැතිවෙලා කෘෂි කර්මාන්තය කර ගෙන යන්න බැරිවනවා. මේ ආණ්ඩුව අපේ කෘෂි කර්මාන්තය දැනටත් වළ පල්ලට දමලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කෘෂි කර්මාන්තයට කරලා තිබෙන දේ පෙනෙනවා නේ. ගරු කථානායකතුමනි, ඒ ජලාශ පද්ධතිය අවභාවිත කිරීම නිසා අපට ඊළඟ කන්නයට අවශ්‍ය ජලය නැති වෙනවා. මේ කන්නයේත් පොහොර ටික නැති වෙලා අපේ ගොවියා විනාශ වුණා. ඒ අනුව, කෘෂි කර්මාන්තයම විනාශ වෙලා ගියා. ලබන කන්නයේත් ජලාශවල වතුර නැතිව, වැව් ටිකට වතුර දෙන්න බැරිව වාරි පද්ධතිය කඩා වැටිලා අපේ කෘෂි කාර්මික කටයුතු අඩාළ වෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒකට ඔබතුමා ලබාදෙන විසඳුම මොකක්ද? මේ ප්‍රශ්නයත් අදාළ නැහැයි කියන්න එපා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා එතුමාට ඕනෑ දේශපාලන කථාව කර ගත්තා. නමුත් ආණ්ඩු කරපු, හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විධියට එතුමාත් දන්නවා, අපට ජල විදුලි බලාගාරවල අයිතිය තිබුණාට ජලාශවලින් ජලය නිකුත් කිරීමේ අයිතිය සම්පූර්ණයෙන්ම තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බව. අපි කොච්චර ඉල්ලුවත්, ඒ අය මොනම හේතුවක් නිසාවත් කෘෂිකර්මයට අවශ්‍ය ප්‍රමාණය, පානීය ජලයට අවශ්‍ය ප්‍රමාණය තියාගෙන තමයි අපට ජලය නිකුත් කරන්නේ. මෙතුමා කියන විධියට අපට ජලය පාවිච්චි කරන්න පුළුවන්කම ලැබුණා නම්, මේ දවස් ටිකේත් අපට විදුලිය කපන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා කෘෂි කර්මාන්තයට හානියක් වන විධියට ජල විදුලි බලාගාර සඳහා ජලය නිකුත් කිරීමක් හෝ එමඟින් විදුලිය නිෂ්පාදනය කිරීමක් හෝ අපි කිසිදු විටක සිදු කර නැහැයි කියන එක මේ අවස්ථාවේදී මම ඉතාම පැහැදිලිව මතක් කරනවා.

## ශ්‍රී ලංකාවේ භාවිත කරන ගෘහස්ථ ගෑස් සිලින්ඩර: විස්තර

### இலங்கையில் பாவனையிலுள்ள சமையல் எரிவாயு 'சிலிண்டர்': விபரம்

### DOMESTIC GAS CYLINDERS USED IN SRI LA1NKA : DETAILS

1309/2022

**8. ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ගෑස් පරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 හා 2021 වර්ෂවල ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක පැවති මිල සහ සිලින්ඩරයේ ධාරිතාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක අඩංගු එල්.පී.ගෑස්වල තිබිය යුතු බවට පිළිගත් සංයුතිය කවරේද;

(ii) එම සංයුතිය තීරණය කරනු ලබන ආයතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක අඩංගු එල්.පී. ගෑස්වල ප්‍රමිතිය තීරණය කරනු ලබන ආයතනය කවරේද;

(ii) ඒ අනුව, නිසි ප්‍රමිතියකින් යුක්ත බවට පරීක්ෂා කර බලා තහවුරු කරනු ලබන ආයතනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள சமையல் எரிவாயு பாவனையாளர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) 2020 மற்றும் 2021ஆம் ஆண்டுகளில் காணப்பட்ட சமையல் எரிவாயு 'சிலிண்டர்' ஒன்றின் விலை மற்றும் அதன் கொள்ளளவு என்பன ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சமையல் எரிவாயு சிலிண்டரில் உள்ளடங்கியுள்ள எல்.பீ. எரிவாயுவில் காணப்பட வேண்டுமென ஏற்றுக்கொள்ளப்பட்ட சேர்மானம் யாதென்பதையும்;

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

(ii) மேற்படி சேர்மானத்தை தீர்மானிக்கும் நிறுவனம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) சமையல் எரிவாயு சிலிண்டரில் உள்ளடங்கியுள்ள எல்.பீ. எரிவாயுவின் தரத்தை தீர்மானிக்கும் நிறுவனம் யாதென்பதையும்;

(ii) அதற்கமைவாக, உரிய தரத்தைக் கொண்டுள்ளது என்பதைச் சோதனை செய்து உறுதிப்படுத்தும் நிறுவனம் யாதென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Trade:

(a) Will he inform this House-

(i) the number of domestic gas consumers in Sri Lanka; and

(ii) separately, the price and the capacity of a domestic gas cylinder in year 2020 and 2021, according to each year?

(b) Will he also inform this House-

(i) the standard L.P.G. composition of a gas cylinder; and

(ii) the institution that determines the aforesaid composition?

(c) Will he further inform this House-

(i) the institution that declare the standard of the LP Gas content in a domestic gas cylinder; and

(ii) accordingly, the institution that test and verify the standard of the LP Gas cylinder?

(d) If not, why?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ගෑස් පාරිභෝගිකයන් සංඛ්‍යාව පිළිබඳ සංගණනයක් සිදු කර නොමැත. නමුත්, දළ වශයෙන් ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ගෑස් පාරිභෝගිකයන් ලක්ෂ 39ක් පමණ වන බවට ගණන් බලා ඇත.

(ii) 2020.01.01 සිට 2020.12.31 දක්වා ගෘහස්ථ ගෑස් සිලින්ඩර මිල සහ ධාරිතාව අනුව:

(ලිට්රෝ ගෑස් හා ලාෆ් ගෑස්)

| ධාරිතාව | කි. ග්‍රෑම් 12.5 | කි. ග්‍රෑම් 5.0 | කි. ග්‍රෑම් 2.3 |
|---|---|---|---|
| මිල | රු. 1,493.00 | රු. 598.00 | රු. 289.00 |

2020.01.01 සිට 2020.12.31 දක්වා ගෘහස්ථ ගෑස් සිලින්ඩර මිල සහ ධාරිතාව අනුව:

ලිට්රෝ ගෑස්

| දිනය | ගෑස් ධාරිතාව / මිල | | |
|---|---|---|---|
| | කි. ග්‍රෑම් 12.5 | කි. ග්‍රෑම් 5.0 | කි. ග්‍රෑම් 2.3 |
| 2021.01.01 දින සිට 2021.10.10 දක්වා | රු. 1,493.00 | රු. 598.00 | රු. 289.00 |
| 2021.10.11 දින සිට 2021.12.31 දක්වා | රු. 2,675.00 | රු. 1,071.00 | රු. 506.00 |

ලාෆ් ගෑස්

| දිනය | ගෑස් ධාරිතාව / මිල | | |
|---|---|---|---|
| | කි. ග්‍රෑම් 12.5 | කි. ග්‍රෑම් 5.0 | කි. ග්‍රෑම් 2.3 |
| 2021.01.01 දින සිට 2021.08.11 දක්වා | රු. 1,493.00 | රු. 598.00 | නැත |
| 2021.08.12 දින සිට 2021.10.10 දක්වා | රු. 1,856.00 | රු. 743.00 | නැත |
| 2021.10.11 දින සිට 2021.12.31 දක්වා | රු. 2,840.00 | රු. 1,136.00 | නැත |

(ආ) (i) ශ්‍රී ලංකා ප්‍රමිති 712 අනුව එල්.පී. ගෑස් සංයුතිය 2021.12.16 දිනට පෙර ඇමුණුම I ලෙසද, 2021.12.16 දිනෙන් පසු ඇමුණුම II ලෙසින්ද ඉංග්‍රීසි භාෂාවෙන් දක්වා ඇත.

ඇමුණුම් I, II **සභාගත*** කරමි.

(ii) 2021.12.16 දිනට පෙර ගෑස් සැපයුම්කරු

2021.12.16 දින සිට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

(ඇ) (i) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

(ii) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

(ඈ) අදාළ නොවේ.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඇමතිතුමනි, පාරිභෝගිකයන් මුදල් ගෙවලා නේ ගෑස් සිලින්ඩර ලබා ගන්නේ. මුදල් ගෙවා ලබා ගන්නා නිසා ඒ සිලින්ඩර අයිති වෙන්නේ පාරිභෝගිකයාට. නමුත්, අවසානයේදී පාරිභෝගිකයාට බල කරනවා අදාළ සමාගමෙන්ම ගෑස් ගන්න කියලා. සිලින්ඩරය අයිති මට නම්, මට හැකියාවක් තිබෙන්න ඕනෑ ලාෆ් එකෙන් හෝ ලිට්රෝ එකෙන් ගෑස් ලබා ගන්න. අපි පසුගිය කාලයේ දැක්කා නේ, එක සමාගමක් ගෑස් ආනයනය නවැත්තුවාම විශාල අර්බුදයක් ඇති වුණු හැටි. ඒක නිසා පාරිභෝගිකයන්ට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා. මුදල් ගෙවලා සිලින්ඩරයක් ලබාගෙන තිබෙනවා නම්, ඒ සිලින්ඩරය ගත්ත කෙනාට තමන් කැමැති සමාගමකින්,-සමාගම්වල ප්‍රශ්නය අපට විසඳන්න බැහැ. නමුත්, පාරිභෝගිකයාගේ ප්‍රශ්නය ඊට වඩා ලොකුයි. - ගෑස් මිලදී ගැනීමට තිබෙන නීතිමය බාධාව මොකක්ද? ඒක ඔබතුමාට විසඳන්න පුළුවන්ද?

ඒ ගමන්ම මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ කාරණයත් දැනගන්න කැමැතියි. පසුගිය කාලයේ ගෑස් පිපිරීම් විශාල ප්‍රමාණයක් වාර්තා වුණා. ඒවාට වන්දි ලබා දෙන්නම් කියලාත් ප්‍රකාශ කළා. ඒ වන්දි ලබා දීම ක්‍රියාත්මක කරනවාද? ඒ වාගේම, ඒ පරීක්ෂණ වාර්තා අනුව ඒ පිපිරීම් සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන තිබෙනවාද කියලාත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, පාරිභෝගිකයා මුදල් ගෙවලා ගෑස් සිලින්ඩරයක අයිතිය ලබා ගන්නා බව ඇත්ත. මීට පෙර එක් සමාගමකින් ලබා ගන්නා ගෑස් සිලින්ඩරයට අනෙක් සමාගමෙන් ගෑස් පිරවීම පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා, ඒ සම්බන්ධව අධිකරණය නඩු තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඊට අමතරව, ලබා දෙන ගෑස්වල ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න නිසා තමයි සිලින්ඩරවලට වෙනම වර්ණ පවා යොදා තිබෙන්නේ. එක් සමාගමක සිලින්ඩරයකට අනෙක් සමාගමෙන් ගෑස් ලබා දුන්නාට පස්සේ පිපිරීමක් වැනි දෙයක් සිද්ධ වුණොත්, එහි වගකීම පිළිබඳව ප්‍රායෝගික ප්‍රශ්නයක් මතු වෙනවා. පසුගිය දා ඇති වුණු සිද්ධීන්වලදී ලාෆ් සමාගමේ ගෑස් පිපිරීම් සහ ලිට්රෝ සමාගමේ ගෑස් පිපිරීම් ලෙස වර්ගීකරණයක් කරන්න පුළුවන්කම ලැබුණේ එවැනි බෙදීමක් තිබෙන නිසා. ඒක පාරිභෝගිකයාගේ ආරක්ෂාවටත් යම්කිසි ආකාරයක රුකුලක් වෙනවා.

මේ වන විට ලිට්රෝ සමාගම අදාළ අයට වන්දි ලබා දීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ කටයුත්ත කඩිනමින් නිම කරනවා කියලා අපට දැනුවත් කරලා තිබෙනවා. උත්සව තියලා ඒ අයට වන්දි ලබා දීමක් සිදු වෙන්නේ නැහැ. පොලිස් බල ප්‍රදේශ අනුව ඒ නිවෙස්වලට ගිහින් චෙක්පත ලබා දීම තමයි සිදු කරන්නේ. ඒ අනුව අදාළ වන්දි ලබා දීමේ කටයුත්ත සිදු කරමින් පවතිනවා.

ඒ සම්බන්ධයෙන් සොයා බලන්න අතිගරු ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ වාර්තාව ජනාධිපතිතුමාට ලබා දීමෙන් අනතුරුව, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය හා ප්‍රමිති ආයතනය ගෑස්වල ප්‍රමිතිය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන ඒ ක්‍රියාවලිය සිදු කරනවා.

පසුගිය කාලසීමාව තුළදී ගෑස් සම්බන්ධයෙන් පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය විධියට සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විධියට අපි ඒ වගකීම භාරගෙන කටයුතු කළේ අපේ රටේ ගෑස් පිළිබඳව ප්‍රමිතියක් සහ නියාමනයක් තිබුණේ නැති නිසායි. පාරිභෝගිකයා ආරක්ෂා කිරීම වෙනුවෙන් තමයි අපි ඉදිරිපත් වෙලා ඒ වගකීම භාර ගත්තේ. ඒ නිසා දැන් මේ වන විට නීති සකස් වෙලා, ගැසට් පත්‍ර පළ කරලා, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයත් එක්ව ගෑස් සිලින්ඩර රටට ඇතුළු වනකොට සම්පූර්ණයෙන් ඒවා නියාමන කරලා, පරීක්ෂණ කරනවා. ඒ වාගේම ගෑස් සිලින්ඩර, regulators, ගෑස් සහ සියලු උපාංග පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදු කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. දැන් ඒ සම්පූර්ණ වගකීම පැවරෙන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගෑස් සිලින්ඩර එක තැනකින් පුරවලා ඒවා බෙදා හැරලා නැවත ඒ හිස් සිලින්ඩර පුරවන තැනට ගෙනෙන්න ඕනෑ. මෙහිදී ප්‍රවාහනය සඳහා වැය වන ගාස්තු සහ මාර්ගයේදී ඇති වන තත්ත්ව සියල්ල සැලකිල්ලට ගනිමින් අපට වැඩ පිළිවෙළක් හදන්න බැරිද ගරු ඇමතිතුමනි? රට පුරා සිටින පාරිභෝගිකයන්ට ගෑස් ලබා ගන්නා අවස්ථාවේම ඒ සිලින්ඩරය පුරවා ගැනීමට පුළුවන් විධියේ ක්‍රමවේදයක් හදන්න බැරිද? ලාෆ් සමාගමේ මෙහෙයුම් කටයුතු හම්බන්තොට වරාය තුළින් සිදු කරනවා. අපට ආරංචියක් ආවා, ලිට්රෝ සමාගමට අයත් හම්බන්තොට තිබෙන මෙහෙයුම් පර්යන්තයත් කොළඹට ගෙනෙන්න හදනවා කියලා. මුළු දිවයින පුරාම පාරිභෝගිකයන්ට ඒ ඒ ප්‍රදේශවලින්ම ගෑස් පුරවාගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න බැරිද? එහෙම කළොත් හිස් සිලින්ඩර් එහා මෙහා ගෙන යන එක, ගෑස් ප්‍රවාහනයට වන විශාල වියදම සහ මාර්ගවල සිදුවන අවහිරතා මඟ හරවා ගන්න අපට පහසු වෙයි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

මම හිතන විධියට ලෝකයේ දියුණු රටවල ගෑස් නළ මඟින් තමයි නිවාසවලට ලබා දීමේ කටයුත්ත කරනු ලබන්නේ. නමුත්, අපි රටක් විධියට එවැනි දියුණු තත්ත්වයකට තවම පත් වෙලා නැහැ. ඒ නිසා ලෝකයේ දියුණු රටවල වාගේ, ඔබතුමා කියනවා වාගේ නිවාසවලට නළ මඟින් ගෑස් ලබාදීමේ කටයුත්ත ක්‍රියාත්මක කළොත් හොඳයි. දැන් කොළඹ නගරයේ අලුතින් ඉදිවන නිවාස යෝජනා ක්‍රමවල මා හිතන විධියට මේ තාක්ෂණය භාවිත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -1467/2022- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වන රක්ෂිත: විස්තර
பொலன்னறுவை மாவட்ட வன ஒதுக்கங்கள்: விபரம்
FOREST RESERVES IN POLONNARUWA DISTRICT: DETAILS

1727/2022

**10. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති වන රක්ෂිතවල නම් කවරේද;

(ii) එම වන රක්ෂිතවලට අයත්වන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම වන රක්ෂිත තුළ පරිසරයට හානිකර විවිධ අයථා කටයුතු සිදු කරනු ලබන බව පරිසර සංවිධාන විසින් පෙන්වා දී තිබෙන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனப்பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்தில் அமைந்துள்ள வன ஒதுக்குப் பிரதேசங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி வன ஒதுக்குப் பிரதேசங்களுக்குரிய மொத்த நிலப்பரப்பு யாதென்பதையும்;

(iii) மேற்படி வன ஒதுக்குப் பிரதேசங்களில் சுற்றாடலை மாசாக்கும் முறையற்ற பல்வேறு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதாக சூழல் அமைப்புக்கள் சுட்டிக்காட்டியுள்ளன என்பதை அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Conservation:

(a) Will he inform this House -

(i) the names of forest reserves situated within Polonnaruwa District;

(ii) the total extent of land belonging to those forest reserves; and

(iii) whether he is aware that the environmental organizations have pointed out various irregular acts that are harmful to the environment are committed within these forest reserves?

(b) If not, why?

**ගරු සී.බී. රත්නායක මහතා (වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Wildlife and Forest Conservation)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i), (ii)

Reserve Forests List in Polonnaruwa District

| DISTRICT | NAME | AREA (Ha) | GAZETTE NO | GAZETTED DATE |
|---|---|---|---|---|
| POLONNARUWA | MORAGASWEWA F.R. | 699.11 | 1589/9 | 17.02.2009 |
| POLONNARUWA | WEERALANDA F.R. | 604.02 | 1589/9 | 17.02.2009 |
| POLONNARUWA | GALOYA F.R. | 14,038.29 | 1589/9 | 17.02.2009 |
| POLONNARUWA | GIRITHALE F.R. | 350.20 | 1572/10 | 21.10.2008 |
| POLONNARUWA | RALAPANAWA F.R. | 2,002.41 | 1583/22 | 09.01.2009 |
| POLONNARUWA | ULPATHWEWA-KALE F.R. | 124.32 | 1583/22 | 09.01.2009 |
| POLONNARUWA | KELAGAMA F.R. | 5,424.00 | 1759/1 | 21.05.2012 |
| POLONNARUWA | BORAWEWA F.R. | 983.00 | 1759/1 | 21.05.2012 |
| POLONNARUWA | RATMALE F.R. | 1,110.00 | 1759/1 | 21.05.2012 |
| POLONNARUWA | UNAGOLLEWA F.R. | 662.83 | 1589/9 | 17.02.2009 |
| POLONNARUWA | PALUDENIYA F.R. | 68.11 | 1731/12 | 08.11.2011 |
| POLONNARUWA | WEHERAGAL GALELIYA F.R. | 26.07 | 1731/12 | 08.11.2011 |
| POLONNARUWA | ELAHERA F.R. | 9,360.00 | 1834/13 | 28.10.2013 |
| POLONNARUWA | PALLIYA GODELLA F.R. | 2,014.83 | 1850/32 | 19.02.2014 |
| POLONNARUWA | PIMBURATHTHEWA F.R. | 14.04 | | |
| POLONNARUWA | MADURUOYA F.R. | 398.08 | | |
| POLONNARUWA | BUDURUWAYAYA F.R. | 164.74 | | |
| **TOTAL EXTENT** | | **38,044.04** | | |

Conservation Forests List in Polonnaruwa District

| DISTRICT | NAME | AREA (Ha) | GAZETTE NO | GAZETTED DATE |
|---|---|---|---|---|
| POLONNARUWA | HURULU OYA C.F. | 18,268.56 | 1767/3 | 16/07/2012 |
| POLONNARUWA | ANAWULANDAWA C.F. | 4,757.80 | 1572/10 | 21.10.2008 |
| POLONNARUWA | MUWANPALASSAKALE C.F. | 5.17 | 1566/36 | 12.09.2008 |
| POLONNARUWA | ULPATHWEWA C.F. | 124.32 | 1583/22 | 09.01.2009 |
| **TOTAL EXTENT** | | **23,155.84** | | |

(iii) පරිසර සංවිධාන මඟින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වනාන්තර තුළ සිදු වන යම් පරිසර හානි සම්බන්ධව පෙන්වා දී ඇති අතර, ඒ සම්බන්ධව අවශ්‍ය නීතිමය පියවර ගෙන ඇත.

ඒ අනුව, 2022.02.10 දින සිංහගම, අලුත්ඔය පරිසරය සුරැකීමේ සංවිධානය විසින් බුරුත ගස් කපා වංගෙඩි සාදා විකුණනු ලබන ජාවාරමක් පිළිබඳව ලැබුණු පැමිණිල්ලක් අනුව, වන අපරාධ අංක 05/2022 යටතේ චෝදනා ගොනු කර 84949 දරන නඩු අංකය යටතේ හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබ ඇත.

2021 වර්ෂයේ ගල් ඔය රක්ෂිතයේ තිඹිරිගස්වැව කොටසේ පුද්ගලයන් පස් දෙනෙකු විසින් හෙක්ටෙයාර 0.5ක භූමි කොටසක් එළි කිරීම සම්බන්ධයෙන් වන අපරාධ අංක 23/2021, 24/2021, 25/2021, 26/2021, 27/2021 යටතේ චෝදනා ගොනු කර නඩු අංක 81785, 81786, 81787, 81788, 81789 යටතේ හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබ ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බඳනාගල ගම්මානයේ අලිමංකඩක් තිබෙනවා. මේ වනවිට බඳනාගල සිට මාදුරු ඔය ජාතික වනෝද්‍යානයට යන මාර්ගයේ බඳනාගල ගමේ විශාල භූමි ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ නිසා අලි ගම් වදින ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මොකද, අලි ගමන් කරන මාර්ගය තමයි ශුද්ධ කරකර පෞද්ගලික ආයතනවලට ලබා දීලා තිබෙන්නේ. අක්කර දෙක, තුන නොවෙයි, අක්කර 250, අක්කර 500 වාගේ ලබා දීලා තිබෙනවා. පමණක් තැන්වල වැව් ආශ්‍රිත ඉඩම් පවා වෙන් කර දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ගියොත් බලන්න පුළුවන්, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇල්ලේ වැව කියන වැව ආශ්‍රිත ඉඩම් අක්කර 50, 50 වෙන් කර දීලා තිබෙනවා මේ වෙනකොට. මේ හේතුව නිසා දැන් විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ගම්වලට අලි එන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මී ගස්, කුඹුක් ගස්, බෙහෙත් ඖෂධවලට ගන්නා ගස් පවා මේ වෙනකොට විනාශ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව ඔබතුමාගේ අමාත්‍යාංශය මොනවා හෝ පියවරක් අරගෙන තිබෙනවාද?

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon.C.B. Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ඒ කටයුතු අධ්‍යයනය කරමින් පවතිනවා. මහවැලි කලාප ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශයට තමයි එම භූමි ප්‍රමාණය අයිති වෙන්නේ. ඒ භූමිය වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට අයති නැහැ. නමුත් ඒවායේ වගා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දීමට මහවැලි කලාප භාර අධ්‍යක්ෂ ජනරාල් විසින් අවස්ථාව ලබා දීලා තිබෙනවා. එහිදී වන අලින්ගෙන් වන හානි අවම කිරීමට අවශ්‍ය පසුබිම සකස් කළ යුතුයි කියන කාරණය අපි ඔවුන්ට දන්වා තිබෙනවා. ඒ අනුව, අලි වැට ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පහසුකම් සලසා දීමට එකඟතාව පළ කර තිබෙනවා. ඔබතුමා කියන කාරණය සත්‍යයක් හැටියට මම දකිනවා.

කෙසේ නමුත්, ඊයේ සංවර්ධන කමිටුවේත් කථා කර තිබෙනවා, මී ගවයන්, කිරි ගවයන් තෘණ භූමිවලට ඇතුළු කිරීමට අවසර ලබා දෙන්නේ නැහැ කියන කාරණය. පසුගිය කාලවලදී ඒ භූමිවලට අනවශ්‍ය විධියට සතුන් ඇතුළු කිරීම නිසා, අලින්ට සහ ඒ සතුන්ට භක්ක පටස් දමා තිබුණා. ඒ වාගේම දර කැපීමේ මුවාවෙන් කැළය ඇතුළට ගිහිල්ලා රක්ෂිතයේ තිබෙන ගස් ටික කපා ගෙන එනවා. ඒ කටයුතු කරන උදවිය අල්ලාගැනීම සඳහා අපි කටයුතු කරගෙන යනවා. අපි ඒවාට යම් යම් තහංචි ටිකක් දමා තිබුණා. නමුත් අපි කිසිසේත්ම උලාගෙන කෑමට තිබෙන තෘණ භූමිවලට ගවයන් ඇතුළු කිරීම තහනම් කරලා නැහැ. විශේෂයෙන්ම ඒ සතුන්ට කන්දකාඩුව කියන ප්‍රදේශය තුළ අක්කර දෙදහස් ගණනක භූමි ප්‍රමාණයක් තෘණ භූමි හැටියට වෙන්කර තිබෙනවා. නමුත් ඒ ගොවීන් ඒ තැන්වලට යන්න කැමති වෙලා නැහැ. මෙන්න මේ වාගේ හේතු නිසා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගැටලු මතු වෙලා තිබෙනවා. අපි තෘණ භූමි සඳහා සුදුසු භූමි හඳුනා ගෙන ඒ අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා.

ඔබතුමා කියන, මහවැලි කලාපය තුළ පැන නඟින ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න වන ජීවී දෙපාර්තමේන්තුව සූදානමින් සිටිනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මාදුරුඔය ජාතික වනෝද්‍යානයේ මී ගවයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ජාතික වනෝද්‍යානයක් ඇතුළට තමයි මේ හරක් ගෙනැවිත් දමලා තිබෙන්නේ. අද මෙන්න මේක තමයි විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. මේ, පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවීන්ට අයිති හරක් නොවෙයි. ඒ හරකුන්ගේ අයිතිකරුවන් ඉන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමයේ. මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න වෙනවා. මොකද, දැන් මේ නිසා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන නිසා. එතැන අලින්ට ඉන්න ඉඩක් නැහැ, හරක් 2,000ක්, 3,000ක් විතර ඉන්න නිසා. ගම්වාසීන් දිගින් දිගටම මේ ප්‍රශ්නය වන ජීවී නිලධාරීන්ට මතු කර තිබෙනවා.

ගරු ඇමතිතුමනි, සෝමාවතිය රක්ෂිතය ආශ්‍රිතව සිටින කිරි ගොවීන්ගේ හරකුන් සෝමාවතිය රක්ෂිතයට ඇතුළු වෙනවා, වෙන යන්න තැනක් නැති නිසා. ඔබතුමා කිව්වා, කන්දකාඩුව කියන ප්‍රදේශයේ තණ බිම් ඒ ගොවීන්ට ලබා දෙනවා කියලා. හැබැයි, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉන්න කිරි ගොවීන්ගේ හරක් එහාට ගෙනියන්න බැහැ. මොකද, කිලෝමීටර 50ක් විතර දුර ගෙනියන්න ඕනෑ නිසා. ඒ නිසා මම හිතන විධියට සෝමාවතිය රක්ෂිතයට ඇතුළු වෙන කිරි හරක් අයිති ගොවීන් ඒ වනයට හානි කරනවාද, වන සතුන් ඝාතනය කරනවාද කියලා බලන්න වන ජීවී නිලධාරීන් සම්බන්ධ කරගෙන ඒ ප්‍රදේශයේ බීට්වු කාර්යාල දෙක තුනක් දමන්න පුළුවන්. එහෙම කළොත් ඇත්තටම මේ ප්‍රශ්නය විසඳෙයි.

ගරු ඇමතිතුමනි, 2011 වසරේ අලි ඇතුන් 5,879ක් සිටි බවට ගණනය කරලා තිබෙනවා. ඉන් අවුරුදු 10කට පසුව අලි ඇතුන් කොපමණ සංඛ්‍යාවක් ඉන්නවාද කියන එක ගණනය කරලා නැහැ. ගම්වලට ගියාම ඔබතුමාටත් පෙනෙනවා ඇති මේ අලි-මිනිස් ගැටුම කියන එක දිගින් දිගටම ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක් බව. මේකෙන් අලිත් මැරෙනවා, මිනිස්සුත් මැරෙනවා. ගරු ඇමතිතුමනි, අස්වැන්න ගත්තාම ගෙවල්වල වී ටික තියාගෙන ඉන්නවා. අලින් පුරුදු වෙලා තිබෙනවා, ගෙවල් කඩලා

[ගරු කිංස් නෙල්සන් මහතා]

වී ටික බොන්න. වී බොනවා කියලා තමයි කියන්නේ. ඒ වාගේ විනාශ කරනවා. මට මතකයි, වත්මන් අගමැතිතුමා මුදල් ඇමතිතුමා විධියට අය වැය කථාව කරනකොට කිව්වා, "වී ගබඩා කරන්න කන්ටේනර් ලබා දෙනවා" කියලා. මම හිතන්නේ ඒක ඉතාම හොඳ වැඩසටහනක්. ඒක ක්‍රියාත්මක කළොත් හොඳයි. එතකොට මේ ප්‍රශ්නය අවම කර ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මම ඉස්සෙල්ලාත් කිව්වා, අලින් යන මාර්ග -අලිමංකඩ- තමයි මේ වෙනකොට සුද්ද කරලා ගොවීන්ට ලබා දෙන්නේ කියලා. මේ අය ගොවියොත් නොවෙයි. කොහෙන් ආපු අයද කියලා නම් මම දන්නේ නැහැ. මේ ගැන අමාත්‍යාංශය පැත්තෙන් විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න, ගරු ඇමතිතුමනි. මාදුරු ඔය ජාතික වනෝද්‍යානයට වෙලා තිබෙන අපරාධය පිළිබඳවත් යම් ක්‍රියාමාර්ගයක් ගන්න මැදිහත් වෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon.C.B. Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා පළමුවෙන්ම මී ගවයින් පිළිබඳව ප්‍රශ්නයක් මතු කළා. ඒ පිළිබඳව කථා කරද්දී, අපි ඒ ප්‍රදේශ හඳුනාගෙන, සෝමාවතිය රක්ෂිතය සඳහා භූමියක් හඳුනාගෙන ඒ අවශ්‍යතාව ඉෂ්ට කරන්න සූදානම් කරනවා. එතුමා අහපු දෙවැනි ප්‍රශ්නයට උත්තරය මේකයි. මේ මී ගවයන්ගෙන් විශාල සංඛ්‍යාවක් පොළොන්නරුවේ ඉන්න සත්තු නොවෙයි. ඒ සතුන් පොළොන්නරුවට ගෙනැත් දමනවා. ඒ සතුන් කන්දකාඩුව වැනි ප්‍රදේශවලට ගෙනැත් දමන්න කියලා කියන්න තමයි අපි දැන් සූදානම් වෙන්නේ.

මම විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. මොන දෙපාර්තමේන්තුවකට, මොන ආයතනයකට අයිති වුණත් අලිමංකඩ තිබෙන ප්‍රදේශය මොනම හේතුවක් නිසාවත් ලබා දීම සුදුසු නැහැ. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වනජීවී දෙපාර්තමේන්තුව විසින් ගන්න සූදානම් වෙනවා.

පසුගිය කාල වකවානුවේදී අපි අලි සංගණනය පවත්වන්න සූදානම් වුණා. කෝකටත් තෛලය හැටියට මම මේ කොවිඩ්-19 ගැන කථා කරනවා නොවෙයි. නමුත්. නිලධාරින් හා පිරිස් බලය අඩු නිසා ඒක කරන්න බැරි වුණා. දැන් අපට අඩු ආදායම්ලාභීන් 5,000කගේ පිරිස් බලයක් සම්බන්ධ කර ගන්න පුළුවන් වුණා. එයින් සැළුමලත් කොටසක් අරගෙන, මේ පිළිබඳ විශේෂඥයන්ගේ දායකත්වයත් ලබාගෙන, ඒ වාගේම විශ්වවිද්‍යාල සිසුන්ගේ දායකත්වයත් ලබාගෙන මේ වර්ෂයේ මැද භාගයේ සිට අලි සංගණනය සඳහා යන්න අපි සූදානම් වෙනවා. අපට අලි ඇතුන් කොච්චර සංඛ්‍යාවක් ඉන්නවාද කියන කාරණය රටට හෙළි කරන්න, ඒක ක්‍රියාත්මක කරන්න අපි කටයුතු සූදානම් කරනවා. ඒ වාගේම මාදුරු ඔය රක්ෂිතයේ ඉතිහාසයේ සිටම සිද්ධ වුණු දේවල් තමයි තවමත් ඔය සිද්ධ වෙන්නේ. ඒ සඳහා දැඩි ක්‍රියාමාර්ග ගන්නත්, අණපනත් සංශෝධනය කරලා දැඩි නීති රීති ක්‍රියාත්මක කරන්නත් කටයුතු සූදානම් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මාධ්‍යවේදීන් හා සිවිල් ක්‍රියාකාරීන්ට එල්ල වන තර්ජන
### ஊடகவியலாளர்கள் மற்றும் சிவில் ஆர்வலர்களுக்கு விடுக்கப்படும் அச்சுறுத்தல்கள்
### THREATS AGAINST MEDIA PERSONNEL AND CIVIL ACTIVISTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතිකකොට ඇති මූලික අයිතිවාසිකමක් වෙනවා. රටක ජනතාවට නිවැරදි තොරතුරු ලබා දෙමින්, පාලකයන්ට නිසි මඟ පෙන්වන ජනමාධ්‍ය රටක සිව්වන ආණ්ඩුව වන්නේ ඒ නිසායි. විවිධ අවස්ථාවල විවිධ රජයන් යටතේ භාෂණයේ නිදහසටත්, මාධ්‍යවේදීන්ටත් තර්ජනයන් සිදුවූ බව හැමෝම දන්නා කාරණාවක්. කෙසේ වෙතත්, මෑත ඉතිහාසයේ භාෂණයේ නිදහසට හා මාධ්‍යවේදීන්ට බරපතළම තර්ජන එල්ල වූයේ පසුගිය 2005-2015 කුප්‍රකට ආණ්ඩු සමයේ ය. ඒ අනුව අපරාධකරුවෙක් නොමැතිව අතුරුදහන්වීම්වලට, පහරදීම්වලට සහ තර්ජනයන්ට ලක් වූ මාධ්‍යවේදීන් හා සිවිල් ක්‍රියාධරයන් බොහොමයක් සිටියි.

ලසන්ත වික්‍රමතුංග ඝාතනය, ධර්මරත්නම් සිවරාම් ඝාතනය, ප්‍රදීප් එක්නැලිගොඩ පැහැර ගැනීම, පෝද්දල ජයන්ත පැහැරගෙන ගොස් වධහිංසා කිරීම, මන්දනා ඉස්මයිල්ට තර්ජනය කිරීම, සුබ්‍රමනියම් රාමචන්ද්‍රන් අතුරුදහන් කිරීම, කීත් නොයාර් පැහැර ගැනීම, උපාලි තෙන්නකෝන්ට පහර දීම මෙන්ම සිරස, සියත මාධ්‍ය ජාලයන්ට සහ උදයන් පුවත්පත් ආයතනයට පැහැරදීම හා ගිනි තැබීම, විනාශ කිරීම යනාදිය ඒ අතරින් කිහිපයක් පමණයි.

ගරු කථානායකතුමනි, 2019දී නැවතත් බලයට පත් වූ මෙම අන් මත නොඉවසන හා විරුද්ධ මත මර්දනය කිරීම තම ඒකායන ප්‍රතිපත්තිය කොටගත් ආණ්ඩුව, මාධ්‍ය හා මාධ්‍යවේදීන් මර්දනයත්, මිනිසුන්ගේ භාෂණයේ නිදහස සීමා කිරීමත් වඩාත් සංවිධානාත්මකව සිදු කරන බව දැකිය හැකිය. එනම්,

- හඳුනා නොගත් කණ්ඩායම් හා අන්තවාදී කල්ලි විසින් මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනවලට තර්ජන හා පහරදීම් සිදු කිරීම
- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි නීතිමය හස්ත භාවිතයෙන් මාධ්‍යවේදීන් සහ සමාජ ක්‍රියාකාරීන් බිය වැද්දවීම
- ව්‍යවස්ථානුකූල නීති සංශෝධන මඟින් භාෂණයේ නිදහස සීමා කිරීම

ඉහත ආකාරයෙන් රජයේ නිල හා නොනිල හස්ත උපයෝගී කර ගනිමින් මාධ්‍යවේදීන්ටත්, භාෂණයේ නිදහසටත් සිදු කරන තර්ජනවල වැඩිවීමක් පසුගිය කාල සීමාවේදී දකින්නට

ලැබෙනවා. මෙය ආරම්භ වූයේ, ලේක් හවුස් මාධ්‍යවේදී මධූක තක්ෂල ප්‍රනාන්දුට සිදු කළ පහර දීමෙනි. ඉන්පසු රම්සි රාසික් නම් තරුණයා සමාජ මාධ්‍යවල අදහස් දැක්වීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම, මාධ්‍යවේදී චතුරංග අල්විස් අත්අඩංගුවට ගැනීම, එහනෆ් ජසීම් කවියා අත්අඩංගුවට ගැනීම, චිරන්ත අමරසිංහ, සුදත්ත තිලක්සිරි, ඊ නිවුස් මාධ්‍යවේදී කීර්ති රත්නායක, අසේල සම්පත්, ශෙහාන් මාලක සහ  මනෝරම වීරසිංහ වැනි සමාජ ක්‍රියාකාරීන් හඳුනාගත් හා නොගත් හේතුවලට රහස් පොලීසියට කැඳවීම. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු විසින් මාධ්‍යවේදී තරිඳු ජයවර්ධනට තර්ජනය කිරීම. මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට ප්‍රහාර එල්ල කිරීම ආදී බොහෝ සිද්ධි වාර්තා වුණා.

ගරුතර්ජනවලට ලක් වුණු ඒ මාධ්‍යවේදීන්ගේ  නාම ලේඛනයක් මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ මා මතක් කරන්න කැමැතියි, චමුදිත සමරවික්‍රම මහත්මයාගේ නිවසට එල්ල කළ ඒ ප්‍රහාරයට මුල් වුණු සැකකරුවන් තවමත් අත්අඩංගුවට අරගෙන නැති බව.  එතුමාට ආරක්ෂාව ලබා දෙන්න උසාවි නියෝගයක් ලබා දී තිබෙනවා. නමුත් ඒ උසාවි නියෝගයත් මේ වන විටත් ක්‍රියාත්මක කරලා නැහැ.

තමා  කථානායකතුමනි, එවන් අඩන්තේට්ටම්, හිරිහැර, මැර ප්‍රහාර, නොකළ වැරදිවලට අත්අඩංගුවට ගැනීමක් හෝ තර්ජනයක් සිදු වේ යැයි බියෙන් මේ වන විටත් මව් බිමෙන් බැහැර වී සිටින මාධ්‍යවේදීන් බොහෝය. මීට අමතරව උතුරු - නැඟෙනහිර ජනමාධ්‍යවේදීන්ට සමාජ මාධ්‍ය පරිශීලකයන්ට හා වෙබ් අඩවි ක්‍රියාකරුවන්ට බරපතළ තර්ජන ඇති බවට පැමිණිලි රාශියක් ලැබී ඇත.

වෘත්තීය සමිති හා සංගම් නායකයන්ගේ අදහස් විවිධ අයුරින් මර්දනයට ආණ්ඩුව කටයුතු කරමින් සිටිනවා. එමෙන්ම වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමේදී ඊට පූර්වයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන්  ආරක්ෂක නිෂ්කාසන වාර්තා කැඳවීමට ද ක්‍රියා කරන බව දකින්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙහි එක් උච්චතම අවස්ථාවක් වනුයේ, ජනමාධ්‍ය නිදහස හීන කරන අණපනත් ගෙන ඒමට කටයුතු කිරීමයි. දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර, එමඟින් ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය කටයුතුවලට දැඩි බාධා එල්ල විය හැකිය. වෙනත් රටවල දත්ත ආරක්ෂණ නීතිවල ජනමාධ්‍යවේදීන්ගේ නිදහසට බාධා නොවන බවට වූ වගන්තිය ඇතුළත් කර තිබුණ ද, මෙම පනතේ එසේ ඇතුළත් කර නැහැ. මෙම පනත මඟින් ස්වාධීන නොවූ ආයතනයක් දත්ත ආරක්ෂණ අධිකාරිය ලෙස පිහිටුවන අතර, රුපියල් කෝටියක් දක්වා දඩ නියම කිරීමේ බලය එම ආයතනයට  හිමි වෙනවා.

එමෙන්ම, තවදුරටත් සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා ද අණපනත් ගෙන ආ යුතු යැයි බරපතළ මතයක් රට තුළ ගොඩ නැඟීමට ආණ්ඩුවේ සමහර අමාත්‍යවරු විසින් කටයුතු කරමින් සිටිනවා. මේ සියල්ල සිදු වනුයේ හිටපු ජනමාධ්‍යවේදියෙකු මාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අවධියකයි.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1. ජනමාධ්‍ය නිදහස, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සෞභාග්‍යයේ දැක්මට අනුව තවදුරටත් සුරැකිය යුතු දෙයක් ලෙස රජය ප්‍රමුඛකොට සලකන්නේද?

2. පසුගිය කාල සීමාව තුළදී මෙවැනි සිදුවීම්වල වර්ධනයක් සිදුව ඇති බව රජය පිළි නොගන්නේ ද?

3. 2015ට පෙරත්, වර්තමානයේත් මාධ්‍යවේදීන්ට සහ සිවිල් ක්‍රියාකාරීන්ට එරෙහිව මර්දනය දියත් වී ඇති අතර, එය එසේ සිදු වන්නේ ආණ්ඩුව අන් මත නොඉවසන නිසාද? සියලු මාධ්‍යවේදීන් සහ සිවිල් ක්‍රියාකාරීන් ආණ්ඩුවේ මතයම නියෝජනය කළ යුතු යැයි ආණ්ඩුව සිතනවාද?

4. 2015ට පෙර සිදු වූ හා 2019 වන විටත් අවසන් නොවූ මාධ්‍යවේදීන්ට හා සමාජ ක්‍රියාධරයන්ට එරෙහිව සිදු වූ අපරාධ සම්බන්ධයෙන් වන පරීක්ෂණ තවදුරටත් සිදු කරන්නේද?

5. මෑතකාලීනව නැවතත් වර්ධනය වන මාධ්‍යවේදීන් හා සිවිල් ක්‍රියාකරුවන්ගේ භාෂණයේ නිදහස සීමා කිරීම, බලපෑම් කිරීම හා ප්‍රහාර සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති සාධනීය පියවර කවරේද?

6. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත හා සැලසුම් කරමින් තිබෙන සමාජ මාධ්‍ය පාලන පනත් කෙටුම්පත් වැනි නීතිමය රාමු තුළ කොටු කරමින් ජනමාධ්‍යවේදීන් සහ සිවිල් ක්‍රියාකරුවන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සීමා කිරීම ජනමාධ්‍ය අමාත්‍යවරයෙකු ලෙස නුසුදුසු යැයි ඔබතුමා පිළිගන්නේද? එසේ නම්, එවැනි පනත් සඳහා නිර්දේශ ඉදිරිපත් කළේ මන්ද?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යතුමා අද පැමිණ නැති නිසා පොලීසිය පැත්තෙන් යම් පැහැදිලි කිරීමක් කරන්න මට අවසර දෙන්න.

මේ සම්බන්ධයෙන් ලැබෙන සියලු පැමිණිලි ගැන පොලීසිය ඉතා හොඳින් විමර්ශනය කරනවා. ඒ පැමිණිලි බරපතළ නම්, ඒවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ කොළඹ අපරාධ විමර්ශන ඒකකය මඟින් විමර්ශනය කරනවා. විමර්ශනය කර ඒ පිළිබඳ සියලු දත්ත, සියලු කරුණු අධිකරණයට ඉදිරිපත් කරනවා. ඊට පසුව අධිකරණය විසින් තමයි ඉදිරි කටයුතු කරන්නේ.

එතුමා දැන් චමුදිත කියන මාධ්‍යවේදියාගේ ප්‍රශ්නය ගැන කිව්වා. ඔහුගේ නිවසට ගල් ප්‍රහාර සහ අසූචි ප්‍රහාර එල්ල කර තිබෙනවා. ඔහුට ශාරීරික හිංසා සිදු කර නැහැ. මේ සම්බන්ධයෙන් එතුමා කියූ පරිදි පිළියන්දල ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ ඉල්ලීමකට අනුව, එමඟින් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව කටයුතු කරන ලෙසට පොලිස්පතිතුමාට උපදෙස් දීලා තිබෙනවා. ඒ නියෝගය පොලිස්පතිතුමා වෙත ලැබීමෙන් පසුව අදාළ පනත අනුව කටයුතු කරන්න උපදෙස් පතා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත යොමු කරලා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

තිබෙනවා. ඒ උපදෙස් ලැබෙනකල් එම නිවාස සංකීර්ණයට ඇතුළු වන තැන පොලිස් නිලධාරින් යොදවා සෑහෙන ආරක්ෂාවක් සපයා තිබෙනවා.

ගරු කථානායකතුමනි, චමුදිත කියන මාධ්‍යවේදියාගේ ගෙදර ගේට්ටුවේ බොහෝ කලක සිට පොලීසියේ පොතක් දමලා තිබෙනවා. මෙම සිද්ධිය සිදුවූ දින රාත්‍රියේත් 12.45ට පොලිස් නිලධාරින් ගිහිල්ලා විමර්ශනය කරලා පොලීසියේ ඒ පොත අත්සන් කරලා තිබෙනවා. ඒ සිද්ධිය වෙලා තිබෙන්නේ 2.00ට. ඒ වාගේම තවත් ජංගම මුර සංචාරවලින් ඔහුගේ නිවස අවට ප්‍රදේශය ආවරණය කරනවා. ඒ වාගේම රාජ්‍ය බුද්ධි සේවය මඟින් අපි වාර්තාවක් කැඳවා තිබෙනවා, ඔහුගේ ජීවිතයට තර්ජනයක් තිබෙනවාද කියලා බලන්න.

මේ සිද්ධිය සිදු වුණු හැටියේම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් ඔහුගේ නිවසට ගියා. ඊට පසුව SOCO විශේෂඥ කණ්ඩායමක් ගියා. ඒ වාගේම සුනඛයින් දැම්මා, ඉව අල්ලන්න. CCTV කැමරා 92ක් විශ්ලේෂණය කරනවා. අපැහැදිලි ඒවා පැහැදිලි කර ගන්න වාගේම සමහර වාහනවල තිබෙන අංක තහඩු පරීක්ෂා කර බලන්න අපි මොරටුව විශ්වවිද්‍යාලයට යවා තිබෙනවා.

ඒ වාගේම දුරකථන කුලුනු හරහා දැනටමත් දුරකථන විශාල සංඛ්‍යාවක් විශ්ලේෂණය කරගෙන යනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන කෙනෙකුට හිරු මාධ්‍ය ආයතනය විසින් රුපියල් ලක්ෂ 5ක ත්‍යාගයක් පිරිනමන බව කියා තිබෙනවා. හිරු මාධ්‍යයට ඒ තොරතුරු ලැබීමෙන් පසු ඒවා පොලීසියට දුන්නොත් ඒවා පිළිබඳවත් විමර්ශනය කරන්න පුළුවන්.

ගරු විපක්ෂ නායකතුමා කිව්වා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ රජයේ නිල සහ නිල නොලත් හස්ත උපයෝගි කරගෙන මාධ්‍යවේදීන්ට තර්ජනය කරනවා කියලා. අපි ඒක පිළිගන්නේ නැහැ. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. ජිනීවා මානව හිමිකම් සැසි වාරය ඉලක්ක කරගෙන කරපු දුෂ්ට ප්‍රකාශයක් හැටියටයි අපි ඒ ප්‍රකාශය දකින්නේ. ඒ පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා. අපේ රටේ හමුදාව යුද අපරාධ කළේ නැහැයි කියලා Sir Desmond de Silva, Prof. Sir Geoffrey Nice, Prof. Michael Crane, Prof. Michael Newton, Major General John Holmes, Rodney Dixon කියන යුද විශේෂඥයෝ හයදෙනාම කියා තිබියදී, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ තමයි ජිනීවාවලට ගිහිල්ලා 30/1 යෝජනාවට සම අනුග්‍රාහකත්වය දීලා යුද අපරාධ කළාය කියා පිළිගත්තේ, ගරු විපක්ෂ නායකතුමනි. ඉතින් මේ වාගේ කාලයක මේ කරන චෝදනා එම සැසිවාරය ඉලක්ක කරගෙන කරනවා කියායි අපි හිතන්නේ. එම නිසා මීට පසුවවත් රට පාවාදෙන ආකාරයේ ප්‍රකාශ කරන්න එපා කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පොලීසිය පැත්තෙන් වන කාරණාවලටයි මම මේ පැහැදිලි කිරීම කළේ. ඔබතුමා අසා තිබෙන අනෙක් ප්‍රශ්නවලට ජනමාධ්‍ය අමාත්‍යවරයා උත්තර ලබා දෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා නඟපු ප්‍රශ්නයට ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් මේ සතියේ ඉදිරි දිනකදී පිළිතුරු ලබා දෙනවා ඇති. පොලීසිය විෂයය භාර අමාත්‍යවරයා හැටියටයි ගරු සරත් වීරසේකර මැතිතුමා ඒ පැහැදිලි කිරීම කළේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම මෙය විවාදයක් කර ගන්න යන්නේ නැහැ. නමුත්, ගරු ආචාර්ය සරත් වීරසේකර අමාත්‍යතුමාට මම යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මගේ ක්‍රියාකලාපය තුළ මමවත්, සමඟි ජන බලවේගයවත් කිසිම දවසක මොනම ජාත්‍යන්තර සභාවකදීවත් රට පාවා දෙන්න කටයුතු කරලා නැහැ. එම නිසා කරුණාකර චමුදිත සමරවික්‍රම මැතිතුමා ප්‍රමුඛ ජනමාධ්‍ය ක්ෂේත්‍රයට එල්ල වන ප්‍රහාර මේ විධියට ඉතා පටු ආකාරයේ අර්ථ කථනයකට ලක් කරන්න එපාය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කරුණු කාරණා ගණනාවක් කිව්වා. ඒවා සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අවශ්‍යයි. චමුදිත මහත්මයාට පූර්ණ ලෙස ආරක්ෂාව ලබා දෙන්න කියපු උසාවි නියෝගය ක්‍රියාත්මක නොකරන්නේ ඇයි? දැන් ඔබතුමා කිව්වා, හරියටම රාත්‍රී 12.45ට පොත අත්සන් කළාට පස්සේ තමයි එම ප්‍රහාරය එල්ල වෙලා තිබෙන්නේ කියලා. එතකොට, පොත අත්සන් කරන වේලාවත් පිළිබඳවත් ප්‍රහාරය එල්ල කරපු කණ්ඩායම හොඳින් අවබෝධ කරගෙන ඉන්න ඇති. මේ කාරණා පිළිබඳව සමාජයේ ලොකු කුතුහලයක්, ලොකු කථා බහක් නිර්මාණය වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරකම් තුළ තමයි අද රජය ප්‍රමුඛව මාධ්‍ය මර්දනයක් ක්‍රියාත්මක වනවාය කියන කාරණය පෙනී යන්නේ. එම වැඩ පිළිවෙළට වග කියන්න ඕනෑ විපක්ෂයේ අපි නොවෙයි, ඔබතුමන්ලායි. මේ රටේ මාධ්‍ය නිදහස තිබෙනවා කියා ඔබතුමන්ලා ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වන්න ඕනෑ. එහෙම නැතිව මේ අවස්ථාවේ අපි ජිනීවා මුල් කරගෙන ප්‍රකාශ නිකුත් කරනවාය කියන ඒ බොළඳ ප්‍රකාශය, ඒ පහත් ප්‍රකාශය සිදු කිරීම බොහොම වැරැදියි. ඒක ඉතාම නින්දිත, තුච්ඡ ප්‍රකාශයක් හැටියටයි මම දකින්නේ. මොකද, අපි ජාත්‍යන්තරයත් එක්ක සාකච්ඡා කරනකොට කිසිම දවසක, මොනම ආකාරයකින්වත් රට පාවාදෙන විධියට කථා කරලා නැහැ. ඒක හොඳට මතක තියාගන්න. අපි කිසිම දවසක එහෙම කරලා නැහැ. එම නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ ප්‍රශ්නයෙන් පැනලා යන්නේ නැතුව චමුදිත සමරවික්‍රම මහත්මයාට ලබා දිය යුතු ආරක්ෂාව ලබා දෙන්න කියලා. ඔබතුමා දන්නවා නේ, මම මේ ප්‍රශ්නය අහපු නිසා නේ කලබලේට ඊයේ රෑ ඉඳලා ඒ නිවාස සංකීර්ණයට පොලිස් ආරක්ෂාව ලබා දුන්නේ. මේ ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා මම චමුදිත මහත්මයා එක්ක කථා කළා. කථා කරලා තමයි මම මේ ප්‍රශ්නය ඇහුවේ. මම ඒක එළිපිටම කියනවා. උසාවි නියෝගය ක්‍රියාත්මක වුණාද, ආරක්ෂාව ලැබුණාද කියලා මම එතුමාගෙන් ඇහුවා. මේ ප්‍රශ්නය අහපු නිසා කලබලයෙන් මීට පැය කිහිපයකට පෙර එම නිවාස සංකීර්ණයට ආරක්ෂාව ලබා දුන්නා කියා මට දැනගන්න ලැබුණා.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ නම සඳහන් වුණු නිසා මම තව කාරණයක් මතක් කරන්න කැමැතියි. ප්‍රවෘත්ති සාකච්ඡාවකදී එතුමා කියා තිබෙනවා, මේ ප්‍රහාරයට රජය සම්බන්ධ නැහැ කියලා. හැබැයි, මේ ප්‍රහාරය එල්ල කරපු කණ්ඩායම අත්අඩංගුවට ගන්න අපොහොසත් වුණොත් රජය මේකට සම්බන්ධයි කියා එතුමාත් නිගමනයකට එන බව කියා තිබෙනවා.

ඔබතුමා ඒකත් හොඳට හිතේ තියා ගන්න. ඒ නිසා කරුණාකර ප්‍රශ්නයක් ඇහුවාම එම ප්‍රශ්නය නිකම් බොරුවට ජිනීවාවලට නතු කරන්න යන්න එපා. අපි ජිනීවාවලට රට පාවා දෙන දේශ

ද්‍රෝහීන් නොවෙයි. පෙනෙනවා නේ, දේශ ප්‍රේමී ආණ්ඩුවේ තරම? තමුන්නාන්සේලාට රට රැක ගන්න ඩොලර් ටික නැහැ; තෙල් ටික නැහැ; අඩු ගණනේ A/L විභාගය පවත්වන සමයේ විදුලිය සපයා ගන්නත් බැරි ආණ්ඩුවක්, මේක. වැඩ බැරි, අදක්ෂ ආණ්ඩුවක්. හැම දෙයකින්ම බේරෙන්න "ජීනීවා, ජීනීවා" කියන මන්තරය කියන්න යන්න එපා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු කථානායකතුමනි, ඔය හැම එකකටම උත්තර දෙන්න ගියොත් මේක විවාදයක් වනවා. නමුත් මම එක කාරණයක් කිව යුතුයි. උසාවි නියෝගය දීලා තිබෙන්නේ සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය ප්‍රකාරව කටයුතු කරන්න කියායි. ඒ අධිකාරියට අපි යවලා තිබෙනවා. ඔවුන්ගේ උපදෙස් එනතුරු තමයි අපි මේ කටයුතු ටික කරන්නේ.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයත් කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

අපේ ක්‍රීඩා ඇමතිතුමාට තමයි මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ. ක්‍රිකට් ක්‍රීඩක භානුක රාජපක්ෂ මහත්මයාට සිදු වී තිබෙන අසාධාරණයක් සම්බන්ධයෙන් මම මේ කියන්නේ. අපිට දැනගන්න තිබෙන ආකාරයට, එතුමා ඉන්දීය සංචාරයටත් එකතු කර ගන්න කටයුතු කර නැහැ. අපි දන්නවා, ජාත්‍යන්තර වශයෙන් විස්සයි විස්ස තරග සඳහා තිබෙන ප්‍රධාන තරගාවලිය, ඉන්දියාවේ IPL ක්‍රිකට් තරගාවලිය බව. එම තරගාවලියට සුදුස්සෙක් වෙන්න පුළුවන්කම තිබෙනවා නම්, ඔහුට ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩා කරන්න අවස්ථාව නැත්තේ ඇයි කියන එකයි අපට තිබෙන ගැටලුව, ගරු කථානායකතුමනි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரும் அபிவிருத்தி ஒருங்கிணைப்பு மேற்பார்வை அமைச்சரும் டிஜிட்டல் தொழில்நுட்பம் மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports, Minister of Development Coordination and Monitoring and State Minister of Digital Technology and Enterprise Development)

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා, රාජපක්ෂ කෙනෙකු වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳව. ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් තේරීම් කමිටුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ක්‍රිකට් කමිටුවක් පත් කර තිබෙනවා, administrationවලට. ඒ වාගේම මහේල ජයවර්ධන මහත්මයා Consultant Coach විධියට පත් කරලා තිබෙනවා. තේරීම් කමිටුවලට ඇඟිලි ගැසීම් කරලා, ක්‍රිකට් පාලක මණ්ඩලයට ඕනෑ විධියට සහ තව වෙනත් හේතු මත කණ්ඩායම් තෝරාගත්ත නිසා තමයි පසුගිය කාලය තුළ අපේ ක්‍රිකට් ක්‍රීඩාව වැටුණේ.

ගරු මන්ත්‍රීතුමනි, භානුක රාජපක්ෂ කියන්නේ දක්ෂ, හොඳ අනාගතයක් තිබෙන ක්‍රීඩකයෙක්. ඒ වාගේම ඔහු අපේ රට නියෝජනය කළ යුතු ක්‍රීඩකයෙක් කියලා අපි විශ්වාස කරනවා. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටුව සහ පුහුණුකරුවන්ගේ නිර්දේශ මත තමයි මෙවර ඉන්දීය සංචාරයට කණ්ඩායම තෝරාගෙන තිබෙන්නේ. ඒ අනුව ඔවුන් භානුක රාජපක්ෂ තෝරා නොගැනීමට හේතු මොනවාද කියා ඔහුව දැනුවත් කර තිබෙනවා. අමාත්‍යවරයා විධියට ඒ සම්බන්ධයෙන් මාවත් දැනුවත් කළා. ක්‍රීඩකයෙකුගේ පෞද්ගලික කාරණා පිළිබඳව මාධ්‍යය තුළ කථා නොකළ යුතුයි කියා මම හිතනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා එම හේතු පිළිබඳව මම මේ අවස්ථාවේදී කථා කරන්නේ නැහැ. හැබැයි, මේක ඔහුගේ ක්‍රිකට් ජීවිතයේ අවසානය නොවෙයි. ඔහුට ඕනෑ තරම් වයස තිබෙනවා; හැකියාව තිබෙනවා; දක්ෂතාව තිබෙනවා. මම විශ්වාස කරනවා, ඔහු නැවත ක්‍රිකට්වලට හොඳ comeback එකක් වෙයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට තවත් කාරණයක් අහන්න තිබෙනවා. පෙබරවාරි මාසයේ 08 වැනිදා -දැනට සති දෙකකට පමණ පෙර- මම ඉතා වැදගත් ප්‍රශ්නයක් ඇහුවා, මුදල් ඇමතිතුමාගෙන්. මේ වන තෙක් ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දී නැහැ. මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හෙට ඒ සම්බන්ධයෙන් විවාදයක් තිබෙනවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ විවාදය පිළිබඳව නොවෙයි මම කියන්නේ. මම ස්ථාවර නියෝග 27(2) යටතේ බොහොම පැහැදිලි ප්‍රශ්නයක් එදා ඉදිරිපත් කළා. නමුත්, ඒ ප්‍රශ්නයට තවම පිළිතුරක් ලබා දීලා නැහැ. ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා නොදෙන්නේ ඇයි කියා මම දැනගන්න කැමතියි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, අපි මේ සතියේ එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා. විපක්ෂ නායකතුමාට ඕනෑ දේවල් එතුමාට ඇහෙනවා. හැබැයි එතුමාට වැදගත්කමක් නැති දේවල් ඇහෙන්නේ නැහැ.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### අධිභාර බද්ද පනත් කෙටුම්පත
### மிகைக் கட்டண வரி சட்டமூலம்
### SURCHARGE TAX BILL

"අධිභාර බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

*පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.*

***2022 මාර්තු 08වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி அமைச்சர் சார்பாக மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2022 மார்ச் 08, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Dinesh Gunawardena on behalf of the Minister of Finance; to be read a Second time upon Tuesday, 08th March, 2022 and to be printed and to be referred to the Committee on Public Finance.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

අධිභාර බද්ද පනත් කෙටුම්පත දැන් ගරු සභානායකතුමා ඉදිරිපත් කළා. සේවක අර්ථසාධක අරමුදලින්,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් විවාදයක් තිබෙනවා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි. සේවක අර්ථසාධක අරමුදලින් සියයට 25ක tax එකක් අය කිරීම ඉවත් කර ගන්නවා කියලා ආණ්ඩුව කිව්වා. නමුත් මේ පනත් කෙටුම්පතෙන් ඒක ඉවත් කරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව විවාදයේදී කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක අද පනත් කෙටුම්පතින් ඉවත් කරන්න තිබුණා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඉතා පැහැදිලිව මුදල් ඇමතිතුමා ප්‍රකාශයක් කළා, ඒක අන්තර්ගත වන්නේ නැහැ කියලා. අපි ඒ වගකීම ඉෂ්ට කරන රජයක්. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය යළි නඟන්නේ මොකටද? පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම, කාරක සභා අවස්ථාවේදී වෙනස්කම් රාශියක් සිදු වන බව ඔබතුමා දන්නවා. ඒක නොදන්න නවකයෙකු හැටියට ඔබතුමා හැසිරීම ගැන මම කනගාටු වනවා. *[බාධා කිරීමක්]* මොකද නැත්තේ?

දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයත් ප්‍රකාශ කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඒ ගැන හෙට විවාදයේදී සාකච්ඡා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් ඒ ගැන අහලා හරියන්නේ නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඒ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ තිබෙනවා සියයට 25ක් කපනවා කියලා. සියයට 25 කපන්නේ නැහැ කියලා ඒකේ සඳහන් වෙලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හෙට පැවැත්වෙන විවාදයේදී සාකච්ඡාවට ගන්න.

දිනට නියමිත කටයුතු. න්‍යාය පත්‍රයේ යෝජනා අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමා.

## නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත: නියෝග
### விளைபொருட் தரகர்களுக்கு உரிமமளித்தற் சட்டம்: ஒழுங்குவிதிகள்
### LICENSING OF PRODUCE BROKERS ACT : REGULATIONS

[අ.භා. 12.02]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்ட அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනතේ 9 වගන්තිය සමඟ කියවිය යුතු 2(4),(6) වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 අප්‍රේල් 08 දිනැති අංක 2222/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ අද දිනට නියමිත කටයුතුවලට අදාළ විෂය අංක 2 දරන යෝජනාව ද මා ඉදිරිපත් කරනවා.

මෙම යෝජනා සම්බන්ධයෙන් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සහ රබර් කර්මාන්තයට අදාළ වන නියෝග තමයි අද මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම 2021 වසර ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තයට යම් පමණක අභියෝගාත්මක වසරක් වුණා. හරිත කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සමඟ අවසන් කාර්තුවේදී යම් පමණක රසායනික පොහොර හිඟයක් මේ රටේ ඇතිවීමත් සමඟයි ඒ තත්ත්වය ඇති වුණේ. ගරු කථානායකතුමනි, නමුත් වැවිලි කර්මාන්ත අපනයන අංශයෙන් ශ්‍රී ලංකා ඉතිහාසයේ අපි ලබපු වැඩිම අපනයන ආදායම වාර්තා කරලා තිබෙන්නේ 2021 වසරේදී කියන කාරණය මම ඉතාම සන්තෝෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා. තේ, රබර්, පොල් සහ අනෙකුත් භෝග අපනයනයෙන් අපි ඩොලර් බිලියන 3.8ක මුදලක් උපයාගෙන තිබෙනවා. යහපත් යෙදවුම් සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සමඟ 2023 වසර වන විට ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ අපනයන ආදායම ඩොලර් බිලියන 5 දක්වා වැඩි කර ගැනීමට අපට හැකියාව ලැබෙයි කියලා විශ්වාස කරනවා.

වර්තමානයේ දීත් තේ කර්මාන්තය සම්බන්ධයෙන් අදහස් රාශියක් ප්‍රකාශ වෙන බව අපි දන්නවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් මේ කර්මාන්තය ගැන හොඳින් දන්නා කෙනෙක්. අපි දන්නවා, පසුගිය වසරේ අවසන් කාර්තුවේදී මේ ක්ෂේත්‍රය තුළ අපි යම් අපහසුතාවලට මුහුණ දුන් බව. හැබැයි, දැන් නැවතත් වෙළෙඳ පොළට සුලභව පොහොර ලබා දීලා තිබෙනවා. නමුත්, ඒ පොහොරවල මිල සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබෙන බව අපි පිළිගන්න අවශ්‍යයි. ඒ මිල ඇත්තටම ඉතාම ඉහළ මට්ටමකට ගියේ ලෝක වෙළෙඳ පොළේ යූරියා හා අනෙකුත් රසායනික ද්‍රව්‍යවල මිල ඉතා ඉහළ මට්ටමකට ගිය නිසායි. ගරු කථානායකතුමනි, මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 300ක පමණ මිලකට තිබුණු යූරියා ඇතුළු අනෙකුත් රසායනික ද්‍රව්‍යවල මිල පසුගිය නොවැම්බර්, දෙසැම්බර් මාස වෙනකොට මෙට්‍රික්ටොන් එකක් ඩොලර් 900ක් දක්වා තුන් ගුණයකින් වැඩි වුණා. ඒ නිසා අපේ රටට දැනට ගෙන්වා තිබෙන පොහොරවල මිල වැඩියි. හැබැයි, දැනට ලෝක වෙළෙඳ පොළේ පොහොර මිල ක්‍රමානුකූලව අඩු වෙමින් තිබෙනවා. අප්‍රේල් මාසයෙන් පසුව මේ පොහොරවල මිල සැහෙන ප්‍රමාණයකින් අඩුවෙයි කියා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම එම අන්තර් කාලසීමාව තුළ 2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 21කින් වැඩිවෙලා තිබෙනවා. 2020 වසරේදී මේ රටේ සමස්ත තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 279යි. ගිය අවුරුද්දේ කිලෝග්‍රෑම් මිලියන 300ක් දක්වා, කිලෝග්‍රෑම් මිලියන 21කින් නිෂ්පාදනය වැඩිවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, යම් පමණකට පොහොර අඩු වුණත්, යහපත් කාලගුණ තත්ත්වය නිසා නිෂ්පාදනය වැඩි වුණා.

ගරු කථානායකතුමනි, මේ රටේ ගොවි ජනතාවට අපි පැහැදිලි කළ යුතු කාරණය තමයි, නිෂ්පාදනය අඩුවීම පොහොර හිඟවීම නිසා ඇති වූ ප්‍රශ්නයක්ම නොවෙයි කියන එක. ගරු කථානායකතුමනි, ඔබතුමාත් බොහොම පැහැදිලිව දන්නවා, මේ රටට වැඩිම පොහොර ප්‍රමාණයක් ආනයනය කරලා තිබෙන්නේ 2020 වර්ෂයේදී බව. එම වසරේදී මේ රටට පොහොර මෙට්‍රික්ටොන් 837,000ක් ආනයනය කරලා තිබෙනවා. නමුත්, ඒ වසරේදී තමයි ලංකාවේ තේ නිෂ්පාදනයේ අඩුම අගය වාර්තා වන්නේ. ඊට සාපේක්ෂව බලද්දී 2013 වසරේදී ලංකාවට ගෙන්වා තිබෙන්නේ පොහොර මෙට්‍රික්ටොන් 435,000යි. එම වසරේදී පොහොර ආනයනය භාගයකට වඩා අඩු වුණාට, ලංකාවේ තේ අස්වැන්නේ වැඩිම නිෂ්පාදනයක් සිද්ධ වුණේ එම වසරේදීයි. 2013 වසරේදී අපි තේ කිලෝග්‍රෑම් මිලියන 340ක් නිෂ්පාදනය කරලා තිබෙනවා. ඒ නිසා මේක පොහොර සම්බන්ධයෙන් විතරක්ම සිද්ධ වුණු කාරණයක් නොවෙයි. අපට පොහොර අවශ්‍යයි. අපි පොහොර ලබාදීමට කටයුතු කරනවා. ඒ වාගේම අනෙකුත් සමෝධානික කටයුතු, පාංශු සංරක්ෂණය, උස් සෙවණ, මිටි සෙවණ ශාක ලබාදීම, පසෙහි ආම්ලිකතාව අඩු කිරීමට ඩොලමයිට් ලබාදීම, ජල සැපයුම ඇතුළු කරුණු කාරණා රාශියක් මේකට බලපානවා. එම නිසා රජය හැටියට අපි කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හරහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත්, රාජ්‍ය අමාත්‍යාංශයත් මේ සහන ජනතාවට ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා. අපි දැනටමත් මේ වසරේදී ඩොලමයිට් සියල්ල නොමිලයේ ලබා දෙන්නට අවශ්‍ය කටයුතු සකස් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වසර තුළ කුඩා තේවතු හිමියන්ට අවශ්‍ය ඩොලමයිට් ටික නොමිලයේ ලබා දෙන්නත්, සින්ක් සල්ෆේට් නොමිලයේ ලබා දෙන්නත්, උස් සෙවණ, මිටි සෙවණ ශාක සඳහා අවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම්, පැළ සියල්ල ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම ජල සැපයුම වෙනුවෙන් විශාල සහනාධාර ක්‍රම කීපයක්ම යෝජනා කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ජල සැපයුම වෙනුවෙන් සියයට 50ක ආධාරයක් කුඩා තේවතු හිමියන්ට ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. ඒ ආධාරය ලබා දීමේදී රුපියල් 150,000ක උපරිමයක් දක්වා ගමන් කරන්නත් අපට පුළුවන්කම තිබෙනවා. ඊට අමතරව, ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රම යටතේ සියයට 4ක වාගේ සහන පොලියකට ණය පහසුකම් ලබා දෙන්නත් අපි වැඩසටහන් කීපයක් ලැස්ති කර තිබෙනවා.

මේ සියල්ලත් සමඟ, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ පුනර්ජීවනය වෙනුවෙන් ඍජු පැළ කිරීමේ ක්‍රමවේදයක් මේ අවුරුද්දේ හඳුන්වා දෙන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. පාංශු පරීක්ෂණය කිරීමෙන් පසුව, නැවත දීර්ඝ කාලයක් පාංශු සංරක්ෂණ වැඩසටහන්වලට යන ගමන් මාර්ගයෙන් යම් තරමකට බැහැර වෙලා, වගා කරන්න සුදුසු ඉඩම් තිබෙන, වගා කරන්න කැමැති පුද්ගලයන්ට ඍජු පැළ කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වනවා. ඒ අනුව අක්කර කාලක් සඳහා තේ පැළ සහ කොම්පෝස්ට් පොහොර නොමිලේ ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. භූමිය සකස් කර ගැනීමෙන් පසුව රුපියල් 30,000ක් වටිනා කාබනික ද්‍රව්‍ය එකතු කිරීමත්, තවත් රුපියල් 35,000ක් පමණ වටිනා පැළ නොමිලේ ලබා දීමටත් අපි කටයුතු කරනවා. ආසන්න වශයෙන් තේ අක්කර

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

කාලක නැවත තේ වගාව සඳහා -අලුත් තේ වගාව සඳහා- රුපියල් 75,000ක් පමණ වටිනා යෙදවුම් නොමිලේ ලබා දීමට මූල්‍ය ප්‍රතිපාදන මේ අවුරුද්දේ වෙන් කර තිබෙනවා. ඒ හරහා තේ කර්මාන්තය දියුණු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඉතිහාසය පුරාම තේ කර්මාන්තයේ නැවත වගා ප්‍රමාණය සියයට 3ක් හැටියට සඳහන් කරලා තිබෙනවා. නමුත් පසුගිය වසර 10ක කාලය තුළ කවදාවත් නැවත වගාව සියයට 3ක් සිදුවෙලා නැහැ. මේ අවුරුද්දේ ඍජු පැළ කිරීමේ ක්‍රමවේදය යටතේ ආධාර ලබා දීම මඟින් අඩු ගණනේ සියයට 2ක්වත් නැවත වගාව -අලුත් වගාව - පටන් ගන්න අපට පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත්, ශ්‍රී ලංකාවේ දැනට විශාල ගැටලුවක් වෙලා පවතින එක මට්ටමේ පවතින නිෂ්පාදන ධාරිතාව වර්ධනය කළ හැකි වනවා. 2010 සිට 2020 වෙනතුරුම සාමාන්‍යයක් හැටියට නිෂ්පාදන ධාරිතාව තිබෙන්නේ කිලෝ මිලියන 300යි. ඒක වැඩි වෙලා නැහැ. ඍජු ආධාර ක්‍රමය යටතේ අඩු ගණනේ තව සියයට 2කින් තේ වගාව වර්ධනය කර ගැනීමට හැකි වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ හා සමගාමීව කුඩා තේ වතුහිමියන් දැනුවත් කිරීමේ කටයුතු රැසක් අපි ආරම්භ කරලා තිබෙනවා. මේ රටේ තේ කර්මාන්තයේ සාමාන්‍යයෙන් අක්කරයකින් මසකට දලු කිලෝ 350ක පමණ අඩු මට්ටමකයි තිබෙන්නේ. ඒකට හේතුව, ශ්‍රී ලංකාවේ වගා බිම්වල තත්ත්වයයි. බිම්වල පැරණිකම නිසා පාංශු තත්ත්වය දුර්වල වෙලා තිබෙනවා. නමුත් කෙන්යාවෙත්, ඉන්දියාවෙත් මේ ප්‍රමාණය කිලෝ 450, 500 දක්වා වැඩි වෙලා තිබෙනවා. කෙන්යාවේ අලුත් වගාව නිසා මීට වඩා ගොඩක් හොඳ මට්ටමට තිබෙනවා. හැබැයි, අපි බොහොම පැහැදිලිව කියන්න අවශ්‍යයි පාංශු සංරක්ෂණ ක්‍රමවේද, කාබනික කොටස් එකතු කිරීම, උස් සෙවණ - මිටි සෙවණ ක්‍රමවේද ඇති කිරීම, ජල සැපයුම ලබාදීම කළේ නැත්නම් ඵලදායිතාව වැඩි කිරීමට අපට හැකි වන්නේ නැති බව. අක්කරයකින් මසකට කිලෝ 350ක් ලැබෙන දලු ප්‍රමාණය කිලෝ 450කට 500කට ගෙනගියේ නැත්නම් ඉදිරි කාලයේදී අපට විශාල ගැටලුවක් මතු වෙනවා.

හැබැයි, ඒ එක්කම යහපත් කෘෂිකාර්මික භාවිතා සමඟ ශ්‍රී ලංකාවේ සමහර කුඩා තේ වතු හිමියන් තමන්ගේ තේ අක්කරයෙන් මසකට දලු කිලෝ 500, 600 ලබා ගන්නවාය කියන කාරණයත් අපි කියන්න අවශ්‍යයි. දලු කිලෝ 1,000ක් ලබා ගන්නා තැන් තිබෙනවා. ඒ ගොවි මහත්වරුන් ආදර්ශයට අරගෙන, එම සැපයුම් ලබාදීම හරහා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ පරිවර්තනීය වෙනසක් කිරීමේ හැකියාව ලැබේවි කියලා අපි විශ්වාස කරනවා. කෙසේ වුවත්, මේ සියලු අභියෝග හමුවේ ගිය අවුරුද්දේ මොන බාධක තිබුණත්, ලංකාවේ තේ නිෂ්පාදනය කිලෝ මිලියන 300ක් දක්වා ඉහළ දැමීමට කටයුතු කරපු කුඩා තේ වතු හිමියන්ටත්, විශාල වතු හිමියන් ඇතුළු ඒ සෑම කෙනෙකුටම අපේ උපහාරය පිරිනමන්න කටයුතු කරනවා. එහි ප්‍රතිඵලයක් හැටියට ගිය අවුරුද්දේ තේ අපනයනයෙන් ඩොලර් බිලියන 1.32ක මුදලක් ලබා ගෙන තිබෙනවා. ඒක 2020ට සාපේක්ෂව ගත්තොත් වැඩි ප්‍රමාණයක්. 2020දී අපට ඩොලර් බිලියන 1.2යි ලැබිලා තිබෙන්නේ. අපි අද වැඩිපුර අපනයන ආදායමක් උපයාගෙන තිබෙනවා.

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණය පිළිබඳව අපි උපරිම උත්සාහයක් දැරුවා. මේ රටේ වතු කම්කරු ජනතාවට සාමූහික ගිවිසුම හරහා රුපියල් 1,000 දීමනාව ලබාදීමට උපරිම උත්සාහ කළා. නමුත් වතු සමාගම් ඊට කැමැති වුණේ නැහැ. කැමැති නොවුණු නිසා තමයි නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාට සිද්ධ වුණේ, පඩි පාලක සභාව හරහා නියෝගයක් පනවා රුපියල් 1,000 දීමනාව ලබා දෙන්නට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජය ඉතාම සද්භාවයෙන් වතු කම්කරු ජනතාව ගැන ඇති හැඟීමෙන්, කැක්කුමෙන් රුපියල් 1,000 දීමනාව දෙන්න යෝජනා කළා. නමුත් වතු සමාගම් කැමැති වුණේ නැහැ. ඒ නිසා අපි පඩි පාලක සභාව හරහා නියෝග පනවා තිබෙනවා. ජනතා වතු සංවර්ධන මණ්ඩලයත්, රාජ්‍ය වැවිලි සංස්ථාවත් ඒ මුදල ගෙවනවා. වැවිලි සංස්ථාව පමණක් 2021 වසරේදී වැඩිපුර මිලියන 60ක් භාවිත කරලා තිබෙනවා, රුපියල් 1,000 පඩිය දෙන්නට. හැබැයි, වතු සමාගම් මේකට විරුද්ධව දැන් උසාවි ගිහිල්ලා තිබෙනවා. අපි බලාගෙන ඉන්නවා. අපි ඒ පාර්ශ්ව දෙකටම -වතු වෘත්තීය සමිති ක්ෂේත්‍රයටත්, වතු හිමියන්ටත්- යෝජනා කරලා තිබෙනවා, පුළුවන් නම් නැවත සාමූහික ගිවිසුමට ප්‍රවිෂ්ට වෙන්න කියලා. ඔවුන් යෝජනා කළේ, රුපියල් 800 වැටුපක් සහ productivity-based incentive එක රුපියල් 100යි, attendance incentive එක රුපියල් 100යි කියන කාරණයට. ඔබතුමා හොඳින් දන්නවා, රජය හැටියට අපට ඒ ස්ථානයට යන්න පුළුවන්කම තිබුණේ නැති බව. මොකද, වෘත්තීය සමිති පැත්තෙන් දිගින් දිගටම කිව්වා, අපට දිනකට රුපියල් 1,000ක මූලික වැටුපක් අවශ්‍යයි කියලා. අපි රජය හැටියට අපේ යුතුකම උපරිමයෙන් ඉෂ්ට කර තිබෙන බවත්, අනාගතවාදීවත් වතු කම්කරු ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් උපරිමයෙන් කැප වෙලා කටයුතු කරන බවත්, ඉතා වගකීමෙන් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මම මේ ඔබතුමාට දොස් කියනවා නොවෙයි. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඔව්. නමුත් අපි යෝජනාව දුන්නා, ගරු මනෝ ගනේසන් මැතිතුමනි. *[බාධා කිරීමක්]* නැහැ, අපි දන්නවා. නමුත් මේක දැන් උසාවිය ඉදිරිපිට තිබෙන කාරණයක්.

රජය හැටියට මේ සාමූහික ගිවිසුමට ඇතුළත් වෙන්න, -

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Sir, I rise to a point of Order.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කටයුතු කරන්නේ සද්භාවයෙන්. ඔබතුමා ගැන විශ්වාසය තිබෙනවා. ඔබතුමා නිහතමානී දේශපාලන නායකයෙක් බව අපි දන්නවා. ඔබතුමා කටයුතු කරන ආකාරය අපි බලාගෙන ඉන්නවා; ප්‍රශ්නයක් නැහැ. ගරු ඇමතිතුමනි, වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දීමනාව දෙනවා කියලා පොරොන්දු වෙලා දැන් අවුරුද්දකට වැඩියි. නමුත්, තවම හරියාකාරව ඔවුන්ට එය ලැබුණේ නැති බව ඔබතුමා දන්නවා නේ. අවුරුදු ගණනක් ගියත් ඉටුවෙලා නැහැ නේ. මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුව. අපේ නොවෙයි නේ. ඒ නිසා ඒ කොම්පැනිකාරයන්ට එන්න කියන්න. එක මේසයක වාඩි කරවා ඔවුන් සමඟ සාකච්ඡා කරන්න. ඒ ගොල්ලන්ට එන්න කියන්න. ඔබතුමා නේ, ඇමතිවරයා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඔවුන් දෙන්නේ නැත්නම්, රජය හැටියට කරන්න පුළුවන් දේ තමයි අපි කළේ, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසායි අපි පඩි පාලක සභාව

හරහා ඒ යෝජනාව කළේ. දැන් එය උසාවිය ඉදිරිපිට තිබෙන කාරණයක්. ඒ නිසා අපි යෝජනා කර තිබෙනවා, පුළුවන් නම් නැවත සාමූහික ගිවිසුමකට ඇතුළත් වෙලා දෙපාර්ශ්වය මේක හොඳින් විසඳා ගනිමු කියලා.

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, දැන් අපට කරන්න පුළුවන් දේ තමයි ඒක. අපි ඉදිරියටත් ඔවුන් සමඟ අඛණ්ඩව කටයුතු කරනවා. තමන්ගේ ජීවිත කාලයම තේ වගාව වෙනුවෙන් කැප කරපු, දුක් විඳපු, මේ රටේ අහිංසක වතු කම්කරු ජනතාවට සාධාරණය ඉෂ්ට කළ යුතුයි කියන දැඩි මතයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත්, මේ රජයත් සිටිනවාය කියන කාරණය ඉතා වග කීමෙන් මම ප්‍රකාශ කරනවා. වතු කම්කරු ජනතාවට සාධාරණය ඉෂ්ට කරනවා වාගේම, තේ වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා අපට කරන්න පුළුවන් කටයුතු සියල්ලක්ම අපි ඉදිරි කාලයේ කරනවා. හැබැයි, දැනටමත් රජයේ සමාගම් සහ තවත් සමාගම් කීපයක් රුපියල් 1,000 දීමනාව ලබා දෙනවාය කියන කාරණයත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ සෘජු පැළ කිරීමේ ක්‍රමවේදය සමඟ ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ තේ දලු අස්වැන්න වැඩිවෙලා යහපත් කෘෂි කාර්මික තත්ත්වයක් සමඟ ශ්‍රී ලංකාවේ තේ වගාවට වඩාත් යහපත් කාලයක් උදාවෙයි කියලා අපි විශ්වාස කරනවා. දැනටමත් -ගිය අවුරුද්දේ- කුඩා තේ වතු හිමියන්ගෙන් සියයට 76ක් ඒ වෙනුවෙන් දායකත්වය ලබා දී තිබෙනවා. ඔවුන්ගේ දායකත්වය ක්‍රමානුකූලව ඉදිරියේදී ඉහළ යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රබර් වගාව පැත්තෙනුත් ශ්‍රී ලංකාවේ පරිවර්තනීය වෙනසක් සිදු වෙමින් තිබෙනවා. ශ්‍රී ලංකා ඉතිහාසයේ සිට ගත්තාම රබර් අපනයනයෙන් ලබාගත් ඉහළම ආදායම ගිය අවුරුද්දේ අපි උපයාගෙන තිබෙනවා. ඒ ඩොලර් බිලියනයක මුදලක්. ඉතිහාසයේ සිට ගත්තාම ඒක තමයි අපි ලබාගත් වැඩිම ආදායම. අපේ ආණ්ඩුව බලයට පත් වන කොට මේ රටේ රබර් කර්මාන්තය මියැදෙමින් තිබුණේ. RSS - 1 ගැන ඔබතුමා හොඳින් දන්නවා. ඔබතුමාගේ ප්‍රදේශයේත් විශාල වශයෙන් ඒ නිෂ්පාදනය සිදු වනවා. RSS - 1 කිලෝ එකකට දුන්නේ රුපියල් 235යි. දැන් රුපියල් 490ක් ලැබෙනවා. ඒ සමඟම නැවත රබර් වගාවට ජනතාව ක්‍රමානුකූලව යොමු වෙමින් තිබෙනවා. ඒ නිසා අපට පසුගිය අවුරුද්දේ මෙට්‍රික් ටොන් 77,000ක වාගේ ප්‍රමාණයක් නිෂ්පාදනය කර ගන්න පුළුවන් වුණා. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැ. ලෝකයේ, rigid tyres මහා පරිමාණයෙන් නිෂ්පාදනය කරන කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් වෙමින් තිබෙනවා. අලුතෙන් කර්මාන්තශාලා දෙකක් ආරම්භ කරන්න අපි කටයුතු කළා. එකක් ගිය අවුරුද්දේ විවෘත කළා. විශාල ඉල්ලුමක් රබර්වලටත් තිබෙනවා. ඒ නිසා රබර් වගාකරුවන් මේ පිළිබඳව අවධානය යොමු කරමින්, නැවත වගාවට යොමු වෙමින් සිටිනවා. අම්පාර සහ මොනරාගල ප්‍රදේශවල අලුත් රබර් වගාවන් ඉතා හොඳින් කෙරෙනවා. ඒවාට ආධාර දෙන්නත් රජය වැඩසටහන් කීපයක් සකස් කර තිබෙනවා. රබර් වගාවේ අනාගතය පිළිබඳවත් අපට විශාල විශ්වාසයක් තිබෙනවා.

ශ්‍රී ලංකා ඉතිහාසයේ රබර් අපනයනයෙන් වැඩිම ආදායම ගිය අවුරුද්දේ ලැබුණා වාගේම, පොල් අපනයනයෙනුත් ඉතිහාසයේ වැඩිම ආදායම ගිය අවුරුද්දේ ලබා ගන්න අපට පුළුවන් වුණා. ඒ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 836ක්. ඒ වාගේම අපේ ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා භාරව සිටින කුඩා වැවිලි භෝග ක්ෂේත්‍රය ගත්තොත්, ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම අපට ලැබුණේ ගිය අවුරුද්දේ. අපට එම අංශයෙන් ඩොලර් මිලියන 566ක් උපයා ගන්න පුළුවන් වුණා. ඒක 2020 වසරට සාපේක්ෂව සියයට 32ක වැඩි වීමක්. පොල්, රබර් වාගේම කුරුඳු ඇතුළු අපනයන භෝගවලිනුත් අපි හොඳ ආදායමක් ලබා ගත්තා. ඉතිහාසයත් එක්ක ගත්තාම, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩිම අපනයන ආදායම 2021 වසරේ ලැබී තිබෙනවා. ඒ ප්‍රමාණය අනිවාර්යයෙන්ම 2022 වසරේ වඩාත් වර්ධනය වන බව සිහිපත් කරමින්, ඒ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලබා දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, ආයෝජන සඳහා අවස්ථාව ලබා දුන් මුදල් අමාත්‍යතුමා ඇතුළු සියලු දෙනාටත් ස්තුති කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 12.16]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් විවේචන ඉදිරිපත් කරන්න බැරි ඇමතිවරු ඉන්නේ ටික දෙනායි. ඒ අතර අපේ රමේෂ් පතිරණ ඇමතිතුමා සිටින බව මා කියන්න කැමැතියි. මෙතුමාගේ කාර්ය භාරය ගැන අපි සතුටු වනවා. හැබැයි, එකක් කියන්න ඕනෑ. ග්ලයිෆොසෙට් තහනම් කළාට, licence එකක් හරහා මාස 36ක් ගෙනෙන්න හැකියාව තිබුණා. දැන් ඒ මාස 36 ඉවර වෙලා ග්ලයිෆොසෙට් ගෙන්වීම සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා. කුඩා තේ වතු හිමියෝ, රබර් වතු හිමියෝ ඇතුළු සියලු වගාකරුවන්ට මෙය බලපානවා. කරුණාකර ඒ ගැන ප්‍රතිපත්ති තීරණයක් ගන්න වෙයි. මොකද, ඒ සම්බන්ධයෙන් විශේෂඥ කණ්ඩායම් එක මතයක නැති නිසා.

නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන නියෝග සම්බන්ධයෙන් අපට ගැටලුවක් නැහැ. නමුත්, මූලික කාරණා දෙකක් මම ඉදිරිපත් කරන්න කැමැතියි.

අධිභාර බද්ද පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙහි ඉතාම පැහැදිලිව, "මේ පනතේ මතු සඳහන් විධිවිධානවලට යටත්ව, "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන අධිභාර බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන" යනුවෙන් සඳහන් කර, "රුපියල් මිලියන දෙදහසට වැඩි නම් පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් ගෙවන්න ඕනෑ" කියලා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන ගැටලුව තමයි, "සමාගම" කියන එකේ අර්ථ නිරූපණය මොකක්ද කියන එක. මෙහි ඉතාම පැහැදිලිව කියනවා, සමාගම කියන්නේ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අර්ථ නිරූපණය කියලා. එහි සමාගම කියන අර්ථ නිරූපණය යටතේ තිබෙනවා, විශ්‍රාම වැටුප් අරමුදලත්, සේවක අර්ථසාධක අරමුදලත්, විශ්‍රාම අරමුදලත්, විශ්‍රාම පාරිතෝෂිත අරමුදලත් කියන සියලු ආයතන

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මේ සමාගම යටතට ඇතුළත් වෙනවා කියලා. බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා කියලා තිබුණා සේවක අර්ථසාධක අරමුදලට මේ බද්ද ගහන්නේ නැහැ කියලා. එතුමා ඒක තැන් තැන්වල කියලා හරියන්නේ නැහැ. එතුමාට බැහැ නීතිය වෙනස් කරන්න. නීතිය වෙනස් කරන්න පුළුවන් මේ පාර්ලිමේන්තුවේදී පමණයි. එහෙම කියලා සතියකින් පසු අද සභාගත කර තිබෙන මේ අධිභාර බද්දට සේවක අර්ථසාධක අරමුදල යටත් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම එතුමා කියන කථාව සත්‍යයක් නම්, ඒ වෙනස් කිරීම මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින් කරන්න තිබුණා. දැන් කියලා වැඩක් නැහැ අපි මේ ගැන විවාද කරනවා කියලා. ඒ නිසා වහාම ඒ ගැන අවධානය යොමු කරන්න කියලා මා කියනවා.

අනෙක් කාරණය හැටියට තවත් ගැටලුවක් මතු වෙනවා. දැනටත් සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන ආදායමට සියයට 14ක බද්දක් ගහනවා. හැබැයි, අර්ථසාධක අරමුදලේ 43වන වගන්තියේ තිබෙනවා, සේවක අර්ථසාධක අරමුදලේ ආදායම්වලට බදු ගහන්න බැහැ කියලා. එතකොට මෙතැන පරස්පරයක් තිබෙනවා. සේවක අර්ථසාධක අරමුදලේ ආදායම්වලට බදු ගහන්න බැරි නම්, ගිය අවුරුද්දේ සියයට 14ක් බදු ගැහුවේ කොහොමද? ගිය අවුරුද්දේ විතරක් නොවෙයි. අවුරුදු 20ක්, 25ක් තිස්සේ මේ බද්ද ගහලා තිබෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණය මෙයයි. අද රටේ තත්ත්වය ගැන මම අලුතින් කථා කරන්න ඕනෑ නැහැ. ඒ ගැන කවුරුත් දන්නවා කියා මා හිතනවා. කබ්රාල් මැතිතුමා මේ දවස්වල කියනවා, "කිසි ගැටලුවක් නැහැ, සති කිහිපයකින් මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න පුළුවන්" කියලා. හැබැයි, යථාර්ථය ඊට වඩා ගොඩක් වෙනස්. ඩොලර් බිලියන 7.8ක් තිබුණු සංචිත ජනවාරි අග වනකොට ඩොලර් බිලියන 2.3ට අඩුවෙලා තිබෙනවා. ඒකෙන් ඩොලර් බිලියන 1.6ක් Chinese Yuan. එතකොට අතේ තිබෙන ඩොලර් මිලියන 700ක් පමණ තමයි වියදම් කරන්න පුළුවන්. ඒ අතරම බලාපොරොත්තු වුණු ප්‍රේෂණ ලැබෙන්නේ නැහැ. ගිය අවුරුද්දේ ජූලි, අගෝස්තු මාසවල වාගේ සිට ප්‍රේෂණ ලැබීම සියයට 30කින්, 40කින්, 50කින් අඩු වෙන්නට පටන් ගත්තා. 2021 දෙසැම්බර් වෙනකොට සියයට 60කින් පමණ මාසික ප්‍රේෂණ අඩු වුණා. 2020 ඩොලර් මිලියන 815ක් ලැබුණු එක, 2021 දෙසැම්බර් මාසයේ ලැබුණේ ඩොලර් මිලියන 325යි. මේකට හේතුව හැටියට ඔවුන් නොයෙකුත් කාරණා ඉදිරිපත් කරනවා. නමුත්, අපේ කලාපයේ අනෙක් රටවල් සමඟ බැලුවාම ඒ සියලු රටවල ප්‍රේෂණ වැඩිවෙලා තිබෙනවා. ලංකාවේ විතරයි අඩු වෙන්නේ. ඒකට හේතුව තමයි, රජය ඒ ප්‍රේෂණ ලංකාවට එවන අයට ඩොලරයකට රුපියල් 208ක් ගෙවනවා. ඇත්තවශයෙන්ම රුපියල් 198ක්. ඒකට තව රුපියල් 10ක් එකතු කරනවා. එතකොට රුපියල් 208ක්. රජයෙන් එහෙම ගෙවන්න සූදානම් වුණාට ඩොලරයකට රුපියල් 250කට අධික ගණනක් උන්ඩියල් සහ හවාලා ක්‍රම යටතේ ඔවුන්ට ලැබෙනවා. මේ තරම් වෙනසක් තියෙද්දී කිසිම සාමාන්‍ය පුද්ගලයෙක් අඩු ගණනට මුදල් එවන්නේ නැති බව රජය තේරුම් ගන්න ඕනෑ. ඒක අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාත් තේරුම් ගන්න ඕනෑ, බැසිල් රාජපක්ෂ මැතිතුමාත් තේරුම් ගන්න ඕනෑ. මම ඒ ගැන සොයා බැලුවා. ඊයේ වනකොට පිටකොටුවේ රුපියල් 257ට පවා ඩොලර් විකිණිලා තිබෙනවා.

රජය දැන් කියනවා සංචාරක කර්මාන්තය නැවතත් ප්‍රතිස්ථාපනය වෙලා එනවා කියලා. සංචාරකයන් 150,000ක්ද කොහේද ආවා. මමත් දැක්කා මිරිස්ස පැත්තේ, ඇල්ල පැත්තේ සංචාරකයන් ඉන්නවා. නමුත්, එහෙම සංචාරකයන් ප්‍රමාණයක් ආවා කියලා මේ ප්‍රශ්නය විසඳන්න හැකියාවක් නැහැ.

අනෙක් කාරණය තමයි පුද්ගලිකකරණ ආදායම. එදා කබ්රාල් රාජ්‍ය ඇමතිතුමා බ්ලූම්බර්ග් ආයතනයට කියලා තිබුණා, මාස හයක් තුළ සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ආයතනය හරහා රටේ වත්කම් විකුණලා -ඉඩම් විකුණලා- ඩොලර් බිලියනයක් ලබා ගන්න එතුමා බලාපොරොත්තුවෙන් හිටියා කියලා. නමුත් එවැනි මුදලක් ඇවිල්ලාත් නැහැ. අනෙක් කාරණය, අතමාරු ක්‍රමයට, swap ක්‍රමයට ඉන්දියාවෙන්, චීනයෙන්, බංග්ලාදේශයෙන්, පාකිස්තානයෙන් මුදල් ලබා ගෙන මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා එතුමන්ලා හිතනවා. නමුත් එහෙම වෙන්නේත් නැහැ. මේක අපි තේරුම් ගන්න ඕනෑ.

මම කෙටියෙන් කියන්නම්. එතුමන්ලා හිතන විධියට මේ තිබෙන්නේ ද්‍රවශීලතාවේ-liquidity- ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම ද්‍රවශීලතාවේ ප්‍රශ්නය වාගේම මෙය බුන්වත් වීමේ ප්‍රශ්නයක් - solvency ප්‍රශ්නයක් - බංකොලොත් වීමේ ප්‍රශ්නයක්. එය දීර්ඝ කාලීන ප්‍රශ්නයක්.

අද අපට භාණ්ඩ ආනයනය කරන්න ඩොලර් නැති කථාව කවුරුත් දන්නවා. අද ගල් අඟුරු නැහැ, කිරි පිටි නැහැ, බෙහෙත් නැහැ, පෙට්‍රල් නැහැ, ඩීසල් නැහැ, ගෑස් නැහැ, සිමෙන්ති නැහැ, යකඩ නැහැ. මේ සියලු දේ නැහැ. ඒ ගැන නැවත කියන්න ඕනෑ නැහැ. නමුත්, ඊටත් එහාට ගිහිල්ලා අපට විශාල වශයෙන් ඩොලර් ණය ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හැමදාම කියනවා පසුගිය කාලයේ විශාල ණය ප්‍රමාණයක් ගත්තා, ඒක තමයි මේකට හේතුව, පසුගිය රජයට චෝදනාවක් එල්ල වෙනවා කියලා. Verité Research කියන ආයතනය ස්වාධීන ආර්ථික පර්යේෂණ ආයතනයක්. ඒ ආයතනයෙන් මීට මාස 3කට කලින් භාණ්ඩාගාරයටත්, මහ බැංකුවටත් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණා, 2015 සිට 2019 දක්වා ගත්ත මුළු ණය ප්‍රමාණයෙන් සියයට 89.8ක් අරගෙන තිබෙන්නේ, කලින් රජය ගත්ත ණයවල පොලිය ගෙවන්න කියලා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවටත් එවලා තිබුණා. ඒ මුදල්වලින් සියයට 11.2ක් පමණයි සංවර්ධන කටයුතුවලට පාවිච්චි කරන්න පුළුවන් වුණේ. මේක තමයි තිත්ත ඇත්ත. කවුරු මොනවා කිව්වත්, අපි ණය උගුලක හිරවෙලා ඉන්න බව අපට තේරුම් ගන්න වෙනවා.

දැන් අපට මොකක්ද කරන්න තිබෙන්නේ? කොහොමද මේ උගුලෙන් එළියට යන්නේ? සමහරු කියනවා ඒ සඳහා IMF එකට යන්න ඕනෑ කියලා. සමහරු කියනවා IMF එකට යන්න ඕනෑ නැහැ කියලා. උදය ගම්මන්පිල ඇමතිවරයා කිව්වා, කැබිනට් මණ්ඩලයේ බොහෝ දෙනාත් දැන් IMF එකට යනවාට කැමැතියි කියලා. ඇත්ත වශයෙන්ම අපි 2020 නොවැම්බර් මාසයේ පැයක පමණ කථාවක් කරලා කිව්වා, IMF එකට ගියොත් මේ ප්‍රශ්නය බේරා ගන්න පුළුවන් කියලා. හැබැයි, අද අපි විශ්වාස කරන්නේ නැහැ, IMF එකේ උදව් අරගෙන පමණක් මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා. ඒකට හේතුව මේකයි. අපේ රටේ ණය පිළිබඳව, ණය තිරසාරත්වය පිළිබඳව විශ්ලේෂණයක් කරනවා. ඒ ණය තිරසාරත්ව විශ්ලේෂණයේ ප්‍රතිඵල අනුව, ණය තිරසාර නම් පමණයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරහා ණය ප්‍රතිව්‍යුහගත කර ගන්නේ නැතිව අපට මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්න පුළුවන් වන්නේ. ණය තිරසාර නැතිනම් අපට IMF එකේ සහායෙන් පමණක් ගොඩ එන්න බැහැ. අපට ණය ප්‍රතිව්‍යුහගත කර ගන්න වෙනවා. යම්කිසි විධියකට ණය නොගෙවා ඉන්න සහන කාලයක් අපට ලබා ගන්න වෙනවා. ඒක technical default එකක් කියලාත් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳ වාර්තාවක් මේ සිකුරාදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනවා. අපි බල කරලා කියනවා ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා. එතකොට අපට ආණ්ඩුවේ හිටියත්, විපක්ෂයේ හිටියත් යථාර්ථය මොකක්ද කියලා දැන ගන්න පුළුවන්. අජිත් නිවාඩ් කබ්රාල් මොකක්ද කියන්නේ කියන එකෙන් අපට වැඩක් නැහැ. ඇත්ත වශයෙන්ම අපට අවශ්‍ය වෙන්නේ තාක්ෂණික ණය තිරසාර විශ්ලේෂණ වාර්තාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 ණය තිරසාර විශ්ලේෂණ වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. එම වාර්තාවේ දිනය ලෙස සඳහන් වන්නේ, 2019 නොවැම්බර් මස 01වැනි දා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

මේ වාර්තාව හැන්සාඩ් ගත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද මේ වාර්තාව ඉතා වැදගත්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "External debt remains sustainable, though with high currency and rollover risks."

මොකක්ද මේ කියන්නේ? 2019දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් පත් කරනකොට අපේ විදේශීය ණය තිරසාරයි. ණය ගෙවා ගෙන ඉස්සරහට යන්න හැකියාවක් අපට තිබුණා. මේ වාර්තාවේ මේ පිළිබඳ නොයෙකුත් හේතු ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, ණය තිරසාර නැතිනම් අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගයෙන් පමණක් ගොඩ එන්න බැහැ.

විපක්ෂ නායකතුමා කිව්වා වාගේ එතුමා ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27 (2) ප්‍රශ්නයටවත් උත්තර දෙන්න මුදල් ඇමතිතුමා අද මේ ගරු සභාවට ඇවිල්ලා නැහැ. ඉතා ලජ්ජයි. එතුමා ඒ ප්‍රශ්නයෙන් පැනලා ගිහිල්ලා තිබෙනවා. අපට මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කරන්න අවශ්‍ය නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන වාර්තාව, සිකුරාදාට පසුව මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා.12.26]

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப் படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ අභියෝග තිබුණත්, ඒ අභියෝග ජයග්‍රහණය කරලා, මෑත ඉතිහාසයේ ඒ ක්ෂේත්‍රයෙන් වැඩිම ආදායමක් ලබාගත් වර්ෂයක් හැටියට පසුගිය වර්ෂය හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම ඉතිහාසයේ වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක්, එනම් ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක් පසුගිය වර්ෂයේ ලබා ගන්න හැකියාවක් ලැබුණා. ඒ නිසා අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග රබර් සහ තේ ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා ඉතාම වැදගත් බව මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

මේ නියෝග අද පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පස්සේ රබර් නැවත වගා කිරීම සඳහා ලබාදෙන සහනාධාරය වැඩි කරන්නත්, රබර් සඳහා ලබා දෙන වාරික 8කින් ගෙවනු ලබන සහනාධාරය, වාරික 5 දක්වා අඩු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් තමයි ගොවියා ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ. විශේෂයෙන්ම කුඩා රබර් වතු හිමියන්ට සාමාන්‍යයෙන් හෙක්ටෙයාරයක් වගා කිරීම සඳහා රුපියල් මිලියන 1.2ක්, 1.6ක් පමණ මුදලක් වැය වෙනවා. එයින් සියයට 20ක් පමණ මුදලක් තමයි අපි ලබා දෙන්නේ. ඒ මුදලත් වාරික 8කින් ගෙවනකොට ගොවියාට අපහසුතාවලට පත්වෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි එය වාරික 5කට අඩු කිරීම සඳහා කටයුතු කරන්න බලාපොරොත්තු වන්නේ.

අමාත්‍යාංශය හැටියට අපේ ප්‍රධානම අරමුණ තමයි, නිෂ්පාදනය වැඩි කර ගැනීම. පසුගිය වර්ෂ කිහිපය තුළදී නැවත වගාව සහ නව වගාව කළේ නැති නිසා අද වනවිට නිෂ්පාදනය වැඩි කර ගන්න බැරිවෙලා තිබෙනවා. ඒක තමයි මූලිකම කාරණය. ඉතිහාසය බැලුවොත්, නැවත වගාව සහ නව වගාව කාලයෙන් කාලයට අඩු වැඩි කරලා තිබෙනවා. නමුත් වසර 6කට පස්සේ හෙක්ටයාර 2,566ක පමණ රබර් නැවත වගා කිරීම සහ නව වගා කිරීම සඳහා හැකියාව ලැබී තිබෙනවා. මේ වර්ෂයේ අපේ ප්‍රධාන ඉලක්කය වන්නේ, තේ සහ රබර් වගා කිරීමට සහනාධාර ලබා දීලා, වැඩිපුර නැවත වගාවට සහ නව වගාවට තේ සහ රබර් ගොවියා යොමු කිරීමයි. ඒ තුළින් තමයි, තව වසර 3කින් තේ නිෂ්පාදනයත්, තව වසර 6කින් රබර් නිෂ්පාදනයත් වැඩි කර ගන්න හැකියාව ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රබර් සඳහා අද අපට විශාල ඉල්ලුමක් තිබෙනවා. අපේ ගරු අමාත්‍යතුමා සඳහන් කළ ආකාරයට 2020දී අපේ ආණ්ඩුව ආරම්භයේදී රබර්වලට ලැබුණේ රුපියල් 235ක් පමණයි. අද එය රුපියල් 500 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම ක්‍රේප් රබර් සඳහා අද රුපියල් 700කට වැඩි මිලක් ලැබෙනවා. අපි නිෂ්පාදනය වැඩි කර ගත්තේ නැත්නම් ඉදිරියේදී අපේ රටේ ඇතිවන නව කර්මාන්තවලට විශාල

[ගරු කනක හේරත් මහතා]

අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙනවා. අපට වැඩි රබර් ප්‍රමාණයක් නැවතත් ආනයනය කරන්න වෙනවා. ඒ නිසා අපේ ප්‍රමුඛතාව, මූලික අරමුණ වෙලා තිබෙන්නේ වගාව වැඩි කිරීමයි. වගාව වැඩි කරන්න නම් ගොවියා ආරක්ෂා කළ යුතුයි; ගොවියා ශක්තිමත් කළ යුතුයි. ඒ සඳහා නැවත වගාව සහ නව වගාව සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවාය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම රබර් ගොවියා රබර් වගාව අත්හරින්නේ හොඳ ආදායමක් ලැබුණේ නැත්නම් තමයි. මේ වර්ෂ කිහිපය තුළ රබර් ගොවියාට හොඳ ආදායමක් ලැබෙනවා. සමහර විට වැඩිපුර රබර් කපන තත්ත්වයටත් පත්වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
තව විනාඩි දෙකකින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රජයක් හැටියට ගරු මුදල් අමාත්‍යතුමා අද කුඩා රබර් වතු හිමියාගේ, කුඩා තේ වතු හිමියාගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා, ඔවුන්ට අමතර අදායමක් ලබා ගැනීම සඳහා රුපියල් 40,000ක පමණ මුදලක් වෙන් කරලා තිබෙනවා. කාලයෙන් කාලයට අඩු වැඩිවන මිල නිසා පාඩුවක් වෙනවා නම් තවත් අමතර ආදායමක් ලබා ගැනීමට හැකිවන මේ වැඩ පිළිවෙළ තුළින් ගොවියා ශක්තිමත් වෙයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා.

අපේ ගරු අමාත්‍යතුමා තේ පිළිබඳව කථා කළ නිසා මම තේ පිළිබඳව කථා කරන්නේ නැහැ. අපට තිබෙන අභියෝගය නිෂ්පාදනය වැඩි කිරීමයි. ඒ සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හැටියට නැවත වගාව, නව වගාව සහ පැළ සිටුවීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන් පසුගිය වර්ෂයේ විශාල අභියෝග තිබුණත්, පොහොර ප්‍රශ්නය තිබුණත් ගොවියා ආරක්ෂා කර ගන්න අපි කටයුතු කළා වාගේම, මේ වර්ෂය තුළදීත් අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා නැවත වගාව සහ නව වගාව වැඩි කරලා කුඩා රබර් වතු හිමියන්ට සහ කුඩා තේ වතු හිමියන්ට සහන ලබා දෙන්න කටයුතු කරන බවත් සඳහන් කරමින් මා නවතිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.30 දක්වා සභාවේ වැඩකටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Sivagnanam Shritharan, you have seven minutes.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Your time has been reduced to seven minutes due to time constraints.

[பி.ப. 1.30]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தலைப்புகளுக்குக் கீழே உரையாற்றுவதற்கு முன்னர், மிக முக்கியமாக 2022ஆம் ஆண்டிலே நடைபெறுகின்ற 2021ஆம் ஆண்டுக்கான க.பொ.த. உயர்தரப் பரீட்சைக்கான வினாத்தாள்களில் இடம்பெற்ற சில பிழைகளால் தமிழ் மொழிமூல மாணவர்கள் எவ்வளவு தூரம் பாதிக்கப்படப் போகின்றார்கள் என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகிறேன்.

2022.02.07ஆம் திகதி நடைபெற்ற உயிரியல் வினாத்தாள் பகுதி 1இல் பல தவறுகள் - பிழைகள் காணப்படுகின்றன. அவையாவன: 2ஆவது வினாவில் "பிரதானமாக" என்பதற்குப் பதிலாக "முக்கியமாக" எனவும், 5ஆவது வினாவில் "விளைதிறனானது" - effective - என்பதற்குப் பதிலாக "வினைத்திறனானது" - efficient எனவும், 7ஆவது வினாவில் "பெறப்பட்ட" என்பதற்குப் பதிலாக "பெற்ற" எனவும், "கடத்தப்படுகின்றன" - passed - என்பதற்குப் பதிலாக "ஊடுகடத்தப்படுகின்றன" - transmission எனவும், "மாற்றங்கள் ஏற்படுகின்றன" என்பதற்குப் பதிலாக "மாற்றம் ஏற்படுகின்றது" எனவும், 9ஆவது வினாவில் "கொம்புருத் தாவரங்கள்" என்பதற்குப் பதிலாக "கொம்புத் தாவரங்கள்" எனவும், 12ஆவது வினாவில் "முதிர்ச்சியின்போது" என்பதற்குப் பதிலாக "முதிர்ச்சிப் பருவத்தில்" எனவும், 13ஆவது வினாவிலும் 39ஆவது வினாவிலும் "வினைத்திறனாக" என்பதற்குப் பதிலாக "திறமையாக" எனவும், 13ஆவது வினாவில் "திசைகோட் சேர்க்கை" என்பதற்குப் பதிலாக "திசைமுகப்படுத்தல்" எனவும், 16ஆவது வினாவில் "ஒளித்தொகுப்புச் செய்யும்" என்பதற்குப் பதிலாக "ஒளித்தொகுப்பி" எனவும், 17ஆவது வினாவில் "விடுவிக்கத் தூண்டப்படும்" என்பதற்குப் பதிலாக "தூண்டப்படும்" எனவும், 18ஆவது வினாவில் "அமைவிடம்" என்பதற்குப் பதிலாக "இருக்கும் இடம்" எனவும், 21ஆவது வினாவிலும் 44ஆவது வினாவிலும் "சமிக்ஞை" என்பதற்குப் பதிலாக "சைகை" எனவும், 22ஆவது வினாவில் "இயற்கையாக கொல்லும்" என்பதற்குப் பதிலாக "இயற்கைக் கொல்லும்" எனவும், 24ஆவது வினாவில் "பார்வைப் புலன் பரப்பு" என்பதற்குப் பதிலாக "கட்புலப் புலன் பரப்பு" எனவும், 31ஆவது வினாவில் "தேவையானவையாகும்" என்பதற்குப் பதிலாக "போதியனவாகும்" எனவும், 40ஆவது வினாவில் "படுக்கை" என்பதற்குப்

பதிலாக "படுகை" எனவும், 44ஆவது வினாவில் "சுரப்பிகளை" என்பதற்குப் பதிலாக "சுரப்பிகளையும்" எனவும், 47ஆவது வினாவில் "தலைகீழாகக் காணப்படலாம்" என்பதற்குப் பதிலாக "தலைகீழாக்கப்படலாம்" எனவும், 48ஆவது வினாவில் "தத்திகளினுள்ளும் தாவரங்களினுள்ளும்" என்பதற்குப் பதிலாக "தத்திகளிலும் தாவரங்களிலும்" எனவும் குறிப்பிடப் பட்டுள்ளன.

இவ்வாறாக சொற்கள் மாறியிருப்பதும் சொற்பதங்கள் மாறியிருப்பதுமான பிழைகள் ஏற்படுவதற்குக் காரணம், சிங்கள மொழிமூலம் தயாரிக்கப்படுகின்ற வினாத்தாள்கள் தமிழுக்கு மொழிபெயர்க்கப்படுகின்றபோது, தமிழ் மொழி மூலமான சம்பந்தப்பட்ட பாடத்துறை வல்லுநர்கள் அல்லது அந்த வினாத்தாள்களைத் திருத்துபவர்கள் அல்லது சம்பந்தப் பட்ட பாட ஆசிரியர்களின் உதவிகளைப் பெறாமையாகும். இதனால், இலங்கை பூராவும் தமிழ் மொழிமூலம் பரீட்சைக்குத் தோற்றுகின்ற மாணவர்கள் meritஇல் பல்கலைக்கழக அனுமதியைப் பெறக்கூடிய சந்தர்ப்பம் உட்பட பல்கலைக்கழக அனுமதிக்கான சந்தர்ப்பத்தை இழக்கிறார்கள். கௌரவ கல்வி அமைச்சர் அவர்கள் இங்கு இல்லையென்றாலும், தயவுசெய்து இந்த விடயத்தை அவருக்குத் தெரியப்படுத்த வேண்டுமென நான் வலியுறுத்துகின்றேன்.

இந்த விடயம் தொடர்பாக 2022 பெப்ருவரி 15ஆம் திகதிய "வீரகேசரி" பத்திரிகையிலே ரூபசிங்கம் என்ற ஓர் ஆசிரியரால் எழுதப்பட்ட ஆக்கமொன்றும் பிரசுரிக்கப்பட்டிருந்தது. அதில் எவ்வாறு இந்தப் பிழைகளால் வினாக்களிலே பாதிப்புக்கள் ஏற்பட்டிருக்கின்றன என்று அவரால் தெளிவாகச் சொல்லப் பட்டிருக்கிறது. இவ்வாறான பிழைகள் உயிரியல் பாட வினாத் தாளில் மட்டுமல்ல, பல பாட வினாத்தாள்களிலும் இடம்பெற் றிருக்கின்றன. பொதுவாக வினாத்தாள்கள் சிங்கள மொழியில் தயாரிக்கப்பட்ட பிற்பாடு, எவ்வாறு கணித, விஞ்ஞானப் பாட வினாத்தாள்கள் தமிழுக்கு மொழிபெயர்க்கப்படுகின்றதோ, அவ்வாறு மொழிபெயர்க்கப்படுகின்றபொழுது இவ்வாறான தவறுகள் ஏற்படுத்தப்படுகின்றன. இதனால், தமிழ் மாண வர்கள் பெருமளவில் பாதிக்கப்படுகிறார்கள். க.பொ.த. உயர் தரப் பரீட்சைப் பெறுபேறுகளின் அடிப்படையில், இலங்கை யிலே கிட்டத்தட்ட 1,000க்கும் மேற்பட்ட தமிழ் மாணவர்கள் meritஇல் பல்கலைக்கழகத்துக்குத் தெரிவுசெய்யப்படக்கூடிய வாய்ப்புகள் இருந்தாலும், கடந்த வருடம் 200 பேர்தான் தெரிவுசெய்யப்பட்டிருந்தார்கள். ஆகவே, இந்த விடயத்திலே அரசாங்கமும் கல்வி அமைச்சரும் அதிக கவனத்தைச் செலுத்த வேண்டுமென நான் இந்த இடத்திலே பதிவுசெய்கிறேன்.

அடுத்து, வெளிநாட்டுப் பிரஜைகளுக்கும் இலங்கையர் களுக்கும் இடையிலான விவாகத்தைப் பதிவுசெய்தல் தொடர்பான விடயத்தையும் நான் இங்கு பதிவுசெய்ய விரும்புகிறேன். இலங்கையின் விவாகம் (பொது) பதிவு செய்தல் கட்டளைச் சட்டத்தின் 112ஆவது அத்தியாயத்தில் குறித்துரைக்கப்பட்ட நியதிகளை மாற்றத்துக்கு உட்படுத்தும் வகையிலும் 2022.01.01ஆம் திகதி முதல் நடைமுறைப் படுத்தப்படும் வகையிலும் பதிவாளர் நாயகத்தால் வெளியிடப் பட்டுள்ள 2021.10.18ஆம் திகதிய 18/2021ஆம் இலக்க சுற்றறிக்கையானது, இலங்கையிலிருந்து போர்ச் சூழலாலும் பொருளாதாரக் காரணிகளாலும் புலம்பெயரவேண்டிய நிர்ப்பந் தத்தின் அடிப்படையில், வெளிநாடுகளில் வாழும் இலங்கைத் தமிழர்களின் திருமணம் மற்றும் குடும்ப உறவுகளில் அதிகூடிய பாதிப்பை ஏற்படுத்தியிருப்பதாக நாம் உணர்கிறோம்.

இச்சுற்றறிக்கையை நடைமுறைப்படுத்துவதன்மூலம் வெளி நாடுகளில் வசிக்கும் இலங்கையர்கள், அதிலும் குறிப்பாக வடக்கு, கிழக்கு, மத்திய மற்றும் மேல் மாகாணங்களிலிருந்து புலம்பெயர்ந்து வெளிநாடுகளில் வாழும் இளைஞர், யுவதிகள் தத்தம் பண்பாடு, கலாசார, மரபியல் அடையாளங்களை ஒத்தவர்களை திருமணம் செய்யமுடியாத அபாய நிலையே உருவாக்கப்படும். இச்சுற்றறிக்கையின்மூலம் இலங்கையின் விவாகம் (பொது) பதிவுசெய்தல் கட்டளைச் சட்டத்தின்கீழ் விவாகப் பதிவை மேற்கொள்வதற்கு உரித்துப்பெற்ற, மாதாந்த வேதனமற்ற கௌரவ பதவியையுடைய கிராமிய விவாகப் பதிவாளர்கள் வெளிநாட்டுப் பிரஜைகளுக்கான விவாகப் பதிவை மேற்கொள்ள முடியாதென தடைசெய்து, அதற்கான அதிகாரத்தை மேலதிக மாவட்டப் பதிவாளர்களுக்கு வழங்கி யிருப்பது, கிராமிய விவாகப் பதிவாளர்களை அகௌரவப் படுத்தி, உளவியல் தாக்கங்களுக்கு உட்படுத்துவதாகவும் மாதாந்த வேதனமோ, நிலையான வருமானமோ அற்ற அவர்களுக்கு விவாகப் பதிவின்போது வழங்கப்படும் சிறு வருமானத்தை இல்லாமற் செய்வதாகவும் அமைந்துள்ள சமநேரத்தில், நிரந்தரமான மாத வேதனத்துக்கு உரித்துடைய அரச உத்தியோகத்தர்களான மேலதிக மாவட்டப் பதிவா ளர்கள் பிறிதொரு வழியில் வருமானத்தை ஈட்டுவதற்கான வாய்ப்பையும் ஏற்படுத்தியுள்ளது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

ஒரு நிமிடம் தாருங்கள்! வெளிநாடுகளிலிருந்து விவாகப் பதிவுக்காக இலங்கைக்கு வருகைதரும் தமிழ் இளைஞர், யுவதிகள் இலங்கையின் தேசிய பாதுகாப்பைக் காரணங் காட்டி, தமது விவாகப் பதிவுகளை மேலதிக மாவட்டப் பதிவாளர்மூலமே மேற்கொள்ள வேண்டுமென்பதும் ஆறு மாத காலத்தினுள் தாம் வதியும் நாட்டின் பாதுகாப்புப் பிரிவு அதிகாரியால் குறித்த நபர் குற்றவாளியல்லர் என்பதை சான்றுறுதிப்படுத்தி வழங்கப்படும் பாதுகாப்புத் தடைநீக்கல் அறிக்கையை - Security Clearance Report - கட்டாயமாகச் சமர்ப்பிக்க வேண்டுமென்பதும் இந்தியாவிலிருந்து வருகை தந்து இலங்கையின் மத்திய மற்றும் மேல் மாகாண உறவுகளைத் திருமணம் செய்பவர்களையே அதிகம் பாதிப்பதாக அமைந்துள்ளன. இச்சுற்றறிக்கையில் குறிப்பிடப் பட்டுள்ள நிபந்தனைகள் எவையும் சிங்கள மக்களின் திருமணச் சடங்குகளில் எவ்விதத் தாக்கத்தையும் ஏற்படுத்தப் போவதில்லை. மாறாக, இலங்கையில் வாழும் தமிழர்களையும் புலம்பெயர் நாடுகளில் வதியும் தமிழர்களையுமே பாதிப்பதாக அமைந்துள்ளன.

தமிழர்களைப் பொறுத்தமட்டில் தனிமனித வாழ்வின் பிரதான அங்கமாகவுள்ள திருமணம் என்பது மத, மொழி, கலாசார, பண்பாட்டு விழுமியங்களின் அடிப்படைக் கூறாக, அக்கூறுகளிலிருந்து பிரித்துப் பார்க்க முடியாத ஓர் அடையாள மாகவே காலங்காலமாக பின்பற்றப்பட்டு வருகிறது. இந்நிலையில் மேற்படி சுற்றுநிருபத்தில் குறிப்பிடப்பட்டுள்ள "பிரதேச செயலகத்தில் கடமையாற்றும் மேலதிக மாவட்டப் பதிவாளர்மூலமே திருமணத்தைப் பதிவு செய்ய முடியும்" என்ற விடயமானது, முகூர்த்த தினமொன்றில் குறிக்கப்பட்ட சுப நேரத்தில் அதிக எண்ணிக்கையிலான திருமணங்களைப் பதிவுசெய்ய முடியாத நிலைக்கு வழிகோலுவதோடு, தமிழர் களின் மத, பண்பாட்டு வரையறைகளில் பிறழ்வை ஏற்படுத்தும் வகையிலான நடைமுறைச் சிக்கல்களையும் மேலெழச் செய்வதாக உள்ளது. ஏற்கனவே, மத்திய மற்றும்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

மேல் மாகாணங்களில் வாழும் தமிழர்கள் பிறப்பு, இறப்பு, விவாகப் பதிவுகளில் மொழி ரீதியான ஆதிக்கத்துக்கு உள்ளாக் கப்பட்டு வருகிறார்கள் என்று கூறி, நேரம் இடம்கொடுக் காமையால் எனது உரையை நிறைவுசெய்கிறேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is, the Hon. Vijitha Herath. You have seven minutes.

[අ.භා. 1.39]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැවිලි ඇමතිතුමා කිව්වා, තේ වගාව දියුණු කරලා ඩොලර් මිලියන 5,000ක් ලාභ හොයන්න බලාපොරොත්තු වනවා කියලා. නමුත්, දැන් තත්ත්වය ඊට වඩා සම්පූර්ණයෙන් වෙනස්. අද වනකොට පොහොර නැතිව තේ ගොවියාට විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. පසුගිය කාලය පුරාවටම ආණ්ඩුව නිසි ප්‍රමිතියෙන් යුක්ත පොහොර තේ වගාකරුවන්ට ලබා දුන්නේ නැහැ. අදටත් ඒ ප්‍රශ්නය එහෙමම තිබෙනවා. සාමාන්‍යයෙන් අද වනවිට තේ පොහොර මිටියක් රුපියල් 7,000ක්, රුපියල් 8,000ක් පමණ වනවා. පොහොර මිල වැඩිවීම නිසා දැන් තේවලට පොහොර යෙදීම අඩු වීම හේතුකොටගෙන තේ ඵලදාවත් අඩු වෙලා තිබෙනවා. වෙනදා තේ දලු කිලෝ 500ක් කඩපු තැනකින් අද කඩන්නේ තේ දලු කිලෝ 200ක් පමණයි. ජනාධිපතිතුමා ඉදිරිපිටදීම තේ වගාකරුවන් ඉතා පැහැදිලිව ඔවුන්ගේ මේ දුක්ගැනවිල්ල කිව්වා. ඇස්තමේන්තු හදලා ඉලක්ක ගැන කථා කළාට ඇත්තටම අපේ රටේ ඩොලර් උපයන ප්‍රධාන අපනයන ආදායමක් වූ තේ වගාවටත් දැන් කණ කොකා හඬා තිබෙන්නේ. ඒ නිසාම බරපතළ ගැටලු තත්ත්වයකට තේ ගොවියා මුහුණ දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ තත්ත්වය නිසාම අද වනකොට තේ ගොවියා තේ වගාවෙන් ඉවත් වන්න පටන් ගෙන තිබෙනවා. අද වනවිට එන්න එන්නම තේ වගාකරුවන්ට තේ වගාව එපා වෙලා එතැනින් ඉවත් වන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. එම නිසා අපට ඩොලර් උපයන්න පුළුවන් ප්‍රධානම ආර්ථික මාර්ගය අද වනකොට මේ ආණ්ඩුව විසින් විනාශ කරලා තිබෙනවා.

රබර් වගා කිරීමට, රබර් වගාව ප්‍රවර්ධනය කිරීමට අණ පනත් ගෙනෙන එක හොඳයි. නමුත්, ප්‍රායෝගිකව මේ දවස්වල තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි, පැළ බෙදීම. විශේෂයෙන් කුරුඳු පැළ බෙදා දෙනකොට අපි දැකපු දේ තමයි මන්ත්‍රීගේ ලිස්ට් එකට ඒ පැළ බෙදා දීම. මන්ත්‍රීගේ ලිස්ට් එකේ නම නැත්නම් කුරුඳු පැළ හම්බ වන්නේ නැහැ. එවැනි තත්ත්වයකට අද මේ රට වට්ටලා තිබෙන්නේ.

වැවිලි ඇමතිතුමා කිව්වා, වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුප ලබා දෙනවා කියලා. නමුත්, අඩුම ගණනේ රජයේ සමාගම්වල වැඩ කරන වතු කම්කරුවන්ටවත් තවම රුපියල් 1,000ක දෛනික වැටුප ලබා දෙන්නේ නැහැ. එම නිසා පෞද්ගලික වතු සමාගම් ඒ දෛනික වැටුප ලබා නොදෙන එක පිළිබඳ ප්‍රශ්නය එහෙමම තිබියදී රජයේ සමාගම් ද තවම එම දෛනික වැටුප ලබා නොදී ඉන්නවා. එය ලබා දෙන්න ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා නම්, ආදර්ශයක් විධියට හෝ අඩුම ගණනේ රජය සතු සමාගම්වල වැඩ කරන වතු කම්කරුවන්ටවත් රුපියල් 1,000ක දෛනික වැටුප ලබා දෙන්න රජයට වගකීමක්, බැඳීමක් තිබෙනවා. නමුත්, ඒකවත් තවම ක්‍රියාත්මක වන්නේ නැහැ. වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුපක් දෙනවා කියලා මහා ලොකුවට රජය පම්පෝරි ගැහුවා තමයි. හැබැයි ඒ දවස්වලම අපි කිව්වා, ඒ කාර්යය නියමානුකූලව වෙන්නේ නැහැ කියලා. සමහරු මෙය දෙනවා කිව්ව සතුටට කිරිබත් පවා කෑවා. දැන් නම්, පිටිත් ගණන් ගිහිල්ලා, හාලුත් ගණන් ගිහිල්ලා, සීනිත් ගණන් ගිහිල්ලා, පරිප්පුත් ගණන් ගිහිල්ලා. එම නිසා වතු කම්කරුවන්ට රොටියයි, පරිප්පු ටිකයි කන්නවත් පුළුවන් තත්ත්වයක් දැන් නැහැ. ඇත්තටම දැන් රුපියල් 1,000ක දෛනික වැටුපක් වැඩක් නැහැ. රුපියල් 1,000ක් නොවෙයි, දැන් රුපියල් 2,000කවත් දෛනික වැටුපක් වතු කම්කරුවන්ට දෙන්න ඕනෑ. මොකද, බඩු මිල වැඩි වෙලා - වැඩිම උද්ධමනයත් ඇති වෙලා- ජීවන වියදම වැඩි වනකොට රුපියල් 1,000ක දෛනික වැටුපක් ප්‍රමාණවත් නැහැ. නමුත්, පොරොන්දු වෙච්ච රුපියල් 1,000ක දෛනික වැටුපවත් තවම වතු කම්කරුවන්ට ලබා දුන්නේ නැහැ. ඒක නොදෙන්න තමයි වෙන උපක්‍රමයක් පාවිච්චි කළේ. ඉතා පැහැදිලිවම සේවකයන්ගේ ජාතික අවම වේතනය පිළිබඳ පනත සංශෝධනය කරන්න යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කළා නම්, අද වනකොට වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුප ලැබෙනවා. නමුත්, ඔබතුමන්ලා ඒ පුංචි දේවත් කළේ නැහැ. ඔබතුමන්ලා කළේ, සාප්පු හා කාර්යාලයීය සේවකයන් සම්බන්ධයෙන් වූ පනත සංශෝධනය කරන්න කටයුතු කරපු එකයි. නමුත්, දැන් ඒකටත් උසාවියට ගිහිල්ලා තිබෙනවා. අවුරුදු දෙකක් තිස්සේ තවම වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුප දෙන්න බැරි වුණා. ජනාධිපතිතුමා මහා ලොකුවට පොරොන්දු දුන්නා, මාර්තු පළමුවෙනි දා ඉඳලා වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුප ලබා දෙනවා කියලා. නමුත් දැන් අවුරුදු දෙකක් වනවා, තවමත් අපේ රටේ වතු කම්කරුවන්ට රුපියල් 1,000ක දෛනික වැටුප ලබා දීලා නැහැ. තේ වගාව දියුණු කරලා එහෙම නැත්නම් වතු වගාව දියුණු කරලා රටට ඩොලර් ගේන්න පුළුවන්කම තිබියදී අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව කරන්නේ මේ කටයුතු සම්පූර්ණයෙන්ම අර්බුදයට පත් කිරීමක්.

ඒ විතරක් නොවෙයි. මට මතකයි, එක සහල් ඇටයක් අපි පිට රටින් ගේන්නේ නැහැ කියලා කෘෂිකර්ම ඇමතිවරයා කිව්වා. සහල් ඇටයක් හෝ පිට රටින් ගෙනාවොත් කෘෂිකර්ම ඇමතිකමෙන් ඉවත් වනවා කියලා එතුමා කිව්වා. නමුත්, පසුගිය මාස තුන ඇතුළතදී පිට රටින් සහල් කිලෝග්‍රෑම් කෝටි 35ක් ගෙනැල්ලා තිබෙනවා.

ඇත්තටම අපේ දෛනික සහල් අවශ්‍යතාව කිලෝග්‍රෑම් ලක්ෂ 60යි. ඒ කිලෝග්‍රෑම් ලක්ෂ 60න් කිලෝග්‍රෑම් ලක්ෂ 40ක්ම පිට රටින් ගෙනෙන සහල්. විශේෂයෙන් ඉන්දියාවෙන්, බංග්ලාදේශයෙන් සහ පාකිස්ථානයෙන් ගෙනෙන සහල්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, you have two more minutes.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

අද වෙනකොට සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් සම්පූර්ණයෙන් කඩා වැටිලා. මෝල් හිමියෝ 500කට විතර තමන්ගේ කර්මාන්තය පවත්වාගෙන යන්න බැරි තත්ත්වයට පත්

වෙලා තිබෙනවා. සල්ලි උපදවන අය - මේ රටේ ගොවි ජනතාව ශක්තිමත් කරන මෝල් හිමියන් කඩා වැටෙන්නේ ඔබතුමන්ලා සහල් ආනයනය කිරීමට ගත්ත ප්‍රතිපත්තිය නිසා. අද සමහර බාල වර්ගයේ සහල් පවා පාරිභෝගිකයන්ට ආහාරයට ගන්න සිදු වෙලා තිබෙන්නේ මේ වැරදි ප්‍රතිපත්තියත් එක්කයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය, අර්බුදය තෙල් අර්බුදයයි. දැන් තෙල් නැහැ. තෙල් නැති නිසා ෂෙඩ්වල පෝලිම. කරන්ට් කපනවා. අද හැන්දෑ වෙනකොට කෙරවලපිටියට අවශ්‍ය තෙල් ටික දී ගන්න බැහැ. නැවක් ඇවිල්ලා තිබෙනවා, දවස් තුනක සිට. නමුත්, ඒ තෙල්වලට සල්ලි ගෙවනතුරු ගොඩ බාන්නේ නැහැ. දැන් දවස් තුනක විතර සිට තෙල් ටික නැවේ තිබෙනවා. තවම ඒ ටික ගොඩ බාලා නැහැ. එතකොට රටේ තෙල් නැහැ. දැන් හැම තැනම තෙල් පෝලිම් ගැහිලා. ඉතින් ඒ ප්‍රශ්නයට තවම උත්තරයක් නැහැ. ඒකට හදිසි කැබිනට් රැස්වීම් තියනවා කියනවා. ඒවායින් මොන තීන්දු ගත්තත් පසුගිය කාලය පුරාවටම ඇත්ත ප්‍රශ්නයට උත්තරයක් ඇවිල්ලා නැහැ. තෙල් විෂයය භාර ඇමති එකක් කියනවා, විදුලිය විෂයය භාර ඇමති තව එකක් කියනවා. ඒ ඇමතිවරුන්ගේ රණ්ඩුව තමයි අපට බලන්න වෙලා තිබෙන්නේ. කබ්රාල් බැංකුවලට කියනවා, ණය දෙන්න එපා කියලා. ණය දෙන්න එපා කිව්වාම, තෙල් ගන්න සල්ලි නැති වෙනවා. රුපියල් මිලියන 290ක් ගෙවන්න තිබෙනවා. ඒක ගෙවා ගන්න බැරි නිසා තෙල් ටික දෙන්නේ නැහැ; ගොඩ බාන්නේ නැහැ. ඒ නිසා ඒ ටික එතැන හිර වෙලා තිබෙනවා. ඒකට උත්තරයක් නැහැ.

විශේෂයෙන්ම මේ දවස්වල අපොස (උසස් පෙළ) විභාගය පැවැත්වෙනවා. අද රෑ ලයිට් කපන කොට කොහොමද ළමයින් පාඩම් කරන්නේ? හෙට කොහොමද විභාගය ලියන්නේ? මේකට ආණ්ඩුවේ උත්තරය මොකක්ද? ඩොලර් මිලියන 5,000ක ආදායමක් ලබන්න පුළුවන්, මෙච්චර මෙච්චර ආදායමක් ලබන්න පුළුවන් කියලා කටින් බතල හිටෙව්වාට ඔබතුමන්ලා ඇත්ත ප්‍රශ්නවලට උත්තර දීලා නැහැ. මේ වෙනකොට රටේ තිබෙන ප්‍රධානම අර්බුදය, අද දවසේ තිබෙන ප්‍රධානම අර්බුදය තෙල් අර්බුදය සහ විදුලිය අර්බුදයයි. මේ ප්‍රශ්නය නිසා සමස්ත කර්මාන්ත කඩා වැටිලා තිබෙනවා. රබර් කර්මාන්තයත් කඩාගෙන වැටෙනවා, තේ කර්මාන්තයත් කඩාගෙන වැටෙනවා. හෙට අනිද්දා වෙනකොට අනිවාර්යයෙන්ම තවත් වටයකින් තෙල් මිල ඉහළ යනවා. නමුත් මේ ප්‍රශ්නවලට උත්තරයක් ලබා දීලා නැහැ. මේක තමයි ආණ්ඩුවේ බැරිකම ඔප්පු කිරීම.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you. The next speaker is the Hon. (Dr.) V.Radhakrishnan. You have five minutes.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

No, I have been allotted eight minutes.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Your time has been reduced to five minutes because of the delay occured earlier.

[பி.ப. 1.46]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, விளைபொருட் தரகர்களுக்கு உரிமமளித்தற் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான இன்றைய விவாதத்தை ஆரம்பித்துவைத்த கௌரவ பெருந்தோட்ட அமைச்சர் அவர்கள் பெருந்தோட்டங்களை அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகள் பற்றி இங்கு பேசினார். அமைச்சர் அவர்கள் பெருந்தோட்ட அபிவிருத்தி சம்பந்தமாகப் பேசியபோது, எனக்கு மிகவும் சந்தோஷமாக இருந்தது. ஆனாலும், பெருந்தோட்டத்திலே வேலைசெய்கின்ற மக்களுடைய ஊதியத்தைப் பற்றிப் பேசவேண்டிய அவசியம் எங்களுக்கு இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் பேசும்போது, "1,000 ரூபாய் சம்பள உயர்வு தொடர்பாக பெருந்தோட்டக் கம்பனிகள் இப்பொழுது நீதிமன்றத்துக்குச் சென்றிருக் கின்றன; நீதிமன்றத் தீர்ப்பு வரும்வரைக்கும் எங்களால் ஒன்றும் செய்யமுடியாது" என்று சொன்னார். இது ஒரு நொண்டிச்சாட்டாகும். அந்த நொண்டிச்சாட்டை வைத்துக் கொண்டு, காலத்தை இழுத்தடிப்பதற்கான நடவடிக்கையைத் தான் இப்பொழுது இந்த முதலாளிமார் சம்மேளனம் செய்துகொண்டிருக்கின்றது. ஆகவே, அரசாங்கம் இதில் தலையிட்டு, உடனடியாக நடவடிக்கையெடுக்க வேண்டும் என்பதை நாங்கள் இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

இன்று விலைவாசி மிகவும் அதிகரித்திருக்கின்ற சூழ் நிலையில், தோட்டத் தொழிலாளர்களுக்கு இந்த நிலைமை ஏற்பட்டிருப்பது மிகவும் விசனத்துக்குரிய ஒரு விஷயமாகும். அந்த மக்களைச் சமாதானப்படுத்துவதற்காக மாதாந்தம் சலுகை விலையில் 15 கிலோகிராம் கோதுமை மா விநியோகிக்கப்பட்டு வருகின்றது. இந்தக் கோதுமை மா விநியோகம் என்பது, தோட்டத் தொழிலாளர்களைத் தொடர்ந்தும் மந்த போசணை நிலையிலே வைத்திருக்கின்ற ஒரு நிலைமையை உறுதிப்படுத்துவதற்கான நிகழ்ச்சிநிரலே தவிர, அந்த மக்களுடைய போசாக்கு மட்டத்தை அதிகரிப் பதற்கான நடவடிக்கை அல்ல.

" தமிழ் முற்போக்குக் கூட்டணியினர் 50 ரூபாய் சம்பள உயர்வைக்கூடப் பெற்றுக்கொடுக்கவில்லை; ஆனால், நாங்கள் இப்பொழுது கோதுமை மா கொடுக்கின்றோம்; அதற்கு 120 மில்லியன் ரூபாய் செலவழித்திருக்கிறோம்" என்றெல்லாம் நுவரெலியா மாவட்ட மக்கள் பிரதிநிதிகள் சொன்னார்கள். தமிழ் முற்போக்குக் கூட்டணி மலையக மக்களுக்கு என்னென்ன செய்திருக்கின்றது என்பதைப் பட்டியல் போட்டுச் சொல்லமுடியாது. கடந்த நல்லாட்சிக் காலத்தில் - 4 வருட காலத்தில் - தமிழ் முற்போக்குக் கூட்டணி நுவரெலியா மாவட்ட மக்களுக்கு அரசியல் ரீதியான உரிமைகளைப் பெற்றுக்கொடுத்தது. அதாவது, பிரதேச சபைகளின் எண்ணிக்கையை அதிகரித்துக் கொடுத்தோம்; புதிய பிரதேச செயலகங்களை உருவாக்க நடவடிக்கை யெடுத்தோம். அதுமாத்திரமன்றி, அங்குள்ள பாடசாலைகளை அபிவிருத்தி செய்ய நடவடிக்கையெடுத்தோம்; தோட்டங் களிலே வீடுகளைக் கட்டிக்கொடுத்தோம்.

இவ்வளவு விஷயங்களையும் செய்த நாங்கள், இப்பொழுது ஒட்டுமொத்த தமிழ் மக்களின் பிரச்சினைகள் தொடர்பில் கவனஞ் செலுத்தி வருகின்றோம். அந்த அடிப்படையில், ஒரு குழுவினுடைய ஆலோசனைகளைப் பெற்று, 13ஆவது

[ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා]

திருத்தச் சட்டம் இந்த நாட்டிலே தொடர்ந்தும் இருக்க வேண்டுமென்றும் அது முழுமையாக நடைமுறைப்படுத்தப்பட வேண்டுமென்றும் கோரி தமிழ் முற்போக்குக் கூட்டணி சார்பில் ஓர் ஆவண அறிக்கையைத் தயார்செய்து இலங்கை அரசாங்கத் துக்கும் எதிர்க்கட்சித் தலைவருக்கும் இந்திய அரசாங்கத்துக்கும் பிரித்தானிய அரசாங்கத்துக்கும் கொடுப்பதற்கு நடவடிக்கை எடுத்திருக்கிறோம். தோட்டத் தொழிலாளர்களுடைய அல்லது மலையக மக்களுடைய அல்லது இந்திய வம்சாவளி மக்களு டைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு இந்தக் காலகட்டத் திலேயாவது இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென்று நாங்கள் கேட்டுக்கொள்கிறோம்.

இன்று கச்சதீவிலுள்ள புனித அந்தோனியார் கோவிலுக்கு இந்திய மக்களும் இலங்கை மக்களும் தனியாகப் போய் சுயாதீனமாக தெய்வ வழிபாடு செய்வதற்குக்கூட முடியாம லிருக்கின்றது. கச்சதீவு என்பது, முதலிலே இந்தியாவுக்குச் சொந்தமாக இருந்தது. அதன் பின்னர் அது இலங்கைக்குத் தாரைவார்த்துக் கொடுக்கப்பட்டது. ஆனால், இன்று இரண்டு சாராராலும் அங்கு போய் நிம்மதியாக சாமி கும்பிடுவதற்குக் கூட முடியாது நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆகவே, அங்கு மக்கள் போய் முறையாக வழிபடுவதற்கான சந்தர்ப்பத்தை உருவாக்கிக்கொடுக்க வேண்டும் என்பதை நாங்கள் தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம்.

அடுத்து, இன்று சில கம்பனிகள் தோட்டத் தொழிலாளர் களின் சம்பளத்தை 1,500 ரூபாய் வரைக்கும் உயர்த்துவதற்கு நடவடிக்கை எடுத்து வருகின்றன. குறிப்பாக, LOLC Company இன்று 1,500 ரூபாய் வரைக்கும் சம்பளம் கொடுப்பதற்குத் தயாராக இருக்கின்றது. ஆனால், இது சம்பந்தமாக நீதிமன்றத்தில் தொடரப்பட்டுள்ள வழக்கை வைத்துக்கொண்டு, இன்று முதலாளிமார் சம்மேளனம் இந்த மக்களின் சம்பளத்தை உயர்த்தாமல் இழுத்தடிப்புச் செய்வதை நாங்கள் வன்மையாகக் கண்டிக்கிறோம் என்பதையும் நான் இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
Please give me one more minute, Sir. இன்று இந்த நாடு வங்குரோத்து நிலையை அடைந்துவிட்டது என்று சொல்கி றார்கள்.

අද අපි සියලුදෙනාම කියනවා, රට බංකොලොත් වෙලා කියලා. රට බංකොලොත් වෙලා නොවෙයි, රටේ දේශපාලනය බංකොලොත් වෙලා තිබෙනවා. රටේ ආර්ථිකය බංකොලොත් වෙලා තිබෙනවා. රටේ system එක බංකොලොත් වෙලා තිබෙනවා. කවදාවත් අපේ රට බංකොලොත් වෙන්නේ නැහැ. මේ රටට අවශ්‍ය ශක්තිය තිබෙනවා. නමුත්, ආණ්ඩුව මේ කටයුතු හරියට කරන්නේ නැති නිසා තමයි, අද අපි මේ තත්ත්වයට වැටිලා තිබෙන්නේ කියන එක මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Ashok Abeysinghe. You have six minutes.

[අ.භා.1.51]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තිබෙන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ කථා කරන්න. එහිදී

රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳ කථා කරනවා. වැවිලි කර්මාන්තය ගැන කථා කරද්දී අද රට මුහුණ පා තිබෙන බලශක්ති අර්බුදය ගැන කථා නොකරම බැරි තත්ත්වයකට පත්ව තිබෙනවා. කෙසේ වෙතත්, වැවිලි කර්මාන්තය ගැන වචන කිහිපයක් මේ අවස්ථාවේදී මම කථා කරන්න ඕනෑ.

2018 වසරේ රබර් නිෂ්පාදනය තිබුණේ කිලෝග්‍රෑම් මිලියන 84යි. 2020 වසර වනකොට ඒ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 78කට අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම 2018 වසරේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 325ක් පමණ ප්‍රමාණයක් තමයි තිබුණේ. මේ වන විට කිලෝග්‍රෑම් මිලියන 275 දක්වා ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. පොල් ගෙඩි මිලියන 3,000කට වැඩිය තිබුණු පොල් එලදාව මෙවර මිලියන 2,700ට වඩා අඩු වෙලා තිබෙනවා. මෙට්‍රික්ටොන් ලක්ෂ 51ක් තිබුණු වී නිෂ්පාදනය මේ වසරේ අඩු වෙලා තිබෙනවා. මේ සියල්ලටම පොහොර ප්‍රශ්නය තමයි බලපාන්නේ.

ඊයේ-පෙරේදා තේ නිෂ්පාදනය කරන පැත්තකට ජනාධිපතිතුමා ගියාම ගොවීන් කියනවා මම දැක්කා, කිලෝග්‍රෑම් 500ට තිබුණු අපේ නිෂ්පාදනය දැන් කිලෝග්‍රෑම් 200ට අඩු වෙලා තිබෙනවා කියලා. මේ පිළිබඳව කියද්දී ජනාධිපතිතුමා කියනවා, "අපි අවුරුදු දෙකක් පොහොර නිකම් දුන්නා" කියලා. ඒ නිසා ජනාධිපතිතුමා දැනුවත් කරන්න ඕනෑ, තේවලට පොහොර නිකම් දුන්නේ නැහැ කියලා. තේ වගාව සඳහා රුපියල් 1,200ක මිලකට තමයි පොහොර බෑග් එකක් දුන්නේ. ඒ නිසා තේ වගා කරන පැත්තකට ගිහිල්ලා පොහොර නිකම් දුන්නා කිව්වාම ඒක විහිළුවකට ලක් වෙනවා. ඒ නිසා මෙවැනි දේවල් පිළිබඳ ජනාධිපතිතුමා දැනුවත් කරන්න ඕනෑ.

ඊයේ ලංකාවේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් කැඳවා ජනාධිපතිතුමා සාකච්ඡාවක් පැවැත්වූවා අපි දැක්කා. ඒ අවස්ථාවේ එතුමා ඒ ව්‍යාපාරිකයන්ට ආරාධනා කළා, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්න ඒ ක්ෂේත්‍රවලට ආයෝජනය කරන්න කියලා. බලශක්ති ක්ෂේත්‍රයට -සුළං විදුලි බලාගාර, සූර්ය විදුලි බලාගාර සඳහා- ආයෝජනය කරන්න කිව්වා. හැබැයි, එතුමාට අමතක වෙලා තිබෙනවා, මේ අය වැයෙන් ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන්ට අවමය මිලියන 500ක -කෝටි 50ක- අධිභාරයක් පනවා තිබෙනවාය කියන එක. ඒ ගොල්ලන්ගේ ලාභයට අවම කෝටි 50ක අධිභාරයක් පනවලා තිබෙනවා. ලාභය රුපියල් මිලියන 2,000කට තමයි අධිභාරයක් පනවනවා කියලා කියන්නේ. රුපියල් මිලියන 2,000ක් කියන්නේ, රුපියල් බිලියන දෙකක්. රුපියල් බිලියන දෙකෙන් සියයට 25ක් කියන්නේ, කෝටි 50ක්. අය වැයෙන් කෝටි 50ක අධිභාරයක් ඒ අයට පනවලා, ඒ අය ගෙන්වලා කියනවා, අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න බලශක්ති ක්ෂේත්‍රය වෙනුවෙන් ආයෝජනය කරන්න

කියලා. ඒක මොන විහිළුවක්ද? ජනාධිපතිතුමා දන්නේ නැද්ද, අවමය කෝටි 50 ගණනේ ඒ ව්‍යාපාරිකයන්ගෙන් බදු අයකර තිබෙනවා කියලා? එවැනි තත්ත්වයක් තිබෙද්දී මුදල් ඇමතිවරයා කියනවා අපි දැක්කා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයක් නැහැ කියලා. නමුත්, එතුමා එහෙම කියනකොට අපේ රටේ දෙමව්පියන් කිරි පිටි ගන්න පෝලිමේ ඉන්නවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයක් නැත්නම් කිරිපිටි ගන්න පෝලිමේ ඉන්නේ කොහොමද?

ඉන්ධන හිඟයක් තිබෙනවා. ඉන්ධන කියන්නේත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක්. ඉන්ධන හිඟයක් තිබෙන නිසා ජනතාව ඉන්ධන ගන්න මේ දවස්වල පෝලිම්වල ඉන්නවා. එතකොට මුදල් ඇමතිවරයා කියනවා, රටේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයක් නැහැ කියලා. රටේ හැම තැනකම පෝලිම් තිබෙද්දී ජනාධිපතිවරයා ඉදිරිපිට මුදල් ඇමතිවරයා කියනවා, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයක් නැහැ කියලා. හැබැයි, පාරට ගිහිල්ලා බලනකොට හැම තැනම පෝලිම් දකින්න තිබෙනවා. ඒ වාගේම හැම වෙලාවේම හිනා වෙවී කථා කරන අපේ මහ බැංකු අධිපතිවරයා කියනවා, "අපට ඩොලර් ප්‍රශ්නයක් නැහැ. අපේ රටට ඕනෑ තරම් සංචාරකයෝ එනවා, සංචාරකයෝ එන නිසා ප්‍රශ්නයක් වෙන එකක් නැහැ." කියලා. මම නම් එතුමාට කියන්නේ ආර්ථික ඝාතකයා කියලා. හැබැයි, එහෙම තිබෙද්දී උදය ගම්මන්පිල ඇමතිතුමා කියනවා, "අපට ඉන්ධන නැව් දෙකක් ඇවිල්ලා තිබෙනවා, ඒක ගන්න ඩොලර් මිලියන 35ක් හොයා ගන්න බැහැ" කියලා. බැංකුවලට උපදෙස් දීලා තිබෙනවා, ඉන්ධන ගන්න බලශක්ති අමාත්‍යාංශයට සල්ලි දෙන්න එපා කියලා.

එවැනි තත්ත්වයක් තමයි මේ රටේ තිබෙන්නේ. එක පැත්තකින් ජනතාව රවට්ටනවා. තවත් පැත්තකින් ජනාධිපතිතුමා ඉස්සරහ රට පිළිබඳ වෙනම චිත්‍රයක් මවනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. මහ බැංකු අධිපතිවරයා කියනවා නම්, "කිසිම ප්‍රශ්නයක් නැහැ, ඕනෑ තරම් සංචාරකයෝ ලංකාවට එනවා, අපට ඩොලර් තිබෙනවා" කියලා, එහෙම නම් ඉන්ධන නැව මුදා ගන්න ඩොලර් මිලියන 35ක් හොයා ගන්න බැරි වෙලා තිබෙන්නේ කොහොමද? ඩොලරයට ගෙවන මුදල ස්ථාවර තත්ත්වයේ තියා ගන්න ඩොලර් මිලියන 300ට වැඩි ප්‍රමාණයක් පසුගිය මාසයේ වියදම් කර තිබෙන බව මාධ්‍යයෙන් අපි දැක්කා. ඒ ඩොලර් පුච්චනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒ කියන්නේ, ඩොලරය සඳහා ගෙවන මුදල ස්ථාවර තත්ත්වයේ තියා ගන්න විශාල ඩොලර් ප්‍රමාණයක් වියදම් කර තිබෙනවා. මේ වන විට අපේ සංචිත ඩොලර් බිලියනයකට වඩා අඩු වෙලා තිබෙනවා. තව මාස කිහිපයකින් බලශක්තිය -විදුලිය සහ ඉන්ධන- මේ රටට නැති වුණොත් මොකද වෙන්නේ? දැනටමත් මේ රටේ බලශක්ති අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. බලශක්ති ඇමතිවරයාම කියනවා, තව මාස එකහමාරකින්, දෙකකින් අපට ඉන්ධන ගෙනෙන්න බැරි වෙනවා කියලා. හැබැයි, සමහර ඇමතිවරු කියනවා, "නැහැ කිසිම ප්‍රශ්නයක් නැහැ, තව මාස දෙක තුනකින් මේ ප්‍රශ්නය විසඳනවා" කියලා. මොකක්ද මේ කියන්නේ? රටේ ජනතාවට ඇත්ත කියන්න. රට ආර්ථික අර්බුදයකට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා විශාල ප්‍රශ්න රාශියක් මතුව තිබෙනවා. අද ජනතාවට ජීවත් වෙන්න විධියක් නැතිව තුන්වේල කන්න බැරි වන තත්ත්වයකට පත්ව තිබෙනවා. රටට අවශ්‍ය ඉන්ධන ටික ගන්න බැරි වුණොත් මොකක්ද වෙන්නේ?

අද උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට කරුවලේ පාඩම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අද රටේ විදුලිය නැහැ; ඉන්ධන නැහැ. මෙහෙම තත්ත්වයක් තිබෙද්දී මේ රටේ ආර්ථික අහේනියක්, ආර්ථික අර්බුදයක් නැහැ කියලා කියන්නේ කොහොමද?

රටේ ජනාධිපති රවට්ටන්න එපා. හැම තැනම රැවටීමයි තිබෙන්නේ. ගොවීන්ගේ ප්‍රශ්නය ගැන කථා කරනකොට කියනවා, අපි අවුරුදු දෙකක් පොහොර නිකම් දුන්නා කියලා. අවුරුදු දෙකක් පොහොර නිකම් දුන්නා කිව්වාට, තේ වගාවට නිකම් පොහොර දීලා නැහැනේ.

මේ සියල්ල ආණ්ඩුව විසින්ම ඇති කර ගත්ත ප්‍රශ්න. ආණ්ඩුව බලයට පත් වුණු වහාම රුපියල් බිලියන 600කින් රාජ්‍ය ආදායම අඩු කර ගත්තා. ඒ ආදායම අඩු කර ගැනීමේ ප්‍රතිඵලය නිසා අපේ රටට විදේශ ණය ගන්න බැරිව ගියා. අපට අද ණය ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. අද වෙද්දී අපේ රාජ්‍ය ආදායම මදි වෙලා තිබෙනවා ණය වාරික සහ පොලිය ගෙවන්න. රාජ්‍ය ආදායම බිලියන 1,500ක් වෙද්දී බිලියන 2,500ක් ණය වාරික සහ පොලිය තිබෙනවා. රාජ්‍ය වියදමින් සියයට 71ක් පොලිය ලෙස ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මේක විශාල ප්‍රශ්නයක්.

අපට දිනපතා අවශ්‍ය මෙගාවොට් 2,600ක විදුලිබල ප්‍රමාණය අද වෙනකොට සපයා ගන්න බැරි වෙලා තිබෙනවා. නමුත් අපට මෙගාවොට් 4,000ක විදුලිබල ධාරිතාවක් තිබෙනවා. පසුගිය දිනවල නම් කිව්වේ, අපි ඉන්දියාවටත් විදුලිය දෙනවා කියලායි. ඉන්දියාවටත් විදුලිය දෙනවා කිව්වාට, දැන් ලංකාවේ පැය තුන හතරක් විදුලිය කපන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එම නිසා අපි කියන්නේ රටේ ජනතාවට ඇත්ත කියන්න,ජනාධිපතිතුමා රවට්ටන්න එපා කියලායි. ඇමතිවරු ඇත්ත කියලා, සත්‍ය තත්ත්වය පැහැදිලි කරලා දීලා මේ අර්බුදය විසඳා ගන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා අපි විශේෂයෙන්ම කියනවා. එහෙම කරන්න බැරි නම් කරන්න පුළුවන් කෙනෙකුට ආණ්ඩු බලය දීලා යන්න. සමගි ජන බලවේගයට මේ රට ගොඩ නඟන්න, ආර්ථිකය ගොඩ නඟන්න පුළුවන් බව මා ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. Vijitha Berugoda. You have ten minutes.

[අ.භා.1.57]

**ගරු විජිත බේරුගොඩ මහතා (දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித பேருகொட - அறநெறிப் பாடசாலைகள், பிரிவேனாக்கள் மற்றும் பிக்குமார் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Vijitha Berugoda -State Minister of Dhamma Schools, Pirivenas and Bhikkhu Education)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විවාදයේදී රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳ අදහස් දක්වන්න මා බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, ඉතිහාසයේ ඉඳලාම අපේ රට කෘෂි කාර්මික රටක් බව. ඒ කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙනවා. එකක්, ව්‍යාපාරික කෘෂි කර්මාන්තය. අනෙක් එක, පාරිභෝගික කෘෂි කර්මාන්තය.

ව්‍යාපාරික කෘෂි කර්මාන්තය ගැන කථා කරන කොට, තේ, පොල්, රබර් තමයි ප්‍රධාන අපනයන භෝග විධියට අපි පාසල් යන

[ගරු විජිත බේරුගොඩ මහතා]

කාලයේ ඉඳලාම ඉගෙන ගත්තේ. පසු කාලීනව වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය තුළින් අපේ රට ලෝකය හා සම්බන්ධවීමත් සමඟ වැවිලි කර්මාන්තය කියන විෂය පුළුල් වුණා. තේ, පොල් හා රබර්වලට එහා ගිය සාම්ප්‍රදායික නොවන අපනයන පිළිබඳව විශේෂ අවධානයක් යොමු වුණා. ඒ අනුව අපනයන ක්ෂේත්‍රයත් පුළුල් වුණා. නමුත් තේ, පොල්, රබර් කියන ඒවා තමයි තවම අපේ රටේ ප්‍රධාන අපනයන ආදායම් අතරට එක් වෙලා තිබෙන්නේ. එහි ප්‍රතිශතය වෙනස් වෙන්න පුළුවන්.

රබර් කියන වැවිලි භෝගය ඉතා වැදගත්. රබර් නිෂ්පාදනයේ යෙදෙන ගොවීන්ට එයින් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. අපි දන්නවා, 2015 දක්වා හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේ රබර් වගාව සඳහා විශේෂ අවධානයක් යොමු කළ බව. ඒ විතරක් නොවෙයි, එදා රබර් ගොවීන්ට විශාල ආදායමක් ලැබුණා; ඒ නිෂ්පාදනවලට සාධාරණ වටිනාකමක් ලැබුණා. හැබැයි, අපි අමතක කරන්න හොඳ නැහැ, 2015-2016 කාලයේ රබර් සාධාරණ මිලකට විකුණා ගන්න බැරුව ගොවීන් අසරණ තත්ත්වයකට පත් වුණු බව. සමහර අය දෛනිකව කිරි කපන එක පවා නතර කළා. ඒ වාගේම රබර් අලුතින් වගා කිරීම පවා හරියාකාරව කළේ නැහැ. මොකද, ඒ නිෂ්පාදනයට සාධාරණ වටිනාකමක්, ඒ ශ්‍රමයට වටිනාකමක් ලැබුණේ නැති නිසා. යහපාලන ආණ්ඩුවේ ක්‍රියා පිළිවෙත නිසා තමයි එහෙම වුණේ. ඒක රබර් වගාවට විතරක් නොවෙයි, ගම්මිරිස් වගාවටත් සිද්ධ වුණා. 2019දී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරයට පත්වීමත් සමඟ පීඩනයට පත් වෙලා හිටපු ඒ ජනතාවට සහනයක් ලබා දෙන්න, විශේෂයෙන්ම ව්‍යාපාරික කෘෂි කර්මාන්තයේ රබර් වගාවේ යෙදී සිටින ඒ ගොවීන්ගේ නිෂ්පාදනවලට නැවත සාධාරණ මිලක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කළා. ඒ අනුව අතරමඟ නතර වෙලා තිබුණු රබර් ආශ්‍රිත නිෂ්පාදන කළ කර්මාන්තශාලා නැවත ආරම්භ කළා. ඒ නිසා අද වෙනකොට අපේ රබර් නිෂ්පාදනයට ලෝකයේ හොඳම මිලක් ලැබෙනවා. ෂීට් රබර් නම්බර් 01, කිලෝ එකකට රුපියල් 480ක් ලැබෙනවා. ඒක, ඒ සඳහා ලැබෙන හොඳ මිලක්. එහෙම බැලුවාම, අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා සිටි රබර් වගාවට සම්බන්ධ නිෂ්පාදකයන්ට අද වනවිට විශාල සහනයක් ලැබී තිබෙනවා. හැබැයි, ඒවා ගැන හුඟක් අය කථා කරන්නේ නැහැ.

යම් වසංගතයක් එක්ක, ස්වාභාවික විපතක් එක්ක යම් ප්‍රශ්නයක් මතු වුණාම, ඒක ආර්ථිකයට බලපානවා; සමාජ තත්ත්වයට බලපානවා; අපේ සංස්කෘතික සමාජ දේහයට බලපානවා. එතකොට ඒ පිළිබඳව කතිකාවක් ඇති වෙන එක සාමාන්‍ය දෙයක්. හැබැයි, අපි මේ ප්‍රශ්නයට මුහුණ දුන්නා නේ, ආණ්ඩුවක් විධියට. අපි දන්නවා, ලෝකයේ ඕනෑම රටක විටින් විට ආර්ථික අර්බුද මතු වෙන බව. ඔවුන් ඒවාට මුහුණ දෙනවා. ඇත්තටම අපි සතුටු වෙන්න ඕනෑ, මේ රටේ මිනිසුන්ගේ ජීවිත බේරා ගැනීමට හැකිවීම පිළිබඳව. අපට සියල්ලට වඩා පළමුවෙන්ම වැදගත් වෙන්නේ මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමයි. සමහර දේශපාලන නායකයන් තමන්ට දැනුමක් නැති විෂයන් ගැන සඳහන් කරමින් බෙහෙත් නියම කරන කොට, අතිගරු ජනාධිපතිතුමා ඒ බෙහෙත් දෙන්න කිව්වේ නැහැ. එතුමා කිව්වේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව, වෛද්‍ය නිර්දේශ අනුව කටයුතු කරන්න කියායි. ඒ අනුව තමයි එන්නත් ලබා දීම සඳහා කටයුතු කළේ. අපට මොන ප්‍රශ්න තිබුණත්, ඩොලර් අර්බුද යනාදී මොනවා තිබුණත් අවශ්‍ය එන්නත් වර්ග ගෙනාවා; එන්නත් ලබා දුන්නා; තුන්වැනි මාත්‍රාවත් දුන්නා. තුන්වැනි මාත්‍රාව ලබා ගැනීමට සිටින ඉතුරු පිරිසට ලබා දීම සඳහා එම එන්නත් ආරක්ෂිතව සෞඛ්‍ය අංශය සතුව තිබෙනවා. මේ නිසා ඇත්තටම මේ වසංගත තත්ත්වයට මුහුණ දීලා මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒක ඒ තරම් වටින්නේ නැද්ද? මිනිසුන්ගේ ජීවිත නොවෙයි ද වටින්නේ?

අපට ආර්ථික ප්‍රශ්න ගණනාවක් ආවා. අවුරුදු දෙකක් තිස්සේ වරින් වර රට වහන කොට, ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත නොවෙන කොට, විවිධ ප්‍රශ්න ඇති වුණා. රජයේ ආයතන වසා තිබුණා; පාසල් වසා තිබුණා. මිනිසුන් වැඩට ගියේ නැහැ. විදේශ රටවල හිටපු අයගෙන් ලක්ෂ දෙකක් පමණ ආපසු මෙරටට ගෙන්වා ගත්තා. කාටත් අමතකයි, එදා විදේශ රටවල සිටි සමහර මිනිසුන් අතිගරු ජනාධිපතිතුමාට video calls ගත්ත බව. "අපි අසරණ වෙලා ඉන්නේ. විදේශ රටවල සේවය කරන අපි අසරණ වෙලා ඉන්නේ. අපි ගෙන්වා ගන්න, අතිගරු ජනාධිපතිතුමනි" කියලා මිනිසුන් ආයාචනා කළා. අතිගරු ජනාධිපතිතුමා ඒ මිනිසුන්ට ඇහුම් කන් දීලා ලක්ෂ දෙකක් පමණ පිරිස -ඒ කථා කළ සියලු දෙනාම වාගේ- මේ රටට ගෙන්වා ගත්තා. මානුෂික මෙහෙයුමක් විධියටයි ඒ කටයුතු කළේ.

ආර්ථික ක්‍රියාකාරකම් අඩුවීම, නිෂ්පාදන අඩුවීම, ආදායම් අඩුවීම, සංචාරකයන් නොපැමිණීම වැනි කාරණා අපි කවුරුත් දන්නවා. ඒ වාගේම අපි දන්නවා, අවුරුදු ගණනාවක් තිස්සේ ගත්ත විදේශ ණයත් වරින් වර ගෙවීමට සිද්ධ වෙන බව. ඒ ණය වාරික සහ පොලිය ගෙවන්න සිද්ධ වෙනවා. අපේ රටට තවම ඒ ණය වාරික සහ පොලිය ගෙවන්න බැරි වෙලා නැහැ නේ. විපක්ෂය මොනවා කිව්වත්, අපි ඒවා ගෙවනවා නේ. විපක්ෂයේ කුහකකමට "ඔන්න මේ රට වැටෙනවා, ආර්ථිකය බංකොලොත්" කියලා පසුගිය දවස්වල කියපු ආකාරය අපි දැක්කා නේ. ඊළඟට, විදේශ සංචිත ප්‍රමාණය එකයි දශම ගණනට අඩු වුණාම බොහොම සතුටු වුණා රට වැටෙයි කියලා. හැබැයි, රට වැටුණොත් මේ රටේම තමයි ඒ අයත් ඉන්නේ; මේ රටේම තමයි සමස්ත පුරවැසියන්ම ඉන්නේ කියලා ඒ අය හිතන්නේ නැහැ.

හැබැයි, කුහකත්වය ප්‍රදර්ශනය කරනවා. කොහොම හරි අවසානයේ දෙසැම්බර් 31 වෙනකොට අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 3.6ක් දක්වා වැඩි වුණා. ඔන්න, ඊට පස්සේ මේ අය මාධ්‍යයට ඇවිල්ලා කියනවා, "ආ, ඒක කලින් හිටපු මහ බැංකු අධිපතිතුමා අත්සන් කළ ගිවිසුමක් අනුව චීනයේ යුආන්වලින් ආවේ" කියලා. ඒ වාගේ බොළඳ දේවල් තමයි විපක්ෂය ප්‍රකාශ කරන්නේ. මේ වෙලාවේ අපි පක්ෂවලට, පාටවලට බෙදිලා භේදභින්න වෙනවාට වැඩිය, අපි කවුරුත් එකතු වෙලා මේ රට ගොඩ නඟන්න උත්සාහ කරන්න ඕනෑ.

දෙවැනි ලෝක යුද කාලයේ ජපානයේ හිරෝෂිමා, නාගසාකි නගරවලට බෝම්බ වැටිලා විනාශ වෙනකොට, ඒ රටේ මිනිසුන්ට නැවත ඒ රට ලෝකයේ තුන්වැනි ආර්ථිකය සහිත තත්ත්වයට ගොඩ නඟන්න පුළුවන් වුණේ මිනිසුන් භේදයකින් තොරව එකතු වූ නිසායි. ඒ ජනතාව පුළුවන් විධියට පරිත්‍යාග කළා. සමහර කාන්තාවන් කනේ තිබුණු රත්‍රං ටික, බෙල්ලේ තිබුණු රත්‍රං ටික පවා පරිත්‍යාග කළා. ඒ අවංක කැපවීම නිසා ඒ රට ගොඩනඟා ගන්න පුළුවන් වුණා. ඇයි අපේ රටට එහෙම කරන්න බැරි? අපේ රටටත් ඒ දේ කරන්න පුළුවන්. දැන් අපේ රට නව සාමාන්‍යකරණයට ඇවිත් තිබෙන බව අපි දන්නවා. රාජ්‍ය ආයතන විවෘත කළා. මිනිසුන් ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදෙනවා; නිෂ්පාදනවල යෙදෙනවා. ඩොලර් අර්බුදයටත් මුහුණ දෙමින් අපි මේ රට පවත්වා ගෙන යනවා. ඒ නිසා මේ අවුරුද්ද ඇතුළත මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළ අපට සාර්ථකව ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

මිනිසුන් අපහසු අවස්ථාවක සිටිද්දී, ඒ පිළිබඳව සලකා බලා මිනිසුන්ට අවශ්‍ය සහන සලසා දෙන්න රුපියල් මිලියන 85,000ක

මුදලක් අය වැයෙන් වෙන් කළා. එහෙම කරලා නිෂ්පාදනය වැඩි කරන්න, නිෂ්පාදන ආර්ථිකය ගොඩ නඟන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව විවිධ පියවර රාශියක් අරගෙන තිබෙනවා. අපි ඇත්තටම ඒ ගැන සතුටු වෙනවා. අපි කවුරුත් කල්පනා කරන්න ඕනෑ, මේ වෙලාවේ අපේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන්නයි. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

ඒ අනුව තමයි විශේෂයෙන්ම රබර් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සහනාධාර වැඩි කරලා තිබෙන්නේ. රබර් නැවත වගා කිරීම සඳහා ලබා දුන් රුපියල් 175,000ක මුදල රුපියල් 350,000 දක්වා වැඩි කර තිබෙනවා. මේ සහනාධාරය නිසා මිනිසුන් වැඩි වැඩියෙන් රබර් නිෂ්පාදනයට යොමු වෙනවා. ඒ එක්කම, අලුතින් රබර් වගා කරන ගොවීන්ට ලබා දුන් මුදල රුපියල් 150,000 සිට 300,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක පසුගිය කාලයේ සිට ක්‍රියාත්මක වන විධියට අනුමැතිය ලබා ගන්න තමයි මේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා කාටත් සතුටු වෙන්න පුළුවන්කම තිබෙනවා. 2019 සිට ක්‍රියාත්මක වෙන මේ වැඩසටහනට නෛතික ආවරණයක් තිබුණේ නැහැ. නෛතික ආවරණයක් ලබා ගැනීම සඳහා තමයි අද මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම මොණරාගල දිස්ත්‍රික්කයේ පුරවැසියකු විධියට ඒ ගැන විශේෂයෙන් සතුටු වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have only two more minutes.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මම හිතන විධියට මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් නිෂ්පාදනය සඳහා විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. දැනටමත් අපේ දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 13,000ක පමණ රබර් වගාවට මූලික තැන දීලා තිබෙනවා. සුදු අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කළ කාලයේ සිට රබර් වගාව ව්‍යාප්ත වෙලා මේ වෙනකොට මොණරාගල දිස්ත්‍රික්කයේත් රබර් වතුයායවල් දැන් දකින්න පුළුවන්. විශේෂයෙන් අද බිබිලවත්ත වතුයාය, මොණරාගල ජීලෝන් වතුයාය ඇතුළු වතුයාය ගණනාවක් රබර් නිෂ්පාදනයේ යෙදිලා තිබෙනවා. ඉස්සර ව්‍යාපාරිකයන් සහ රජය රබර් වගාවට යොමු වුණත්, අද සාමාන්‍ය මිනිසුන් රබර් වගාව සඳහා යොමු වෙලා තිබෙනවා. මේ වෙනකොට ගොවීන් 18,000ක් පමණ මේ වගාවේ යෙදිලා ඉන්නවා. අපි මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 13,000ක පමණ මේ වගාව ආරම්භ කරලා තිබෙනවා. 2021 වර්ෂයේ මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් මෙට්‍රික්ටොන් 75,000ක් පමණ නිෂ්පාදනයක් කළා. මොණරාගල දිස්ත්‍රික්කයේ පුරවැසියන් අපේ රටේ ජාතික නිෂ්පාදයට දායක වුණා.

අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, IFAD එකෙන් අරමුදල් සපයන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 2008 සිට 2014 දක්වා ක්‍රියාත්මක වූ බව. ඒකෙන් හෙක්ටෙයාර 5,000ක් වැව්වා. 2016 සිට 2021 දක්වා කාලයේ අපේ දිස්ත්‍රික්කය තුළ STARR Project එකෙන් හෙක්ටෙයාර 2,000ක වගා කටයුතු කරන්න පුළුවන්කම ලැබුණා. 2022 වසරට රජයේ සහනාධාරවලින් හෙක්ටෙයාර 260කට මුදල් වෙන් කරලා තිබෙනවා. ඉතින්, ඒ ගැන අපි සතුටු වෙනවා. සමස්තයක් වශයේ ලංකාවේ ගොවීන් ලක්ෂ 2ත්, 5ත් අතර ප්‍රමාණයක් මේ වගා කටයුතුවල යෙදිලා ඉන්නවා. ලංකාවේ රබර් නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 90,000 - 100,000 අතර ප්‍රමාණයක් වෙනවා. විශේෂයෙන් ඒක මතක තබා ගැනීම ඉතා වැදගත්.

ඊට අවශ්‍ය තාක්ෂණ සහාය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ලබා දෙනවා. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් නිලධාරියකු බැගින් පත් කරලා තිබෙනවා. තාක්ෂණික සහාය, අවශ්‍ය උපදෙස් සහ අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දෙන්න සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට නිලධාරීන් දෙදෙනා, තුන්දෙනා බැගින් පත් කරලා තිබෙනවා. මේ තුළින් අපට අවශ්‍ය ඩොලර් උපයා ගන්න හැකි වෙනවා. ඒ නිසා ජාතික නිෂ්පාදනයට දායකවීමෙන් මිනිසුන්ගේ ආර්ථික වටිනාකම වැඩි වෙලා, ආදායම වැඩි වෙලා, නිෂ්පාදනය වැඩි වෙලා අපේ රටේ ආර්ථික සංවර්ධනයේ අවසාන ඉලක්කය කරා යන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම අද ඉදිරිපත් කළ මේ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. මේ මඟින් ඒ කටයුතුවලට අවශ්‍ය අවශ්‍ය නීතිමය ආවරණය ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මේ වෙලාවේ හැටියට රටක් විධියට අපි සියලුදෙනා එකතු වෙලා, ජාතික නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා වැවිලි කර්මාන්තය තුළ ඩොලර් උපයන ව්‍යාපෘති විධියට මේවා තව තවත් ශක්තිමත් කරගෙන රටක් විධියට ඉදිරියට යන්න කටයුතු කරමු කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Waruna Liyanage. You have three minutes.

[අ.භා. 2.08]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට කථා කරන්න විනාඩි 6ක කාලයක් ලබා දීලා තිබුණා. නමුත් විනාඩි තුනයි දැන් තිබෙන්නේ. ඒ නිසා බොහෝ අදහස් ප්‍රකාශ කරන්න තිබුණත්, ඒකට අවස්ථාවක් නැහැ.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන රබර් කර්මාන්තය වෙනුවෙන් වචනයක් හෝ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මොනරාගල විජිත බේරුගොඩ රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ මොනරාගල දිස්ත්‍රික්කයට පස්සේ රත්නපුර දිස්ත්‍රික්කයේත් විශාල වශයෙන් රබර් සහ තේ කර්මාන්තයේ නියැළෙන විශාල ජනතාවක් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රබර් කර්මාන්තය ගැන කථා කරනකොට පසුගිය ආණ්ඩුවෙන් මොනවත්ම කළේ නැහැ වාගේ තමයි අපේ රාජ්‍ය ඇමතිතුමා කථා කළේ. හැබැයි එතුමා කථා කළා, අර STARR Project එක ගැන. මේ STARR Project එක තුළින් එතුමාගේ දිස්ත්‍රික්කයේ -මොනරාගල දිස්ත්‍රික්කයේ- රබර් කර්මාන්තය දියුණු වුණා කියලා එතුමාම පිළිගත්තා. ඒ

[ගරු වරුණ ලියනගේ මහතා]

වාගේම තමයි අපේ දිස්ත්‍රික්කයේත් STARR Project එකෙන් රබර් කර්මාන්තයේ විශාල දියුණුවක් ඇති කරගත්තා. තේ කර්මාන්තය වෙනුවෙනුත් මේ STARR Project එක යටතේ විශාල වැඩ කොටසක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රබර් කර්මාන්තය වෙනුවෙන් නොයෙකුත් රජයන් නොයෙකුත් ආකාරයට ඒ ඒ කාල වකවානුවලදී උදව් කරලා තිබෙන බව අපි දන්නවා. හැබැයි 2015න් පස්සේ පැවැති අපේ ආණ්ඩුවෙන් රබර් කර්මාන්තය ආශ්‍රිත නිමි කර්මාන්තයක් විධියට හොරණ ටයර් ෆැක්ටරි එකක් පටන් ගන්නත් කටයුතු කළ බව අපට මතකයි. ඒ නිසා ලංකාවට විශාල ශක්තියක් ලබා දෙන්න එවැනි කාලවලදී කටයුතු සිදුවෙලා තිබෙනවා කියලාත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

වැස්ස වැඩියෙන්ම තිබෙන දිස්ත්‍රික්කයක් තමයි රත්නපුර දිස්ත්‍රික්කය. රබර් කර්මාන්තයේදී වැසි ආවරණ සඳහා ආධාර විධියට ලබා දෙන්නේ රුපියල් 70ක් වැනි සුළු මුදලක්. මේ රුපියල් 70ක මුදල වෙනුවට රුපියල් 120ක්වත් ලබා දෙන්න පුළුවන් නම්, රබර් කර්මාන්තය නඟාසිටුවීම සඳහා කටයුතු කරන්න පුළුවන් කියන එක අපේ ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තේ කර්මාන්තය ගැනත් මම කථා කරන්න ඕනෑ. අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා, වගා පාලුවීම නිසා වී ගොවියාට ආධාර ලබා දෙන වැඩසටහනක් අපි දැක්කා. මම වැවිලි කර්මාන්ත ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරන්න කැමැතියි. කෘෂිකර්ම අමාත්‍යාංශයත් දැනුවත් කරලා, පොහොර නැතිවීම නිසා තේ වගාවට සිදු වූ හානිය වෙනුවෙන් තේ ගොවියාටත් ආධාර ලබා දෙන වැඩසටහනක් ඇති කරන්න කියලා ඉල්ලනවා. ෆැක්ටරියට ලබා දුන් දළු ප්‍රමාණය ඒ කාලයේදී අඩු වුණාද, වැඩි වුණාද කියලා දළු ලබා දීමේදී ලැබෙන රිසිට්පතෙන් නීත්‍යානුකූලව බලාගන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා. ඒ නිසා වගා හානිය වෙනුවෙන් යම්කිසි මුදලක් ලබා දීලා, තේ ගොවියාගේ ආර්ථිකයත් ශක්තිමත් කරන්න කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. තවත් කාරණා කියන්න තිබුණත්, ඔබතුමා ඒ සඳහා අවස්ථාව ලබා නොදීම සම්බන්ධයෙන් කනගාටු වන අතරම, රබර් කර්මාන්තයේ දියුණුව සඳහා අපට ලබා දෙන්න පුළුවන් උපරිම ශක්තිය අනාගතයේදීත් අපි ලබා දෙන බව සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Mahinda Amaraweera. You have 13 minutes.

[අ.භා. 2.11]

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි වැවිලි අමාත්‍යාංශයට අදාළ නියෝග කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරනවා. රබර් වගාව සම්බන්ධයෙන් රජය තීන්දුවක් ගෙන තිබෙනවා, රබර් වගා කිරීම සඳහා මෙතෙක් ලබා දුන් රුපියල් 175,000ක සහනාධාරය රුපියල් 350,000ක් දක්වා දෙගුණයක් බවට පත් කරන්න. මේක ඉතා හොඳ ප්‍රවේශයක් කියන එක අපි පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. රටක් විධියට ගත්තාම රජයක් මේ වාගේ දේවල්වලට මැදිහත්වීම ඉතා වැදගත් වෙනවා. මේවා දේශපාලන වැඩසටහන් හෝ වෙනත් කිසිම දෙයක් නොවෙයි. සමහර වෙලාවට අද ඉන්දවන රබර් ගහේ කිරි කපන්න වෙන්නේ ආපසු මහජන ඡන්දයකටත් ගියාට පසුවයි. ඊට පස්සේ තමයි මේවායේ කිරි කපන්න වෙන්නේ; මේවායේ ආදායමක් ලබා ගන්න වෙන්නේ. නමුත් අපි දීර්ඝ කාලීනව හිතලා, මේ ගැන කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරලා, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ඉල්ලීම අනුව මේ ආධාර ක්‍රමය ක්‍රියාත්මක කළා.

ඒ වාගේම, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න තවත් ආධාර ක්‍රම ගණනාවක් යටතේ තේ වගාව වෙනුවෙන්, කුරුඳු වගාව වෙනුවෙන්, අපනයන භෝග සංවර්ධනය වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් ගොවීන්ට සහනාධාර විධියට ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. මේ සියල්ල ආයෝජන විධියට තමයි අපි දකින්නේ. කන්න - බොන්න දෙන දේවල්, සමෘද්ධි සහනාධාරය වැනි සහනාධාරවලට වඩා එවැනි දේවල්වලට දෙන සහනාධාර හැම දෙයක්ම නැවත රටට ලැබෙනවා. ඒ බොහෝ දේවල් නැවත ඩොලර් විධියට අපට ලැබෙනවා. අද ඩොලර් ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙන අපට ඒකෙන් මිදෙන්න නම්, ඒකෙන් ගොඩ එන්න නම්, ඒකට සාර්ථකව මුහුණ දෙන්න නම්, මෙන්න මේ වාගේ කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළවලට තමයි මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේ අවශ්‍යතාව තිබෙන්නේ. ඒ නිසා මේ නියෝග අපේ රබර් කර්මාන්තය දියුණු කර ගන්න ගත්ත දැවැන්ත වෙනසක් කියන එක මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. ඊයේ කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වුණා, ගොවීන් දිරි ගන්වන දීමනාවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් සම්බන්ධ. පසුගිය කන්නයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ තමයි ගොවීන් වෙත කාබනික පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළ. එහි යම් යම් අඩුපාඩු වුණා. අපි රජය විධියට පිළිගන්නවා, ඒක එක වර ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා අපට එය සියයට 100ක් සාර්ථක කර ගන්න බැරි වුණා කියලා. සමහර ප්‍රදේශවල නම් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒක කරන්න බැරි දෙයක් නොවෙයි. මම මීට අවුරුදු තුනකට ඉස්සර කාබනික පොහොරවලින් කුඹුරක් අස්වද්දලා, සාර්ථක අස්වැන්නක් ගත්ත කෙනෙක්. කාබනික පොහොර යොදලා ගෙවත්ත සාර්ථක කර ගත්ත කෙනකු විධියටයි මා මේ කරුණු කියන්නේ. මේක කරන්න බැරි වැඩක් නොවෙයි. මේක නරක වැඩකුත් නොවෙයි. මේක ඉතාම හොඳ දෙයක්. කරන්න පුළුවන් දෙයක්. හැබැයි, ඒක ක්‍රමානුකූලව, සියලුදෙනාගේ සහයෝගය අරගෙන කරන්න ඕනෑ දෙයක්. හදිසියේ කරපු නිසා මා හිතන විධියට ඒ වැඩ පිළිවෙළට නිලධාරින්ගේ පැත්තෙනුත් නිසි සහයෝගය ලැබුණේ නැහැ, ඒ අය දැනුවත් කරන්න හැකියාවක් ලැබුණේ නැහැ කියන කාරණය තමයි අපට දැන ගන්න තිබෙන්නේ. එහෙම නැතුව නිලධාරින් හරියට දැනුවත් කරලා ඒ අය මේ කාර්යයට ප්‍රවේශ වුණා නම්, මේ කටයුතු සාර්ථක කර ගන්න තිබුණා. ඒ වාගේම අපේ ගොවි සංවිධාන සහ ගොවි ජනතාව හරි විධියට දැනුවත් කළා නම්, ඒ තුළිනුත් අපට හොඳ ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන්කම තිබුණා. දැන් ඒ සිදුවීම වෙලා ඉවරයි. ඒ කන්නයේ අස්වැන්නේ යම් අඩුවක් තිබෙන බව රජය පිළිගෙන, අස්වැන්න අඩු වුණු හැම කෙනෙකුටම වීවලට ඉහළ සහතික මිලක් ලබා දීලා, ඒ අයට රුපියල් අනූවකට වැඩි මිලකට වී විකුණා ගන්න අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ අස්වැන්න අඩු වුණු එක පිළිබඳවත් සැලකිල්ලට අරගෙන දිරි දීමනාවක් විධියට යම් මුදලක් ලබා දෙන්න ඊයේ කැබිනට් මණ්ඩලයට යෝජනාව ඉදිරිපත් කළා. අපි

රජය විධියට ඒක ඉදිරියේදී ක්‍රියාත්මක කරනවා. ගොවි ජනතාව පැත්තක තියලා, ගොවි ජනතාව අධෛර්යයට පත් කරලා අපට රටක් දියුණු කරන්න බැහැ. හැම රජයක්ම වාගේම මේ රජයත් ඒක ඉහළින්ම පිළිගන්නා කාරණයක්.

අද අපේ රටේ තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි ඩොලර් ප්‍රශ්නය; විදේශ සංචිත ප්‍රශ්නය. ඒ වාගේම රටින් ආහාර ද්‍රව්‍ය ගෙනෙන්න තිබෙන ගැටලුව. ඒකට මුහුණ දෙන්න වෙන්නේත් අපේ ගොවි ජනතාවත් එක්ක; අපේ ධීවර ජනතාවත් එක්ක. අපේ ගොවි ජනතාවට ශක්තිය තිබෙනවා, මේ රටට අවශ්‍ය ආහාර ටික සම්පූර්ණ කර ගන්න. ඒක ගැටලුවක් නොවෙයි. ඒක කරන්න පුළුවන්. කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට මමත් මාස නවයක විතර කාලයක් හිටියා. 2018 වසරේ මාස් කන්නයේ ඒ කටයුතුවලට අදාළව මම තමයි අමාත්‍යවරයා විධියට කටයුතු කළේ. අවුරුදු හතළිහකට පසුව ලැබුණු වැඩිම වී අස්වැන්න ඒ වෙලාවේ ලැබුණා. අපි ඒක හරියට කළමනාකරණය කළා වාගේම පුරන් කුඹුරු අක්කර 38,000ක් වගා කරන්න කටයුතු කළා. ඒ වාගේම ගොවියාට විශ්වාසයක් ඇති කළා, භය නැතුව වගා කරන්න කියලා.

මම රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දුන්නා, රුපියල් හතළිස්දහසක. වී, බඩ ඉරිඟු, අර්තාපල්, බී ලූනු ඇතුළු වගා කිහිපයකට හානියක් වුණොත්, රුපියල් හතළිස්දහසක වන්දියක් ලබා දීමේ ක්‍රමයක් හඳුන්වා දුන්නා. ඒ නිසාම මිනිස්සු වගා කරන්න පටන් ගත්තා. ඒකේ ප්‍රතිඵලය විධියට පුරන් කුඹුරුත් වගා කළා. ඒවායේ වී අස්වැන්න සාර්ථකව ලැබුණා. සේනා දළඹුවාගේ බලපෑම මත යම් විනාශයක් සිදු වුණත්, අවුරුදු ගණනාවකට පසුව ලැබුණු ඉහළම බඩ ඉරිඟු අස්වැන්න ලබා ගන්නත් අපට ඒ වෙලාවේ පුළුවන්කම ලැබුණා. ඉතින් ඒ විධියට අපේ ගොවි ජනතාව ධෛර්යවත් කළොත්, ගොවි ජනතාව ගැන විශ්වාසය තියලා කටයුතු කළොත්, අපට අවශ්‍ය ශක්තිය ඒ අය දෙනවා.

ඒ අයට මිලක් ඕනෑ; ආරක්ෂාවක් ඕනෑ. එතකොට අපි කිව්වත්, නොකිව්වත් ඒ අය වගා කරනවා. ඒ ගොල්ලෝ ඒකට ප්‍රවේශ වෙනවා. එතකොට එහි සාර්ථක ප්‍රතිඵලයක් අත්කර ගන්න අපට පුළුවන්කම තිබෙනවා. අපේ නිෂ්පාදන ආර්ථිකය ප්‍රමාණවත් නැති නිසා අද අපට අවශ්‍ය සියලු දේ පිට රටින් ගේන්න වෙලා තිබෙනවා. ඩොලර් ප්‍රශ්නය පිළිබඳව අපි කැබිනට් මණ්ඩලය තුළදීත් කථා කරනවා; පාර්ලිමේන්තුවේදීත් කථා කරනවා; ආණ්ඩු පක්ෂ රැස්වීම්වලදීත් කථා කරනවා. අපට අවශ්‍ය නිෂ්පාදනවලින් බොහොමයක් මේ රට තුළ හදාගන්න පුළුවන්. 1970-1977 යුගයේ -මැතිනියගේ කාලයේ- මේ රට කෘෂිකර්මයෙන් ස්වයංපෝෂිත වෙන්න ආසන්න මට්ටමටම පැමිණියා. තව අවුරුද්දක් දෙකක් ඒ රාජ්‍ය පාලනය තිබුණා නම් මේ රටට අවශ්‍ය ආහාර ටික මේ රට තුළම නිෂ්පාදනය වෙනවා. ඒ වාගේම තමයි, අපට අවශ්‍ය කර්මාන්ත ටිකත් මේ රට තුළම ආරම්භ වෙනවා. අපට අවශ්‍ය බොහෝ දේවල් අපේ රටේම නිෂ්පාදනය කරන තත්ත්වයක් ඒ වෙලාවේ තිබුණා.

ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාව, කන්කසන්තුරේ කඩදාසි කර්මාන්තශාලාව, පරන්තන්වල තිබුණු රසායනික කර්මාන්තශාලාව, පිහන් කර්මාන්තශාලා ටික, ට්‍රැක්ටර් සංස්ථාව, ඒ වාගේම ටයර් සංස්ථාව -කැලණි ටයර්- නිෂ්පාදන කටයුතු කළා. අපට අවශ්‍ය රෙදි නිෂ්පාදනය කරන කර්මාන්තශාලා පූගොඩ, තුල්හිරිය, මත්තේගොඩ ප්‍රදේශවල තිබුණා. ඒ වාගේම, ගම් මට්ටමින් සාර්ථකව ක්‍රියාත්මක වුණු අත්යන්ත්‍ර පේෂකර්මාන්ත තිබුණා. Weaving centres කියන ඒවා ගම්වල තිබුණා. ඒවායින් අපට අවශ්‍ය රෙදි ටික වේගයෙන් නිෂ්පාදනය වෙන්න ගත්තා. ඒ වාගේම, අපට අවශ්‍ය බොහොමයක් දේවල් පිට රටින් ගේන්නේ නැතුව මේ රට තුළ නිෂ්පාදනය කරන්න මේ රටේ ව්‍යාපාරිකයෝත් පෙලඹුණා. ඒ වෙලාවේ ඩියුරෝ උණු වතුර බෝතලය, මදුරු දැල් අපේ රටේ තමයි හැදුවේ. ඒවා පිට රටින් ගෙනාවේ නැහැ. Unique Radio එක වාගේම අපේ රට තුළ උපාලි ෆියට් කාර් එකත් නිෂ්පාදනය වෙමින් තිබුණා. හැබැයි, අවසානයේ මොකක්ද වුණේ? 1977 ආණ්ඩු පෙරළියත් එක්ක ඒ වෙලාවේ බලයට පත් වුණු රජය මොකක්ද හිතුවේ?

1977 බලයට පැමිණි ආණ්ඩුවට පෙර තිබුණු ආණ්ඩුවෙන් යම් අඩු පාඩුවක් සිද්ධ වුණා. අපි ඒක පිළිගන්නවා. හාල් ටික ගන්න, මිරිස් ටික ගන්න පෝලිමේ ඉන්න වුණා කියන චෝදනාවත් එක්ක එදා තිබුණු ආණ්ඩුවේ මන්ත්‍රී ධුර ප්‍රමාණය අටට බස්සලා නව රජයක් බලයට පත් වුණා. 1977දී බලයට ආපු රජය ඒ ආර්ථිකය සම්පූර්ණයෙන්ම අනෙක් පැත්තට හැරෙව්වා; විවෘත ආර්ථිකය පටන් ගත්තා. අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම විවෘත කරලා දැම්මා. ඒකේ අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද? ආර්ථිකය විවෘත කිරීමේ ප්‍රතිඵලයක් විධියට අපට අවශ්‍ය සියලු දේ පිට රටින් ගෙනාවා. කන බොන දේ සුලභ වුණා. හැම දෙයක්ම ඇති වෙන්න තිබුණා. අඳින්න පලඳින්න අවශ්‍ය දේවල් ඕනෑ තැනක තිබුණා; සියලු භාණ්ඩ තිබුණා. ඒක ඇත්ත. හැබැයි, ණයට තමයි ගොඩක් දේවල් ගෙනාවේ. එතැනින් පස්සේ අපේ රටේ ගොවියා වැටෙන්න පටන් ගත්තා. අපේ ධීවරයා තුළ පිබිදීමක් ඇති කර ගන්න බැරි වුණා. ඒ වාගේම අපේ කර්මාන්තකරුවෝ කර්මාන්තවලින් අයින් වුණා. රජයේ කර්මාන්තශාලා එකින් එක වැහිලා ගියා. අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද? අපි රටින් ගෙනැල්ලා කන්න පටන් ගත්තා. අනෙක් දේවලුත් රටින් ගෙනැල්ලා පාවිච්චි කරන්න පටන් ගත්තා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have three more minutes.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ නිෂ්පාදන යුගය තිබුණා නම් අද වන විට අපිට පිට රටින් බඩු ගෙන්වන රටක් නොවෙයි, පිට රටට බඩු යවන රටක් බවට පත් වෙන්න තිබුණා. එදා ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගියා නම් අද අපට ඩොලර් හොයමින් යන්න ඕනෑ නැහැ. ඩොලරයට සාපේක්ෂව රුපියල මීට වඩා ගොඩක් ශක්තිමත් වෙන්න තිබුණා. නමුත්, විවෘත ආර්ථික ක්‍රමයත් එක්ක අවාසනාවන්ත විධියට දිගින් දිගටම සිදු වුණේ මොකක්ද? අපේ ආර්ථිකය පරිහානියට ගියා. රටින් ගෙනැල්ලා කන්න, රටින් ගෙනැල්ලා අඳින්න, රටින් ගෙනැල්ලා එදිනෙදා අවශ්‍යතා සම්පූර්ණ කර ගන්න තමයි අවසානයේ අපට සිද්ධ වුණේ.

ජනාධිපතිතුමා ඊයේ ව්‍යාපාරිකයන් මුණ ගැහුණා. ඒ වාගේම ආයෝජකයන් මුණ ගැහුණා. මේ රටට අවශ්‍ය දේ මේ රට තුළම නිෂ්පාදනය කර ගැනීම සඳහා දිරි ගන්වන වැඩ පිළිවෙළ හරියාකාරව ක්‍රියාත්මක කළොත්, අපට නැවත නිෂ්පාදන ආර්ථිකයක් සහිත ශක්තිමත් ආර්ථිකයක් තිබෙන යුගයකට යන්න පුළුවන්කම තිබෙනවා. අපේ ගොවියා ගැන, අපේ ධීවරයා ගැන, අපේ නිෂ්පාදකයා ගැන, අපේ සුළු පරිමාණ කර්මාන්තකරුවා ගැන විශ්වාසය තියලා කටයුතු කළොත්, මේ රටේ ඇති වෙනවාය කියන ආර්ථික අර්බුදයටත් ඒ වාගේම විදේශ විනිමය අර්බුදටයත් මුහුණ දෙන්න අපට අනිවාර්යයෙන්ම අවස්ථාවක් කර ගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය මා තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා ඒ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න අපි සැවොම එකතුවෙලා කටයුතු කරමු කියන ආරාධනයත් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thak you, Hon.Minister. The next speaker is the Hon. J.C. Alawathuwala. You have six minutes.

[අ.භා. 2.22]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වැවිලි අමාත්‍යාංශයට අදාළ පනත් දෙකක් යටතේ වූ නියෝග පිළිබඳව සාකච්ඡා වනවා. රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග යටතේ subsidy වැඩි කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව තිබෙනවා. වගා කටයුතු ගැන කථා කිරීමේදී අපි කාටවත් අමතක කරන්න බැහැ, පොහොර පිළිබඳ කාරණය. පසුගිය වසරේ වාගේම මෙම වසරේ මේ වනතුරුම වගාවට අවශ්‍ය පොහොර අපේ ගොවීන්ට ලැබිලා නැහැ. මේක ප්‍රධාන කාරණයක්. රබර්, තේ, සුළු අපනයන බෝග, වී -මේ හැම වගාවක්ම- කරන ගොවීන් පොහොර නැතිව අසරණභාවයට පත්වෙලා ඉන්න බව අපි පැහැදිලිවම කියන්න ඕනෑ. දැන් ඒ කාරණය පැහැදිලිව අපට පෙනෙන්න තිබෙනවා. මේ වනකොට ගොවිතැන් කරපු අය අස්වැන්න නෙළනවා. රසායනික පොහොර තහනම් කරලා එක රැයකින් කාබනික පොහොරවලින් වගා කරන්න තීන්දු කළ නිසා අද ගොඩක් ප්‍රදේශවල ගොවීන්ගේ අස්වැන්න සියයට 40කින්, සියයට 50කින් -භාගයක්ම- අඩුවෙලා තිබෙනවා. සමහර තැන්වල ඊට වඩා අඩුවෙලා තිබෙනවා. වැවිලි ඇමතිතුමා සහ කෘෂිකර්ම ඇමතිතුමා ඇතුළු රජය ගත් වැරැදි තීන්දු තීරණ නිසා අද වන්දි ගෙවන්න වෙලා තිබෙන්නේ ගොවියාට බව අපි පැහැදිලිවම කියන්න ඕනෑ. අද ගොවියාගේ ආදායම අඩුවෙලා තිබෙනවා; අස්වැන්න අඩුවෙලා තිබෙනවා.

තේ ගැන කථා කළොත්. මේ වනකොට තේ වගාව සම්බන්ධ ඉතා භයානක තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඊයේ-පෙරේදා ජනාධිපතිතුමා ගාල්ලට ගිය අවස්ථාවේ තේ ගොවියෝ මොනවාද කිව්වේ කියලා අපි දැක්කා. ගොවියෝ එතුමාටම කිව්වා, ඒ අයගේ තත්ත්වය; ඒ අයගේ අස්වැන්නට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා අපි මේ කාරණා ගැන අසත්‍ය කථා කරලා වැඩක් වෙන්නේ නැහැ. මේවාට අවශ්‍ය ප්‍රතිකර්ම කරන්න අපි ලහිලහියේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් ඊළඟට ඇති වෙන්නේත් මීටත් වඩා භයානක තත්ත්වයක්.

රබර් වගා කරන ගොවීන්ට ලබා දෙන ආධාරය වැඩි කිරීම ගැන අපි සතුටු වනවා. හැබැයි, ඒ ආධාරය වැඩි කළාට විතරක් මදි. සුළු පරිමාණයේ ගොවීන් තමයි ගොඩක් රබර් වගා කරන්නේ. මහා පරිමාණව රබර් වගා කරන අයට වඩා සුළු පරිමාණව රබර් වගා කරන අයට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ අයට තමයි ගොඩක් වෙලාවට මේ ආධාරය දෙන්නේ. වගාකරුවා වත්ත සුද්ද කරලා, වළවල් කපලා, පැළ හිටෙව්වාට පස්සේ තමයි මේ ආධාරය දෙන්නේ. ඒක තමයි ඇත්ත.

කෑගල්ල දිස්ත්‍රික්කයේ අපේ තාරක බාලසූරිය රාජ්‍ය ඇමතිතුමාත් මේ කාරණය දන්නවා ඇති. ගොවීන්ට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය මේකයි. රබර් වගා කරන්න වතු සුද්ද කරලා, වළවල් කපලා, පැළ හිටවලා ඊට පස්සේ මේ මුදල් ගන්න පුළුවන් තරමේ ආදායමක් අද මේ ගොවියාට නැහැ. ඒ නිසා මේ ආධාරය දෙනකොට ඒ ආධාරය මේ වැඩ කරගෙන යන අතරතුර කඩින් කඩ ලබා දෙන්න කියලා අපි කියනවා. වත්ත සුද්ද කළාම ප්‍රමාණයක්, වළවල් කැපුවාම ප්‍රමාණයක්, පැළ සිටෙව්වාම ප්‍රමාණයක් වශයෙන් එම ආධාරය ලබා දෙන විධියේ වැඩ පිළිවෙළක් හදා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)

එහෙම තමයි දෙන්නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

එහෙම ක්‍රමයක් කලින් තිබුණේ නැහැ නේ. එතකොට තමයි මේ ආධාරයෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ. එතකොට තමයි ගොවියාට මේ ආධාරය ප්‍රයෝජනවත් විධියට පාවිච්චි කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා ඒ ආධාරය එහෙම දෙනවා නම් හොඳයි. ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා කියනවා, එහෙම තමයි දෙන්නේ කියලා. එහෙම නම් ඒක හොඳයි. ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම කියනවා. මේ හැම ප්‍රශ්නයටම වඩා තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි පොහොර පිළිබඳ ප්‍රශ්නය. පොහොර ප්‍රශ්නයට වහාම විසඳුම් ලබා දුන්නේ නැත්නම් මේ මොනවා කළත් මේ වගා කටයුතු ඉස්සරහට ගෙනයන්න බැරි වනවා.

අපේ රටේ තේ වගාව ගැන කථා කරන කොට මම කියන්න කැමතියි, අපට ඒ සම්බන්ධයෙන් ලොකු ඉතිහාසයක් තිබෙන බව. අපේ රටේ තේවලට "Ceylon Tea" කියන සන්නාම නාමය තිබෙනවා. අද ඒ සන්නාමය පවා අපේ රටට අහිමි වන තරමට මේ පොහොර ප්‍රශ්නය බලපා තිබෙනවා. තේ පැළ තවාන් පොහොර නැතිකම නිසා සම්පූර්ණයෙන්ම අද හානියට පත්වෙලා තිබෙනවා. ඒ තත්ත්වය බලපාන්නේ තව ඉස්සරහට. ලබන අවුරුද්දේ ඉඳලා මේ කරුණු සියල්ල මේ වගාවට බලපානවා. ඒ නිසා කරුණාකරලා මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ කරගෙන ආපු ගොවිතැන කරන්න, වගා කටයුතු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. වගාවට අවශ්‍ය පොහොර ලබා දෙන වැඩ පිළිවෙළ හැදුවේ නැත්නම් මේ එක වගාවකින්වත් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. පසුගිය කාලයේ ගත් ඔළමොට්ටළ තීන්දු තීරණ නිසා අද ගොවියාට වන්දි ගෙවන්න සිදුවෙලා තිබෙනවා.

රටක් හැටියටත් අද අපි ඩොලර් නැතිව ඉන්න වෙලාවක් තමයි මේ වෙලාව. තේ කියන්නේ ඩොලර්. රබර් කියන්නේ ඩොලර්. සුළු අපනයන භෝග කියන්නේ ඩොලර්. අපට විශාල ප්‍රමාණයක් ඩොලර් ලැබෙන අපේ ආදායම් මාර්ග විශාල ප්‍රමාණයකට ඉදිරියේදී හානි වෙන තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ තත්ත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්න කියලා මේ වෙලාවේදී මම කියනවා. මට කථා කරන්න වෙලාව ලබාදීම පිළිබඳව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you. The next speaker is the Hon. Tharaka Balasuriya. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Kokila Gunawardene to the Chair?

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக பாலசூரிய )
(The Hon. Tharaka Balasuriya )

Sir, I propose that the Hon. (Mrs.) Kokila Gunawardena do now take the Chair.

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு ஜோன் செனவிரத்ன)
(The Hon. John Seneviratne)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) KOKILA GUNAWARDENE *took the Chair.*

[අ.භා. 2.28]

**ගරු තාරක බාලසූරිය මහතා (කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக பாலசூரிய - பிராந்திய உறவு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Regional Co-operation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් වගාව සහ තේ වගාව පිළිබඳව එතුමාගේ අදහස් ඉදිරිපත් කළා. හැබැයි, මම එතුමාට මතක් කරන්න කැමැතියි, යහ පාලන ආණ්ඩුව කාලයේ රබර් කිලෝවක් තිබුණේ රුපියල් 180 සිට රුපියල් 220 වාගේ ගණනකට බව. තේ දළු කිලෝවක් රුපියල් 70කට වැඩියෙන් ගියේ නැහැ. නමුත්, මෙම රජය බලයට පත්වෙලා ප්‍රතිඅපනයනය සම්පූර්ණයෙන්ම නවත්වපු නිසා අද රබර් කිලෝවක් රුපියල් 450ට වඩා වැඩියෙන් අලෙවි වනවා. මීට මාසයකට, දෙකකට විතර ඉස්සර රබර් කිලෝවක විකුණුම් මිල රුපියල් 500ත් පැනලා තිබුණා. ඒ වාගේම, අද වන විට අපේ පැතිවල තේ දළු කිලෝවක් රුපියල් 90ත්, 110ත් අතර මිලකට අලෙවි වනවා. අද වන විට කුරුඳුවලටත් හොඳ මිලක් තිබෙනවා. අනෙක් භෝගවලටත් අද හොඳ මිලක් තිබෙනවා. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී මේ ගැන කථා කළේ නැහැ. ඒ මන්ත්‍රීතුමා කිව්වේ නැහැ, ඒ රජයෙන් කොහොමද ගොවියාට සැලකුවේ කියලා. ගොවිතැන් කරන භූමියෙන් අක්කර ලක්ෂ දෙකක් අඩු කරන්න ඕනෑ කියලා පසුගිය යහ පාලන ආණ්ඩුවෙන් කිව්වා. ගොවීන්ට අන්න ඒ විධියට සලකපු ආණ්ඩුවක් දැන් අපට උපදෙස් දෙන්න එනවා, රබර් වගාවත්, තේ වගාවත් දියුණු කරන්නේ කොහොමද කියලා. කෙසේ වෙතත්, අද මේ ඉදිරිපත් කර තිබෙන නියෝග දෙක පිළිබඳව මම සතුටු වෙනවා.

අපේ ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාත්, අපේ කනක හේරත් රාජ්‍ය ඇමතිතුමාත්, ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමාත් කෘෂිකර්ම ක්ෂේත්‍රය හරහා ආර්ථිකය නඟා සිටුවන්න විශාල සේවාවක් කරලා තිබෙනවා. ඒ වාගේම, අද ලෝක වෙළෙඳ පොළේ රබර්වලට තිබෙන ඉල්ලුම ඇමෙරිකානු ඩොලර් බිලියන 400ක් කියලා යම්කිසි විධියක විශ්වාසයක් තිබෙනවා. හැබැයි, මේක 2025 වෙනකොට බිලියන 600කට විතර වර්ධනය වෙනවා කියලා තමයි හිතන්නේ. හැබැයි, අද අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. ලෝක වෙළඳ පොළේ සියයට 0.5ක වාගේ සුළු ප්‍රමාණයක් තමයි ලංකාවේ රබර්වලින් දෙන්නේ. අද අපේ රබර් නිෂ්පාදනය දිහා බැලුවොත් මෙට්‍රික්ටොන් 76,000ක් විතර නිෂ්පාදනය වෙනවා. නමුත්, ලංකාව ඇතුළෙන්ම මෙට්‍රික්ටොන් 140,000ක විතර ඉල්ලුමක් තිබෙනවා. ඒවායෙන් බහුතරයක්, එ් කියන්නේ සියයට 60ක් විතර අපි ගන්නේ ටයර් නිෂ්පාදනය කරන්න. සියයට 30ක් විතර ග්ලවුස් නිෂ්පාදනයට ගන්නවා. ඉතාම සුළු ප්‍රමාණයක් තමයි රබර් කිරි හැටියට අපි පිට රට යවන්නේ. හැබැයි, අපේ රබර් ගොවීන් එක්ක කථා කරනකොට ඔවුන් පොඩි චෝදනාවකුත් කරනවා. දැන් DSI වාගේ දේශීය ආයතනවලින් රබර්වලට හොඳ මිලක් දුන්නාට, සමහර ලොකු ජාත්‍යන්තර ආයතනවලින් ඒ මිල යම්කිසි විධියකට අඩු කරන්න කොයි වෙලාවේත් උත්සාහයක් තිබෙනවා කියලා.

රබර් ආශ්‍රිත නිෂ්පාදන දිහා බැලුවොත්, 2020දී ඇමෙරිකානු ඩොලර් මිලියන 786ක පමණ රබර් ප්‍රමාණයක් තමයි අපි අපනයනය කළේ. හැබැයි, 2021 වෙනකොට රබර් අපනයනයෙන් ලැබූ ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,050ක් දක්වා වර්ධනය කර ගන්න අපට පුළුවන් වුණා. ඒ කාරණා සියල්ල දෙස බැලුවාම, මෙම රජය යම්කිසි විධියකින් දේශීය ආර්ථිකය නඟා සිටුවන්න විශාල උනන්දුවක්, උත්සාහයක් ගෙන තිබෙන බව අපට කියන්න පුළුවන්.

අද අපේ විපක්ෂ මන්ත්‍රීවරු ඩොලර් ප්‍රශ්නය ගැන කථා කළා. ඇත්ත වශයෙන්ම අද අපි තේරුම් ගන්න ඕනෑ, අපේ රටේ ගෑස් ප්‍රශ්නය හෝ වෙනත් මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, මේ ඔක්කෝම ප්‍රශ්න ඩොලර් ප්‍රශ්නයත් එක්ක බද්ධ වෙලා තිබෙන බව. සංචාරක ව්‍යාපාරයෙන්, විදේශ ශ්‍රමිකයන්ගෙන් සහ අනෙකුත් ක්‍රමවලින් අපේ රටට ගලා ආ ඩොලර් ආදායම බිලියන 13ක් විතර වාර්ෂිකව අපට අහිමි වුණා. ඒ අහිමිවීම පසුගිය අවුරුදු 3ක පමණ කාලයක සිට ඇති වුණු දෙයක්. ඒ වාගේම, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මැද පෙරදිග රැකියා කරපු ලක්ෂ එකහමාරක් වාගේ පිරිසක් නැවත ලංකාවට ආවා. ගිය අවුරුද්දේ 129,000ක පමණ ශ්‍රමිකයන් පිරිසක් නැවත පිට රට යවන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, දේශීය ආර්ථිකය නඟා සිටුවන වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙනිච්චොත් අපට විශාල ලෙස ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

මෙතැනදී දැන් පොහොර ප්‍රශ්නය ගැනත් කථා කළා. ඇත්ත වශයෙන්ම කෑගලු දිස්ත්‍රික්කයේ ආසනවලට යනකොට අපි දකිනවා, වී ගොවීන්ට කිසිම ප්‍රශ්නයක් නැති බව. අද වී අස්වැන්න දිහා බැලුවොත්, පසු ගිය අවුරුද්දේ අස්වැන්නට වඩා වී අස්වැන්න හොඳයි කියලා ඔවුන් කියනවා. අපි පොඩ්ඩක් භය වෙලා හිටියා. මොකද, වී කරල පොඩ්ඩක් කහ පැහැ වුණා. නමුත් පොහොර ටික දැම්මාම බොල් වී ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා කියලා ගොවීන් කියනවා. ඒ වාගේම වී කරලේ බර වැඩියි කියාත්

[ගරු තාරක බාලසූරිය මහතා]

කියනවා. මම හිතන්නේ මේ අවුරුද්ද වෙනකොට තවදුරටත් ගොවීන් උනන්දු වෙයි. හැබැයි, විපක්ෂය අද කියන්නේ කොහොමද? පොහොර ටික දෙන්න, පොහොර ටික දෙන්න කියනවා. නමුත් ඒ අය මෙහි අනික් පැත්ත ගැන කථා කරන්නේ නැහැ. අපි දිගටම කෘත්‍රිම පොහොර -රසායනික පොහොර- පාවිච්චි කළොත් අන්තිමටම මොකක්ද වෙන්නේ? තව ටික කාලයක් යනකොට අපට පොළොන්නරුවේ විතරක් නොවෙයි හැම පැත්තකම, හැම දිස්ත්‍රික්කයකම වකුගඩු ඉස්පිරිතාල හදන්න වෙනවා. මේකට විසඳුම මොකක්ද කියලා අපේ විපක්ෂයේ අය කියන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ අවුරුදු දෙක තුළදී විපක්ෂය ඉතාම කුහක දේශපාලනයක් කළේ. ඒ අය අඩුපාඩු පෙන්වන්න හදනවා කිව්වාට කිසිම විධියකට ඒ අයුරින් නොවෙයි කටයුතු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය අඩුම ගණනේ එන්නත් කර ගන්නවත් ජනතාව උනන්දු කළේ නැහැ. විපක්ෂයේ ඉන්න එක නායකයෙක්වත් රටේ දරුවන්ට කිව්වේ නැහැ, ගිහිල්ලා එන්නතක් ලබා ගන්න කියලා. අපේ සජිත් ප්‍රේමදාස මහත්තයා කිව්වා, එන්නත අන්තිමට ලබා ගන්නවා වාගේ කථාවක්. අනුර දිසානායක මහත්තයා කිව්වා, එන්නත ගහ ගන්නේ නැහැ වාගේ කථාවක්. හැබැයි, අන්තිම මොහොතේ දෙන්නාම මොකක්ද කළේ? ජනතාවට කියන්නේ නැතුවම හොරෙන් ගිහිල්ලා ඒ එන්නත ගහ ගත්තා. මෙන්න මෙවැනි අය සිටින විපක්ෂයක් තමයි අද කෘෂිකර්මය ගැන කථා කරන්නේ. නමුත් යහ පාලන කාලයේ කෘෂිකර්මයට මොකක්ද වුණේ කියන එක අද ගොවීන්ට මතක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැනදී අපි තේරුම් ගන්න ඕනෑ අපි මේ ඉන්නේ ගෝලීය ප්‍රශ්නයක බව. කොවිඩ් වසංගතය තවම ඉවර නැහැ. සාපේක්ෂව බැලුවොත් ඔමික්‍රෝන් වයිරසයෙන් ලෙඩේ දරුණු නැති වුණත් ඉදිරියේදී තව වයිරස් ප්‍රභේද එන්න බොහෝදුරට ඉඩ කඩ තිබෙනවා. සමහර විට කොවිඩ් වසංගතයත් එක්ක තව සෑහෙන කාලයක් ජීවත් වෙන්න ඉඩ කඩ තිබෙනවා. හැබැයි, මේ අපහසු වකවානුවක් වුවත්, මෙම රජයේ නිසි කළමනාකරණය නිසා අපට යම්කිසි මට්ටමකට ඔළුව උස්සන්න දැන් පුළුවන් වෙලා තිබෙනවා. මම කියන්නේ නැහැ, අද තිබෙන ඩොලර් අර්බුදය දරුණු ප්‍රශ්නයක් නොවෙයි කියලා. ඇත්තටම එය දරුණු ප්‍රශ්නයක්. ඒක ලංකාවට විතරක් නොවෙයි අනික් රටවලත් තිබෙනවා. නමුත් මෙම ප්‍රශ්නයෙන් ගොඩ එන්න නම් අපි එක විධියකට කටයුතු කරන්න වුවමනා වෙනවා. ඒ කියන්නේ සියලුදෙනාම එකතු වෙලා මේ රට ගොඩගන්නේ කොහොමද කියලා කල්පනා කරලා, ඒකට විසඳුම් සොයන්න වුවමනාවක් තිබෙනවා.

විශේෂයෙන්ම රබර් කර්මාන්තය ගැන කථා කරනකොට අද රබර්වලට හොඳ මිලක් තිබෙන බව කියන්න ඕනෑ. නමුත් අපි අපේ ඇමතිතුමන්ලාට මෙතැනදී කියන්න ඕනෑ, විශේෂයෙන්ම රබර් නිෂ්පාදනයට අවශ්‍ය ඇසිඩ්වල මිල දැන් සෑහෙන වැඩි වෙලා තිබෙන බව. රුපියල් 8,000ට තිබුණු ඇසිඩ් අද වෙනකොට රුපියල් 20,000ට මිල වැඩි වෙලා තිබෙනවා. රබර් නිෂ්පාදනයෙන් නියම ප්‍රතිලාභයක් ලබා ගන්න අවශ්‍ය නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇසිඩ්වලටත් යම්කිසි මිල පාලනයක් ගෙන ඒමේ අවශ්‍යතාව තිබෙනවා.

ඒ වාගේම අපි දැක්කා රබර්, තේ විතරක් නොවෙයි විශාල ලෙස කෘෂි කාර්මික වගාව දියුණු කරන්නත් රජයේ උනන්දුව තිබෙන බව. හැබැයි, පසුගිය අවුරුදු 5 ගත්තොත් ඒ යහ පාලනයේ න්‍යාය මොකක්ද? ගොවිතැන සම්පූර්ණයෙන්ම නවත්වලා ඉන්පසු පිටරටින් ඒ භාණ්ඩ ටික ආනයනය කරන්න ඕනෑ කියන එකයි ඒ න්‍යාය වුණේ.

මෙතැන ඉන්න මැති ඇමතිවරුන් ආර්ථික අපහසුතා ගැන කථා කළා. හැබැයි, ඒ එක්කෙනෙක්වත් මතක් කළේ නැහැ, අපට තිබෙන ජාත්‍යන්තර බැඳුම්කර ගැන. ජාත්‍යන්තර බැඳුම්කර බිලියන 17.5ක් තිබුණා. ඒකෙන් 12.5ක්ම යහ පාලන ආණ්ඩු කාලයේ ගත්ත බැඳුම්කර කියලා කවුරුවත් කිව්වේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව විතරයි මේ බැඳුම්කරවලට ගෙවන්න කටයුතු කරලා තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ බැඳුම්කර ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක් ගත්තා. හැබැයි, බිලියන 12.5ක්ම ගත්තේ යහ පාලන ආණ්ඩුවෙන්කියන එක යහ පාලන ආණ්ඩුවේ හිටපු අයට අද අමතක වෙලා තිබෙනවා.

මම හිතන හැටියට දැන් මේ වසංගතයේ යම්කිසි මට්ටමක අඩුවීමක් තිබුණත්, අපි රටක් හැටියට හිට ගන්න නම් තවදුරටත් අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ. ආර්ථිකය ශක්තිමත් කරනවාය කියන එක මේ තිබෙන පසුබිමත් එක්ක එච්චරම ලෙහෙසි පහසු දෙයක් නොවෙයි.

මේ අවස්ථාවේ අපි කුහක දේශපාලනයෙන් ඉවත්වෙලා රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම ඉතා වැදගත්. ඒ නිසා මම අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ, පොහොර ප්‍රශ්නයද, අර ප්‍රශ්නයද, මේ ප්‍රශ්නයද කියමින් මිනිසුන් වැරදි මාර්ගවලට පොලඹවන්නේ නැතුව මේ රජය කරන හොඳ දේවල්වලට සහයෝගය දෙන්න කියලායි. කාබනික පොහොර භාවිතයෙන් ජයග්‍රහණය අත් කර ගන්න පුළුවන් කියලා අද බහුතරයකගේ මතයක් තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය නිම කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුදිතා ප්‍රිශාන්ති මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.38]

**ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஷான்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් කථා කරන කොට මුලින්ම මතක් කළ යුතුයි, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග තුන අතරට රබර් එක්ව තිබෙන බව. රබර් බෝගය ශ්‍රී ලංකාවට පළමුවරට හඳුන්වා දෙන්නේ, සර් හෙන්රි වික්හැම් මහතා විසින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රබර් වගාව ආරම්භ කළ ලෝකයේ පළමු ආසියාතික රට ශ්‍රී ලංකාවයි. ස්වාභාවික රබර් කර්මාන්තය අතින් ලෝකයේ ප්‍රධාන තැනක් අප රටට හිමිව තිබෙනවා. බස්නාහිර, සබරගමුව, මධ්‍යම හා දකුණු පළාත්වල ඇතැම් දිස්ත්‍රික්කවල හා මොනරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව ශීඝ්‍රයෙන් පැතිර තිබෙනවා. රබර් ගසක ආයු කාලය වසර 100ක් පමණ වනවා. පැළයක් සිටුවා වසර පහකින් අස්වැන්න ලබාගත හැකි අතර, අවුරුදු තිහක කාලයක් එක රබර් ගසකින් අස්වැන්න ලබා ගන්න පුළුවන්. එය ආර්ථිකමය වශයෙන් ඉතා ප්‍රයෝජනවත්. වියළි කලාපයේ නම් බොහෝ විට මූලික අස්වැන්න ලබා ගැනීම සඳහා අවුරුදු හයක පමණ කාලයක් ගත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා මේ අවස්ථාවේ විශේෂයෙන් කියන්න ඕනෑ, අපේ රටේ රබර් වගාකරුවන්ට අද හොඳ ආදායමක් ලැබෙන බව. පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ රබර් ගොවියාට දුන්න සහන මොනවාද කියලා අපි කවුරුත් දන්නවා. ඒ කාලයේ රබර් කිලෝවකට රුපියල් 170කුත්, ඔට්ටපාලු කිලෝ එකකට රුපියල් 80කුත් තමයි වගාකරුවන්ට ලැබුණේ. ඒ නිසා තමයි රබර් වගාකරුවන් පාරට බැස්සේ. ඒවා අමතක කර දමලායි අද විපක්ෂය කථා කරන්නේ. අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019 වසරේ බලයට පත්වුණාට පසුව රබර් කර්මාන්තයේ දියුණුව සඳහා රබර්වලට ඉතා හොඳ මිලක් දුන්නා. මේ වන විට රබර් ෂීට් කිලෝ එකකට රුපියල් 415ක්, 420ක් වැනි ගෙවීමක් කරනවා. ඒ වාගේම ඔට්ටපාලු කිලෝ එකක් සඳහා රුපියල් 220ක් ගෙවනවා. අමුකිරි කිලෝ එකක් සඳහා රුපියල් 460ක් ගෙවනවා. මේ වාගේ සහන අපේ ආණ්ඩුව තුළින් හැරෙන්න වෙනත් කිසිදු ආණ්ඩුවකින් ලබා දුන්නේ නැහැ. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව තමයි මෙවැනි මිලක් රබර් වගාකරුවන්ට ලබා දුන්නේ.

රබර් නැවත වගා කිරීමේ සහනාධාරය හැටියට රුපියල් ලක්ෂ තුනහමාරක් ලබා දෙනවා. එම සහනාධාරය ඉස්සර මාස අටක් තිස්සේ ගෙවනවා. දැන් මාස පහක් තුළ ඒ සියලු ගෙවීම් කටයුතු අවසන් කරන්න අප රජය මඟින් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම අතුරු බෝග වගා කරන රබර් ගොවියාට අක්කර එකකට රුපියල් 4,000ක මුදලක් සහනාධාර වශයෙන් ලබා දෙනවා. ඒ වාගේම දුම්ගෙවල් සහනාධාරය ලෙස 150,000ක් ලබා දෙනවා. රෝල් ජෝඩු සඳහා ගෙවීමට අවශ්‍ය මුදලින් සියයට පනහක සහනාධාරයක් දෙනවා. කිසිදු අය කිරීමකින් තොරව කම්බි කෝප්ප ලබා දෙනවා. අතිගරු ජනාධිපතිතුමා මෙවැනි සහනාධාර ලබා දීලා තිබෙනවා. එක් ගසක් වැසි ආවරණය කිරීම සඳහා රුපියල් 70ක මුදලක් ලබා දෙනවා. ඒ වාගේ සහන රාශියක් ලබා දෙනවා.

ශ්‍රී ලංකාවේ කුඩා වතු හිමියන් සහ වතු සමාගම් හෙක්ටෙයාර 128,879ක රබර් වගා කරනවා. ඒ අතරින් හෙක්ටෙයාර 83,253ක වගා කටයුතු කුඩා රබර් වතු හිමියන් කරන්නේ. මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේත් කුඩා වතු හිමියන් තමයි විශාල වශයෙන් ඉන්නේ. ඔවුන්ට ලබා දෙන විශේෂ සහනයක් ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ, හොඳ රබර් වෙළෙඳ පොළට ගෙනෙන ගොවියාට එකම මිලක් තහවුරු නොකර මිල පරාසයක් තියලා රුපියල් පනහක් හෝ රුපියල් සියයක්වත් වැඩියෙන් දෙන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න කියලායි.

ඒ වාගේම සමිති සමාගම් හරහා කුඩා කර්මාන්ත ආරම්භ කිරීමටත්, රබර් ෂීට් සඳහාත් අමතර සහනාධාරයක් ලබා දෙන්නත් කටයුතු කරන්න කියලා මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. අද ඇසිඩ් මිල සම්බන්ධයෙනුත් ගැටලුවක් තිබෙනවා. ගරු තාරක බාලසූරිය රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, ඇසිඩ් සඳහා විශාල මුදලක් අය කරනවා. ඇසිඩ් මිල වැඩි නිසා දැන් රබර් වගා කරන්නේ නැහැ. ඒ නිසා ඇසිඩ් සඳහා සාධාරණ මිලක් ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා. අපේ දිස්ත්‍රික්කයේ තේ වගාකරුවන් විශාල පිරිසක් සිටිනවා. ඒ අයටත් මේ වනකොට ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. අපේ ගරු ඇමතිතුමන්ලා හරහා ඒවාටත් නිවැරදි විසඳුම් ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රජය යටතේ අපි කුඩා තේ වතු හිමියන්ට, රබර් වතු හිමියන්ට සහනාධාර රාශියක් ලබා දීලා තිබෙනවා. තවදුරටත් මේ වගාකරුවන් ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් යොදන්න කියලා ගරු ඇමතිතුමන්ලාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා.2.44]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. කලින් කථා කළ ගරු තාරක බාලසූරිය රාජ්‍ය අමාත්‍යතුමා ඉතාම වැදගත්, හොඳ රාජ්‍ය අමාත්‍යවරයෙක්. එතුමා කිව්වා, විපක්ෂය කුහක විධියට කථා කරන්න හොඳ නැහැ කියලා. හැබැයි, එතුමාට පුංචි වැරැද්දක් වුණා. කොවිඩ්-19 පාලනය කිරීම සඳහා එන්නත ගහන එක ගැන මේ උත්තරීතර සභාවේදී මුලින්ම ඉල්ලීම කළේ, අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. "කවදාද, මේ එන්නත ගෙනැල්ලා ගහන්නේ" කියලා ඇහුවේ අපේ නායකතුමායි. එන්නත ගහන්න එපා කියලා අපි කිව්වාද? අපි තමයි එන්නත ගහන්න කියලා මුලින්ම කිව්වේ. හැබැයි, එතුමා ඒක වෙනස් කරමින් කථා කිරීම ගැන අපි බොහොම කනගාටු වෙනවා. *[බාධා කිරීම්]*

නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ පනවන නියෝග සහ රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පනවන නියෝග පිළිබඳව කථා කරන මේ මොහොතේ මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ කරුණු සියල්ල ආර්ථිකයට තමයි බලපාන්නේ. අද ආර්ථිකයට බලපාන ප්‍රධානම සාධක දෙක තමයි තෙල් සහ විදුලිය කියන්නේ. දැන් තෙල් සහ විදුලියට මොකක්ද සිද්ධ කරලා තිබෙන්නේ? තෙල් ප්‍රශ්නය නිසා අද සමස්ත රටම ආර්ථික වශයෙන් කඩා වැටී තිබෙනවා. තමුන්නාන්සේලා මේ රට ගොඩනහන්න කොපමණ උත්සාහ කරනවා කිව්වත්, තමුන්නාන්සේලාගේ එදිනෙදා ක්‍රියාවලිය අනුව සිද්ධ වන දේ තමයි, දිනෙන් දින රට කඩාගෙන වැටෙන එක; ජනතාව බලාපොරොත්තු වන ජීවිතය නැති වෙන එක.

ඒ වාගේම තමයි විදුලිය පිළිබඳ ප්‍රශ්නයත්. තවම මේ ප්‍රශ්න දෙක හරියට විසඳා ගන්න මේ ආණ්ඩුවේ කණ්ඩායම්වලට බැහැ. වියත්මඟ කිව්වා, අර මඟ කිව්වා, ඉණිමඟ කිව්වා. හැබැයි, ඒ එක මඟක්වත් නැතිව අද හෙණමඟ තමයි ජනතාවට තිබෙන්නේ. තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම මේ වැටිලා තිබෙන තත්ත්වයෙන් රට නැඟිට්ටවන්න. මේ පනත් කෙටුම්පත්, නියෝග ඔක්කොම අපට සම්මත කර ගන්න පුළුවන්. සම්මත කරලා ජනතාවට මෙවායින් වැඩ කරන්න පුළුවන්. හැබැයි, එහෙම වැඩ කරද්දී රටට අවශ්‍ය මූලිකාංග ටික නැතිව ගියොත් මොකක්ද වෙන්නේ?

මම මේ උත්තරීතර සභාවෙන් ප්‍රශ්නයක් අහනවා, කරුණාකර පිළිතුරු දෙන්න. විදුලිය ගැන කථා කිරීමේදී මේ කාරණය කියන්න ඕනෑ. ගරු අමාත්‍යවරයෙක් රුපියල් එකෝකෝටි විසිලක්ෂයක පමණ විදුලි බිලක් ගෙවන්න තිබෙනවා. ඒක තිබෙන්නේ හමුදා නිලධාරියෙකුගේ නමක් යටතේ කිව්වා. ඒ විදුලි බිල ගෙවලා නැත්නම් ඒක මහා හෙණ ගහන අපරාධයක්. මේ රටේ ආප්ප කඩේ, කඩල කඩේ, වඩේ කඩේ කරන දුප්පත්, අහිංසක මිනිසුන්ට විදුලිබල මණ්ඩලයෙන් පාට් එකකුත් දාලා කරන්ට් එක කපලා යනවා. හැබැයි, ඇමතිවරයෙකුගේ එක්කෝටි විසි ලක්ෂයක පමණ බිලක් තිබෙනවා නම්, ඒක ගෙවලා නැත්නම් වහාම ඒක ගෙවන්න ඕනෑ. ඒක ගෙවලා නැත්නම් ඒක මහා පාප කර්මයක්. ඉස්සර වෙලා ඒක කරන්න කියලා අපි ඉල්ලනවා. මේ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ගරු සභාවට කියන්න එහෙම දෙයක් තිබෙනවාද නැද්ද කියලා. ඒ වාගේම අනික් සියලු ඇමතිවරුන්ගෙන් අපි ඉල්ලනවා කරුණාකර ඔබතුමන්ලාගේ ලක්ෂ ගණන්, කෝටි ගණන් විදුලි බිල් තිබෙනවා නම් වහාම ඒවා ගෙවන්න කියලා. මොකද, මේ රටේ මිනිස්සු අඳුරේ ඉන්නේ ඒ විධියට බිල් ගෙවන්න තිබෙන මිනිස්සු ඒවා ගෙවන්නේ නැති නිසායි. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට, ජනතාව වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම හැටියට අපට වගකීමක් තිබෙනවා නම්, ඒ වගකීම පළමුවෙන් ඉෂ්ට කරන්න ඕනෑ. අපි සියලුදෙනාම මේ උත්තරීතර පාර්ලිමේන්තුවට හෝ ගෙනැල්ලා පෙන්වා දෙමු, අපේ විදුලි බිල් මෙහෙමයි, ඒවා අපි ගෙවා තිබෙනවාද නැද්ද කියලා. ඒක පාඩමක් හැටියට කියලා දෙන්න ඕනෑ.

තෙල් මිල සම්බන්ධ කාරණය ගැනත් මම කථා කරන්න ඕනෑ. අද හිතා මතාම petrol shedවලට තෙල් එවන්නේ නැහැ. එහෙම එවන්නේ නැත්තේ ජනතාවගේ ගමන් බිමන් අඩු කරන්නයි.

ජනතාවගේ ගමන් බිමන් අඩු කරනවා කියන්නේ, අත්‍යවශ්‍ය ගමන් බිමන් ටික අඩු වෙනවා කියන එකයි. අද වෙලේ හාන ට්‍රැක්ටරය තෙල් ටික නැතුව නතර වෙලා තිබෙනවා; ගොයම් කපන මැෂින් එක තෙල් ටික නැතුව නතර වෙලා තිබෙනවා. ඒ අය අද බියෙන් ඉන්නවා. පොහොර නැතුව එක පැත්තකින් ගොවීන් කඩා ගෙන වැටුණා. ඉන්පසුව ඒ අයගේ අස්වැන්න නැති වෙලා තිබෙනවා. දැන් තිබෙන අස්වැන්නත් නෙළා ගන්න ක්‍රමයක් නැහැ, මේ තෙල් ප්‍රශ්නය නිසා.

මේසන් බාස්ගේ, වඩු බාස්ගේ ඉඳලා සියලුදෙනාට සිමෙන්ති නැතිව හෙණ ගෙඩියක් ඔළුවට වැටිලා තිබෙන වෙලාවක, තෙලුත් නැතිව ගියාම කිසිදු වැඩකටයුත්තක් කර ගන්න බැහැ. සියලු ජන කොටස්වලට, සියලු ව්‍යාපාරවලට මේ තෙල් ප්‍රශ්නය විශාල වශයෙන් බලපානවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට මේ ප්‍රශ්නය විසඳන්න බැරි නම් දෙයියනේ කථා කරලා කියන්න. අපි ඔක්කෝම එකට වාඩිවෙලා මේ රටේ යම් කිසි වැඩ පිළිවෙළක් හදමු. තමුන්නාන්සේලා දැන් අදක්ෂයි; ෆේල්. තමුන්නාන්සේලා අද මේ රටේ බලයට පත් වෙලා හිටියාට, මොන විධියකින් හෝ සාපලත් කණ්ඩායමක්; රටේ ජනතාවට සාපයක් වෙලා තිබෙනවා. රටේ ජනතාව අද petrol shed එකට ගියත්, කඬේට ගියත්, කිරි පිටි ටික ගන්න ගියත්, ගෑස් ටික ගන්න ගියත් -මේ හැම තැනකදීම- කියන්නේ, "මේක මහා සාපයක්. උඹලාට හෙණ ගහපල්ලා, මන්ත්‍රීවරුන්ට හෙණ ගහපල්ලා" කියලායි. මේ දෙපැත්තටම ඒක කියනවා. ඇයි ඒ? මේක අපි විපක්ෂය හැටියට මෙතැන ඇවිල්ලා කියන දෙයක් නොවෙයි. හැමදාම නිවුස් බලන්නකෝ; නිවුස්වල මොනවාද කියන්නේ කියලා බලන්නකෝ. ජනතාව සාප ඉල්ලනවා. මොනවා හරි සාපයක් මෙතැන තිබෙනවා. එක්කෝ ලේ තැවරිච්ච කණ්ඩායමක් මේ රටේ ඉන්නවා. මේ ක්‍රමවේදය වෙනස් කළේ නැති නම් මේ රට ගැන, ආණ්ඩු ගැන, මේ පාර්ලිමේන්තුව ගැන තඹ දොයිතුවකවත් විශ්වාසයක් මේ රටේ මහ ජනතාව තබන්නේ නැහැ. ඒ නිසා අපි ඔක්කෝම එකට එකතු වෙලා අපේ වගකීම ඉෂ්ට කරමු. තමුන්නාන්සේලාට විතරක් නොවෙයි බණින්නේ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාටම බණිනවා. ඒ නිසා තමුන්නාන්සේලාත් එක්ක එකතු වෙලා අපේ වගකීම ඉෂ්ට කරන්න අපි සූදානම්. මේ රටේ මිනිසුන්ට කන්න, අඳින්න සහ තෙල් ටික, ගෑස් ටික, සිමෙන්ති ටික, විදුලිය නැතිවීම වැනි ප්‍රශ්න විසඳීම සඳහා තමුන්නාන්සේලා එක්ක වාඩි වෙලා සාකච්ඡා කරන්න අපි කැමැතියි. මේ රටේ ප්‍රශ්න ටික විසඳමින් රටේ ජනතාව ජීවත් කරවන්න අවශ්‍ය වැඩ පිළිවෙළට අපටත් කථා කරන්න. කථා කරලා රටක් හැටියට අපි එක විසඳුමකට එමු. ඩොලර් ටික කොහොමද හොයන්නේ, රට කොහොමද ඉස්සරහට ගෙනියන්නේ, ජනතාවට කන්න දෙන්නේ කොහොමද කියන ප්‍රශ්න පිළිබඳව අපි එක විසඳුමකට එමු. ඒ පණිවුඩය තමයි අද අපි ලබා දෙන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.50]

**ගරු ලලිත් වර්ණ කුමාර මහතා**
(மாண்புமிகு லலித் வர்ண குமார)
(The Hon.Lalith Varna Kumara)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපත් සමඟ දීර්ඝ කාලයක් පළාත් සභාවේ හිටපු මන්ත්‍රීතුමියක් අද මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම ගැන ගොඩක් සතුටුයි.

මේ රටේ ජනතාව වෙනුවෙන් අත්‍යවශ්‍ය කාරණා කිහිපයක් අද සාකච්ඡාවට ඉදිරිපත් කර තිබෙනවා. මේ තුළින් මේ රටේ ජනතාවට සුබවාදී අනාගතයක් නිර්මාණය කිරීම වාගේම රට ගොඩ නඟන වැඩ පිළිවෙළට සාර්ථක තීන්දු තීරණ ගැනීමේ අවස්ථාව සැලසෙනවා.

අද ඉදිරිපත් කර තිබෙන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ ගෙනෙන නියෝග හරහා ලංකාවේ 8 දෙනෙකු පමණ ඉන්න ක්ෂේත්‍රයට අලුතින් තව අයට ඇතුළත් වෙන්න ඉඩ ප්‍රස්ථාව හදා දීලා තිබෙනවා. ඒ තුළින් ගොවියාගේ නිෂ්පාදන කිහිප දෙනෙකු අතර රැඳෙන්නේ නැතිව සාධාරණව සුවිශේෂී මිලකට, තරගකාරී මිලකට විකුණා ගැනීම සඳහා අවස්ථාවක් උදා වෙනවා.

ඊළඟට, වැවිලි අමාත්‍යතුමා විසින් රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ නියෝග ඉදිරිපත් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම එය ඉතා වටිනවා. වැවිලි අමාත්‍යතුමා කියන්නේ මේ රටේ දක්ෂ ලෙස වැඩ කරන, උගත්, බුද්ධිමත් ඇමතිවරයෙක්. රාජ්‍ය ඇමතිතුමාත් එහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තේ, රබර්, පොල් තමයි අපේ රටේ ප්‍රධාන අපනයන භෝග හැටියට මුලින්ම හඳුන්වා දී තිබුණේ. පසුගිය කාලය තුළ පැවැති රබර් මිල නිසා ඒ වෙනුවට වෙනත් දේවල් වගා කරන්න ගොඩක් අය උත්සාහ කළා. අපට මතකයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළ රබර් කිලෝ එකකට රුපියල් 600කට එහා ගිය මිලක් ලැබුණු බව. ඒ නිසාම රබර් වගාව සුරක්ෂිත වුණා.

නමුත් ඊට පසු කාලයේ ඒ සාධාරණය ඉටු නොවුණු අතර ඒ වෙනුවට ලංකාවේ මිලට වඩා අඩු මිල ගණන්වලට පිටරටින් රබර් ගෙන්වපු නිසා ඒ කර්මාන්තයත් පහළට වැටුණා. ඒ විතරක් නොවෙයි. රබර් දර ආශ්‍රිතව ආරම්භ කළ කර්මාන්ත තුළිනුත් අපේ ප්‍රදේශවල තිබෙන රබර් ගස් ටික විනාශ වන තත්ත්වයට පත්වන අවස්ථා නැතුවා නොවෙයි. ඒ කෙසේ වෙතත්, අද ඉදිරිපත් කරන නියෝග තුළින් නැවත රබර් වගා කිරීම සඳහා එදා හෙක්ටයාරයකට ලබා දුන් රුපියල් 1,75,000 මුදල වෙනුවට අද රුපියල් ලක්ෂ 3ක් රබර් ගොවියා වෙනුවෙන් ලබාදීම පිළිබඳව අද

අපි සතුටු වෙනවා. මේ නිසා ඒ අය රබර් වගාව වෙනුවෙන් ඉතාම කැප වීමෙන් කටයුතු කරනවා.

මීට පෙර කථා කළ අපේ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ රජයෙන් තවත් නොයෙක් සහනාධාර දෙනවා. රබර් ගහ වැඩුණාට පස්සේ රබර් කිරි නිෂ්පාදනය කරනකොටත් සහනාධාර විශාල ප්‍රමාණයක් දෙනවා. ඇත්තටම මේ තුළින් ගොවියාට ලොකු ලාභයක් ලැබෙනවා. මේ දෙන දේවල් රජය නැවත ගන්නේ නැහැ. අපට වටින්නේ, "ඩොලර් නැහැ. ඩොලර් නැහැ"යි කියා කෑ ගහනවා වෙනුවට අපේ නිෂ්පාදන පිටරටවලට යවලා ඩොලර් ලබා ගන්න එකයි. ඩොලර් දීලා ඩොලර් සොයන ක්‍රමය නොවෙයි, අපේ ද්‍රව්‍ය දීලා ඩොලර් ලබා ගන්නා ක්‍රමය ඒ තුළින් ඉස්මතු වෙනවා. හැබැයි, මෙය ජනප්‍රිය නොවෙන්න පුළුවන්. තව අවුරුදු කිහිපයක් යන කල් මෙහි ඵලදාව ගන්න බැරි වෙන්න පුළුවන්. නමුත් අපි අද හෝ ඒ ගැන හිතුවේ නැත්නම්, ඒ වෙනුවෙන් ක්‍රියා කළේ නැත්නම්, අපට මේ කටයුතු ඉදිරියට ගෙන යන්න පුළුවන්කමක් නැහැ.

1977 කාලය අපට මතකයි. අද සමහර අය කියනවා, "එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ක්‍රියාත්මක කළ ක්‍රමය ඉතා හොඳයි. ඒ ක්‍රමය ක්‍රියාත්මක වුණා නම්, අද මේ රට කාටවත් යටත් නැති රටක් හැටියට ගොඩ නැඟෙනවා" කියලා. සමහරු අද එය තේරුම් ගෙන තිබෙනවා. නමුත් ඇත්තටම ඒ දවස්වලත් අද වාගේම එදා ආණ්ඩුව පෙරළන්න වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. විපක්ෂය අද කරන වැඩ පිළිවෙළ වාගේම වැඩ පිළිවෙළ කරලා තමයි එදාත් ජනතාව නොමඟ යැව්වේ. අදත් කරන්නේ ජනතාව නොමඟ යැවීමක්.

අද සමහරු කියනවා, ඉන්ධන පෝලිම් තිබෙනවා කියලා. ඉන්ධන පෝලිම් තිබෙනවා තමයි. එදා රුපියල් 500ක පෙට්‍රල් ගහපු කෙනා, අද රුපියල් 2,000ක, රුපියල් 3,000ක පෙට්‍රල් ගහගෙන යනවා. ඒ පෙට්‍රල්, ෂෙඩ් එකක් ළඟට බට දිගේ එන්නේ නැහැ. කුමන හෝ ප්‍රවාහන ක්‍රමයක් තුළින් තමයි ෂෙඩ් එකට ඉන්ධන එන්නේ. ඉන්ධන පිරිපහදු කරන ක්‍රමයක් තිබෙනවා. රටේ ජනතාවට දෙන පණිවුඩය තුළින් ජනතාව ඉක්මන් වීම නිසා එවැනි අවස්ථාවල හිඟයක් ඇති වෙනවා.

ඒ විතරක් නොවෙයි. මීට පෙර කථා කළ මන්ත්‍රීවරයකු කිව්වා, රසායනික ද්‍රව්‍ය තහනම් කළා කියලා. රසායනික ද්‍රව්‍ය තහනම් කළා තමයි. ඒ තහනම් කළේ මේ අවුරුද්දට. ගිය අවුරුද්දට අවශ්‍ය ප්‍රමාණය ලංකාවට ගෙනාවාට පස්සේ තමයි තහනම් කළේ. හැබැයි, මොකක්ද වුණේ? දේශපාලන කුහකකමත් එක්ක, විපක්ෂය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්, ව්‍යාපාරිකයන් කපටි කමට තමන්ට ලැබෙන ලාභය දෙගුණ, තෙගුණ කර ගන්න ඒ පොහොර ටික හංගා ගත්තා. ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න ඕනෑ කියලා විපක්ෂය ඒ අයට සහයෝගය දුන්නා. අදත් පොහෙ◌ාර නැතුවා නොවෙයි. අද ඕනෑ තැනක පොහොර තිබෙනවා. හැබැයි, අන්තිමට වුණේ, මිලක් නැතුව පොහොර හොරට විකුණන එක. මේවා අලුතින් ගෙනාපු පොහොරද? නැහැ. මේ ඔක්කොම හංගා ගත්ත පොහොර. මේක තමයි, විපක්ෂය කරන වැඩ පිළිවෙළ.

දැන් විදුලිය නැහැ, විදුලිය නැහැයි කිය කියා මීට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් කෑ ගැහුවා. ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න එතුමන්ලා සූක්ෂ්ම වැඩ පිළිවෙළ රාශියක් කරන බව අපි දන්නවා. සමහර විට ගෙවල්වල තිබෙන CFL bulbs, LED bulbs ගලවලා, තමන්ගේ විදුලි බිල වැඩිවුණත්, current එක වැඩියෙන් යන bulbs දමලා, මුළු ගෙදරම තිබෙන ඔක්කොම bulbs එළි වන කල් දල්වා තබන සූක්ෂ්ම වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා. එයින් කරන්නේ මේ රටට හානියක්. එවැනි වැඩ පිළිවෙළවල් නොකරනවා නොවෙයි. එවැනි වැඩ පිළිවෙළ කරලා තමයි ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න කටයුතු කරන්නේ.

එතුමන්ලා කියනවා, එන්නත් ගෙනෙන්න ඉල්ලීමක් කළේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ලු. ඒක ඇත්ත වෙන්න ඇති. හැබැයි ගෙනෙන්න බැරිවෙයි කියලා හිතුවා. එන්නත් ගෙනාවාම කරන්න දෙයක් නැති නිසා කිව්වා, "මම එන්නත විදින්නේ නැහැ" කියලා. අදටත් කරන්නේ ඒකයි. අද මේ රටේ ජනතාව අපහසුතාවට පත් කරනවා. "තුන්වන එන්නත විදින්න එපා. මෙහෙම වෙනවා, මෙහෙම වෙනවා" කියලා කියනවා. ඒ එන්නත් විදලා මේ ව්‍යසනයට සාර්ථකව මුහුණ දුන්නාම මේ අයට කියන්න, කරන්න දෙයක් නැහැ. ඒ ගොල්ලෝ හැම දාම බලන්නේ ජනතාව අපහසුතාවට පත් කරන්නයි.

2015දී අපේ හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත්වෙලා ගෙදර යනකොට මේ රටේ තිබුණු වී ප්‍රමාණය දමන්න තැනක් නැතුව, මේ අය ඒ වී ගෙන ගිහින් මත්තල ගුවන් තොටුපොළේ තමයි ගබඩා කළේ.

ඒ තරම් වී තිබුණා, අපි 2015දී ආණ්ඩුව භාර දෙනකොට. ඒ විතරක් නොවෙයි. සංඛ්‍යා ලේඛන අරගෙන බලන්න, අනුරාධපුරයේ, පොළොන්නරුවේ ගොවියෝ කී දෙනෙකු 2015න් පස්සේ වහ බීලා මැරුණාද කියලා. අපේ ආණ්ඩුව තරම් ගොවි ජනතාවට, එහෙම නැත්නම් කෘෂිකර්මයට හැම දාම සේවාවක් කරපු වෙනත් ආණ්ඩුවක් නැහැ.

විපක්ෂය සමහර වෙලාවට බැඳුම්කරය පිළිබඳවත් කථා කරනවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලය තුළදී -ඒ අවුරුදු පහටම- සම්පූර්ණයෙන්ම ණය අරගෙන තිබෙන්නේ බිලියන 5,000යි. හැබැයි, යහ පාලන ආණ්ඩුවේ අවුරුදු පහට බිලියන 12,500ක් ණය අරගෙන තිබෙනවා. අපි ගත් ඒවා අද දක්වා ව්‍යාප්ත වෙලා පරිහරණය වනවා. ඒ මුදල්වලින් හදපු අධිවේගී මාර්ග, ගුවන් තොටුපොළවල් තමයි අද ආයෝජන බවට පත් වෙලා තිබෙන්නේ. හැබැයි, යහ පාලන ආණ්ඩුවේ අවුරුදු පහට ගත් බිලියන 12,500ට මොනවාද වුණේ කියන එක අපි හොයන්න ඕනෑ. ණය ගෙව්වාද, එහෙම නැත්නම් ඒ මුදල්වලින් කරපු වැඩවල ප්‍රතිඵලය මොකක්ද, ඒ තුළින් රටට ආපු ආයෝජනය මොකක්ද කියලා අපට දෙවරක් සිතා බලන්න වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Vadivel Suresh. You have six minutes.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Madam Chair, I have nine minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

No, you have got only six minutes.

[பி.ப. 2.59]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற இறப்பர் மீள்நடுகை மானியச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதத்திலே கலந்து கொண்டு, என்னுடைய தொப்புள்கொடி உறவுகளான மலையக மக்கள் சார்பாக ஒரு சில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன்.

இறப்பர் மானியம், தேயிலை மானியம் வழங்குவது அவசியம்தான். அதிலே எந்தவிதமான சந்தேகமும் கிடையாது. ஆனால், இந்த இறப்பர் தொழிற்றுறையை அல்லது தேயிலைத் தொழிற்றுறையை அல்லது பெருந்தோட்டத் தொழிற் றுறையைக் காப்பாற்றுவதற்கு மனித உயிர்கள் இன்றியமை யாதது. இன்று இறப்பர் மரங்களையும் தேயிலைச் செடி களையும் பாதுகாப்பதற்கு அக்கறைப்படுகின்ற இந்த அரசாங்கம், அவற்றைப் பராமரிக்கும் தோட்டத் தொழிலாளர் களை - மனித உயிர்களை - மறந்து செயற்படுகின்றது. தோட்டத்தொழிலாளர்களுக்கு 1,000 ரூபாய் சம்பள உயர்வு வழங்குவது தொடர்பில் தாக்கல் செய்யப்பட்டுள்ள வழக்கு எதிர்வரும் 24ஆம் திகதி விசாரணைக்கு வரவிருக்கின்றது. அந்தவகையில், 1,000 ரூபாய் சம்பள உயர்வு வழங்குவதாகக் கூறப்பட்ட காலத்துக்கு முன்பிருந்த வாழ்க்கைச் செலவுக்கும் இன்றைய வாழ்க்கைச் செலவுக்கும் இடையில் பாரிய வித்தியாசம் காணப்படுகின்றது என்பதை நான் பெருந் தோட்டக் கைத்தொழில் அமைச்சர் அவர்களுக்கும் தொழில் அமைச்சர் அவர்களுக்கும் தெரிவித்துக்கொள்ள விரும்பு கின்றேன். இன்று அவர்களுக்கு நாட் சம்பளமாக 1,000 ரூபாய் அல்ல, 2,500 ரூபாய் கொடுக்கப்பட வேண்டும்.

பெருந்தோட்டக் கம்பனிகள் தாக்கல் செய்திருக்கின்ற வழக்கைக் காரணங்காட்டி, நாளை மறுதினமான எதிர்வரும் 24ஆம் திகதி இடம்பெறவிருக்கின்ற வழக்கு விசாரணையின் பின்னரும் இதனை வழங்காது மேலும் இழுத்தடிப்புச் செய்வார்களேயானால், அது இந்த நாட்டிலே வாழ்கின்ற தோட்டத்தொழிலாளர்களுக்குச் செய்கின்ற பாரியதோர் அநீதி என்பதை நான் இந்த உயரிய சபையிலே கூறிவைக்கின்றேன். தற்பொழுது, இச்சபையில் பெருந்தோட்ட அமைச்சர் ரமேஷ் பதிரண அவர்களும் தொழில் அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்களும் நீதி அமைச்சர் அலி சப்ரி அவர்களும் இருக்கிறார்கள். எதிர்வரும் 24ஆம் திகதி நீதிமன்றத்தில் விசாரணைக்கு எடுக்கப்பட இருக்கின்ற தோட்டத் தொழிலாளர்களின் 1,000 ரூபாய் சம்பள உயர்வுடன் சம்பந்தப் பட்ட வழக்கை உடனடியாக முடிவுக்குக் கொண்டுவந்து, அவர்களுக்கு இன்றைய வாழ்க்கைச் செலவுக்கு ஏற்றவகையில் சம்பள நிர்ணய சபையினூடாக 2,500 ரூபாயைக் கொடுப்பதற்குரிய ஏற்பாட்டை நீங்கள் மூவரும் இணைந்து செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அவ்வாறு நீங்கள் செய்தால், "ஒரே நாடு, ஒரே சட்டம்" என்ற எண்ணக்கருவை நாங்கள் ஏற்றுக்கொள்வோம்.

இந்திய வம்சாவளி மக்களான மலைய மக்களைப் புறக்கணித்துவிட்டு, இந்தியாவிலிருந்து வருகின்ற எரிபொருள் கப்பலை வரவேற்பதற்கு அமைச்சர் செல்கின்றார். இந்தியா வால் வழங்கப்படுகின்ற உதவிகளை இந்த அரசாங்கம் பெற்றுக்கொள்கின்றது. இந்த நாடு கஷ்டத்தில் விழும்போது, இந்திய அரசாங்கத்தால் வழங்கப்படுகின்ற உதவிகளை இந்த அரசாங்கம் ஏற்றுக்கொள்வதாக இருந்தால், இந்திய வம்சாவளித் தோட்டத்தொழிலாளர்களைப் பெருந்தோட்டக் கம்பனிகள் வஞ்சிப்பதை ஏன் நிறுத்த முடியாது? ஒரு நாளில் பறிக்க முடியாத அளவு தேயிலைக் கொழுந்தைப் பறிக்குமாறு பெருந்தோட்டக் கம்பனிகள் சொல்கின்றன. அதாவது, 30 நாட்களில் செய்யவேண்டிய வேலையை 15 நாட்களில் செய்யச் சொல்கின்றன; 15 கிலோகிராம் கொழுந்து பறிக்கும் நேரத்தில் 30 கிலோகிராம் பறிக்கச் சொல்கின்றன; 150 இறப்பர் மரத்திலிருந்து பால் எடுக்கவேண்டிய நேரத்தில் 350 மரத்திலிருந்து பால் எடுக்குமாறு சொல்கின்றன. இதனை எவ்வாறு அவர்களால் செய்ய முடியும்? யட்டியாந் தோட்டை யிலுள்ள ஒரு தோட்டத்தில் குறிப்பிட்ட நேரத்துக்குள் 350 இறப்பர் மரத்திலிருந்து பால் எடுக்கச் சொல்கிறார்கள். அவ்வாறு எடுப்பதென்றால், ஒரு நாளைக்கு ஒரு தொழிலாளி 7 -8 கிலோமீற்றர் தூரம் நடக்க வேண்டும். இவை எல்லாம் நடைமுறையில் சாத்தியப்படாத விடயங்கள்! அவர்கள் robot அல்லர், மனிதர்கள்! நாங்கள் rupees and centsஐப் பற்றிப் பேசவில்லை. மாறாக, human rightsஐப் பற்றிப் பேசுகின்றோம்.

இன்று மலையகத்தில் மனித உரிமை மீறப்பட்டுக் கொண்டிருக்கின்றது. உடனடியாக இந்தப் பாராளுமன்றமும் சம்பந்தப்பட்ட அமைச்சர்களும் மலையகத்திலுள்ள மனித உயிர்களைக் காப்பாற்றுவதற்கு முன்வர வேண்டும். நீங்கள் அந்த மக்களை வஞ்சித்து Ceylon Teaஐ உற்பத்தி செய்வதாக இருந்தால், இறப்பரிலும் தேயிலையிலும் இலாபம் தேடுவதாக இருந்தால், அது எப்படி நியாயமாகும்? அதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். அமைச்சர்களும் மக்கள் பிரதிநிதிகளும் மலையகத்திலுள்ள 10' x 8' சதுரஅடி அளவுடைய 'லயன்' அறைகளைச் சென்று பார்த்தால், அவர்களுடைய அருமை புரியும்! இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற எந்தவோர் அமைச்சரினது அல்லது எந்த ஒரு பாராளுமன்ற உறுப்பினரது மனைவிக்காவது ஒரு நாளில் 350 இறப்பர் மரத்திலிருந்து பால் எடுக்க முடியுமா? அல்லது 22 கிலோகிராம் தேயிலைக் கொழுந்து பறிக்க முடியுமா? உரமும் இல்லை; கிருமிநாசினியும் இல்லை. ஆனால், அந்தத் தொழிலாளர்கள் நாளொன்றுக்கு 22 கிலோகிராம் தேயிலைக் கொழுந்து பறிக்க வேண்டும். அப்படியென்றால், எங்களுடைய மக்கள் robotஆக மாற வேண்டும். எங்களது தோட்டத் தொழிலாளர்களுடைய உயிர்களைக் காப்பாற்றுவதற்கு நீங்கள் நடவடிக்கை எடுத்தால், நாட்டை முன்னேற்றுவதற் குரிய திட்ட முன்மொழிவுகளை நீங்கள் பாராளுமன்றத்துக்குக் கொண்டுவரும்போது, அவற்றுக்கு நாங்கள் எங்களுடைய இரண்டு கரங்களையும் உயர்த்தி முழு ஆதரவு வழங்குவோம். ஆனால், மலையக மக்கள் வஞ்சிக்கப்படுவதையும் பாதிக்கப்படுவதையும் அனுமதிக்க முடியாது.

மலையகப் பெண்கள் எவ்வளவோ கஷ்டங்களுக்கு மத்தியில் கொழுந்து பறிக்கின்றார்கள். குறிப்பாக, அட்டை களின் தொல்லைகளுக்கு மத்தியில் காலையிலே சென்று கொழுந்து பறிக்கின்றார்கள். பெருந்தோட்டக் கம்பனிகள் அவர்களது இரத்தத்தை உறிஞ்சி அவர்களிடம் வேலை வாங்குகின்றன. தங்களது இரத்தத்தை வியர்வையாகச் சிந்தி அவர்கள் உழைக்கிறார்கள். அவ்வாறு உற்பத்தி செய்கின்ற தேயிலைக்கு 'Ceylon Tea' என்று நாமம் போட்டுக்கொண்டு, tie, coat அணிந்து கௌரவம் பேசுவதில் எவ்வித அர்த்தமும் இல்லை. இந்த முழுப் பாராளுமன்றமுமே வெட்கித் தலைகுனிய வேண்டும். ஏனெனில், தோட்டத்தொழிலாளர் களுக்கு அநீதி! 1,000 ரூபாய் சம்பள உயர்வு இழுத்தடிப்பு! அபிவிருத்தி என்ற பேரில் மலையகத்திலுள்ள காணிகள் சுவீகரிப்பு! மலையகம் எங்களுடைய தாய் நாடு. மலையகத்தில் இருக்கின்ற காணிகளை வெளியாட்கள் அபகரிப்பதற்கு இடமளிக்க முடியாது.

மலையக மக்கள் பல தசாப்த காலமாக - 200 வருட காலமாக - இந்த நாட்டினுடைய பொருளாதாரத்தைப் பாதுகாத்து வருபவர்கள். அவர்கள் ஆயுதம் ஏந்திப் போராடவில்லை; இனவாதம் பேசவில்லை. இந்த நாட்டில் விடுதலைப் புலிகளின் ஆயுதப் போராட்டம் இருந்தது; மக்கள் விடுதலை முன்னணியின் ஆயுதப் போராட்டம் இருந்தது. என்றாலும், மலையக மக்கள் இந்த நாட்டுக்கு எதிராக ஒருபோதும் ஆயுதம் ஏந்தவில்லை. தொழிலாளர்களைக் கௌரவிக்கவேண்டிய இந்த அரசாங்கம், அவர்களை ஒரு சதத்துக்கேனும் கணக்கெடுக்காமல் பெருந்தோட்டக் கம்பனிகள் அவர்களை வஞ்சித்துக்கொண்டிருப்பதைப் பார்த்துக் கொண்டிருக்கின்றது. பெருந்தோட்டக் கம்பனிகளுக்கு இந்தளவுக்கு அதிகாரம் கொடுத்தது யார்? ஏன், பெருந்தோட்டக் கம்பனிகள் இந்தத் தோட்டத் தொழிலாளர்களை இவ்வாறு வஞ்சிக்கின்றன? இதற்கு முடிவு என்ன? அவர்களின் ஆயிரம் ரூபாய் சம்பள உயர்வுக்கு முடிவு என்ன? வாழ்க்கைச் செலவு அதிகரிப்புக்கு முடிவு என்ன? மலையக மக்களின் காணி உரிமை எங்கே? வீட்டுரிமை எங்கே? அவர்களுக்கான பல்கலைக்கழகம் எங்கே? ஒன்றுமே இல்லை!

மலையக மக்கள் இந்த நாட்டினுடைய பிரஜைகள்! இந்த நாட்டை நேசிக்கின்றவர்கள்! அவர்களை இந்த அரசாங்கமும் நாடும் முழுமையாக நிராகரித்திருப்பதன் நோக்கம் என்ன? என்னுடைய தொப்புள்கொடி உறவுகள் சார்பாக, என்னுடைய பாட்டாளி மக்கள் சார்பாக நான் இந்த உயரிய சபையிலே இறுதியாகவும் உறுதியாகவும் ஒன்றைக் கேட்டுக் கொள்கின்றேன். அதாவது, தோட்டத்தொழிலாளர்களின் ஆயிரம் ரூபாய் சம்பள உயர்வு சம்பந்தமான வழக்கை எதிர்வருகின்ற 24ஆம் திகதி நீதிமன்றத்தில் முடிவுக்குக் கொண்டுவருவதற்கு அதனுடன் சம்பந்தப்பட்ட அமைச்சர்கள் முன்வர வேண்டுமென்று கேட்டுக்கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றிகூறி விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදත් මංජුල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.05]

**ගරු සුදත් මංජුල මහතා**
(மாண்புமிகு சுதத் மஞ்சுல)
(The Hon. Sudath Manjula)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයටත්, රටටත් ඉතාම වැදගත් භෝගයක්, එහෙම නැත්නම් දැනට වසර 30කට පමණ පෙර මේ රටේ ආර්ථිකය පෝෂණය කරන්න වැඩිම දායකත්වය දුන් භෝගයක් හැටියට සලකන රබර් පිළිබඳව සුවිශේෂී නියෝග කිහිපයකුත් අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ ගෙන එන නියෝගත්, රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ ගෙන එන නියෝගත් පිළිබඳව සාකච්ඡාවට ලක්වන වෙලාවේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මම මුලින්ම මතක් කරන්න ඕනෑ, අපේ රටේ රබර් වගාව යම් යම් වකවානුවල පසුබෑමකට ලක් වුණු බව. හැබැයි, යහ පාලන යුගය තුළ රබර් මිල කුඨීත වෙලාම ගියා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට විකල්ප වගා කටයුතු සඳහා රබර් වගාකරුවන් යොමුවන්න පටන් ගත්තා. අපි දැක්කා, ඒ වකවානුව තුළ තේ, ගම්මිරිස්, කෝපි, කරාබුනැටි වාගේ අපේ රටේ තිබෙන විවිධ භෝගවල, එහෙම නැත්නම් අපනයන වෙළෙඳ පොළ ජය ගත් විදේශ විනිමය උපයන භෝග ගණනාවක මිල පහළ වැටුණු බව.

විශේෂයෙන්ම රබර් වගාව ගැන බැලුවොත්, 2015 වර්ෂය වන විට අපේ රටේ හෙක්ටෙයාර 136,000ක පමණ ප්‍රමාණයක රබර් වගාව තිබුණා. හැබැයි, අද වන විට අපේ රටේ රබර් පර්යේෂණායතනයේ වාර්තා අනුව හෙක්ටෙයාර 110,000ක වාගේ ප්‍රමාණයක තමයි රබර් වගා කරන්නේ. මේ රටේ රබර් වගාව වැඩියෙන්ම කරන දිස්ත්‍රික්කය මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයයි. මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ විතරක් මේ වන විට හෙක්ටෙයාර 39,100ක රබර් වගා කරනවා. ඒ ප්‍රමාණයෙන් කිරි කපන, කිරි කපන්න පුළුවන් හොඳ මට්ටමේ රබර් වගාව තිබෙන්නේ හෙක්ටෙයාර 77,500ක් විතරයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පැළ වශයෙනුත් හෙක්ටෙයාර 12,500ක් විතර තිබෙනවා. ඒ වාගේම කිරි කපන්න බැරි, ආයු කාලය අවසන් වන වකවානුවේ තිබෙන රබර් හෙක්ටෙයාර 20,000ක් විතර තිබෙනවා.

රජය අද මේ නියෝග තුළින් හෙක්ටෙයාරයක් සඳහා මෙතෙක් ලබා දුන් ආධාර මුදල සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. විශේෂයෙන්ම නැවත වගාව සඳහා, නව වගාව සඳහා සහ සමාගම් හරහා ක්‍රියාත්මක කරන වගාව සඳහා වන සහනාධාරයත් සියයට 100කින් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ දක්වා සහනාධාර දුන්නේ අදියර 8කින්. නව වැඩ පිළිවෙළත් එක්ක අදියර 5කින් ගොවියාට සහනාධාර මුදල් ලබා දෙන්න කටයුතු කර තිබීමත් අපි අගය කළ යුතුයි.

එදා යහ පාලනය කාලයේ, රබර් ෂීට් කිලෝ එකක් රුපියල් 200ට අඩුයි. හැබැයි, අද අපි සතුටු වෙනවා. මොකද, අද අපට නොම්බර 1 රබර් ෂීට් කිලෝ එකක් රුපියල් 450ක මිලකට විකුණාගන්න පුළුවන් වෙලා තිබෙන නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ රබර් වගාවෙන් ලබා ගන්නා කිරි දියර වශයෙන් අළෙවි කරනවා වාගේම, පෞද්ගලික ඉඩම් හිමි කුඩා වගාකරුවන් තම නිෂ්පාදන අළෙවි කරන්නේ රබට් ෂීට් හැටියටයි. හැබැයි, වෙළෙඳ පොළට යනකොට නොම්බර 1 රබර් ෂීට් කිලෝ එකකට තමයි රුපියල් 450ක මිලක් ලැබෙන්නේ. මේ රබර් ෂීට් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රමිතියෙන් යුතු දුම් ගෙවල් අද බොහෝ දුරට දකින්නට අඩුයි. නමුත් රජයේ මැදිහත් වීම තුළින් නව තාක්ෂණය යොදා ගනිමින් නව වැඩ පිළිවෙළක් හරහා දුම් ගෙවල් ඇති කිරීමට ක්‍රියා කරන බව අපි දැක්කා.

මගේ දිස්ත්‍රික්කයේ නායකතුමා අද තේ හා රබර්වල වගකීම දරන රාජ්‍ය ඇමතිතුමා හැටියට කටයුතු කිරීම ගැන මම සතුටු වෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් වගාව, මේ රටේ දේශීය රබර් වගාවෙන් සියයට 35ක් වෙනවා. හෙක්ටෙයාර වශයෙන් බැලුවොත් 39,100ක පමණ ප්‍රමාණයක් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ රබර් වගා කරනවා. සබරගමුව පළාත හැටියට බැලුවත් එහෙමයි. මා නියෝජනය කරන රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ තමයි ලංකාවේ වැඩිම රබර් වගාවක් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තිබෙන්නේ. රුවන්වැල්ල සහ දෙහිඕවිට තමයි ලංකාවේ වැඩියෙන්ම රබර් වගාව සිදු කරන්නේ. රුවන්වැල්ල, දෙහිඕවිට, දැරණියගල, යටියන්තොට, බුලත්කොහුපිටිය, ගලිගමුව සහ දැදිගමුව කියන මේ කලාපය තුළ තමයි කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම රබර් වගාව ව්‍යාප්ත වෙලා තිබෙන්නේ. රබර් මිල කුඨීත වෙලා රබර් ගොවියාගේ, රබර් වගාකරුවාගේ ආර්ථිකය ඉතාම පහළට වැටුණු වෙලාවක අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ රබර් වගාකරුවා නඟා සිටුවන වැඩ පිළිවෙළකට ඇවිල්ලා තිබීම ගැන මම අද සතුටු වෙනවා. අපි ඒක අගය කළ යුතුයි.

විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, වැවිලි අමාත්‍යතුමා, රාජ්‍ය ඇමතිතුමා, ගරු මුදල් අමාත්‍යතුමා ඇතුළු රජයෙන් මම ඉල්ලීමක් කරනවා. රබර් වගාව ආරක්ෂා කර

[ගරු සුදත් මංජුල මහතා]

ගන්න නම් රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලා බිහි විය යුතුයි. අද යම් යම් තැන්වල කර්මාන්තශාලා බිහි වෙලා තිබෙනවා. ඒ වුණත් කෑගල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවක්, එහෙම නැත්නම් ටයර් කර්මාන්තශාලාවක් බිහි වෙලා නැහැ. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, මුදල් අමාත්‍යතුමා සහ වැවිලි විෂය භාර අමාත්‍යතුමන්ලාගේ මැදිහත් වීම තුළ රබර් වගාවට උචිතම දිස්ත්‍රික්කයක් වන කෑගල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන රබර් වගාව තව තවත් වර්ධනය කරන්න පුළුවන් විධියට, රබර්වල මිල තවත් ඉහළට දමන්නට හැකි වැඩ පිළිවෙළක් සහ නිෂ්පාදන ආර්ථිකය තුළ ඉදිරියට යන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව මම මේ වෙලාවේ ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මේ කාරණයත් මම මතක් කරන්නට ඕනෑ. රබර් වියන නිසා පරිසරය ආරක්ෂා වෙනවා. ඒ හරහා පාංශු ඛාදනය අවම වෙනවා වාගේම භූගත ජලයත් ආරක්ෂා වෙනවා.

පසුගිය වකවානුව තුළ රබර් මිල පහත වැටෙනවාත් එක්ක, කඳුකරයේ රබර් ගලවනවාත් එක්ක භූගත ජලය හිඟවෙලා, අපේ කඳුකර ප්‍රදේශවල පානීය ජල පහසුකමට පවා තර්ජනයක් එල්ල වූ බව අපි දැක්කා. ඒ වාගේම තමයි, වන සතුන්ට ජීවත් වෙන්න අවශ්‍ය පරිසරය රබර් වියනත් එක්ක තිබුණා. රබර් මිල අඩු වුණාම රබර් ගස් උදුරලා ඒ බිම් මුඩු භූමි බවට පත් වුණාම වන සතුන් ජනතාව ජීවත් වන ප්‍රදේශවලට ඇවිල්ලා, ජනතාවගේ අවශ්‍යතා සඳහා වගා කරන භූමිවලට තර්ජනයක් වන තත්ත්වයට පත් වුණා. රබර් වගාව නඟාසිටුවන්න අපේ රජය ගෙනයන වැඩ පිළිවෙළ අගය කරන ගමන්, මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.13]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මතක් වෙනවා, "අටුව කඩලා පුටුව හැදුවා වාගේ" කියන සිංහල කියමන. ඒ වාගේ දෙයක් තමයි මේ ආණ්ඩුව අද කරලා තිබෙන්නේ. මේ රටේ ඩොලර් හිඟයක් තිබෙන අවස්ථාවක, ඩොලර් නැති නිසා පොහොර ගෙන්වන්නේ නැහැයි කියන ස්ථාවරය මත බොරු ප්‍රෝඩාවක් කරලා රටේ ජනතාවට කිව්වා, කාබනික පොහොරවලින් බත සපයනවා කියලා. ඒ නිසා අන්තිමට අපට කන්න වුණේ චීනාගේ බත් කියන එක කියන්න සිද්ධ වෙනවා.

ඒකත් එක්කම අද මේ කථා කරන තේ කර්මාන්තය, රබර් කර්මාන්තය සහමුලින්ම කඩාගෙන වැටුණු බවත් මා කියන්න ඕනෑ. පාසල් යන කාලයේ අපි ඉගෙන ගත්තේ තේ, පොල්, රබර් අපනයනය කිරීමෙන් මේ රටට ඩොලර් ආදායම ලැබුණා කියලායි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් පොහොර නැති නිසා තේ කර්මාන්තය, රබර් කර්මාන්තය සහමුලින්ම කඩාගෙන වැටිලා තිබෙනවා. ඒකත් එක්ක රටට ලැබෙන්න තිබුණු ඩොලර් විනිමය කඩාගෙන වැටීම නිසා දැවැන්ත ඩොලර් හිඟයකට අද අපි මුහුණ පා තිබෙනවා. මේ තත්ත්වය මේ රටට බලපානවා. අද ඩොලර් නැති නිසා මේ රටට ඛනිජ තෙල් ගෙනෙන්න සල්ලි නැහැ. ඒ නිසා අද ඛනිජ තෙල් මිල ඉහළ දමා තිබෙනවා. ඛනිජ තෙල් මිල ඉහළ දැමීමේ හේතුව නිසා පීඩනයට පත් වෙන්නේ කවුද? වතුකරයේ සිටින අහිංසක වතු කම්කරුවා, ධීවරයා තමයි ඒකෙන් පීඩනයට පත් වෙන්නේ.

මා නියෝජනය කරන මීගමුව ආසනයේ ධීවරයාට ලාම්පු තෙල්, ඩීසල්, පෙට්‍රල් ගන්න පෝලිමේ ඉන්නත්, වැඩි මිලක් ගෙවන්නත් සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ගේ ජීවිතය ගැට ගහගන්න බැරි තත්ත්වයකට අද පත්ව තිබෙනවා. ආර්ථික වියදම ඉහටත් වඩා උඩට නැඟලා තිබෙනවා. අද වතු කම්කරුවාට රුපියල් 1,000ක් වැටුප හැටියට ලැබෙන්නේ නැහැ. හැබැයි, වියදම වැඩියි. තෙල් මිල වැඩියි. එදා විපක්ෂය නියෝජනය කළ වර්තමානයේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ඇමතිවරු ඉන්දියාවට බැන්නේ කොහොමද? ඉන්දියාව තමයි ලංකාවේ ඉන්න ලොකුම හතුරා කියලා එදා ඉන්දියාවට ඇඟිල්ල දිගු කළා. නමුත්, අද ඉන්දියාව නොහිටින්න අපට තෙල් නැහැ. අපට ඩොලර් මිලියන 500ක තෙල් දුන්නේ ඉන්දියාවෙන්.

We must thank the Indian Government for supporting not only the Sri Lankan Government but also the people of Sri Lanka by giving us crude oil and oil. The former Opposition - the current Government Members - used to attack the Indian Government and the people of India.

ඉන්දියාවට කොහොමද බැන්නේ කියන ඒ ඉතිහාසය අපට මතකයි. But, today, the Indian Government has come forward to support the Sri Lankans and the Sri Lankan Government. What have we done?

අපි මොනවාද කරලා තිබෙන්නේ? අපි අදටත් හිඟා නොකා හිඟා කනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ විතරක් නොවෙයි, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මේ රටේ අහිංසක මිනිසුන්ට ලබා දුන් පොරොන්දු ඉෂ්ට කළේ නැහැ. ඒ පොරොන්දු ඉෂ්ට කරන්න බොරු පිට බොරු කිව්වා. අද කල්පනා කරලා බලන්න, මේ රටේ විදුලිබල ක්ෂේත්‍රයට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. විදුලිබල ක්ෂේත්‍රය භාරව ඉන්න ගාමිණී ලොකුගේ ඇමතිතුමා කියනවා, අපට ඛනිජ තෙල් ලබා දෙන්නේ නැති නිසා විදුලිය කප්පාදු කරන්න වෙනවා කියලා. හත්දෙයියනේ! ගාමිණී ලොකුගේ ඇමතිතුමා ඉන්න කැබිනට් මණ්ඩලයේම තමයි ඛනිජතෙල් අමාත්‍ය උදය ගම්මන්පිල මැතිතුමා ඉන්නේත්. එතකොට උදය ගම්මන්පිල ඇමතිතුමා කියනවා, ලොකුගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් -විදුලිබල අමාත්‍යාංශයෙන්- ඛනිජ තෙල් සඳහා සල්ලි දුන්නේ නැත්නම් ඛනිජ තෙල් දෙන්න වෙන්නේ නැහැ කියලා. හත්දෙයියනේ! මේ එකම කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු.

අජිත් නිවාඩ් කබ්රාල් මහත්තයා මොකක්ද කියන්නේ? රාජ්‍ය බැංකුවලට කබ්රාල් මහත්මයා කියනවා, තෙල් සංස්ථාවට ණය දෙන්න එපා කියලා. එතකොට තෙල් සංස්ථාව කියන්නේ වෙන සංස්ථාවක් ද? ඒකත් ආණ්ඩුවේම ආයතනයක්. මේ රටේ මිනිස්සු තෙල් ගහලා තිබෙන්නේ ණයට ද? නැහැ, මේ රටේ මිනිස්සු මේ රජයට ගෙවන්න තිබෙන බදු ගෙවලා, මේ රජයට දෙන්න ඕනෑ මුදල දීලා තමයි CEYPETCO එකෙන් තෙල් ගැහුවේ. අද රටේ මිනිසුන් "බිලි බෝයි"ලා බවට පත් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ආණ්ඩුව දෙපැත්තට වෙලා කඹ අදිනවා. අපේ මිනිසුන් මහ පාරේ අව්වේ පිච්චෙමින්, වෙලි වෙලී තෙල් ටිකක් ගහගන්න පෝලිම්වල ඉන්නවා. එවැනි තත්ත්වයකට අද රට පත් කරලා. මේ රටේ මොන පෝලිම්ද නැත්තේ? ඒ නිසා අපි රජයට කියනවා, දුන් පොරොන්දු ඉෂ්ට කරන්න කියලා. මේ රජයට අද පොරොන්දු ඉෂ්ට කිරීම තියා, රජය කරගෙන යන්න විධියක්වත් නැහැ. රජයේම ඉන්න මැති ඇමතිවරුන් දැන් ආණ්ඩුව අත්හරින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දැන් 'හැටනව ලක්ෂය' සීසී කඩ ගිහිල්ලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

එක පැත්තකින් රටේ ආර්ථිකය කඩාගෙන වට්ටනවා. අනෙක් පැත්තෙන් අපේ ජාඇල ආසනයේ මහ විනාශයක් සිදු වෙමින් පවතිනවා. අපි දැක්කා, ඒකල ප්‍රදේශයේ ජනතාව උද්ඝෝෂණයක් කරනවා. මමත් එතැනට ගියා. Radio Ceylon ආයතනයට, මේ රජයට අයත් ඉඩමක් පෞද්ගලික ආයතනයකට දීලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට වාර්තා ඉදිරිපත් කරලා නැහැ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන් ඒ යෝජනාව සම්මත කරගෙන නැහැ. ඔබතුමියත් නියෝජනය කරන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඒ කරුණු කිසිවක් ඉදිරිපත් කරලා නැහැ. නමුත් පෞද්ගලික ආයතනයකට ඉඩම දීලා, එතැන වැවක් කපනවා; වැලි හාරනවා. මේ වැලිවලට වෙන්නේ මොකක් ද කියලා අපි දන්නවා. අපි මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්වරයාට කථා කළා. ප්‍රාදේශීය ලේකම්වරයා දන්නේත් නැහැ ඒ ව්‍යාපෘතිය මොකක් ද කියලා. හැබැයි, ප්‍රාදේශීය ලේකම්වරයාට තමයි රජයේ ඉඩම් අයිති. නමුත් නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම දීලා තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය ඒ ඉඩම පෞද්ගලික ආයතනයකට දීලා තිබෙනවා. දැන් එතැන වැලි කැණීම් සිද්ධ වෙනවා, ගස් කැපෙනවා කියන එක තමයි ඒ ප්‍රදේශයේ ජනතාව අපට කියන්නේ. ජනතා නියෝජිතයා හැටියට මම එතැනට යනකොට, ඔබතුමියගේ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීතුමා වන නලින් මන්ත්‍රීතුමාත් එතැනට ආවා. එතුමා තමයි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සමසභාපතිතුමා. නමුත් එතුමාත් ඒ ගැන දන්නේ නැහැ කිව්වා. ඉතින් මේක හතර බීරි ආණ්ඩුවක්. අපට තේරෙන්නේ නැහැ, වෙන්නේ මොකක්ද කියලා. එක පැත්තකින් තෙල් සපයන්න බැරි ආණ්ඩුවක්. තව පැත්තකින් විදුලිය සපයන්න බැරි ආණ්ඩුවක්. අනෙක් පැත්තෙන් මේ රටේ සම්පත් ටික විකුණන ආණ්ඩුවක් බවට අද පත් වෙලා. අපේ ප්‍රදේශවල ජනතාව මේ පිළිබඳව සාවධානයෙන් කටයුතු කරමින් සිටිනවා.

අපි මේ රජයට පැහැදිලිව කියනවා, මේ විධියට රජය අත්තනෝමතික ආකාරයෙන් කටයුතු කරනවා නම්, මේ රටේ ජනතාව පාරට බහින්න සූදානම් කියන කාරණය. මේ රටේ ජනතාව පාරට බැස්සොත් වෙන්නේ මොකක් ද? ඔබට මතක ඇති එදා රතුපස්වලදී වුණේ මොකක් ද කියලා. රොෂේන් චානකලාට මොකක් ද වුණේ? හලාවත ඇන්ටනි මහත්මයලාට මොකක් ද වුණේ? මේ රජය ඒ තත්ත්වයට මේ රටේ අහිංසක ජනතාව පත් කරයි කියන බය අපට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා අපි රජයට කියනවා, පෝලිම් යුගය අවසාන කරන්න, ආර්ථිකය කළමනාකරණය කරන්න කියලා. ලෝක බැංකුවට යන්නේ නැත්නම්, IMF එකට යන්නේ නැත්නම් මේ ආර්ථිකය ගොඩගන්නේ කොහොම ද, මේ රටට අවශ්‍ය ඩොලර් ටික රටට ගෙනෙන්නේ කොහොම ද කියලා රට දැනුවත් කරන්න කියා අපි මේ අවස්ථාවේදී කියනවා.

අවසාන වශයෙන් මම තව කාරණයක් සඳහන් කරන්න කැමැතියි. මගේ ජංගම දුරකථනයට 'දෙරණ' ප්‍රවෘත්ති SMS එකක් ආවා. පාස්කු ඉරු දින එල්ල වුණු ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති විමර්ශන කොමිසමේ වාර්තාව ගරු කථානායකතුමාට ලබා දුන්නා කියලා එහි සඳහන්ව තිබුණා. එය පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. පක්ෂ-විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒ ගැන දැනගන්න, කියවන්න එය ලබා දෙන්න කියන ඉල්ලීමත් අපි මේ අවස්ථාවේදී කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.21]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපේ රටේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ වසර 150කට වැඩි කාලයක් තිස්සේ පවතින තේ කර්මාන්තය තමයි වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට වැඩිම දායකත්වය ලබා දෙන කර්මාන්තය වන්නේ. මේ වසර 150ක කාල සීමාව තුළ විශාල අභියෝග රැසක් තුළ තමයි මේ වැවිලි කර්මාන්තය පැවත ගෙන එන්නේ. එදා විදේශිකයන්ගෙන් අපට හොඳ සහ නරක කියන දෙකම උරුම වුණා. ඒ අනුව උඩරට තිබුණු, කඳුකරයේ තිබුණු වන සම්පත පැත්තකට දමලා, විනාශ කරලා, හෙළා දමලා තේ වගාවට ගියා. ඉන් පසුව ගත වුණු අවුරුදු 150ක කාල සීමාව තුළ අපේ රටේ ආර්ථිකයට දැවැන්තම ශක්තියක් එකතු කළ වැවිලි භෝගය සේම, මේ රටේ මිනිසුන්ගෙන් විශාල ප්‍රමාණයක් ජීවනෝපාය සපයා ගන්නා කර්මාන්තය බවට අද තේ කර්මාන්තය පත් වෙලා තිබෙනවා. තේ කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් පසුගිය ඉතිහාසය තුළ යම් යම් තීන්දු-තීරණ අරගෙන තිබෙනවා. වර්තමානයේ වැවිලි අමාත්‍යාංශය ගන්නා තීන්දුවලින් එක් තීන්දුවක් ලෙසට 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ නියෝග අද ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருள் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Rural Housing and Construction and Building Material Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) KOKILA GUNAWARDENE *left the Chair, and* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *took the Chair.*

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභියෝග රාශියක් එක්ක වසර 150ක කාලයක් තිස්සේ පැවත එන අපේ තේ කර්මාන්තය, අද වෙනකොට තීරණාත්මක තැනකට ඇවිල්ලා තිබෙනවා.

එසේ තීරණාත්මක තැනකට එනකොට, තේ කර්මාන්තය හා බැඳුණු තේ ගොවියාගේ -එහෙම නැත්නම් පහත රට වේවා, උඩරට වේවා තේ කර්මාන්තයේ නියැළෙන තේ ගොවියාගේ නිෂ්පාදනවලට නිසි වටිනාකමක් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. අපේ රටේ ක්‍රමය තුළ ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ මැදිහත් වීම තිබෙන්නේ අමාත්‍යාංශ මට්ටමින් මෙවැනි ප්‍රතිපත්ති සම්පාදනයට විතරයි. හැබැයි, මේ වසර 150ක කාල පරිච්ඡේදය තුළ මේ නිෂ්පාදනවල මිල තීන්දු කිරීමේ ප්‍රධාන කාර්ය භාරය සිද්ධ වෙන්නේ තැරැව්කාර සමාගම්, broker companies හරහා. බ්‍රෝකර් සමාගම් තමයි මිල පිළිබඳ කාරණාවේ ප්‍රධාන වගකීම දරන්නේ. අනෙකුත් බෝගවලට, අනෙකුත් නිෂ්පාදනවලට, අනෙකුත් ක්ෂේත්‍රවල රාජ්‍ය කොටසට රාජ්‍ය මැදිහත්වීම සිද්ධ වුණත්, අවාසනාවට මේ තැරැව්කාර සමාගම්වල ආධිපත්‍යය සහ ඔවුන්ගේ මැදිහත්වීම තුළ තමයි මිල තීන්දු වෙන්නේ. ඒ නිසා තැරැව්කාර සමාගම් සහ තේ ගොවියා අතර තිබෙන සම්බන්ධීකරණය, තේ කර්මාන්තශාලා අතර තිබෙන සම්බන්ධීකරණය ඉතා වැඩි වෙන්න ඕනෑ යුගයක් තමයි මේක. මෙතෙක් කාලයක් ඒ තැරැව්කාර සමාගම්වල ලියා පදිංචි ගාස්තුව වූ රුපියල් 1,500 රුපියල් මිලියනයක් දක්වා වැඩි කරන්න නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ නියෝග ගෙනැත් තිබෙනවා. ඒ වාගේම වාර්ෂිකව අය කරන ගාස්තුව රුපියල් 150,000 සිට 250,000 දක්වා වැඩි කරන්නත්, සුළු හා මධ්‍ය පරිමාණ තැරැව්කාර සමාගම්වලින් රුපියල් 125,000ක වාර්ෂික මුදලක් අය කරන්නත් තීන්දු ගැනීම තමයි මේ නියෝග යටතේ සිද්ධ වෙන්නේ. හැබැයි, මේ නියෝග ඉදිරිපත් කරනවා වාගේම මේ තැරැව්කාර සමාගම් එක්ක තවත් කාරණා ගණනාවක් ඉෂ්ට කර ගැනීම අමාත්‍යාංශයේත්, තේ මණ්ඩලයේත්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේත් වගකීමක් බවට පත් වෙනවා. මොකද, මේ තැරැව්කාර සමාගම්වලට පැවරුණු වගකීම් ගණනාවක් තිබෙනවා. තේවල මිල තීන්දු කරන බ්‍රෝකර් සමාගම් විසින් වෙන්දේසිවලින් තේ අරගෙන විදේශගත කරන - අපනයනය කරන- තේවල මිල තීන්දු කිරීම වාගේම, තේවල ගුණාත්මකභාවය රැක ගැනීම සඳහා වන මැදිහත්වීම ලබා දීමත් ප්‍රධාන වගකීමක් බවට පත් වෙනවා. මොකද, එදාට වඩා අද තේ කර්මාන්තයේ විශාල තරගකාරි තත්ත්වයක් තිබෙන්නේ. අද තේ වගා කරන භූමි ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් යම් ප්‍රමාණයකින් වැඩි වුණත්, ඊට සාපේක්ෂව පසුගිය දශක කිහිපය තුළ තේ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් ඇති වුණා. මේ කර්මාන්තශාලා අතර තිබෙන තරගය නිසා සැබෑ ලෙසින්ම තේ ගොවියාට ප්‍රතිලාභය යනවාද, නැද්ද කියන කාරණාව පසුවිපරම් කරලා බලන්න ඕනෑ. ඒ ප්‍රතිලාභය තේ ගොවියාට නොයන්න බලපාන ප්‍රධානම හේතුවක් තමයි, තේවල ගුණාත්මකභාවය පිළිබඳ වන කාරණාවලට මැදිහත්වීම් අවම වීම. ඒ වාගේම, මේ වසර 150 කාල සීමාව තුළ අපි අසමත් වෙලා තිබෙනවා, තේ කර්මාන්තය අගය එකතු කරන කර්මාන්තයක් බවට පත් කිරීමට. එය ඉතාම මන්දගාමීව, මන්දෝත්සාහී විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ.

සමහර විට තේ ගහක්වත් නැති රටවල්, උදාහරණයක් වශයෙන් කිව්වොත් එක්සත් අරාබි එමිර් රාජ්‍යය, ඩුබායි වැනි රටවල් තේ ආනයනය කරලා ප්‍රතිඅපනයනය කිරීමෙන් අපි වාර්ෂිකව තේ අපනයනය කරලා හම්බ කරන ඩොලර් බිලියන 1.2 වාගේ දහපහළොස් ගුණයක් හම්බ කරන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා තේවල ගුණාත්මකභාවය වැඩි කිරීමත්, අගය එකතු කළ නිෂ්පාදනවලට, value-added productsවලට, යෑමත් පිළිබඳව මේ තැරැව්කාර සමාගම්වල සහ ඒ ආයතනවල මැදිහත්වීම අවශ්‍යයි. සාම්ප්‍රදායක විධියට මීට වසර 100කට, 150කට කලින් සිදුකළ ආකාරයටම කර්මාන්තශාලාවල තේ ටික අපනයනය කිරීමට යෑම තුළ සාධාරණ වෙළෙඳ පොළක් ගොවියාට ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේවල ගුණාත්මකභාවය - quality - පරීක්ෂා කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේත් තැරැව්කාර සමාගම්වලට. මේ තරගය නිසා අපේ තේ කර්මාන්තශාලාවලට ප්‍රධාන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. තේවල කළු පැහැය වර්ධනය කර ගන්න, එහෙම නැත්නම් රසය පවත්වාගෙන යන්න, තේවල නිෂ්පාදන බර වැඩි කර ගන්න වෙළෙඳ උපක්‍රම පාවිච්චි කරනවා. එක උපක්‍රමයක් තමයි තේවලට යම් යම් ද්‍රව්‍ය, ආදේශක එකතු කිරීම. සීනි, ග්ලූකෝස් වැනි දේවල් තේවලට එකතු කිරීම නිසා මෙතෙක් කාලයක් තේවල තිබුණු සාම්ප්‍රදායික ගුණාංග, තේවල ගුණාත්මකභාවය පිළිබඳව යම් අභියෝග ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපි ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමාගෙන් සහ තේ මණ්ඩලයෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මේ තැරැව්කාර සමාගම් එක්ක එකඟතාවක් ඇති කර ගත යුතුයි, ඔවුන්ට බලකළ යුතුයි, වෙන්දේසියේදී මෙවැනි ගුණාත්මකභාවයෙන් අඩු තේ මිලදී නොගැනීම සම්බන්ධව. එය ප්‍රධාන වගකීමක් බවට පත් වෙනවා. ඒ එකඟතාව ඇති නොවන තාක්කල් ගුණාත්මක තේ නිෂ්පාදනයට තේ කර්මාන්තශාලා හිමියන් පෙළඹෙන්නේ නැහැ. මේ නිසා දිගු කාලීනව බලනකොට ලංකාවට නරක තත්ත්වයක් නිර්මාණය වෙමින් තිබෙනවා. පසුගිය කාලයේ විදේශීය තේ අලෙවි ප්‍රදර්ශනවලදී ලංකාවේ තේවලට තිබුණු වටිනාකම සැක සහිත වෙලා තිබෙනවා. එහෙම වෙන්න හේතුව, ඔවුන් තේවල ගුණාත්මකභාවය සොයනකොට වෙනත් ද්‍රව්‍ය එකතු කර තිබීමයි. සීනි වෙන්න පුළුවන්, ග්ලූකෝස් වෙන්න පුළුවන් එවැනි බාහිර දේවල් එකතු කිරීම තුළින් ගුණාත්මකභාවය හීනවීම නිසා දීර්ඝ කාලීනව තේ කර්මාන්තයට ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබිච්ච කෙටි කාල සීමාව තුළ මේ කාරණයත් කියන්න ඕනෑ. අපි තේ අපනයනය කරන රටවල් ගත්තොත්, මැද පෙරදිග කලාපය, රුසියාව සහ තව රටවල් කිහිපයක් අතර තමයි අපි තේ අපනයනය කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා මැද පෙරදිග අර්බුදයක් තිබිච්ච හැම මොහොතකදීම, යුධමය තත්ත්වයක් තිබිච්ච හැම මොහොතේදීම අපේ රටේ තේ කර්මාන්තය බරපතළ අර්බුදයකට පත් වූ බව. මේ කථා කරන මොහොතේ අපේ ප්‍රධානම පාරිභෝගියකු වන, අපේ ප්‍රධානම අපනයනකරුවකු වන රුසියාවේ ඇති ඒ දේශපාලන තත්ත්වය නිසා අපේ තේ කර්මාන්තය බරපතළ ඛේදනීය තත්ත්වයකට පත් වෙන්න පුළුවන්. ඒ නිසා තේ කර්මාන්තය රැක ගැනීම සම්බන්ධවත් මේ මොහොතේ විකල්ප වැඩසටහන්වලට යෑම අපේ වගකීමක් බවට පත් වෙනවා.

පසුගිය කාලයේ අපේ රජය ගත්ත ප්‍රතිපත්තිමය තීන්දු නිසා කුඩා තේ වතු හිමියන්ට සහ තේ කර්මාන්තයට ප්‍රශ්න රැසක් ඇති වෙලා තිබෙනවා. රසායනික පොහොර ආනයනය නතර කිරීමට ඒ කාලයේ ගත්ත තීන්දුව දැන් වෙනස් කරලා තිබෙනවා. දැන් රසායනික පොහොර ආනයනය කරන බව ඇත්ත. හැබැයි ඒ ගත්ත තීන්දුව නිසා ප්‍රශ්න රාශියක් නිර්මාණය වෙමින් තිබෙනවා. ඒ නිසා මේ තේ කර්මාන්තය අද අවිනිශ්චිත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එදා රුපියල් 1,200ට තිබුණු පොහොර හොන්ඩරය අද ගන්න වෙලා තිබෙන්නේ රුපියල් 7,000ට, 8,000ට. ඒ නිසා කුඩා තේවතු හිමියන් ඇතුළු තේ කර්මාන්තයේ යෙදෙන අය ඒ පොහොර යෙදීම නතර කරලා තිබෙනවා. තේ ගහට පොහොර අවශ්‍යයි. මා කියන්නේ නැහැ, එදා දාපු පොහොර ප්‍රමාණයම දාන්න ඕනෑ කියලා. නමුත් තේ ගහේ දල්ල කඩන්න නම්, ඒ දල්ල වර්ධනය වෙන්න අවශ්‍ය නයිට්‍රජන් ප්‍රතිශතය නිසියාකාරයෙන් පොළොවට ලැබෙන්න ඕනෑ; තේ ගහට ලැබෙන්න ඕනෑ. ඒ නිසා පොහොර යෙදීම අත්‍යවශ්‍ය වෙලාවක මේ පොහොර ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත්, ජනාධිපතිතුමාත් මැදිහත් වෙලා තේ කර්මාන්තය සඳහා අවශ්‍ය පොහොර ආනයනය කරන්න තීන්දු කළා වුණත්, ඒ පොහොරවල මිල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒක නිසා අපි ගරු අමාත්‍යතුමාගෙනුත්, අමාත්‍යාංශයෙනුත්, රජයෙනුත්, ජනාධිපතිතුමාගෙනුත් ගෞරවයෙන් ඉල්ලනවා මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න; සහනාධාරයක් ලබා දෙන්න කියලා. රසායනික පොහොරවලට සහනාධාරයක් දෙන්න. ඒකට යම් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ සඳහා අවශ්‍ය නිසි ප්‍රමිතියෙන් යුක්ත කාබනික පොහොරවලට සහනාධාරයක් ලබා දෙන්න. ඒ රසායනික පොහොරවලට හෝ කාබනික පොහොරවලට සහනාධාර ලබාදීම සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කර ගත යුතු වෙනවා. තේ කර්මාන්තයෙන් උපයපු මහා විශාල මුදල් ප්‍රමාණයක් සෙස් අරමුදල තුළ තිබෙනවා. ඒ අරමුදල තුළ තිබෙන මුදල් හෝ පාවිච්චි කරලා මේ සහනාධාර ලබා දෙන්න පුළුවන්කම ලැබුණොත්, මේ තියෙන අර්බුද, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තිබෙන අර්බුද, තෙල් සහ වෙනත් අර්බුදත් එක්ක තිබෙන තේ කර්මාන්තය පවත්වාගෙන යෑමේ අර්බුදය ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබේවි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතෙක් තේ නිෂ්පාදනය සඳහා කෙටිකාලීන සහනයක්වත් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

මේ වේලාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. අපේ රටේ වැවිලි කර්මාන්තය තුළ එදා ඉහළින්ම තිබුණු තේ කර්මාන්තය නැවතත් ඒ ස්ථානයට ඔසවා තබන්න වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත යාපා බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.30]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කර්මාන්තය පිළිබඳව වැදගත් වන පනතක් යටතේ වූ නියෝග පිළිබඳවත් අද සාකච්ඡා කරනවා. ඒ 1979 අංක 09 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත යටතේ වූ නියෝග පිළිබඳවයි. මෙහිදී පැහැදිලි කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවා.

මුලින්ම මා සඳහන් කළ යුතුයි, විපක්ෂය උදෑසන ඉඳලා මේ සභා ගර්භය තුළ සාකච්ඡා කරපු කාරණයක් ගැන. ලෝක පරිමාණයෙන් සිදු වෙලා තිබෙන සැපයුම් දාම කඩා වැටීමේ ගැටලුව නිසා කොරෝනා වසංගතයත් එක්ක ශ්‍රී ලංකාවටත් ඒ සැපයුම් දාම කඩා වැටීමේ ගැටලුවට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ සැපයුම් දාම කඩා වැටීමේ ගැටලුව ශ්‍රී ලංකාවට පමණක් අවේණික ගැටලුවක් බවට පෙන්වා දීම සඳහා සමහරු විවිධ විධියට උත්සාහ ගන්න බව අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ වැඩිම කාලයක් රටක් වහලා තිබුණා නම්, මම දන්න විධියට ඕස්ට්‍රේලියාව තමයි වැඩිම කාලයක් වහලා දාලා තිබුණේ; අවුරුද්දක වාගේ කාලයක් වහලා දැමුවා. ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වාගේ රටවල් තමයි කිරිපිටි නිෂ්පාදනයේ ප්‍රමුඛයන් විධියට ඉන්නේ. ෆොන්ටෙරා සමාගම වාගේ ආයතන තමයි එහි අපනයනකරුවන් වශයෙන් ඉන්නේ. ඕස්ට්‍රේලියාවේ ඉඳලා, නවසීලන්තයේ ෆොන්ටෙරා සමාගමේ ඉඳලා කිරිපිටි අපනයනය කරන්න බැරුව, ඒ කර්මාන්තශාලාවලට කම්කරුවෝ ගෙන්වා ගන්න බැරුව ඒ රටවල නිෂ්පාදනය අඩපණ වෙලා තිබෙන වෙලාවක, සමහර රටවල් lock down වෙලා තිබෙන වෙලාවක, ශ්‍රී ලංකාවට කිරිපිටි ලැබිලා තිබෙනවාද කියලා හොයා බලලා රටේ මහජනතාවට ඒ පිළිබඳව විශාල අවලාදයක් නඟනවා.

ඔබතුමන්ලා දන්නවා, ලෝකයේ හුණු ගල් නිෂ්පාදනය කරන රටවල් අද ඒ ආකරවල හුණු ගල් නිෂ්පාදනය කරන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තිබෙන බව. කොරෝනා වසංගතය ඒ තරම් දරුණු වෙලා තිබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකාවට ලැබෙන සිමෙන්තිවල ප්‍රමාණය සීමාසහිත වෙනවා. ලෝකයට අපනයනය කරන සිමෙන්ති ප්‍රමාණය සීමාසහිත වෙනවා. ලෝකයේ ගෑස්, ඩීසල් සහ පෙට්‍රල් ආදී සියලුදේවල්, වෙනත් ආහාර ද්‍රව්‍ය පවා අපනයනය කිරීම මේ විධියට දැඩි ලෙස සීමා වෙලා තිබෙන තත්ත්වයක් තුළ අපේ රටේත් ඒවා ලබා ගැනීමේ ප්‍රශ්නය අපි කාටත් තිබෙනවා.

නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැපයුම් දාම කළමනාකරණය සම්බන්ධයෙන් රජයක් විධියට දැඩිව කටයුතු කරන බව මා කියන්න ඕනෑ. මේ අය හිතාගෙන ඉන්නවා, මෙන්න මේ විධියට.

"මේ රජය වෙනස් කළාට පසුව ලංකාවේ බිහිවන අලුත් ජනාධිපතිතුමා ඕස්ට්‍රේලියාවට යනවා. ඕස්ට්‍රේලියාවේ කොරෝනා නතර කරනවා. ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ කොරෝනා නතර කරලා, ෆොන්ටෙරා එකේ කිරි පිටි නිෂ්පාදනය ආරම්භ කරනවා.

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

ඒ කිරි පිටි ඒ රටවල් ලංකාවට අපනයනය කරනවා. ලංකාවේ කිරි පිටි සැපයුම සම්බන්ධයෙන් ඊට පසුව ගැටලුවක් ඇති වන්නේ නැහැ. එතකොට ලංකාවේ මහජනතාවට කිරි පිටි ඉතාම ලාභෙට ලබා ගන්න පුළුවන්. ඒ වාගේම ලංකාවේ අලුත් ජනාධිපති කෙනෙක් බලයට පත් වෙනවා. ඒ ජනාධිපති ඉන්දියාවට, නැත්නම් චීනයට යනවා. ඒ රටවල හුණුගල් නිෂ්පාදනය කරනවා නම්, ඒ ආකරවල කොරෝනා ගැටලුවක් තිබෙනවා නම්, වහාම අපේ රටේ අලුතින් බලයට පත් වන ජනාධිපතිවරයා ඒ රටවලට ගිහිල්ලා කොරෝනා නතර කරනවා. නතර කරලා, ඒ රටවලින් ලංකාවට සිමෙන්ති අපනයනය කරනවා. ලංකාවේ සිමෙන්ති ප්‍රශ්නය විසඳෙනවා."

ලෝකයේ කොරෝනා වසංගතය නතර කරලා මේ රටේ ප්‍රශ්න විසඳන්න යන ආකාරයේ අපූරු දේශපාලන විපර්යාසයක්, පාලනයක් පිළිබඳව තමයි මේ අය සිහින මවන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තේ කර්මාන්තය ප්‍රශ්න රැසකට මුහුණ දීලා තිබෙනවා. අපි දන්නවා, සියයට 30ක පමණ ප්‍රමාණයක් මිශ්‍ර කරලා තේ අපනයනය කරන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මැද රට තේ, උඩ රට තේ, පහත රට තේ" කියන ප්‍රභේදවලට ලෝකයේ රටවල් ආසා කරනවා. ලංකාවේ උඩ රට තේවලට රුසියාවේ මහජනයා වැඩි ප්‍රමුඛතාවක් දෙනවා. සියයට 30ක පමණ ප්‍රමාණයක් මිශ්‍ර කිරීම නිසා ඒ ප්‍රභේද වෙනස් වෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමාට මා කියනවා, බලධාරීන්ට කියනවා, මේ නිසා ලංකාවේ තේවලට තිබෙන කීර්ති නාමයට වන හානිය පිළිබඳව අපි යළි සලකා බැලිය යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, තේ කම්හල් වාගේම තේ වතුවල නවීකරණ කටයුතු සිදු වන්නේම නැති බව. තේ කර්මාන්තශාලා ආයෝජකයන් ගොඩක් වෙලාවට තිබෙන තේ ලබා ගන්නවා මිසක් නැවත වගා කිරීම, ගුණාත්මකභාවය වර්ධනය කිරීම පිළිබඳව දක්වන්නේ ඇල් මැරුණු ස්වභාවයක්. උදාහරණයක් විධියට කියනවා නම්, මා ජීවත් වන මහනුවර දිස්ත්‍රික්කයේ තේ වතු ගණනාවක නැවත වගාව ශක්තිමත්ව සිද්ධ වන්නේ නැහැ. ඒ වෙනුවට ඒ අය මොනවාද වගා කරන්නේ? උඩ රට දේශගුණික තත්ත්වය කුරුඳු වගාවට ගැළපෙනවාද කියලා යළි සලකා බලන්න වෙනවා. "ගිරාගම" කියන තේ වත්ත, Pussellawa Plantations Limited එකට බදු අරගෙන තිබෙන තේ වත්ත, දම්රෝ සමාගම විසින් තමයි පාලනය ගෙන යන්නේ. කාලාන්තරයක් මුළුල්ලේ තේ වගා කරලා තිබුණු ගිරාගම වතු යාය අද වනකොට කුරුඳු වගා කරන තැනක් බවට පත් වෙලා තිබෙනවා. තේ වගා කරපු භූමිවල කුරුඳු වගා කිරීම තුළින් අස්වැන්න, ආදායම අතින් සශ්‍රික තත්ත්වයක් උදා වෙනවාය කියලා මා විශ්වාස කරන්නේ නැහැ. අපි දන්නවා, තේ වතුවල වැඩ කරන කම්කරු ජනයාට සමහර වෙලාවට ආදායම අඩු නිසා වත්තේ වැඩ කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ. ඔවුන්ට අඛණ්ඩව දින 25ක්වත් වැඩ ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට වත්තෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නැහැ. මහනුවර දිස්ත්‍රික්කයේ කිරිමැටිය, අලගල්ල, ගිරාගම ප්‍රදේශයේත්, වතුකරයේ ප්‍රදේශවලත් කම්කරුවන් ඒ කර්මාන්තයෙන් ඉවත් වීමක්, නගරයට පිවිසීමක්, වෙනත් කර්මාන්ත කරා පිවිසීමක් අපට දකින්න තිබෙනවා. මේ තත්ත්වය නිසා තේ වතුවල වැඩ කරන කම්කරුවන් විශාල අවදානමක ඉන්නේ. ඒ අය තේ කර්මාන්තයට ආකර්ෂණය කර ගන්න නම්, අපේ රටේ තේ සඳහා කීර්ති නාමයක් ඇති කර ගන්න ඕනෑ.

කෙන්යාව සහ වෙනත් තරගකාරී රටවල් අද ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ අයගේ තේ නාමය ඉතාම ඉහළ මට්ටමේ ජනප්‍රියතාවකට ගෙනැල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ නිෂ්පාදනය කරන තේවලින් ශ්‍රී ලංකාව භාවිත කරන්නේ සියයට 3ක් පමණයි. සියයට 97ක් අපනයනය කරනවා. ඒ නිසා අපේ එකතු කළ අගය වැඩි කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුයි. තේ තැරැව්කරුවන්ගේ, brokersලාගේ, කතිපයාධිකාරී බලය අඩු කළ යුතුයි. දැන් ඒ සඳහා සංශෝධන ගණනාවක් ගෙනැල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ සමාගම්, තේ කර්මාන්තකරුවන්, ආයෝජකයන් කිසිවක් කරන්නේ නැත්නම් තේ කර්මාන්තශාලා ආශ්‍රිත මුඩු බිම් පවතින ප්‍රදේශවල වෙනත් ආයෝජනයකට යා යුතුයි කියලා මා විශ්වාස කරනවා.

එම නිසා මේ වෙනකොට සමහර තේ සමාගම්වලට කූට උපක්‍රම ගණනාවක් තිබෙනවා. අපි දන්නවා, 1992දී ගිරාගම තේ වත්ත අවුරුදු 99ක් සඳහා බදු දීම ආරම්භ කළ බව. නමුත්, පසුව ආපු සංශෝධනයක් නිසා ඒ කාල සීමාව වසර 33 දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ අනුව, 1992දී බදු ගත්ත තේ ඉඩමේ බදු කාලය 2025 වෙනකොට අවසන් වෙන්න ඕනෑ. නමුත්, අදත් එහි නැවත වගා කිරීම්, කුරුඳු වගා කිරීම් සහ වෙනත් වගා කටයුතු සිද්ධ වෙනවා. මම දන්නා නීතියේ හැටියට තේ වත්තක් බදු ගත්තාට පස්සේ ඒ තේ වත්තේ තේ කම්හල් sublease කරන්න පුළුවන්කමක් නැහැ. එහෙම කරනවා නම්, ඒ සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන තිබෙනවා. බදු ගත්තේ තේ වත්තක් නම්, යළි කුරුඳු වත්තක් භාර දෙන්න පුළුවන්කමක් නැහැ. බදු ගත් ඉඩමේ බැම්මක් වෙනස් කරනවා නම්, ගොඩනැඟිල්ලක් වෙනස් කරනවා නම් ඒ පිළිබඳව නීති තිබෙනවා. එම නිසා, ගිරාගම තේ වත්තේ සිදු වන දෑ පිළිබඳව මම කථා කරන්න ඕනෑ.

International Football Federation එක, FIFA, ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මට්ටමේ පාපන්දු තරග පැවැත්වීම සඳහා ක්‍රීඩාංගණ දෙකක් ලබා දීමට එකඟ වෙලා තිබෙනවා. එකක් Port City එකටත්, අනිත් එක ගිරාගම වතුයායේ මුඩු බිම් ප්‍රදේශයටත් ලබා දීමට ඔවුන් එකඟතාව පළ කර තිබෙනවා. එම නිසා ගරු අමාත්‍යතුමාගෙන්, බලධාරී ඔබෙන් ඉල්ලීමක් කරනවා, අපට ජාත්‍යන්තර සංවිධානයකින් ලැබෙන මේ උදව්ව ලබාගෙන ආයෝජනයක් කරන්න, නැත්නම් ක්‍රීඩා ආර්ථිකයක් හදන්න ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා ගන්නා මේ උත්සාහයට මුඩුව පවතින වතු බිම් ප්‍රමාණය ලබා දෙන්න කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. அடுத்து, மாண்புமிகு தவராஜா கலை அரசன் அவர்கள்! உங்களுக்கு 07 நிமிடங்கள் ஒதுக்கப் பட்டிருக்கின்றது.

[பி.ப. 3.39]

**ගරු තවරාජා කලෙයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று பெருந்தோட்டத்துறை அமைச்சின்கீழ் வருகின்ற விளை பொருட் தரகர்களுக்கு உரிமமளித்தற் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் மற்றும் இறப்பர் மீள்நடுகை மானியச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாக இங்கே வாதப் பிரதிவாதங்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அதிலே எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நான் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

உண்மையிலே இந்த நாட்டுக்கு அதிகளவு அந்நியச் செலாவணியை ஈட்டித்தருகின்ற துறையாக இது இருந்தாலும், இந்தத் துறையிலே பணியாற்றுகின்ற மக்களை நாட்டிலேயிருக்கின்ற எந்தவோர் அரசியல் தலைவரும் கௌரவப்படுத்தவில்லை; அவர்களுக்குரிய ஊதியங்களை வழங்கவில்லை என்கின்ற ஓர் அடிப்படைக் கருத்து இந்த நாட்டிலே வாழுகின்ற பெரும்பாலான மக்கள் மத்தியிலே இருந்துகொண்டிருக்கின்றது. எனவே, இந்த விடயத்தையும் கருத்திற்கொண்டு செயற்படுவது பொருத்தமாக இருக்குமென்று நான் நினைக்கின்றேன்.

பெருந்தோட்டத்துறையாக இருக்கலாம்; விவசாயத் துறையாக இருக்கலாம், தற்காலத்தில் இந்தத் துறைகள் வீழ்ச்சிப் பாதையில் சென்றுகொண்டிருப்பதை நாம் காண்கின்றோம். அதற்குக் காரணம், இந்த நாட்டிலேயிருக்கின்ற அரசியல் தலைவர்களால் கடைபிடிக்கப்படுகின்ற கொள்கைகள்தான். குறிப்பாக, விவசாயத்துறையை எடுத்துக் கொண்டால், எங்களுடைய அம்பாறை மாவட்டத்திலே விவசாயிகளுக்குக் கொடுக்கப்படவேண்டிய 2021ஆம் ஆண்டுக்குரிய மானியக் கொடுப்பனவானது, 13,000 விவசாயிகளுக்கு இதுவரையும் கொடுக்கப்படவில்லை. இந்த நாட்டிலே விவசாயத்தை மேம்படுத்த வேண்டும்; மக்கள் சார்ந்த நல்ல விடயங்களை மேம்படுத்த வேண்டுமென்று சொல்லு கின்ற இந்த அரசாங்கம், இந்த விடயத்திலே தவறிழைத்திருக் கின்றது என்றுதான் சொல்ல வேண்டும். 2021ஆம் ஆண்டுக்கான அறுவடைகள் முடிவுறுகின்ற இந்தச் சந்தர்ப்பத்திலே, அந்த விவசாயிகளுக்குரிய மானிய அடிப்படையிலான உதவிகள் கிடைக்கப்பெறவில்லை என்பதை நான் இந்த உயரிய சபையிலே கூறிவைக்க விரும்புகின்றேன்.

இந்த அரசாங்கம் உர மானியத்தையும் இரசாயனப் பசளைப் பாவனையையும் நிறுத்திவிட்டு, சேதனப் பசளையூடாக இயற்கை விவசாயத்தை மேம்படுத்த வேண்டு மென்ற திட்டத்தை மேலெடுத்ததன் காரணமாக இப்பொழுது இந்த நாடே ஒரு வீழ்ச்சிப் பாதையில் சென்றுகொண்டிருப்பதை நீங்கள் அறிவீர்கள்! இந்த சேதனப் பசளை விடயத்தை நான் ஒட்டுமொத்தமாக எதிர்க்கவில்லை. இந்த நாட்டுக்குச் சாதகமான ஒரு விடயமாக அது இருந்தாலும், கட்டங் கட்டமாகவே கொண்டுவரப்பட்டிருக்க வேண்டும். இங்குள்ள அதிகமான உறுப்பினர்கள் விவசாயம் சம்பந்தமாகப் பேசுகின்றார்கள். ஆனால், இவர்களில் எத்தனை பேருக்கு விவசாயம் சம்பந்தமான போதிய அறிவு இருக்கும் என்பது எனக்குத் தெரியவில்லை. நான் ஒரு விவசாயியாக இருந்தவன் என்ற அடிப்படையில்தான் இது சம்பந்தமாகப் பேசுகின்றேன்.

விவசாயத்தைப் பொறுத்தமட்டில், இம்முறை விவசாயிகளுக்கு ஓர் ஏக்கருக்கு 7-10 மூடைகள் என்ற அடிப்படையில் தான் விளைச்சல் கிடைத்திருக்கிறது. ஆனால், கடந்த காலங்களில் விவசாயிகள் 40-50 மூடைகள் என்ற அடிப் படையில் அறுவடைகளைப் பெற்றார்கள். இப்பொழுது, இந்த உயரிய சபையிலே அமைச்சர்கள், ஆளுந்தரப்பில் இருக்கின்ற அதிகமான பாராளுமன்ற உறுப்பினர்கள் நெல்லுக்கான விலை உயர்ந்திருப்பதாக மார்தட்டுகின்றார்கள். இப்பொழுதிருக்கின்ற விலையின் அடிப்படையில், 7-10 மூடைகளுக்குக் கிடைக்கும் வருமானத்தினால் எவ்வாறு இந்த விவசாயிகள் தங்களைக் காப்பாற்றிக்கொள்ள முடியும் என்ற விடயத்தையும் நீங்கள் யோசிக்க வேண்டும். இந்த நாட்டிலே உற்பத்தி இல்லாமல் விலை உயர்ந்து என்ன பயன்? அது தொடர்பிலும் சற்றுச் சிந்தியுங்கள்! ஆகவே, நீங்கள் இந்த அரசாங்கத்தை மட்டும் துதிபாடுவதை விட்டுவிட்டு, உண்மையான விடயங்களை ஆழமாகச் சிந்தித்து, இந்த நாட்டுக்குப் பொருத்தமான திட்டங்களை நடைமுறைப்படுத்துவதற்கு முன்வரவேண்டும். அவ்வாறு முன்வராவிட்டால், எதிர்காலத்திலே இந்த நாடு வறுமையான நாடுகளின் பட்டியலுக்குள் வந்துவிடும் என்பதில் எந்தவித சந்தேகமும் இல்லை. இன்று 'பசுமைப் புரட்சி' என்று சொல்லி, மக்கள் பட்டினிப் புரட்சியைச் சந்தித்துக்கொண்டிருக்கின்றார்கள். இதுதான் உண்மை!

விவசாயத்துறை மாத்திரமல்ல, கால்நடை வளர்ப்புக்கூட இன்று மிகவும் மோசமாகப் பாதிக்கப்படக்கூடிய ஒரு சூழல்தான் இருந்துகொண்டிருக்கின்றது. இந்த நிலைமையை மாற்றவேண்டுமானால், உங்களுடைய பசுமைப் புரட்சித் திட்டத்திலே சில மாற்றங்களைக் கொண்டுவாருங்கள்! அவ்வாறு கொண்டுவந்து, இந்த நாட்டையும் இந்த நாட்டு மக்களையும் காப்பாற்றக்கூடிய வழிவகைகளைச் செய்ய வேண்டும் என்று நான் இவ்விடத்திலே வேண்டிநிற்கின்றேன்.

எங்களுடைய அம்பாறை மாவட்டத்திலே நாங்கள் அரசியல் ரீதியாக மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டவர்களாகத் தொடர்ந்தும் இருந்துகொண்டிருக்கின்றோம். இந்த அரசாங்கத்துடன் இருந்துகொண்டு, அபிவிருத்திகளையும் முன்னெடுப்புக்களையும் சில அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் முன்னெடுத்துக்கொண்டிருக்கின்ற இந்தக் காலகட்டத்தில், ஆலையடிவேம்புப் பிரதேசத்தில் மிக மோசமான, மனவேதனையான ஒரு விடயம் நடந்தேறியிருக்கின்றது.

அதாவது, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு Police Stationக்கு முன்னால் இருக்கின்ற வீதிக்கு அருகாமையிலுள்ள மழைக்காலங்களில் நீர் வழிந்தோடுகின்ற ஆழமான கால்வாய்ப் பகுதியை மண் போட்டு நிரப்பிய சம்பவம் கடந்த வாரம் நடைபெற்றிருக்கிறது. நான் அந்த இடத்துக்குச் சென்று பார்வையிட்டேன். பிரதேச சபைக்குச் சொந்தமான அந்த வீதிக்கு அருகாமையிலுள்ள மிகவும் ஆழமான கால்வாயை இலங்கை நில அளவைத் திணைக்களம் நில அளவை செய்திருக்கின்றது. எந்த அடிப்படையில் அது நில அளவை செய்யப்பட்டிருக்கின்றது? என்பதைத்தான் இந்தச் சபையிலே நான் கேட்க விரும்புகிறேன். அதுமாத்திரமல்ல, தேசிய நீர் வழங்கல் வடிகாலமைப்புச் சபைகூட அதற்கு எந்தவிதமான ஒரு கட்டணமும் அறவிடாது, மனிதர்கள் வாழ முடியாதவாறு பாதிப்பை ஏற்படுத்தக்கூடிய வகையில் அந்த அனுமதியை வழங்கியிருக்கின்றது. இவ்வாறு மோசமான, மோசடியான வேலைகள் இந்த மாவட்டத்திலே நடந்து கொண்டிருக் கின்றன. அந்தப் பிரதேச மக்களைத் துன்புறுத்துகின்ற வகையிலே இவ்வாறான போலியான வேலைத்திட்டங்களை முன்னெடுப்பவர்களுக்கு எதிராக இந்த அரசாங்கத்தினால் உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அவ்வாறான வேலைத்திட்டங்களைத் தடுத்து நிறுத்த வேண்டும். அந்தப் பகுதியை மண் போட்டு நிரப்புவதனால் எதிர்காலத்திலே ஆலையடிவேம்புப் பிரதேசம் நீரில் மூழ்கக்கூடிய சூழ்நிலை உருவாகும். அவ்வாறு ஓர் ஆபத்தான சூழலை இந்த ஆலயடிவேம்புப் பிரதேசத்திலே ஏற்படுத்தக்கூடிய வேலையைச் சில தனிநபர்கள் செய்துகொண்டிருக்கிறார்கள். இவர்களின் இந்த வேலையால் அந்தப் பிரதேசத்திலே இனரீதியான முரண்பாடு உருவாகக்கூடிய ஒரு சூழல் இருக்கின்றது. ஆகவே, அதனை உடனடியாக நிறுத்த வேண்டும். நீர் வழிந்தோடும் அந்தப் பகுதியிலே எந்த அடிப்படையில் நில அளவைத் திணைக்களம் அதற்குரிய நில அளவையைச் செய்திருக்கின்றது என்பதைத்தான் நான் கேட்கின்றேன்.

அதுமாத்திரமல்ல, கடந்த காலங்களிலே ஆலையடிவேம்பு பிரதேசத்திலும் எங்களுடைய ஏனைய தமிழ்ப் பிரதேசங் களிலும் அரசியல் ரீதியான நடவடிக்கைகளையோ அல்லது நிருவாக ரீதியான நடவடிக்கைகளையோ எங்களால் சிறப்பாக

[ගරු තවරාජා කලෛයි අරසන් මහතා]

முன்னெடுக்க முடியாதுபோனது. அவ்வாறான சூழலிலும்கூட கருங்கொடித்தீவு என்கின்ற பிரதேசத்தை மையமாக வைத்து ஒரு சில தனிநபர்கள் கட்டடங்களைக் கட்டி அந்தப் பிரதேசத்தையும் ஆக்கிரமித்த வரலாறுகளையும் நான் இவ்விடத்திலே சொல்லிவைக்க விரும்புகிறேன். இவ்வாறான வேலைத் திட்டங்கள் எமது பிரதேசத்திலே பாரிய இனப் பிரச்சினையை அல்லது இன ரீதியான முரண்பாடுகளை உருவாக்கும் என்பதில் ஐயமில்லை. எனவே, அந்தப் பிரதேசத்தின் நிருவாகக் கட்டமைப்பைச் செய்து கொண்டிருக் கின்ற பிரதேச செயலாளர், பிரதேச சபை மற்றும் ஏனைய திணைக்களங்களின் அனுமதியோடும் அவர்களுடைய ஆலோசனைகளோடும் இந்தப் பணிகள் முன்னெடுக்கப் படுமானால் சிறப்பாக இருக்கும். இவ்வாறான வேலைத் திட்டங்கள் அம்பாறை மாவட்டத்தின் ஆலையடி வேம்பு பிரதேசத்தில் மாத்திரமல்ல, ஏனைய எங்களுடைய தமிழ்ப் பிரதேசங்களிலும் முன்னெடுக்கப்படு கின்றன. அந்த விடயங்களை நிறுத்த வேண்டுமென்பதே எனது அன்பான கோரிக்கையாகும்.

தமிழராக இருப்பவர் இந்த நாட்டின் தலைவராக வரமுடியாது; அதேபோன்று பிரதமாரகவும் வரமுடியாது. ஆயினும், நியாயத்தின் அடிப்படையில் செயற்படுகின்ற ஒரு கட்சியாக எங்களுடைய தமிழ் தேசியக் கூட்டமைப்பு இருந்துகொண்டிருக்கின்றது. கடந்த வரவு செலவுத்திட்ட உரையின்போது நிதி அமைச்சர் அவர்கள், "அரசாங்கம் முன்னெடுக்கின்ற அபிவிருத்தி வேலைகளுக்குத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு ஒத்துழைப்பு வழங்க வேண்டும்" என்ற ஒரு கருத்தை முன்வைத்திருந்தார். நாங்கள் எந்தச் சந்தர்ப்பத்திலாவது தமிழ்ப் பிரதேசங்களிலே நடைபெறுகின்ற அபிவிருத்திகளுக்குத் தடையானவர்களல்லர். நீங்கள் எங்களது பிரதேசங்களைப் புறந்தள்ளிவிட்டுதான் ஏனைய பிரதேசங்களிலே அபிவிருத்திகளைச் செய்கின்றீர்கள் என்பதற்காகத்தான் எங்களுடைய குரல்களை ஓங்கி ஒலிக்கின்றோம். அமைச்சர்களாக இருக்கலாம் அல்லது அரசாங்கத் தரப்புப் பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம் யாராவது நெஞ்சைத்தொட்டு சொல்லட்டும், தமிழர் பிரதேசங்களிலே ஒரு சமத்துவமான அபிவிருத்திகள் நடைபெறுகிறது என்று! அவ்வாறு நடைபெறுவது இல்லை. நீங்கள் வழங்கிய ஓரிலட்சம் தொழில்வாய்ப்பில்கூட எங்களைப் புறக்கணிக்கின்றீர்கள். அதேபோன்று வீதி அபிவிருத்தியிலே எங்களுடைய பிரதேசங்களைப் புறக்கணிக்கின்றீர்கள். இதைத்தான் நாங்கள் சொல்கின் றோமே தவிர வேறு எவையுமல்ல.

அதுமாத்திரமல்ல, இந்த நாட்டில் 1983 - 1990 கால கட்டத்தில் வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே பல கைத்தொழில் பேட்டைகள், தனியார் நிறுவனங்கள் போன்றவை மிகவும் சிறப்பாக இயங்கியதனால் அந்தப் பிரதேசங்கள் ஓர் அபிவிருத்தி அடைந்த, சிறந்த வளமிக்க பிரதேசங்களாக இருந்தன. அதன் பின்னர், வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே பல இடங்கள் திட்டமிட்டு அழிக்கப்பட்டன. அந்த அடிப்படையில், கிழக்கு மாகாணத்திலே வாழைச்சேனை காகிதத் தொழிற்சாலை, மண்டூர் ஓட்டுத் தொழிற்சாலை, இறக்காமம் ஓட்டுத் தொழிற்சாலை அதேபோன்று, வடக்கு மாகாணத்திலே காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை போன்ற தொழிற்சாலை களைக் கூறலாம். மட்டக்களப்பு காகித ஆலை தற்பொழுது இயங்கினாலும் இன்னும் முழுமையாக இயங்கவில்லை. இவ்வாறு எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசங்களிலே பல விடயங்களைச் சுட்டிக்காட்ட முடியும்.

இறக்காமத்திலே இயங்கிய ஓட்டுத் தொழிற்சாலையை மையமாகவைத்துதான் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற குடும்பங்கள் வாழ்ந்தன. ஆனால், அந்தப் பிரதேச மக்களுக்கு அந்த ஓட்டுத் தொழிற்சாலையில் வேலை செய்ய முடியாத நிலை ஏற்பட்டுள்ளது. ஏனென்றால், இப்பொழுது அதனைச் சிவில் பாதுகாப்பு படையினர் பொறுப்பெடுத்திருக்கிறார்கள். அதனால் அந்தப் பிரதேசத்திலே அந்தத் தொழிற்சாலையில் தொழில்செய்து வாழ்ந்து வந்த அந்த மக்கள் இன்று வாழ முடியாமல் தத்தளித்துக் கொண்டிருக்கிறார்கள். இதுதான் அங்குள்ள எங்களுடைய தமிழ் மக்களின் நிலைமையாக இருக்கின்றது.

அதேபோன்று, கந்தளாயிலே இயங்கிய சீனித் தொழிற்சாலையும் இப்பொழுது இயங்க முடியாத நிலையில் இருப்பதால் அங்குள்ள மக்களும் தத்தளித்துக்கொண்டிருக்கின்றார்கள். இதுதான் எங்களுடைய தமிழர்களின் நிலைமையாக இருக்கின்றது. நீங்கள் நீண்டகாலமாகத் தயாரித்த agenda - நிகழ்ச்சிநிரலின் அடிப்படையிலே, இப்பொழுது காரியம் நடைபெற்றுக்கொண்டிருப்பதால் இன்று எங்களுடைய மக்கள் அநாதைகளாக்கப்பட்டு, பொருளாதார ரீதியாகவும் பின்னடைவைச் சந்தித்துக்கொண்டிருக்கிறார்கள். ஒரு நிலையான அரசியல் தீர்வோடு இணைந்த அபிவிருத்தியை இந்த நாட்டிலிருக்கின்ற தலைவர்கள் எங்களுடைய மக்களுக்கும் முன்னிறுத்தி, தமிழர்களையும் இந்நாட்டின் பிரஜைகளாக ஏற்று அவர்களை வழி நடத்த வேண்டும் என்பதே எமது அவாவாகும். இறுதியாக, இந்தச் சந்தர்ப்பத்தை வழங்கிய கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி அமர்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Thank you. The next Speaker is the Hon. Selvarajah Kajendren. - *[Not in the Chamber.]*

ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා. Before he starts his speech, will an Hon. Member propose the Hon. Wasantha Yapabandara to the Chair?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *left the Chair, and* THE HON. WASANTHA YAPABANDARA *took the Chair.*

[අ.භා. 3.52]

**ගරු ජානක වක්කුඹුර මහතා (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - கரும்பு, சோளம், மர முந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை உள்ளிட்ட சிறு பெருந்தோட்டப் பயிர்ச்செய்கை அபிவிருத்தி மற்றும் அதுசார்ந்த கைத்தொழில்கள் மற்றும் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura -State Minister of Development of Minor Crops including Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel Related Industries and Export Promotion)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 පිළිබඳවයි අපි කථා කරන්නේ. මුලින්ම මම රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ වූ නියෝග ගැන කථා කරන්න කැමැතියි. මේ නියෝගවල තිබෙන්නේ, 2019.01.01 සිට ක්‍රියාත්මක කර තිබෙන අපේ රටේ රබර් නැවත වගා කිරීම සඳහා ලබා දෙන සහනාධාර මුදල වැඩි කිරීමත්, අලුතින් කරනු ලබන වගාව සඳහා වන සහනාධාර මුදල වැඩි කිරීමත්, ඒ වාගේම එම සහනාධාරය වාරික 8කින් ලබා දීම යන කරුණු. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කිව්වා, එම සහනාධාරය ලබාදෙන වාරික ගණන අඩු කරන්න කියලා. එම වාරික ගණන 5 දක්වා අඩු කරන්න තමයි ගරු රමේෂ් පතිරණ මැතිතුමාත්, ගරු කනක හේරත් මැතිතුමාත් 2021.12.20වැනි දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ. එසේ අඩු කරන්න නම්, කලින් වාරික 8කින් ගෙවීම සඳහා තීරණය කරපු ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කරන්න ඕනෑ. ඒ කටයුත්ත තමයි අද කරන්නේ. නැවත වරක් වාරික 5 දක්වා අඩු කරන කටයුත්ත අපි ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වෙනවා. පසුගිය කාලයේ අපේ රටේ රබර් වගා කිරීම ගොඩක් දෙනෙකු අත් හැරියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් රබර් වතු තිබෙනවා. 2015න් පස්සේ 2020 වනතුරු රබර් වතු කැලේට ගියා. ඒකට හේතුව තමයි රුපියල් 200ටවත් රබර් කිලෝව විකුණන්න බැරි වීම. අපේ රජය බලයට පත් වුණාට පස්සේ රබර් මිල වැඩි කිරීම සඳහා වැඩ කටයුතු රාශියක් කළ නිසා අද එකට එකක් මිල වැඩිවෙලා තිබෙනවා. එදා රුපියල් 220ක උපරිම මිලක්ව පැවති රබර් කිලෝව අද වනකොට රුපියල් 440ට වඩා වැඩිවෙලා තිබෙනවා. එකට එකක් මිල වැඩි වීම තුළ 2021 අවුරුද්ද වනකොට මේ රටේ රබර් වගා කරන්න විශාල ගොවි ජනතාවක් පෙලඹුණා. ඒකට හේතුව තමයි සහනාධාර වැඩි කිරීම සහ රබර් මිල වැඩිවීම.

රබර් වගාව මේ රටේ පරිසරයට හිතකර දෙයක්. අද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කැලෑ ගොඩක් තිබෙනවා. ඒ කැලෑවලින් පරිසරයට වාසියක් නැහැ. අපි දන්නවා, පසුගිය කාලයේ -70 ගණන්වල- වගා කරපු කැලෑ තිබෙන බව. ඒ කැලෑවල මොකක්වත් -යටි වගාවක්වත්- වැවෙන්නේ නැහැ. දැන් ඒ වෙනුවට රබර් වගා කරන්න යනවා. ඒ අනුව රබර් වගාව වන ගහනයටත් යම්කිසි පිළියමක් වනවා. ඒ වාගේම රබර් කිරි කපලා ඉවර වුණාට පස්සේ ඒ ගස් ලොකු මිලකට විකුණා ගන්නත් පුළුවන්. එහෙම තිබියදීත් පසුගිය කාලයේ රබර් වගාවෙන් ජනතාව ඈත් වුණා. දැන් නැවත වරක් ජනතාව විශාල සංඛ්‍යාවක් රබර් වගා කරනවා.

රටේ පවතින ඩොලර් ප්‍රශ්නය සම්බන්ධයෙන් ආණ්ඩුව වැඩ කරන්නේ නැහැ කියනවා අපි දැක්කා. 2021 අවුරුද්දේ අපේ රටේ වැඩිම මුදල රබර් අපනයනයෙන් ලබාගෙන තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියනයකට වැඩි මුදලක් රබර් අපනයනයෙන් මේ රටට ගෙනෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රයේ යෙදිලා ඉන්න ගොවි ජනතාව අද පෙරට වඩා උනන්දුවෙන් කටයුතු කරනවා. ඒ වාගේම අපේ දෙපාර්තමේන්තු ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. අපි බලාපොරොත්තු වනවා, වගා කරන්න පුළුවන් සෑම ප්‍රදේශයකම රබර් වගා කරලා, වගාකරුවන්ට සහනාධාර වාගේම දැනුම ලබා දීලා, වගාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න.

රබර් වාගේම තමයි තේ වගාවත්. අපේ රමේෂ් පතිරණ ඇමතිතුමා මේ කටයුත්ත නීත්‍යනුකූල කරන්න මේ ගැසට් නිවේදනය ගෙනැල්ලා තිබෙනවා. 2010 අවුරුද්දේ තමයි එක බලපත්‍රයක් ලබා ගන්න කොට බලපත්‍ර ගාස්තුව රුපියල් මිලියනයක් කළේ. දැන් අවුරුදු 12ක් වනවා. මේ කටයුත්ත කරන්න අද හෝ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් මම සතුටු වනවා. ඒ වාගේම මහා පරිමාණ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා රුපියල් ලක්ෂ දෙක හමාරකුත්, මධ්‍යම හා කුඩා පරිමාණ බලපත්‍රයක් අලුත් කරන්න එක්ලක්ෂ විසිපන්දාහකුත් වැය වනවා. තේ ක්ෂේත්‍රයෙන් වැඩි ආදායමක් ලබා ගන්නේ නැහැ කියලා ගොඩක් අය බණිනවා. පසුගිය අවුරුද්දේත් අපි 2020 අවුරුද්දට වඩා වැඩි ප්‍රමාණයක් විකුණලා, මේ රටට මුදල් ගෙනැල්ලා දීලා තිබෙනවා. තේ වගාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. අද කුඩා තේ වතු හිමියන්ට පොහොර ගැටලුව තිබෙනවා. අපේ රමේෂ් පතිරණ මැතිතුමා ඒ ගැටලුවලට විසඳුමක් හැටියට කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ගෙනාවා, අමු තේ දළු කිලෝවක් සඳහා සහනාධාරයක් ලබා දෙන්න. ඒ යෝජනාව මේ වනකොට අනුමතවෙලා තිබෙනවා. ඉදිරි කාලයේදී අමු තේ දළු කිලෝවක් සඳහා රජයෙන් සහනාධාරයක් ලබා දෙන්නත්, තමන්ට කැමති පොහොරක් තේ වගාවට යොදන්න අවශ්‍ය කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

මේ අවුරුද්දේ නැවත වගා කිරීම සඳහා වූ සහනාධාරය වැඩි කරලා තිබෙනවා. නැවත වගා කිරීම සඳහා රුපියල් 500,000 තිබුණු සහනාධාරය රුපියල් 650,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම ගුණාත්මකභාවයෙන් ඉහළ තේ පැළ ලබා දීම සඳහා 2021 අවුරුද්දේ විතරක් තේ පැළ තවාන් 500ක් හදන්න අමාත්‍යාංශයෙන් මුදල් දීලා තිබෙනවා. අලුතින් තේ පැළ තවාන් 500ක් හදලා, ගුණාත්මකභාවයෙන් ඉහළ තේ පැළයක් ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට ලබා දෙන්න අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. ඒ වත්තක වැඩි හරියක් තිබෙන්නේ පාළු. ඒ පාළු පැළයක් හිටවන්න රුපියල් 100ක සහනාධාරයක් දුන්නා. ඒ ඉඩමෙන් වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන් ආකාරයට එම සහනාධාරය ලබා දුන්නා. මට මතකයි, මීට පෙර තිබුණු ආණ්ඩුවෙන් රුපියල් 100ක සහනාධාරයක් දෙනවා කියලා උත්සව තිබ්බාට ඒක ලබා දුන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩා තේවතු හිමියන්ට සහන ලබා දෙන්න තිබුණු සෙස් බද්දෙන් නුවරඑළියේ එළවලු ගොවීන්ට මෝටර් බෙදපු එකයි කළේ. අපි ඒක දැක්කා. ඒ ගෙනැල්ලා තිබෙන මෝටර් ටිකක් තවමත් තිබෙනවා. හැබැයි, ඒ සෙස් බද්දෙන් දෙන සහනය කුඩා තේවතු හිමියන්ට හිමි වෙන්න ඕනෑ. ඒක වෙනත් භෝගයක් වගා කරන අයට නොවෙයි හිමි වෙන්න ඕනෑ. මේ සෙස් බද්දෙන් ගන්නා මුදලින් තමයි ලෝක වෙළෙඳ පොළේ වැඩි මිලකට අපේ තේ විකුණා ගන්න අපි කටයුතු කරන්නේ. ඒ වාගේම, ගොවියාට සහන ලබා දෙන්නත් අපි ඒක උපයෝගි කර ගන්නවා.

කුඩා තේවතු හිමියා වෙනුවෙන් අපේ ආණ්ඩුව වැඩ කටයුතු රාශියක් කරලා තිබෙනවා. ඒ සඳහා රජය මැදිහත්වෙලා කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරි කාලයේදී කුඩා තේවතු හිමියන්ට තිබෙන ප්‍රශ්න පිළිබඳව මීට වඩා සොයා බලන්න අපි බලාපොරොත්තු වෙනවා. ප්‍රතිශතයක් විදියට ලංකාවේ වැඩිම

[ගරු ජානක වක්කුඹුර මහතා]

කුඩා තේවතු හිමියන් ප්‍රමාණයක් මගේ මැතිවරණ කොට්ඨාසයේ සිටිනවා. මගේ ආසනයේ සිටින තේවතු හිමියන්ගෙන් සියයට 99ක්ම කුඩා තේවතු හිමියන්. ඒ අයට ප්‍රශ්නයක් තිබෙනවා. බොහෝ වෙලාවට පායන කාලය එනකොට ඒ ප්‍රදේශවලට වතුර නැහැ. ඒ නිසා අපේ ඇමතිතුමා යෝජනා කළා, කුඩා තේවතු හිමියන්ට ජලය ලබා ගැනීම සඳහා මුදලක් ලබා දෙන්න. ඒක ගිය අවුරුද්දේ ක්‍රියාත්මක වුණා. දැන් මේ අවුරුද්දේත් ඒක ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම, අපේ ගම්වල කුඩා තේවතු සමිති තිබෙනවා. සමිතියක් තිබුණාට ඒ ගොල්ලන්ට දළු ටික එකතු කරලා, දළු ටික දා ගන්න තැනක් නැහැ. ගුණාත්මකභාවයෙන් ඉහළ තේ හදන්න නම් ඒවාට අවශ්‍ය පහසුකම් දෙන්න ඕනෑ.

මේ වෙනකොට අමාත්‍යාංශය මැදිහත් වෙලා, මිලියන 4කට වැඩි මුදලක් ලබා දෙමින් කුඩා තේවතු හිමියන්ගේ සමිති හරහා අවශ්‍ය මධ්‍යස්ථාන හදලා දෙන්න කටයුතු කරනවා. කුඩා තේවතු හිමියාගේ දළු ටික පාරට ගෙනෙන්න පුළුවන් වෙන්න අමාත්‍යාංශය මැදිහත්වෙලා පාරවල් හදලා දෙනවා. අපි පාර හදන්නේ කොන්ත්‍රාත්කරුවෙකුට දීලා නොවෙයි. ගමේ කුඩා තේවතු හිමියාගේ සමිතිය හරහා ඒ ගොල්ලනුත් සියයට 10ක් ශ්‍රම දායකත්වය දීලා තමයි ගමේ පාර හදා ගන්නේ. ඒ වාගේ වැඩ කටයුතු රාශියක් කුඩා තේවතු හිමියා වෙනුවෙන් අපේ ආණ්ඩුව මේ වෙනකොට ක්‍රියාත්මක කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැවිලි අමාත්‍යාංශයට අදාළ ගැසට් නිවේදන දෙකක් පිළිබඳව සාකච්ඡා කරනවා. ගොඩක් අය කියනවා, පසුගිය කාලයේ අපනයන ආදායම් වැඩි කරන්න රජය කටයුතු කළේ නැහැ කියලා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සෑම භෝගයකටම සාධාරණයක් ඉෂ්ට කරලා තිබෙනවා. පොල් සඳහා අපේ රටේ වැඩිම මිලක් ලබා දෙන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. කුරුඳු වගාවෙන් වැඩිම ආදායමක් ගෙනෙන්න පුළුවන් වෙලා තිබෙනවා. සුළු අපනයන භෝගවලින් මිලියන 63,000ක් වෙනුවට මිලියන 102,000ක් අපි මේ රටට ගෙනැවිත් දීලා තිබෙනවා. ඒ නිසා ඒ සෑම භෝගයක්ම අපි ප්‍රවර්ධනය කරලා තිබෙනවා. පිට රටට ඇදී ගිය මුදල් අපි නතර කරලා තිබෙනවා. අද මේ සෑම මන්ත්‍රීවරයකුම මට කියන්නේ, අපේ රටේ ජනතාව කහ වගා කළා, ඔවුන්ගෙන් ඒ කහ ටික මිලට ගන්න කියලායි. අපි ඕනෑම භෝගයක් වගා කරනවා. හැබැයි, මිලදී ගන්න කවුරුවත් නැහැ. අතිගරු ජනාධිපතිතුමා කිව්වාම කහ වගා කරන්න කියලා, අපේ රටේ මිනිස්සු කහ වගා කළා. අපි කහවලින් ස්වයංපෝෂිත වුණා. අද වෙනකොට අපේ අමාත්‍යාංශය මැදිහත් වෙලා ලංකාවේ හැම ප්‍රදේශයකටම ගිහිල්ලා කහ අස්වැන්න මිලදී ගෙන ඒ ගොවියාට සාධාරණයක් ඉෂ්ට කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ගොවියා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න වැවිලි අමාත්‍යාංශය මැදිහත්වෙලා තිබෙනවා. දැන් ගොඩක් අය කියනවා, වැවිලි ක්ෂේත්‍රයෙන් ගොවි ජනතාව අයින් වෙනවා කියලා. නමුත් ගොවියා එහෙම අයින්වීමක් වෙලා නැහැ. වැවිලි ක්ෂේත්‍රය තුළින් බිලියන 5කට වඩා වැඩි ආදායමක් අපේ අමාත්‍යාංශයට ලබා ගන්න අද පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ රටේ සියලු කර්මාන්තවලට අවශ්‍ය රබර් කිරි ටික අපේ රටේ නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අද වෙනකොට ටයර් කර්මාන්තශාලා කීපයක් මේ රටේ තිබෙනවා. ඒ කර්මාන්ත ශාලාවලටත් අපේ රටේ රබර් කිරි ටික තමයි අපි දෙන්නේ. මේ රබර් ක්ෂේත්‍රය තුළ ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ගොඩක් වෙලාවට අපේ ප්‍රදේශවලට වැස්ස වැඩි නිසා රබර් කිරි කපා ගන්න අමාරුයි. දැන් ඒකටත් ක්‍රමවේදයක් තිබෙනවා.

ලෝකයේ ගොඩක් රටවල් රබර් කිරි කපන්න අපට වඩා තාක්ෂණය භාවිත කර තිබෙනවා. අපිත් බැලුවා, ඒ ක්‍රමය කරන්න. නමුත් එය ටිකක් අමාරුයි. මොකද, අපේ රටේ ඒ සඳහා යන වියදම වැඩියි. හැබැයි, අපි ආදර්ශයක් විධියට එක ප්‍රදේශයක හරි ඒක කරලා බලමු කියලා අපේ ඇමතිතුමා කිව්වා. නවීන තාක්ෂණයත් එක්ක ඉස්සරහට ගිහිල්ලා, අපේ ගොවියාට අඩු වියදමකින් වැඩි මිලක් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න අපි කල්පනා කරනවා. ඉදිරියේ දී සෑම වගාවකටම තාක්ෂණය උපයෝගී කරගෙන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. වියට්නාමය ගත්තොත්, අපි එක ගම්මිරිස් වැලක් සිටුවනකොට ඒ ගොල්ලන් එක තැනක ගම්මිරිස් වැල් හතරක් සිටුවනවා; හතර පැත්තට වැලක් වගේ අදිනවා. නමුත් අපි එක කණුවකට එක පැළයක් සිටුවනවා. අපි ඒ ක්‍රම වෙනස් කරලා අලුත් විධියට මේ ක්ෂේත්‍රය දියුණු කරන්න අවශ්‍ය කරන කටයුතු කරනවා. අද දවසේ සාකච්ඡා කරන මෙම නියෝගවලට අදාළ දේවල් දැනටත් ක්‍රියාත්මක වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් කිව්වා වාගේම ඉදිරියේදී මේ ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපේ ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා. අපේ බලාපොරොත්තුව, ලංකාවේ රබර් වැවෙන සෑම ප්‍රදේශයකම රබර් වගා කිරීමයි. අපි පොළොන්නරුව ප්‍රදේශයට ගිහිල්ලා බැලුවා, රබර් වගා කරන්න පුළුවන්ද කියලා. ඒ ප්‍රදේශයේ අත්හදා බැලීමක් කරලා තිබෙනවා. හැබැයි, ඒ අත්හදා බැලීම සාර්ථක වෙලා නැහැ. නමුත් අපේ රටේ ගොඩක් ප්‍රදේශවල රබර් වගා කරන්න පුළුවන්. අපේ රාජ්‍ය ඇමති කනක හේරත් මැතිතුමා මේ වෙනකොටත් රබර් වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනවා. රටේ රබර් වවන්න පුළුවන් සෑම ප්‍රදේශයක් ගැනම සොයා බලා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා. මොනරාගල දිස්ත්‍රික්කයේත් රබර් වගා විශාල වශයෙන් තිබෙනවා. ඒ වාගේම, හොරණ ප්‍රදේශයේත් විශාල වශයෙන් රබර් වගාව තිබෙනවා; කෑගල්ල දිස්ත්‍රික්කයේත් රබර් වගාව විශාල වශයෙන් තිබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, අපේ රටේ ගොඩක් ඉඩම් වනාන්තර බවට පත් කරලා තිබෙනවා. නමුත්, ඒවායේ තිබෙන ශාකවලින් ප්‍රයෝජනයක් නැහැ. රත්නපුරයේ ඉඳලා බණ්ඩාරවෙල පැත්තට යනකොට, බලංගොඩ

-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට පස්වරු .4.30 දක්වා කාලය තිබෙනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට කියලා තිබෙනවා, මුඩු ඉඩම් වාගේ තිබෙන සෑම ඉඩමක්ම කැලෑ බවට පත් කරන්න, ඒ ගමේ ජනතාවට ආදායමක් ගන්න පුළුවන් වන විධියට ඒවායේ රබර් වගා කරන්න අවසර දෙන්න කියලා. මේ වෙනකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කොටස් වශයෙන් රබර් වගා කරන්න අවසරයක් දෙනවා. අපේ බලාපොරොත්තුව මේ රටේ වන ගහනය වැඩි කරනවා වගේම මේ ක්ෂේත්‍රය දියුණු කරලා රටට ආදායමක් ගෙනෙන වැඩ පිළිවෙළක් ඇති කිරීමයි. ඒ අනුව ගොඩක් ප්‍රදේශවල අද වෙනකොට රබර් වගාව අත්හදා බලලා තිබෙනවා. පසුගිය කාලයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩක් අය මේ වගාවෙන් ඈත් වෙලා තිබෙනවා. අපේ පතල් කපන අයට තමයි පසුගිය කාලයේ රබර් ටික වික්කේ. හැබැයි, දැන් ඒ අය නැවත වරක් මේ වගාව සඳහා මහන්සි වෙලා කටයුතු කරනවා.

රබර් කිරි කපන්න අවුරුදු පහක් යනවා. අවුරුදු පහක් ගියාට, වාරික අටකින් අපි මුදල් දෙන්න ගියාම ඔවුන්ට මේ මුදල් ගොඩක් ප්‍රමාද වෙලා තමයි හම්බ වෙන්නේ. සාමාන්‍යයෙන් මූලික වියදමෙන් සියයට 21ක විතර ප්‍රමාණයක් අපි ලබා දෙනවා. ඒ නිසා පළමු වාරිකය වශයෙන් අපි දැන් ලක්ෂ එකහමාරක් විතර ලබා දෙනවා. අපි ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ ඒ අයට මේ කටයුත්ත කරගෙන යෑම පහසු කිරීම. ඒ වගේම රබර් සිටුවා අවුරුදු පහක් යනතුරු බලාගෙන ඉන්නේ නැතුව යටි වගාවක් කරන්නත් ඔවුන්ට පුළුවන්. එසේ යටි වගාවක් කරන්න පහසුකම් සපයන්නත් අපි දැන් කටයුතු කරගෙන යනවා. අපේ රටේ ගොඩක් ඉඩම්වල වගාවක් කළාම අවුරුදු තුන හතරක් යනතුරු ඒ භූමියේ තව වගාවක් කරන්න පුළුවන්. හැබැයි, අපි එහෙම ප්‍රයෝජනයට ගන්නේ නැහැ. මේ ළඟදී මගේ අමාත්‍යාංශය යටතේ, මන්නාරමේ අක්කර 4,000ක තිබෙන කජු වගාවක අපි අතුරු භෝගයක් සිටෙව්වා. ඒ අතුරු භෝගයෙන් ඒ වගේම මුදලක් ගන්න පුළුවන්. ඒ නිසා අපි බලනවා, අතුරු භෝග ඒ එක්කම සිටුවන්න. කජු වගාව ඇතුළේ අක්කර 100ක අපි වට්ටක්කා සිටෙව්වා. එම භෝගයත් බොහොම හොඳට හැදිලා තිබෙනවා. අපි බලනවා, අතුරු භෝගත් ඒ ගොවි මහත්වරුන්ට ලබා දෙන්න. ඒ රබර් වතුවල පස බලලා කහ වගා කරන්නත් පුළුවන්; ඉඟුරු වගා කරන්නත් පුළුවන්. බඩඉරිඟු වගා කරන්නත් පුළුවන්. මොකද, ඒවා කෙටි කාලීන භෝග. එම භෝග මාස කීපයයි තිබෙන්නේ. කෙටි කාලීන භෝග වගා කළොත් ඒ අයට ආදායමක් නොලැබ සිටින අවුරුදු පහක විතර කාලය තුළ ආදායමක් ලබා ගන්න පුළුවන්. එවැනි යටි වගාවකින් ආදායමක් ගන්න අවස්ථාව සලසා දෙන්න අපි බලනවා. එහෙම නොවුණොත්, සාමාන්‍යයෙන් අක්කර දෙකක්, තුනක් තිබෙන කෙනෙකුට අවුරුදු පහක් යන කල් ආදායමක් හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන් නැවත රබර් වගාවට පෙලඹෙන්නේ නැහැ. අපේ රටේ හෙක්ටෙයාරයකින් රබර් කිරි කිලෝ 1,000ක් ගන්න පුළුවන්කමක් තිබුණ නමුත්, අද කිලෝග්‍රෑම් 500ක් ගන්න පුළුවන්කමක් නැහැ. ඒකට හේතුව මෙයයි. සාමාන්‍යයෙන් හෙක්ටෙයාරයක රබර් ගස් 516ක් තිබෙන්න ඕනෑ. හැබැයි, පැළ 305ක්වත් සිටුවන්නේ නැහැ. ඒ නිසා දැන් දෙපාර්තමේන්තුව සහනාධාර ලබා දෙන කොට හරියටම ගස් ටික තිබෙනවාද කියලා බලලා තමයි සහනාධාරය ලබා දෙන්නේ. ඒ වාගේම ගොඩක් වෙලාවට පාළු සිටුවන්නේ නැහැ. ඒ නිසා මේ සහනාධාරය ලබා දීමත් එක්ක අපි බලාපොරොත්තු වනවා, පාළු සිටුවීමත්, ඒ ඉඩමේ ඒ අවශ්‍ය පැළ ප්‍රමාණය සිටුවීමත්. අපි හැම වෙලාවේම ඒ භූමියෙන් වැඩි ඵල ප්‍රයෝජනයක් ගන්න, අස්වැන්න වැඩියෙන් ගන්න අවශ්‍ය කටයුතු දෙපාර්තමේන්තුව හරහා කියලා දෙනවා. එහෙම නැත්නම් ලෝකයේ අනෙක් රටවල හෙක්ටෙයාරයකින් රබර් කිරි කිලෝ 1,000ක් ගන්නවා නම්, අපේ රටේ කිලෝග්‍රෑම් 500යි ගන්නේ. හේතුව තමයි, අපි ඒ වගාවේ පාළු පැළ සිටුවන්නේ නැති වීම. දැන් අපි ඒ වැඩ පිළිවෙළත් කරගෙන යනවා. අපි බලාපොරොත්තු වෙන්නේ මේ සෑම ක්ෂේත්‍රයකම උපරිමයෙන් කටයුතු කරලා මේ අවුරුද්දේ අපනයන ආදායම වැඩි කර ගන්න. පසුගිය අවුරුද්දේ අපි ඩොලර් මිලියන පහකට වැඩි අපනයන ආදායමක් මේ රටට ගෙනාවා. ඊටත් වැඩි ප්‍රමාණයක් මේ අවුරුද්දේ ගෙනෙන්න අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි අමාත්‍යාංශය මැදිහත් වෙලා අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ මේ රටේ තේ ගොවියාටත්, රබර් ගොවියාටත් සෙත සැලසෙන නියෝග දෙකක්. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ ක්ෂේත්‍රය සම්බන්ධව කියපු සියලු කරුණු අරගෙන අපි ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බවත් සඳහන් කළ යුතුයි. මේ ක්ෂේත්‍රයට සම්බන්ධ උගතුන් අඩු නිසා ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දීලා අද ඒ ඩිප්ලෝමාධාරීන්ට සහතික පිරිනැමීමේ උත්සවයක් නෙළුම් පොකුණ රඟහලේ පවත්වනවා. අපේ රමේෂ් පතිරණ ඇමතිතුමාත්, කනක හේරත් රාජ්‍ය ඇමතිතුමාත් මේ මොහොතේ අතිගරු ජනාධිපතිතුමාත් එක්ක ඒකට සම්බන්ධවෙලා සිටිනවා. එතුමන්ලා දෙදෙනාම තමන්ට භාර දී ඇති අමාත්‍යාංශ තුළින් මේ ක්ෂේත්‍රය වෙනුවෙන් මැදිහත්වෙලා කටයුතු කරන බව මතක් කරමින්, මේ කටයුතුවලට සහයෝගය ලබා දුන් මැති ඇමතිවරු සියලුදෙනාටත්, අමාත්‍යාංශයේ අපේ ලේකම්තුමන්ලා සහ දෙපාර්තමේන්තුව, තේ පර්යේෂණ ආයතනය ඇතුළු අපේ ආයතනවල සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත: නියෝග
## இறப்பர் மீள்நடுகை மானியச் சட்டம்: ஒழுங்குவிதிகள்
## RUBBER REPLANTING SUBSIDY ACT: REGULATIONS

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(437 අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 අගෝස්තු 18 දිනැති අංක 2241/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ මහාමාර්ග අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා වෙතයි.

මධ්‍යම අධිවේගී මාර්ගයේ CEP3 රඹුක්කන සිට ගලගෙදර දක්වා කිලෝමීටර 20ක මාර්ගය ඉදිකිරීමේදී රුපියල් කෝටි 16,440ක එනම්, රුපියල් බිලියන 164ක වංචාවක් සිදු කළ බවට තොරතුරු ලැබී ඇත.

1. මෙම කොන්ත්‍රාත්තුව ලබා දීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් මුලින් පත් කළ CANC කමිටුවේ පුද්ගලයන් මාරු කර නව කමිටුවක් පත් කළේ ඇයි? එයට හේතු මොනවාද?

2. මෙම කොන්ත්‍රාත්තුව සඳහා වැය වෙතැයි කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කළ බිලියන 82 හා පළමු CANC කමිටුවේ නිර්දේශ නොකතා හරිමින් නව CANC කමිටුව විසින් දේශීය සමාගමක් තෝරා ගත්තේ කුමන පදනමකින්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට සමාන්තර ප්‍රශ්නයක් අද උදේ ඉදිරිපත් වුණ අවස්ථාවේ ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා පසුගිය රජය කාලයේ මහාමාර්ග සංවර්ධනයේදී සිදු වූ දේවල් පිළිබඳව සඳහන් කළා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඒ ආණ්ඩුව කාලයේ සිදුවෙලා තිබෙන වැරදි සම්බන්ධව පරීක්ෂණ කරලා, එවකට හිටපු ඇමතිවරු වැරදිකරුවන් නම් ඔවුන්ට නඩු පවරා දඬුවම් කරන්න කියලා. ඒ ආණ්ඩුව කාලයේ යම්කිසි වරදක් වෙලා තිබෙනවා නම්, මේ ආණ්ඩුව කාලයේ වරදක් වෙන්න ඒක හේතුවක් නොවෙයි.

මධ්‍යම අධිවේගී මාර්ගය පිළිබඳව කථා කරද්දී, පසුගිය දවස්වල මාධ්‍යවලින් වාර්තා වෙලා තිබෙන දේවල් නිවැරදි නම්, ඒ නිවැරදිභාවය ප්‍රකාශ කරන්න මේක අවස්ථාවක් කර ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. හැබැයි, දැනට වාර්තා වෙලා තිබෙන තොරතුරු අනුව මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන අදියරේ වැඩ කටයුතු සඳහා ගිය අවුරුද්දේ ජාත්‍යන්තර ටෙන්ඩරයක් කෝල් කරලා ඒ අනුව සමාගම් ගණනාවක් එයට apply කරලා තිබෙනවා. අපට නම් කිසිම සමාගමක් වෙනුවෙන් පෙනී සිටින්න අවශ්‍යතාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ ප්‍රශ්නයේ අරමුණ ශ්‍රී ලංකා ජනරජයට යම්කිසි පාඩුවක් වෙනවා නම් ඒක වළක්වා ගැනීම. ඒකට අපට A ද, B ද, C ද, Sri Lankan ද, American ද, Chinese ද, Indian ද, ලෝකයේ වෙන රටක් ද කියන එක අදාළ නැහැ. ඒ ටෙන්ඩර් එකෙන් පස්සේ ජනවාරි මාසයේ 16 වැනි දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කරන්න ඕනෑ කියලා Cabinet Appointed Negotiating Committee එකෙන් recommend කරලා තියෙද්දී මේක වෙනස් කරන්න ඕනෑය කියලා, ඒ procurement process එක අවසන් කරලා 27වැනි දා නැවත Cabinet Paper එකක් දමලා Cabinet Appointed Negotiating Committee එක මාරු කරනවා. එහෙම මාරු කළාම එහි සාමාජිකයන් මාරු වෙලා මේ process එක වෙනස් වෙනවා. ගණන් හදලා තිබෙන විධියට, මුල් පියවර අනුව ගියා නම් සම්පූර්ණ වියදම යන්නේ ඩොලර් බිලියන 1.875යි. ඒ කියන්නේ ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් බිලියන 380ක්. මේ වෙනස් කිරීම අනුව දැන් වියදම යනවා ඩොලර් මිලියන 1,050ක්. ඒ අනුව වෙනස ඩොලර් මිලියන 825ක් වෙනවා. මේක තවම award කරලා නැහැ කියලා තමයි කියන්නේ. මේ ගැන negotiate කරන්න කැබිනට් අනුකමිටුවට යොමු කරලා තිබෙනවා. ඒ අනුව මේ ව්‍යාපෘතිය මේ විධියට වුණොත් ඒ වෙනස ඩොලර් මිලියන 825ක් -ශ්‍රී ලංකා රුපියල් බිලියන 167ක්- වෙනවා. දැන් ආනයනය සඳහා ඩොලර් පාවිච්චි කරන උත්ඩියල් ක්‍රමයට කළොත්, මේකෙන් රුපියල් බිලියන 206ක පාඩුවක් වෙනවා කියලා සඳහන් කරලා තිබෙනවා. මේ කථාව වැරදියි නම් එය නිවැරදි කිරීමේ අයිතිය එතුමාට තිබෙනවා.

ඊළඟට, LOLC සමාගමේ funding සඳහා සෙලෙන්දිවා සමාගම හරහා ශ්‍රී ලංකා භූමියේ ඉඩම් ටික විකුණන්න උත්සාහයක් තිබෙනවා කියලා කථාවක් තිබෙනවා. මේ කාරණා වැරදි නම් නිවැරදි කිරීම ගරු ඇමතිතුමාගේ වගකීමක්. මේ තොරතුරු වැරදි විධියට කියලා තිබෙනවා නම්, එතුමා ඒ සම්බන්ධ නිවැරදි කරුණු ඉදිරිපත් කළොත් අපි ඒකත් පිළිගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ප්‍රධානම තර්කය තමයි, මේ කොන්ත්‍රාත් දේශීය සමාගම්වලට ලබා දෙනවා නම් මිල අඩු වෙන්න ඕනෑ කියන එක. නමුත්, දේශීය සමාගම්වලට මේවා ලබා දීමේදී මිල වැඩි වෙනවා නම් රටටයි එයින් පාඩු සිදු වෙන්නේ. මොන කොම්පැනියද, මොන රටද කියන එක අපට අදාළ වන්නේ නැහැ. මොන රට ද, මොන කොම්පැනිය ද කියන එකට වඩා, මේ වෙලාවේ ඩොලර් මිලියන 825ක පාඩුවක් වෙනවා නම්, ඒක වළක්වන්නයි අපි බලාපොරොත්තු වන්නේ. ඇත්ත වශයෙන්ම අපි පාකිස්තානයෙන් ඩොලර් මිලියන 200ක් ණයට ඉල්ලනවා කෑම ටික ගෙනෙන්න. බංග්ලාදේශයෙන් ඩොලර් මිලියන 200ක් ණයට ඉල්ලනවා, අමුද්‍රව්‍ය ගෙනෙන්න. ඉන්දියාවෙන් ඩොලර් මිලියන 500ක් ඉල්ලනවා, ඛනිජ තෙල් ටික ගෙනෙන්න. ඒ මුළු ගණන ගත්තාම ඩොලර් මිලියන 900ක් පමණ වෙනවා. මේ විධියට කටයුතු කළොත්, අපේ රටේ සමස්ත ජනතාවට කන්න, බෙහෙත් ටික දෙන්න, ඛනිජ තෙල් ටික ගෙනෙන්න, අමුද්‍රව්‍ය ගෙනෙන්න යන තරම් මුදල් ප්‍රමාණයක් මේ හරහා නාස්ති වෙනවා කියන එක ගැනයි අපි මේ කරුණු හෙළි කරන්නේ. එහෙම වෙනවා නම් ඒක ජාතික අපරාධයක්. ඒ ජාතික අපරාධය වළක්වාලීම මහජන නියෝජිතයන් හැටියට අපේ වගකීමක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මගේ විනාඩි පහ ඉවර වනකොට අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අවසන් වූ procurement process එක අනුව ඒ විධියටම ටෙන්ඩර් ප්‍රදානය කරනවාද, නැත්නම් කොයි විධියටද මේක කරන්නේ කියන එක පැහැදිලි කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, අපි සාකච්ඡා කරලා, අපේ රජයෙන් තමයි පාර්ලිමේන්තුවේ ප්‍රධාන වැඩකටයුතු අවසන් වුණාට පසු කල්තැබීමේ ප්‍රශ්න අහන්න අවස්ථාව ඔබතුමන්ලාට ලබා දුන්නේ. ඔබතුමා මගේ මිත්‍රයෙක්. එතුමා මේ විනාඩි 5 ඇතුළත බොහොම අසාර්ථක ප්‍රයත්නයක යෙදුණා, පාකිස්තානයෙන් ගත්තා, බංග්ලාදේශයෙන් ගත්තා කියලා කඩේ ගිහිල්ලා මාධ්‍යයට කථාවක් කර ගන්න. එතුමා ප්‍රශ්න දෙකක් අහලා තිබෙනවා. එතුමා අහලා තිබෙන ප්‍රශ්න දෙක ගැන අපට කියන්න තිබෙන්නේ මෙච්චරයි. විවෘත කරපු නැති ටෙන්ඩරයක ගණන් කොහෙන්ද ඔබතුමා ගත්තේ කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය. ඔබතුමා කියනවා නේ ඔබතුමා සමාගමක් නියෝජනය කරන්නේ නැහැ කියලා. ඒ තොරතුර දුන්න අයගෙන්

ගිහිල්ලා අහන්න මාස 7ක් තිස්සේ මේ ටෙන්ඩර් එක ඉවර කර ගන්න බැරි වුණේ ඇයි කියලා. තමුන්නාන්සේලා කථා කරනවා MCC කියන සමාගමක් ගැන. ඒ MCC සමාගම ටෙන්ඩරයකට ඉදිරිපත්වෙලාත් නැහැ. ඒ නිසා මේ කරන්නේ අනියම් බලපෑමක්. මේ හදන්නේ නිලධාරින් බය කරන්න; ආණ්ඩුව බය කරන්න. තමුන්නාන්සේලාගේ කාලයේ අධිවේගී මාර්ගයේ එක කිලෝමීටරයක් හදන්න ලක්ෂ 18,000කට වැඩියෙන් වැය වුණා. කිලෝමීටර 40ක් ලක්ෂ 18,000න් වැඩි කරලා බලන්න. ඔබතුමා හොඳ දක්ෂයෙක්. මම දන්නවා. මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරදක් නැහැ. හැබැයි, ඔබතුමන්ලාගේ ලොක්කෝ ඒවා කළා. දැන් ඒ යූඑන්පී කියන්න එපා. යූඑන්පී, සජබ ඔය දෙකම එකයි. ඔබතුමාගේ නායකයා -ප්‍රේමදාස මහත්මයා- හිටියේත් ඒ කැබිනට් මණ්ඩලයේ වාඩි වෙලා. වෙන කොහේවත් නොවෙයි. ප්‍රේමදාස මහත්තයා හිටපු කැබිනට් මණ්ඩලය තමයි අත උස්සලා ඒකේ හිටපු ඇමති දයා ගමගේට කොන්ත්‍රාත් දුන්නේ.

අපේ ජනාධිපතිතුමා දූෂණයෙන් තොරව තමයි මේ රට පාලනය කරන්නේ. ඒක අපි පැහැදිලිව කියනවා. ඔබතුමාට මම කාරණයක් මතක් කරන්නම්. රුවන්පුර මාර්ගයේ අඩුම ටෙන්ඩර් එකෙන් මේ රටට රුපියල් බිලියන 15ක් ඉතුරු කරගෙන තිබෙනවා. නමුත්, තමුන්නාන්සේලාගේ පැත්තෙන් එක්කෙනෙක්වත් ඒ ගැන හොඳ කිව්වේ නැහැ; එක වචනයක් කිව්වේ නැහැ. තමුන්නාන්සේලාගේ ඉදිරි පෙළේ ජනාධිපති අපේක්ෂකයා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, අඩුම මුදලට මාගා ආයතනයට දීලා හොරකම් කළා කියලා. මම ඔබතුමන්ලාගෙන් අහනවා තවම ටෙන්ඩර් කටයුතු ප්‍රසම්පාදනය කරගෙන යද්දී කෝටි 1,600 ගණනක් හොරකම් කරන්න පුළුවන්ද කියලා. ඔබතුමා නම් එහෙම කිව්වේ නැහැ. කවුරු හරි කියපු දෙයක් තමයි ඔබතුමාත් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ කිව්වේ. මේ තමයි ඒ කාලයේ "දූෂණ විරෝධී පෙරමුණ" කියලා සංවිධාන අටවා ගෙන මලික් සමරවික්‍රමගේ සාක්කුවේ හිටපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඔබතුමා හිටියේ නැහැ. ඒක තමයි ඇත්ත. එහෙම අය තමයි අද මේ මඩ ගහන්නේ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ දූෂණයෙන් තොරව මේ රට පාලනය කරනවා කියලා අපි පොරොන්දු වුණා. ඒ පොරොන්දුව අනුව තමයි ජනාධිපතිතුමාත්, රජයත්, වැඩ කටයුතු කර ගෙන යන්නේ. තමුන්නාන්සේ කියනවා දඬුවම් කරන්න කියලා. ඒ කාලයේ වට රවුම් පාරේ මංතීරු හය, හතරට බස්සලා බිලියන 66කට දුන්නා. හැබැයි, ඔබතුමා එදා නැඟිටලා ඒ ගැන කථා කළේ නැහැ. ජනතාවාදී දේශපාලනඥයකු හැටියට ඔබතුමාට කථා කරන්න බැහැ ඒ කාලයේ. එහෙම කථා කළා නම් ඔබතුමා අයින් කරනවා. මහ බැංකුව කඩපු පට්ට හොරු ටිකක් තමයි ගිය ආණ්ඩුවේ හිටියේ. ඒ නිසා තමයි ඔබතුමා ආදරය කරපු එක්සත් ජාතික පක්ෂය දාලා ඔබතුමාටත් සජබට යන්න වුණේ. නැත්නම් ඔබතුමා කවදාවත් එක්සත් ජාතික පක්ෂය දාලා යන්නේ නැහැ. අපි ඔබතුමා ගැන දන්නවා. ඔබතුමා අපේ මිත්‍රයා. අපේ මිත්‍රකම අවුරුදු 25කට, අවුරුදු 30කට වැඩියි. දේශපාලන වශයෙන් මොනවා කළත් පෞද්ගලිකව අපට ඔබතුමා සමඟ ප්‍රශ්නයක් නැහැ. ඒ කරපු පට්ට හොරකම් නිසා තමයි ඩී.එස්. සේනානායක මහත්මයා හදපු එක්සත් ජාතික පක්ෂය දිය වෙලා ගියේ. එදා හිටපු වාමාංශික අයත්, විපක්ෂ නායකතුමාත් ඒ පැත්තේ. විපක්ෂයේ සංවිධායකත් ඒ පැත්තේ. ඔක්කෝම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරපු එක තමයි කෙරුවේ. අද කියනවා ආර්ථිකය වැටිලා, බංග්ලාදේශයෙන් ණය ගන්නවා, අරහෙන් ණය ගන්නවා කියලා. ඔව්. මහින්ද රාජපක්ෂ මැතිතුමා 2015දී පරදින්නේ නැතුව හිටියා නම් කොවිඩ් - 19 වසංගතය තිබෙන මේ වෙලාවේත්, රටේ ආර්ථිකයට මෙහෙම වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා මහ බැංකුව හොරකම් කළා විතරක් නොවෙයි, අධිවේගී මාර්ගවලින් හොරකම් කළා. ඔබතුමාගේ හිටපු ඇමතිතුමා නැඟිටලා කියනවා පරීක්ෂණ කරන්න කියලා. අපට ඕනෑ වුණේ ඒ පරීක්ෂණ කරලා තමුන්නාන්සේලා කරපු දේවල් කරන්න නොවෙයි. අපට ඕනෑ වුණේ, ඔබතුමන්ලා කඩා වට්ටපු, විනාශ කරපු මේ රටේ ආර්ථිකය නැවත වාරයක් ගොඩ නඟන්න; මුළු ලෝකයේම අභියෝගයට ලක් වෙච්ච කොවිඩ් - 19 වසංගතයෙන් මේ රටේ මිනිස්සු ටික බේරා ගන්න.

ඒකයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට තිබුණු එකම පරමාර්ථය. ඔබතුමන්ලා බලය අරගෙන දාපු නඩු දැක්කා නේ. හෙට ඔබතුමන්ලා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරනවා. අද කියනවා නඩු අයින් කර ගන්නවා ලු. අපි නඩු කිව්වේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව තියෙද්දී. ඒවා අසාධාරණ නඩු; අසාධාරණ චෝදනා. ඒවාට සාක්ෂි හැදුවා; සාක්ෂිකරුවන් මැව්වා. තමුන්නාන්සේලාට වුවමනා පරිදි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට අධ්‍යක්ෂවරයකු පත් කර ගත්තා. ඒ අධ්‍යක්ෂවරිය ඇවන්ට් ගාර්ඩ් එකේ එක් කෙනාට කථා කළේ කොහේ ඉඳලාද, කාගේ ගෙදර ඉඳලාද කියලා දැක්කා නේ. අපි පැහැදිලිව කියනවා, අපේ රජය කිසිසේත්ම ප්‍රශ්නයක් ඇති වෙන්න ඉඩ දෙන්නේ නැහැ කියලා.

ඒ වාගේම මෙහි ප්‍රසම්පාදන කටයුතු ඉවර වුණාට පස්සේ අපි ඒ ගැන කථා කරමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, වරදක් තිබෙනවා නම් අපි බොහොම ගෞරවයෙන් ඒවා ගැන සොයා බලනවා. හැබැයි, මතක තබා ගන්න, මේ ටෙන්ඩර් සම්බන්ධයෙන් දේශපාලනඥයන් නොවෙයි ඉන්නේ, කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරපු ටෙන්ඩර් මණ්ඩල තමයි තිබෙන්නේ කියලා. ඒ ටෙන්ඩර් මණ්ඩල හරියට ඒ කටයුතු කරනවාද කියලා අපි ඔක්කොම ඇහැ ඇරලා බලමු. ඔබතුමාත්, මමත්, අපිත් බලමු මේවා තුළින් හොරකම් වෙනවාද කියලා. ඒ වාගේම මා ඉල්ලීමක් කරනවා, මේ පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාදවලට මුවාවෙලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඒ සමාගම් නියෝජනය කරන්න එපා කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නොවෙයි, බොහෝ අය එහෙම කරනවා. ඉතාම ගෞරවයෙන් මා ඒ ඉල්ලීම කරනවා. ඒක වැරැදි දෙයක්. ඒ දේ කරන්න එපා. ඒක වැරැදියි. ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනඥයකු හැටියට ඔබතුමාටත් ඒක හොඳ නැහැ. අපි කාටත් ඒක හොඳ නැහැ. ඒක තමයි මේ රටට වෙලා තිබෙන්නේ.

2015ට ඉස්සෙල්ලා රටක් වටිනා නායකයකු වන මහින්ද රාජපක්ෂ මැතිතුමාට මඩ ගැහුවා, අගෞරව කළා. එතුමා මේ රටට සාමය ගෙනාපු නායකයා. එතුමාගේ පවුලට මඩ ගැහුවා. රත්‍රන් අශ්වයන්, ලැම්බෝගිනි, හෙලිකොප්ටර් ගැන නේ කිව්වේ. රත්‍රන් අශ්වයෝ ඉන්නවා කියලා නේ කිව්වේ. Buckingham Palace

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

එකක් ඇමෙරිකාවේ තිබෙනවා කියලා නේ කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතාම විනිවිදභාවයකින්, ඉතාම පිරිසිදු විධියට වැඩ කරන නායකයෙක්. විනිවිදභාවයකින් කටයුතු කර තිබෙන මේ ටෙන්ඩරය සම්බන්ධව අපි බලමු. මේ තොරතුර ඔබතුමාට කවුරුන් හෝ දුන්නු එකක්. ඔබතුමා companies පස්සේ යන්නේ නැහැ. අනෙක් හුභක් අය නම් යනවා. හුභක් අය ඉන්නේ ඒ සාක්කුවල. ඔබතුමා ඒ සමාගම් පස්සේ යන්නේ නැහැ. ඒ කාලයේ හොරකමේ ගිය පට්ට හොරු ටික දැන් ඒ සමාගම් පස්සේ යනවා. අපේ රජය විනිවිදභාවයක් ඇතිව තමයි වැඩ කරන්නේ. මේ ටෙන්ඩරය දුන්නාට පස්සේ අපි ඒ ගැන සොයා බලමු. මොනවා හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් එදාට අපි වාඩිවෙලා, සාකච්ඡා කරලා විසඳා ගනිමු. අපි කිසිම ප්‍රශ්නයක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයින් 3දෙනකු හිටපු එක 5දෙනකු දක්වා වැඩි කළා. ඒක ඉතාම හොඳ දෙයක්. ඒක අපි ඉතා අගය කරනවා. ඒක කළ යුතු දෙයක්. මොනවා හෝ වුණොත් අපි ඒ ගැන සොයා බලමු. හැංගිලා වැඩ කරන්න බැහැ නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කල්තැබීමේ ප්‍රශ්න අංක 2, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මන්ත්‍රීතුමා.

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාවේ මෙම ප්‍රශ්නය ඇසීම සඳහා අවස්ථාව ලබාදීම පිළිබඳව.

විශේෂයෙන්ම කොවිඩ් - 19 වසංගතය නිසාම අපේ රටට ලැබෙන විදේශ විනිමය සීමාවෙලා තිබෙන වෙලාවක, ඒත් එක්කම අපේ ආර්ථිකය යම් අපහසුතාවකට මුහුණ දෙමින් සිටින වෙලාවක රජයක් විධියට ඉතාම අසීරු ගමනක මේ රටේ ආර්ථිකය ගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවසක මාධ්‍යයේ පළ වුණා, "කෝටිපතියන් අගරු චෙක්වලින් ආණ්ඩුවට බදු ගෙවලා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අගරු චෙක් හරහා කෝටි 3,000කට අධික ප්‍රමාණයක් බදු ආදායම අහිමිවෙලා" කියලා. අපි ආණ්ඩුව භාරගෙන, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති යටතේ ජනතාවට තිබුණු අධික බදු ප්‍රතිශත අඩු කරලා, ජනහිතකාමී ලෙස අඩු ප්‍රතිශතයකින් බදු පනවමින් ආර්ථිකය ගෙන යන වෙලාවක, ඉතාම සරල ආකාරයේ බදු අය කර ගනිමින් සිටින අවස්ථාවක මෙවන් අතිවිශාල මුදලක් රටේ ආදායමට, මහා භාණ්ඩාගාරට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අහිමි කළාය කියලා මාධ්‍යයේ වාර්තා වෙනවා.

ඒ නිසා මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගෙන් මම පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දැන ගන්න කැමැතියි.

1. මේ ආකාරයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් සිදුකළ චෙක්පත් අගරුවීමේ සිදු වීමක් වාර්තා වී තිබේද?

2. එසේ නම් කොපමණ චෙක්පත් ප්‍රමාණයක්ද? එහි වටිනාකම කොපමණද?

   එහෙම වෙලා තිබෙනවා නම්, මේ මුදල මේ රටට අහිමි කරලා තිබෙන්නේ කවුද? මේ මුදල ගෙවා නැත්තේ කවුද?

3. එම අගරු චෙක්පත්වලට සම්බන්ධ පුද්ගලයන් පිළිබඳව මේ වන විට රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මන්ත්‍රීතුමා විසින් අසන ලද පැනයට පිළිතුර ලබා දෙනවා.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු ගෙවන ක්‍රම දෙකක් තිබෙනවා. එකක්, මුදලින් ගෙවීම. අනික, චෙක්පත්වලින් ගෙවීම.

සාමාන්‍යයෙන් චෙක්පත් මඟින් බදු ගෙවීම් කරද්දී චෙක්පත්වල පවතින දෝෂ, බැංකුව මඟින් සිදුවන දෝෂ, බදු ගෙවන්නන් විසින් ගන්නා ක්‍රියා මාර්ග හේතුවෙන් එම චෙක්පත් අගරු වීම සිද්ධවෙලා තිබෙනවා.

ඒ එක්කම කොවිඩ් වසංගත තත්ත්වය නිසා බදු ගෙවන්නන්ට බැංකුව වෙත ගොස් ගෙවීම් කිරීම දුෂ්කර වූ බැවින් සහ චෙක්පත් අගරුවීම අවම කිරීම සඳහා 2020.04.08 දින සිට මාර්ගගත - online- ක්‍රමයට බදු ගෙවීමේ අවස්ථාව සලසා දීලා තිබෙනවා. දැනට රාජ්‍ය බැංකු ඇතුළුව වාණිජ බැංකු 8ක් මේ online system යටතේ බදු අය කරගැනීමට දායක වනවා වාගේම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවතින ඒ පද්ධතියත් මේ වනකොට ඒ සඳහා සම්බන්ධ කර ගෙන තිබෙනවා.

මේ ප්‍රශ්නයේ තව මූලික කාරණයක් වෙන්නේ අගරු වෙලා තිබෙන චෙක්පත් ප්‍රමාණය සහ ඒ වටිනාකම කීයක්ද කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 2021.12.31 වන විට සම්පූර්ණ වශයෙන් රුපියල් මිලියන 3,012ක් වටිනා චෙක්පත් 6,701ක් අගරු වෙලා තිබෙනවා. මා ළඟ තිබෙන වර්ෂ අනුව වෙන් වෙන්ව ඒ අගරු වූ ප්‍රමාණ සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා.

කොහොම වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008 අවුරුද්දේ ඉඳලා තමයි අපට දත්ත ලැබී තිබෙන්නේ. 2008 සිට 2015 දක්වා වූ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ධුර කාලය තුළ ප්‍රධාන වශයෙන් චෙක්පත් 2,124ක් අගරු වෙලා තිබෙනවා. ඊළඟට, යහ පාලනය කියපු 2015 සිට 2019 කියන කාල පරිච්ඡේදය තුළ චෙක්පත් 3,810ක් අගරු වෙලා තිබෙනවා. 2008 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී ඇති වූ යම් යම් දෝෂ සහ යම් යම් ප්‍රශ්න නිසා චෙක්පත් 2,124ක් අගරු වෙලා තිබෙනවා. හැබැයි, යහ පාලනය කාලයේ චෙක්පත් 3,810ක් අගරු වෙලා තිබෙනවා විතරක් නොවෙයි, යහ පාලනය කාලයේ අගරු වූ චෙක්පත්වල වටිනාකම රුපියල් මිලියන 1,531ක් පමණ වනවා.

හෙට විපක්ෂය විසින් ආර්ථිකය පිළිබඳව සභාව කල් තැබීමේ විවාදයකුත් ඉදිරිපත් කරන්න නියමිතයි. පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආර්ථිකය පිළිබඳව ප්‍රශ්න කරන විපක්ෂ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නායකතුමාගෙන් අපට අහන්න වෙනවා, 2008 සිට මේ දක්වා අගරු වෙලා තිබෙන වෙක්පත් ප්‍රමාණයෙන් සියයට 50ක වටිනාකමක් තිබෙන වෙක්පත් අගරු වීමම ඒ 2015-2019 කාලය තුළ ආර්ථිකයේ ඇති වූ සංකෝචනය පිළිබිඹු කිරීමක් නොවෙයිද කියලා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ යුගයේ යුද්ධය තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008 අවුරුද්ද ගත්තොත් මුළු ලෝකයම ආර්ථික අර්බුදයකට මුහුණ දුන් අවුරුද්දක්. ඊළඟට, අපේ රටේ පැවැති ත්‍රස්තවාදී යුද්ධය අවසන් කරන්න පදනම දැමූ අවුරුද්දත් එයයි. එතකොට ලෝක ආර්ථික අර්බුදයකුත් තිබිලා, අපේ රටේ බරපතළම ත්‍රස්තවාදී අර්බුදයකුත් තිබිලා, ලෝක වෙළෙඳ පොළේ ඉහළම තෙල් මිලත් වාර්තා වෙලා තිබුණු අවස්ථාවකදීත් ඇති වූ තත්ත්වයට වඩා දුර්වල ආර්ථික රටාවක් 2015-2019 කාලය තුළදී දක්නට ලැබුණා.

ඊළඟට, 2020-2021 අවුරුදුවල අපි COVID -19 එක්ක සටන් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන තුළින්ම ඉතාම පැහැදිලිව පෙන්නුම් කරනවා, 2015-2019 කාල පරිච්ඡේදයේ කොතරම් ආර්ථික සංකෝචනයක් සහ දුර්වල පරිපාලනයක් වුණාද කියන කාරණාව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා.

## ඩෙංගු රෝගය පැතිරීම පාලනය
## டெங்குப் பரவலைக் கட்டுப்படுத்துதல்
## CONTROL OF DENGUE OUTBREAK

[අ.භා.4.34]

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ඩෙංගු රෝගය හේතුවෙන් වාර්ෂිකව ජීවිත ගණනාවක් අහිමි වන අතර, මේ දිනවලද කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, යාපනය, මඩකළපුව, පුත්තලම සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල සෞඛ්‍ය නිලධාරි කොට්ඨාස 60ක් ඩෙංගු අධි අවදානම් කලාප ලෙස වසංගත රෝග විද්‍යා අංශය ප්‍රකාශයට පත් කොට ඇත. පසුගිය සතියේ ඩෙංගු රෝගීන් 8,649ක් හමු වී ඇති අතර, එයින් සියයට 51ක් බස්නාහිර පළාත තුළින් වාර්තා වී ඇත.
>
> එම නිසා ඩෙංගු රෝග මර්දනය කිරීමට අවශ්‍ය සුදුසු වැඩ පිළිවෙළක් සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සෞඛ්‍ය අංශ, පළාත් පාලන ආයතන එක්ව කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

අපි දන්නවා, ඩෙංගු රෝගය කියන්නේ වයිරසයක් මඟින් ව්‍යාප්ත වන රෝගයක් බව. මේ රෝගයත් මීට වසර 1,500කට පමණ පෙර චීනයෙන්ම තමයි ආරම්භ වුණේ. අපේ රටම වෙළාගෙන තිබෙන කොවිඩ් වසංගතය චීනයේ වුහාන් නගරයෙන් ව්‍යාප්ත වුණා වාගේම මීට වසර 1,500කට පමණ පෙර ඩෙංගු වසංගතයත් චීනයෙන්ම තමයි ආරම්භ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලංකාවේ ඉතිහාසය විමසා බැලුවොත් 1962දී තමයි ප්‍රථම වරට ඩෙංගු රෝගියෙකු වාර්තා වුණේ. ඉන් පසුව 1965-1966දී අපි මේක වසංගත රෝගයක් ලෙස හඳුනා ගත්තා. වසංගත රෝගයක තිබෙන සුවිශේෂතාව තමයි අපි ඒ ගැන අනිවාර්යයෙන්ම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු වීම.

ඩෙංගු රෝගය මදුරුවාගෙන් බෝ වෙන්නේ. ඒ මදුරුවා රෝගී පුද්ගලයාගේ සිට නිරෝගී පුද්ගලයා කරා ගෙන යන වයිරසය මත පදනම් වුණු වසංගත තත්ත්වය අද රට පුරා පැතිරෙමින් තිබෙනවා. සතියකට රෝගීන් 8,649ක් කියන්නේ, විශාල සංඛ්‍යාවක්. අපි දැන් අති දරුණු කොරෝනා වසංගතයට මුහුණ දීලා කටයුතු කරමින් ඉන්න මේ මොහොත තුළ හෙමින් සැරේ මේ භයානක උවදුරත් නැඟිටිමින් සිටින බව පෙනෙනවා.

2017දී පසුගිය ආණ්ඩුවෙන්, එහෙම නැත්නම් යහ පාලන ආණ්ඩුවෙන් පළාත් පාලන ආයතන සහමුලින්ම වසා දමා තිබෙන අවධියේ තමයි රට පුරා වැඩිම ඩෙංගු වසංගත තත්ත්වයක් ඇති වුණේ. ඒ වර්ෂය තුළ 186,101ක රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වුණා. අපි දන්නවා, IDH එකේ ඇඳන් යටත් රෝගීන්ට ඉන්න සිද්ධ වුණ බව. 2017දී ඒ වාගේ තත්ත්වයක් ඇති වුණා. ඒක නිසා අපි මේ අවස්ථාවේදී මේ රෝගී තත්ත්වයෙන් රට බේරා ගන්න සුවිශේෂී අවධානයක් යොමු කරන්න ඕනෑ. මේ තත්ත්වය වර්ධනය වුණොත් ඇති වන දේ අපි දන්නවා. අපි දන්නා පැරණි කියමනක් තිබෙනවා, "ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මිනිහා කණාමැදිරි එළියටත් භයයි" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඩෙංගු මදුරුවා බෝ වෙන්න කරුණු ගණනාවක් බලපානවා. ප්‍රධානම කරුණ තමයි කැළි කසළ; කැළි කසළ මතට විටින් විට වැස්ස ඇති වීම. අඛණ්ඩ වැස්ස, නියං තත්ත්වය නොවෙයි, විටින් විට වැස්ස ඇති වීම තුළ තමයි ඩෙංගු වසංගතය පැතිරෙන්නේ. ඒ නිසා, කසළ කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සුවිශාල වැඩ කොටසක් කළ යුතුයි.

සෑම ගෙදරකම කසළ කළමනාකරණයට විශේෂ තැනක් දීලා සතිපතා මේ කටයුත්ත සිදු කිරීම ඉතාම අත්‍යවශ්‍යයි. ඩෙංගු රෝගීන් අටදහස් ගණනින් සියයට 51ක්ම හඳුනාගෙන තිබෙන්නේ බස්නාහිර පළාත තුළින්. ඒ නිසා මේ ඩෙංගු වසංගතය නිසි පරිදි පාලනය කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Premnath C. Dolawatte, please. You have three minutes.

[අ.භා.4.39]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, අපේ හිතවත් ගරු අනුප පස්කුවල් මැතිතුමා විසින් අද සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, මෙවැනි වාතාවරණයක් ඇති වෙනවා කියලා දන්නා නිසා අපි සූදානම් වෙලා ඉන්න එක වඩාත් සුදුසුයි කියලා. ඒ මුල් ස්වරූපය දැක්ක

[ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

ගමන් අපේ සූදානම් වීම වඩාත් උචිතයි. ඒ නිසා තමයි අපේ ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මේ වැදගත්, කාලීන යෝජනාව ගෙනෙන්නේ. අපි දැනටමත් ගෝලීය වසංගතයකින් බැට කන ජාතියක්.

විශේෂයෙන් මීට දශක දෙකකට පමණ පෙර කාලයේ, ඩෙංගු රෝගයේ මුල් කාලයේ, අපේ රටේ අහිංසක මිනිස්සු දස දහසකට එහා පිරිසක් ඩෙංගු රෝගයෙන් මිය ගියා. ඒ වාර්තා අනුව සාපේක්ෂව බැලුවාම, අද ඩෙංගු රෝගය නිසා මිය යන සංඛ්‍යාව අඩු වෙන්න පුළුවන්. අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වෙච්ච දියුණුවත් එක්ක ඒ අඩුවීම පිළිබඳ යම් සතුටක් අපට තිබෙනවා. හැබැයි, ඒ පිළිබඳ අපට සාපේක්ෂව බලා සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මෙය වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අපි කඩිනමින් ගන්න ඕනෑ.

විශේෂයෙන් පළාත් පාලන ආයතන, අපේ රටේ දේශපාලන අධිකාරිය, රජය, ජනාධිපතිතුමාගේ කාර්ය සාධක බලකා -මේ සියල්ලම- එකතු වෙලා මේ සඳහා සක්‍රිය දායකත්වයක් ලබා දෙන්න ඕනෑ. අපි මේ කාරණය අද පාර්ලිමේන්තුවේ කථා කිරීමේ වැදගත්කමක් තිබෙනවා. මොකද, ගෝලීය කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවධානය ලබා දිය යුතු අනෙකුත් තැන්වලට ඒ අවධානය යොමු නොවී, ගිලිහී ගිය තත්ත්වයක් තිබෙන්න පුළුවන් නිසා. ඒ නිසා තමයි අපි නැවත මේ කරුණු අවධාරණය කරලා, අවශ්‍ය සියලු පාර්ශ්ව පෙර සූදානමකට ලක් කරලා, ඒ අවශ්‍ය කටයුතු කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්නේ. විශේෂයෙන් රජය, පළාත් පාලන ආයතන, අපේ පළාත්බද වෛද්‍යවරු -මේ සියලුදෙනා සහ සියලු ක්ෂේත්‍ර- එකතුවෙලා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමෙන් තමයි අපට මේ කාර්යය ජයග්‍රහණය කරගන්න පුළුවන් වන්නේ. ජනතාව හැටියට බොහෝ වෙලාවට දේශපාලනඥයන්ට, පරිපාලන අධිකාරියේ රාජ්‍ය සේවකයන්ට විවේචන එල්ල කරනවා අපි දකිනවා. අපි එකිනෙකාට - ඔවුනොවුන්ට- විවේචන කරගන්නවා විනා, පුද්ගලයකු හැටියට අප විසින් සමාජයට දිය යුතු දායකත්වය ලබා දෙනවාද? අපේ ගෙවත්ත අපි පිරිසිදු කරගන්නවාද? ඒ වගකීම අපි කාටත් තිබෙනවා. ඒ වගකීමෙන් අපි කාටවත් බැහැර වෙන්න බැහැ.

මේ අවස්ථාවේ ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ස්ථිර කරන ගමන්, ජාතියක් හැටියට අපි සියලුදෙනා එකතු වෙලා අපේ ගෙවත්ත, වටපිටාව පිරිසිදු කරලා අපට පුළුවන් උපරිමයෙන් ඩෙංගු රෝගය වැළැක්වීම සඳහා කටයුතු කළ යුතුයි කියන එක මතක් කරනවා. ඒ වාගේම සෞඛ්‍ය අංශවල දායකත්වය අරගෙන, රජයේ දායකත්වය අරගෙන මේ රෝගය පිටුදකින්න අවශ්‍ය කටයුතු අපි ඉෂ්ට කරන්න ඕනෑ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී.අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා.4.42]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා විසින් ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතා කාලෝචිත, වැදගත් යෝජනාවක්. පසුගිය සතියේ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව අටදහස් ගණන ඉක්මවා තිබෙනවා. ඇත්තටම මෙය භයානක තත්ත්වයක්. කොරෝනා වසංගත තත්ත්වය තුළ සෞඛ්‍ය අංශවල සහ අනෙක් සියලුදෙනාගේ අවධානය වැඩියෙන් යොමු වෙලා තිබෙන්නේ, මූලිකත්වය ලබා දී තිබෙන්නේ කොරෝනා රෝගය පාලනය කිරීම සඳහායි. ඒ තත්ත්වය තුළ ඩෙංගු රෝගය සම්බන්ධයෙන් යොමු කළ යුතු අවධානය යම් ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා කියා අපි විශ්වාස කරනවා, ගරු රාජ්‍ය ඇමතිතුමියනි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සෑම අංශයක්ම කොරෝනා වසංගත තත්ත්වයත් එක්ක කාර්ය බහුල වී තිබෙන නිසා ඩෙංගු වසංගතය සම්බන්ධයෙන් දක්වන අවධානය අඩු වෙලා ඇති කියා අපි විශ්වාස කරනවා.

ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාල එකතු වෙලා යම් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා. යම් යම් පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාල එක්ක එකතු වෙලා යම් යම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. නමුත් මේ තිබෙන තත්ත්වයත් එක්ක එහෙම කළාට මදි. සතියකට රෝගීන් 8,000, 9,000, 10,000 වැනි ප්‍රමාණවලින් වාර්තා වෙන්න පටන් ගත්තොත් ඒක විශාල ප්‍රශ්නයක් වෙනවා. කුඩා ළමයින්ගේ සිට වැඩිහිටියන් දක්වා වූ මේ පිරිසෙන් යම් ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත් වෙනවා. මේ තත්ත්වය පාලනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් අවශ්‍ය තැනට මේ රෝගය දැන් උත්සන්න වෙලා තිබෙනවා කියන එක තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

රාජිත සේනාරත්න හිටපු සෞඛ්‍ය ඇමතිතුමාගේ කාලයේ ඩෙංගු මර්දනය සඳහා වෙනම බලකායක් බඳවා ගත්තා. මම හිතන විධියට 2,000කට වැඩි තරුණයන් පිරිසක් ඩෙංගු මර්දන ක්ෂේත්‍ර නිලධාරින් හැටියට සිටිනවා. ඒ නිලධාරින් බඳවා ගෙන මේ වනවිට වසර හතරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ අයට යම් දීමනාවක් ලබා දෙනවා. මම හිතන විධියට ඒ අය ඩෙංගු මර්දනය සඳහා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ පිරිස කොරෝනා තත්ත්වය මර්දනය කිරීම සඳහාත් සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල සහයෝගයක් ලබා දුන්නා.

අපි පැහැදිලිවම ඉල්ලීමක් කරනවා, ඩෙංගු රෝගී තත්ත්වය උත්සන්න වෙලා තිබෙන මේ වේලාවේ ඩෙංගු මර්දන වැඩ පිළිවෙළ සඳහා මේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ සහයෝගයත් ලබා ගන්න කියලා. ඒ අයට සේවා ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ අය තවම රුපියල් 20,000ක වාගේ දීමනාවක් ගන්නේ. ඒ නිසා ඒවා විසඳා, ඒ අය සේවය ස්ථිර කරලා මේ වැඩ පිළිවෙළට ඒ අය ස්ථිරව යොදවා ගන්නවා නම්, මම හිතන විධියට ඉතාම සාර්ථක ලෙස මේ කටයුත්ත කරන්න පුළුවන්.

අපි දන්නවා, මැලේරියාව අපේ රටින් තුරන් කරන්න අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය විශාල කාර්යභාරයක් සිදු කළ බව. මැලේරියා රෝගය අපේ රටින් තුරන් කිරීම සඳහා සේවක කණ්ඩායම් බඳවා ගෙන ඒ සඳහා අවුරුදු ගණනාවක් තිස්සේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ තුළින් අපට සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වුණා. ඒ අනුව අද අපේ රටින් මැලේරියාව තුරන් වෙලා තිබෙනවා. ඒ විධියටම ඩෙංගු මර්දන ක්‍රියාවලිය සඳහා බඳවා ගෙන සිටින මේ කණ්ඩායමට අමතරව තවත් කණ්ඩායම් ඇතුළු කරගෙන වෙනම අංශයක් පිහිටුවා -මැලේරියා මර්දන ව්‍යාපාරය වාගේම- නිසි ආකාරයෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත්, අපේ රටින් මැලේරියාව තුරන් කළා වාගේම මේ මාරාන්තික ඩෙංගු රෝගයත් අපේ රටින් තුරන් කරන්න අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට පුළුවන් වෙයි කියන එක අපට පැහැදිලියි. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමිය මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා කටයුතු කරන්න.

විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් කොරෝනා මර්දනයට දක්වන උනන්දුව නිසාම, ඒ කාර්ය බහුල තත්ත්වය නිසාම ඩෙංගු රෝගය මර්දනය සම්බන්ධ කටයුතුවල යම් මඟ හැරීමක් වෙලා තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් නැවත ක්‍රියාත්මක වන ලෙසත් ඉල්ලා සිටිමින් මට මේ වේලාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා.4.47]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල්තබන අවස්ථාවේදී ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා ගෙන එන ලද කාලෝචිත යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබීම ගැන මා ඉතාම සතුටට පත් වෙනවා. මීට කලින් මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා වාගේම ඩෙංගු රෝගය දීප ව්‍යාප්තව ඉතාම වේගයෙන් පැතිර යන තත්ත්වයක් පවතින බව අපි දන්නවා. මම හිතන විධියට මේ වනවිට රෝගීන් 10,000ක් පමණ සහ මරණ කිහිපයක් වාර්තා වෙලා තිබෙනවා.

අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, පසුගිය අවුරුදු දෙකේම අපි කොරෝනා වසංගතයෙන් බැට කෑ බව. කොරෝනා වසංගතය පාලනය සඳහා අවධානය යොමු කරන්න සිද්ධ වෙච්ච නිසා තමයි ඩෙංගු රෝගය මර්දනය සඳහා යම් කිසි ක්‍රියා මාර්ගයක් ගැනීමේ ප්‍රමාදය ඇති වී තිබෙන්නේ. අද වනවිට ජනතාව හැම පැත්තෙන්ම බැට කනවා. විශේෂයෙන් ආර්ථිකමය පැත්තෙන් ගත්තත්, බඩු මිල පැත්තෙන් ගත්තත්, අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම පැත්තෙන් ගත්තත් ජනතාවට ගැටලුසහගත තත්ත්වයක් ඇති වී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඊයේ පෙරේදා ඉඳලා ඉන්ධන ප්‍රශ්නයත් අපේ ජනතාවට විශාල වශයෙන් බලපා තිබෙනවා. ඊට අමතරව රෝගීන්ට අවශ්‍ය ඖෂධ ටික ලබා ගැනීමේදීත් විශාල ගැටලුවකට මුහුණ පා තිබෙන වකවානුවක් හැටියට තමයි මේ වකවානුව හඳුන්වන්න වෙන්නේ. කොවිඩ් වසංගතයෙන් පසුව ඩෙංගු රෝගී තත්ත්වයට අපේ රටේ ජනතාව මුහුණ පා තිබෙන මේ අවස්ථාව අපි දකින්නේ ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු රෝගය වුණත්, වෙනත් වසංගතයක් වුණත් ඒවා එන අවස්ථාවේ තමයි ඒ සඳහා ප්‍රතිකර්ම සොයන්න, එහෙම නැත්නම් එම රෝග ව්‍යාප්තිය නවත්වන්න අවශ්‍ය කරන ක්‍රියා මාර්ග ගන්න ඕනෑ කියලා හුඟක් අප වේලාවට කල්පනා කරන්නේ.

පසුගිය කාල වකවානුවේ නම් කොරෝනා වසංගතය තිබුණු නිසා මේ සම්බන්ධව අවධානය යොමු නොවෙන්න ඇති. නමුත් ඈත අතීතයේ සිටම අපි දකිනවා, පාසලේ තිබෙන කුණු ටික අයින් කරන්න, නගර පිරිසිදු කරන්න, අපිරිසිදු ජලය තිබෙන ස්ථාන පිරිසිදු කරන්න හුඟක් වෙලාවට අපට මතක් වෙන්නේ වසංගත තත්ත්ව වැඩි වන අවස්ථාවේ පමණක් බව. ඒ නිසා මම මේ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙනුත්, අදාළ නිලධාරින්ගෙනුත් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ කටයුතු එක කාලයකට විතරක් සීමා කරන්න හොඳ නැහැ. හැම දාමත් මේ අවධානම තිබෙනවාය කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. අපි අපේ නගර ටික, පාසල් ටික පිරිසිදු කරලා හොඳ තත්ත්වයෙන් පවත්වා ගත්තොත් මෙය මර්දනය කරගන්න පුළුවන්කම ලැබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ඊට අමතරව තවත් කාරණයක් කියන්න තිබෙනවා. පසුගිය රජය විසින්, විශේෂයෙන් ගරු රාජිත සේනාරත්න මැතිතුමාගේ මූලිකත්වයෙන් ඩෙංගු මර්දනය සඳහා බලකායක් පිහිටුවීමට කටයුතු කළා. මම හිතන හැටියට ලංකාව පුරා තිබෙන සියලු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලට, MOH කාර්යාලවලට, ඒ අය අනුයුක්ත කරලා තිබුණා. එසේ අනුයුක්ත කළ 2,000ක පමණ පිරිසක් ඉන්නවා. දැනට ඒ අය අවුරුදු හතරක සේවා කාලයක් සම්පූර්ණ කරලායි තිබෙන්නේ. ඩෙංගු මර්දනය කරන්න විතරක් නොවෙයි, මේ පසුගිය අවුරුදු දෙක තුළ කොවිඩ් වසංගත තත්ත්වය මර්දනය කරන්නත් හුඟක් වෙලාවට ඒ ඩෙංගු මර්දන සහායකවරු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලට, ඒ වාගේම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට විශාල සහයෝගයක් ලබා දුන්නා. නමුත් වර්තමාන රජය බලයට පත් වෙලා අවුරුදු දෙකහමාරක් විතර ගත වෙලා තිබෙනවා. මෙච්චර සේවාවක් කරන ඩෙංගු මර්දන සහායකවරු ස්ථිර කරන්න යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ කියන එක කනගාටුවෙන් වුවත් කියන්න වෙනවා. මේ වෙලාවේ ඒ අයගෙන් විශාල සේවයක් අරගන්න පුළුවන්. පසුගිය දවස්වල ඒ අය විශාල කාර්යභාරයක් ඉටු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමියත් මේ අවස්ථාවට සම්බන්ධ වී සිටින නිසා ඒ කාරණයට කඩිනමින් අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටින්න කැමැතියි. ඒ අයට සුළු දීමනාවක් තමයි දැනට ලබා දෙන්නේ. ඒ අයගේ සේවය ස්ථිර කර දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදර්ශන දෙනිපිටිය මැතිතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[අ.භා.4.51]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අනුප පැස්කුවල් මැතිතුමා ඉතාම කාලෝචිත යෝජනාවක් තමයි මේ වෙලාවේ ගෙනාවේ. මම බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට මේ ප්‍රශ්නයට කඩිනම් විසඳුමක් හැටියට යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. සියලු පළාත් පාලන ආයතන, සියලු රාජ්‍ය ආයතන දැනුවත් කරලා ශ්‍රමදාන ව්‍යාපාර කරලා කෙසේ හෝ ඩෙංගු රෝගය මර්දනය කරන්න අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කළා. කොහොම වුණත් දැනට රෝගීන් 8,649ක් විතර වාර්තා වෙලා තිබෙන එක ලොකු ප්‍රශ්නයක්. මෙතැනදී මම දකින ප්‍රශ්නය තමයි, ගොඩක් ජනතාවට මොකක්ද රෝගය කියලා හොයා ගන්න බැරිකම. මේ අවස්ථාවේ කොවිඩ්-19 තිබෙනවා. තව viral flu එකක් තිබෙනවා. ඊළඟට, ඩෙංගු රෝගයත් ආවාම මේ ඔක්කෝම ප්‍රශ්න එක්ක ජනතාව

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

confusion එකක ඉන්නේ. ඒ ගොල්ලන්ට හිතාගන්න බැහැ මොකද කරන්නේ, මොකද වෙන්නේ කියලා. සමහර doctorsලා ළඟට ගියාම doctorsලා කියන්නේ තව දවස් දෙක තුනක් බලන්න කියලායි. සමහර අය කොවිඩ්-19 කියලා හිතලා ගෙදරට වෙලා ඉන්නවා. මේ ප්‍රශ්නත් එක්ක තමයි මේ ගැටලුව ඇවිත් තිබෙන්නේ. මේ තත්ත්වය හේතුවෙන් ඩෙංගු රෝගය උත්සන්න වෙනවා. ඒ නිසා දැනුවත් වීම මදි කියායි මම නම් දකින්නේ. ජනමාධ්‍ය මඟින් මොන ක්‍රමයකට හෝ ජනතාව මීට වඩා දැනුවත් කරන්න ඕනෑ.

මීට කලින් නම් postersවලින් ජනතාව දැනුවත් කරනවා අපි දැක්කා. ඩෙංගු මර්දනය කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මාධ්‍ය මඟින් හොඳ ප්‍රචාරයක් මීට පෙර ලබා දීලා තිබුණා. නමුත් දැන් ඒක නැහැ. ඒ නිසා අපි කඩිනමින් ඒකට අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ජනතාව දැනුවත් කිරීමේදී පාසල් හරහාත් ඒ කටයුත්ත කරන්න පුළුවන්. මේ පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කළා නම්, ගෙදර දොර පිරිසිදුකමින් තියාගන්න එක කරයි. දැනට ඒ දේවල් සිදු වෙන බවක් අපි දකින්නේ නැහැ. මෙය අනිවාර්යයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයත් මැදිහත් වෙලා, අනෙක් සියලු අමාත්‍යාංශත් මැදිහත් වෙලා කළ යුතු දෙයක්. ඒ කටයුත්ත කඩිනමින් කරන්න ඕනෑ. ජනතාව හිතන්නේ, "කොවිඩ් සඳහා එන්නත්කරණය කරගෙන ඉන්නවා නම් ප්‍රශ්නයක් නැහැ. අපට කොවිඩ් හැදිලා තිබෙන්නේ. ප්‍රශ්නයක් නැහැ." කියලායි. නිකම් උණක් කියලා හිතමින් ඉඳලා අන්තිමට උත්සන්න වුණාම මිය යන තත්ත්වයටම පත් වෙනවා. මේක දරුණු තත්ත්වයක්.

ඒ වාගේම අපි ලංකාවේ තිබෙන සියලු පළාත් පාලන ආයතන එකතු කරගෙන, ග්‍රාමීය කමිටු එකතු කරගෙන, ගමේ සියලුදෙනා එකතු කරගෙන මේ රෝගය නවත්වන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න ඕනෑ. එක දවසක් දාගෙන, weekend එකක් දාගෙන ගමේ සියලුදෙනා එකතු කරගෙන කරන්න පුළුවන් වැඩක් මේක. අපි කුඩා කාලයේ ගමේ ශ්‍රමදාන ව්‍යාපාර තිබුණා. ගමේ සියලුදෙනා එකතු වෙලා එකමුතුකමින් මේ දෙවල් කළා. අද නම් අපි ඒ දේවල් දකින්නේ නැහැ. ගම්වල ශ්‍රමදානයක්වත් වෙනවා දකින්නේ නැහැ. අපි පාරවල් හදනවා, නොයෙකුත් ව්‍යාපෘති කරනවා. නමුත් කවුරුත් ඒවාට උදව් කරන තත්ත්වයක්වත් අපි දකින්නේ නැහැ. ඒවා රජයෙන් කළ යුතු දේවල් විධියට හිතලා පැත්තකට වෙලා ඉන්නවා. පාරක් හදලා දුන්නාම ඒ දෙපස ශුද්ධ පවිත්‍ර කර ගන්නේවත් නැති තත්ත්වයක් තිබෙන්නේ. කානුවකට මොනවා හරි වැටිලා තිබුණත් ඒකවත් අයින් කරන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ. මාධ්‍ය මඟින් තමයි මේ දැනුවත්වීම කරන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා, සියලුදෙනා එකතු වෙලා ඒ කටයුත්තට දායක වෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු මර්දනයට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සෞඛ්‍ය අමාත්‍යාංශය තුළින් කරන්න බලාපොරොත්තු වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය මේ කාර්යයට මැදිහත් වෙලා කටයුතු කරනවා. අපි බදුල්ල දිස්ත්‍රික්කයේ හැම ආයතනයක්ම දැනුවත් කළා ආයතන පිරිසිදු කර ගැනීම සම්බන්ධයෙන්. ආයතන ප්‍රධානීන්ට ඒ වගකීම භාර දෙන්න කියලා දැනුවත් කළා. මුළු රටේම ඒ ආකාරයෙන් කටයුතු කළොත්, අපිට ඩෙංගු රෝගය මර්දනය කරගන්න පුළුවන්. එහෙම නැති වුණොත්, ඉදිරියේ එන වැසි කාලයත් එක්ක නැවත වතාවක් ඩෙංගු රෝගය මීට වඩා හිස ඔසවන්න පුළුවන්. අපිට ඩෙංගු රෝගය මර්දනය කළ හැකි හොඳම අවස්ථාව මේකයි. දැනට සාමාන්‍ය මට්ටමේ තිබෙන නිසා මර්දනය කරගන්න පහසුයි. ගරු අනුප පස්කුවල් මැතිතුමා අද සභාව කල් තබන අවස්ථාවේ ඉතා කාලෝචිත යෝජනාවක් ගෙනාවේ. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, අපේ රටේ ජනතාව බේරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම වෙනුවෙන් හැමෝම උනන්දු කරවන්න මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, මම එක කාරණයක් ගැන කනගාටු වෙනවා. මේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් මෙම ගරු සභාවේ කථා කළා. මීට පෙර ඩෙංගු මර්දනය සඳහාම පත් කරපු, ඒ කියන්නේ ලංකාව තුළ ඩෙංගු රෝගය මර්දනය කරන්න ඕනෑය කියලා ඒ වෙනුවෙන් පත් කරපු කාර්ය සාධක බලකායේ තරුණ තරුණියන් පසුගිය සති දෙක ඇතුළත කොළඹ Health Ministry එක ඉදිරිපිටදී ඒ ගොල්ලන්ගේ රැකියාව ස්ථිර කරදෙන්න කියලා කරපු උද්ඝෝෂණය ගැනවත්, ඒ ගොල්ලන්ගේ රැකියාව ස්ථිර කරදීම පිළිබඳවවත් ඒ එක ගරු මන්ත්‍රීවරයකු හෝ වචනයක්වත් කථා කළේ නැහැ. ඒ ගැන මම කනගාටු වෙනවා.

ඇත්තටම ඒ කාර්ය සාධක බලකාය පත් වෙනකොට -2018 වර්ෂයේදී - ලංකාවේ ජනගහනයෙන් ලක්ෂයකට ඩෙංගු රෝගීන් 238ක් පමණ තමයි හඳුනා ගත්තේ. ඒ ගොල්ලන්ගේ ඒ programme එක අනුව 2023 වෙනකොට ලංකාවේ ජනතාවගෙන් ලක්ෂයකට ඩෙංගු රෝගීන් 100ක් දක්වා වන මට්ටමකට අඩු කරන වැඩ පිළිවෙළක් තමයි දියත් කර තිබුණේ. කොළඹ, ගම්පහ, කළුතර වැනි දිස්ත්‍රික්ක රාශියක ඩෙංගු මර්දනය ගැන කිව්වා. මේ දිස්ත්‍රික්කවල ඩෙංගු රෝගය පාලනය කිරීම වෙනුවෙන්ම පත් කරපු ඒ නිලධාරීන් හිතේ අසතුටින් වැඩ කරන තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ. හැබැයි, අපි ඔවුන්ට ප්‍රශංසා කරන්න ඕනෑ, ඔවුන්ගේ හිතේ කොච්චර අසතුට තිබුණත්, දිස්ත්‍රික්ක මට්ටමින් ඒ ගොල්ලන්ගේ වැඩ රාජකාරි අතපසු නොකොට සිදු කිරීම ගැන. දිගින් දිගටම ඒ රාජකාරිය කරන ගමන් තමයි ඒ ගොල්ලන් ස්ථිර කරන්න කියා ඉල්ලන්නේ. මීට සති දෙකකට පෙර, පාර්ලිමේන්තු සතියේදී අඟහරුවාදා රාත්‍රී එළිවෙනතුරු -ඊළඟ දවසේ උදේ වෙනතුරු- positive reply එකක් බලාපොරොත්තුවෙන් ඒ ගොල්ලන් හිටියා අපි දැක්කා. 2021දීත් ඒ ගොල්ලන් හිටපු ඇමතිතුමා හම්බ වෙලා මේ සම්බන්ධයෙන් කථා කළා. ඒ ගොල්ලන්ට මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙනවා කියන පොරොන්දුව මත ඔවුන් ඔවුන්ගේ රාජකාරිය නිසි ලෙස ඉෂ්ට කළා. ඇත්තටම කොවිඩ්-19 වසංගතය ආපු මුල් කාලයේදී PPE -Personal Protective Equipment- පවා නැතුව තමන්ගේ ජීවිතය පරදුවට තියලා රුපියල් 22,000ක වාගේ පඩියකට තමයි ඔවුන් වැඩ කළේ. අදටත් ඔවුන් ඒ පඩියට තමයි වැඩ කරන්නේ. ඒ නිසා මේ පිරිස permanent කරන්න කියලා මම ගරු රාජ්‍ය ඇමතිතුමියගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ පිරිස අතර 8 වසර සමත් වුණු අය 1,169දෙනෙකු ඉන්නවා. O/Level පාස් වුණු 322ක පිරිසක් ඉන්නවා. රැකියා

ලක්ෂයේ වැඩසටහන යටතේ හෝ ඒ 1,169දෙනාට රැකියා ලබා දීලා තිබුණා නම්, ඔවුන් තමන්ගේ සේවය අද කරනවාටත් වඩා හොඳින් කරන්න ඉඩ තිබුණා. එහෙමයි කියලා මම කිසිසේත්ම කියන්නේ නැහැ, ඔවුන් පසුගිය කාලයේ රාජකාරිය අතපසු කරලා වැඩ කළා කියලා. හැබැයි ඔවුන්ට හිතේ සතුටෙන් වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් මේ පාර්ලිමේන්තුව හරහා අපි සලස්වා දෙන්න ඕනෑ. මොකද, රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට රැකියා දෙසියය, තුන්සියය ගණනේ ලබා දුන්නා. මම දන්නවා, රාජකාරියට බඳවා ගත්ත ඒ සමහර තරුණ තරුණියන් රැකියාවටවත් යන්නේ නැති බව. ඔවුන් රුපියල් ලක්ෂ 2, 3 පගාව දීලා, රැකියාව අරගෙන ගෙවල්වලට වෙලා ඉන්නවා. ඒ නිසා මේ 1,169ක පිරිස මේ රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ හෝ බඳවාගෙන, ඒ ගොල්ලන්ට හිතේ සතුටෙන් මේ රාජකාරිය කරගෙන යන්න අවස්ථාව සලසා දෙන්න. මොකද, වසංගත කියන ඒවා මෙතැනින් නවතින්නේ නැහැ. අනාගතයේදීත් තව වසංගත එන්න පුළුවන්. ඩෙංගු මර්දනය ඉවර වුණාට පස්සේ තව වසංගත තත්ත්ව එන්න පුළුවන්. ඒ අවස්ථාවලදී හෝ ඒ ගොල්ලන්ට වැඩ කරන්න පුළුවන් අවස්ථාව අපි ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම, O/L සමත් තුන්සිය විසිදෙදෙනාට සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා යම් ක්‍රමවේදයක් යටතේ රැකියාව ලබාදෙන්න කියා අපි ඉල්ලා සිටිනවා. අපේ උතුරු පළාතේ O/L සමත් වෙච්ච අය අසූදෙදෙනෙක් ඉන්නවා; නැඟෙනහිර පළාතේ එකසිය හයදෙනෙක් ඉන්නවා. ඒ තරුණ තරුණියන් දිගින් දිගටම උද්ඝෝෂණ කරනවා; පාරට බැහැලා කෑ ගහනවා. අද ලංකාව තුළ ඩෙංගු මර්දනය කරන්න ඕනෑ බව ඇත්ත. හැබැයි, ඩෙංගු මර්දනය කරන්නම කියලා පත් වුණු අයට අපි ඉස්සර වෙලා සාධාරණයක් ඉෂ්ට කර දෙන්න ඕනෑ කියා මා ගරු රාජ්‍ය ඇමතිතුමියට යෝජනා කරනවා.

இன்றைய நாளிலே இந்த உயரிய சபையிலே டெங்கு நோய்த் தடுப்புத் தொடர்பாகக் கொண்டுவரப்பட்டிருக்கின்ற இந்த ஒத்திவைப்புவேளை மீதான பிரேரணையின் விவாதத்திலே, டெங்கு நோய்த் தடுப்புக்காக நியமிக்கப்பட்டவர்களுக்கு நிரந்த நியமனத்தை வழங்குமாறு கௌரவ அமைச்சரிடம் நான் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன். உண்மையிலே, இந்த டெங்கு ஒழிப்புத் திட்டத்தின்கீழ் கிட்டத்தட்ட 1,169 பேர் 8ஆம் தரம் கல்வி கற்ற நிலையில் வேலைக்கு இணைந்திருக்கின்ற அதேநேரத்திலே, 322 பேர் O/Level வரை கல்வி கற்ற நிலையில் இணைந்திருக்கின்றார்கள். இந்த 8ஆம் ஆண்டு சித்தியடைந்தவர்களுக்கு ஓரிலட்சம் வேலைவாய்ப்பின் கீழே யாவது உடனடியாக நிரந்தர வேலைவாய்ப்பை வழங்க வேண்டும். ஏனென்றால், கடந்த வாரம் அவர்கள் தங்களுக்கான தொழில் வாய்ப்பைப் பெறுவதற்காகக் கொழும்புக்கு வந்து இரவு முழுவதும் இங்கு தங்கியிருந்தும் முழுமையான ஒரு தீர்வை அடையமுடியாத நிலையிலே கவலையுடன் வீட்டுக்குச் சென்றிருந்த நிலையை நாங்கள் பார்த்திருந்தோம். இவர்கள் கொவிட்- 19 தொற்று ஏற்பட்ட காலப்பகுதியிலும்கூடத் தங்களுடைய கடமைக்கு முதன்மையளித்துச் செயற்பட்டவர்கள். அதாவது, தங்களுடைய பாதுகாப்பைப் பற்றிக் கரிசனை எடுக்காமல், தங்களுடைய குடும்பத்தைப் பற்றிச் சிந்திக்காமல், அந்தந்தப் பிரதேச மக்களுக்காகத் தங்களுடைய கடமையைச் சரியாகச் செய்ய வேண்டும் என்ற அடிப்படையிலே 22,000 ரூபாய் சம்பளத் திற்கு மிகக் கஷ்டப்பட்டு அவர்கள் தங்கள் கடமையைச் செய்திருக்கின்றார்கள்.

இன்று நாட்டிலே பல்வேறு இடங்களிலே பல்வேறு நபர்களுக்கு அரசியல் சிபாரிசின் கீழ் வேலைவாய்ப்புகள் வழங்கப்படுகின்றது. ஓரிலட்சம் வேலைவாய்ப்பு என்ற திட்டத்தின் கீழ், அரசாங்கத்துடன் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர் ஒருவருக்கு 200 பேருக்குத் தொழில் வாய்ப்பைப் பெற்றுக்கொடுக்கக்கூடிய சலுகை வழங்கப்பட்டது எங்களுக்குத் தெரியும். அவ்வாறு வழங்கப்பட்ட தொழில் வாய்ப்புக்களின்கீழாவது இவர்களை உள்வாங்கியிருக்க வேண்டும். ஏனென்றால், இந்தக் கொவிட் தொற்று அதேபோல டெங்கு போன்ற நோய்கள் இனிவருங்காலங்களிலே நிச்சயமாக ஏற்படும். உண்மையிலே, இந்த டெங்கு நோய் தடுப்புத் தொடர்பான திட்டத்தின் கீழ், 2018ஆம் ஆண்டிலே கிட்டத்தட்ட ஓரிலட்சம் பேருக்கு 238 என்றிருந்த டெங்கு நோயாளிகளினுடைய எண்ணிக்கையை 2023ஆம் ஆண்டாகும்போது ஓரிலட்சத்திற்கு 100 என்ற அளவில் குறைப்பதற்கான வேலைத்திட்டம் முன்வைக்கப்பட்டிருக்கின்றது. ஆகவே, அவர்கள் சந்தோசமாக வேலைசெய்யக்கூடிய ஒரு சூழலை நாங்கள் அமைத்துக்கொடுக்கவேண்டும்.

இன்று டெங்கு நோய் அதிகரித்திருக்கின்றது என்ற வகையில், கௌரவ உறுப்பினர் அவர்கள் தனது முன்மொழிவைக் கொண்டுவந்திருக்கிறார். அவ்வாறு அதிகமானோர் இந்த டெங்கு நோயினால் பாதிக்கப்படுகின்றபொழுதும்கூட, டெங்கு நோயைக் கட்டுப்படுத்துகின்ற கடமையைச் செய்கின்றவர்களைக் கரிசனையில் எடுக்காமல் அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்காமல் இருப்பது உண்மையிலேயே கவலையான ஒரு விடயமாகும். வட மாகாணத்திலே கிட்டத்தட்ட 82 பேர் - விசேடமாக யாழ். மாவட்டத்திலே 51 பேர், எங்களுடைய கிளிநொச்சி மாவட்டத்திலே 09 பேர், மன்னாரிலே 07பேர், வவுனியாவிலே 05 பேர், முல்லைத்தீவிலே 10 பேர். அதேபோல் கிழக்கு மாகாணத்திலே 106 பேர் - மட்டக்களப்பு மாவட்டத்தில் 38 பேர், எங்களுடைய கல்முனையிலே 47 பேர் திருகோணமலையிலே 15 பேர் என்ற வகையில் அந்த நியமனங்கள் வழங்கப்பட்டிருக்கின்றன. இவ்வாறு வடக்கு, கிழக்கு முழுவதுமாக அந்த நியமனங்கள் சரியான முறையில் வழங்கப்படவில்லை என நான் நினைக்கின்றேன். வடக்கு, கிழக்கு பாரிய நிலப்பரப்பாகும். இந்த வடக்கு, கிழக்கு முழுவதும் கிட்டத்தட்ட 188 பேர் தான் நியமிக்கப்பட்டிருக்கின்றார்கள். அந்த அடிப்படையிலே இவர்களுக்கான நிரந்தர நியமனம் வழங்குவது தொடர்பில் உடனடியாக நீதியைப் பெற்றுத்தரவேண்டும் எனக் கௌரவ அமைச்சரிடம் கேட்டு, என்னுடைய உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.02]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, අපි දන්නවා, ඩෙංගු රෝගය හැදෙන්නේ මදුරුවන් මඟින් කියලා. ඩෙංගු රෝගය නිට්ටාවට තුරන් කරන්න නම්, විද්‍යාත්මකව එම කීටයා සහ මදුරුවා රටෙන් තුරන් කරන්න ඕනෑ. ඒ නිසා තමයි හිටපු ආණ්ඩුව ඩෙංගු මදුරුවා සහ කීටයා මර්දනය කිරීම සඳහාම විශේෂිත කාර්ය මණ්ඩලයක් බඳවා ගත්තේ. අද ඒ කාර්ය මණ්ඩලය ඉන්නේ මහ පාරේ. ඒ නිසා මා ඔබතුමියට යෝජනා කරනවා, ඩෙංගු රෝගය නිට්ටාවට තුරන්

[ගරු චමින්ද විජේසිරි මහතා]

කරන්න නම් මේ පටු දේශපාලන අරමුණුවලින් එහාට ගිහිල්ලා, විද්‍යාත්මකව ගෙන තිබුණු තීන්දුව අනුව කටයුතු කරමින්, මේ නිලධාරින් හරහා - මහ පාරේ මේ විධියට කරන උද්ඝෝෂණ නැතිව - මේ ප්‍රශ්නය විසඳන්න කියලා. ඔබතුමියට ඒක කරන්න පුළුවන්. ඔබතුමිය ආණ්ඩුව තුළ කටයුතු කරන විධිය අපි දන්නවා. ඒ නිසා ඒ අයට සාධාරණය ඉටු කරනවා හැරුණු විට වෙන කාරණයක් නැහැ. ඩෙංගු රෝගය මර්දනය සඳහා මෙන්ම ධූමායනය සහ කීට මර්දනය සඳහා යොදවා සිටි සේවකයන් අද බරපතළ ප්‍රශ්නයක ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු ව්‍යාප්තිය නතර කරන්න අවශ්‍ය විසඳුම තමයි එදා ආණ්ඩුව ගත්තේ. ඒ නිසා තමයි ඩෙංගු ව්‍යාප්තිය අඩු වුණේ. හැබැයි, දැන් එය වර්ධනය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් සැකයක් තිබෙනවා. අද කොරෝනා මරණ වැඩි වන බව අපි දන්නවා. හැබැයි, කොරෝනා මරණ වැඩි වීම, "ඩෙංගු මරණ" කියලා කියන්න, "මේ කොරෝනා මරණ නොවෙයි සිදු වන්නේ ඩෙංගු මරණ" කියන කාරණය කියන්න ආණ්ඩුව යම් උත්සාහයක යෙදෙන බව පෙනෙනවා. උපක්‍රමශීලීව මේ කාරණය පාවිච්චි කරලා එක පැත්තකින් ආණ්ඩුව දිගින් දිගටම රටේ ජනතාව නොමඟ යවනවා. අපට පෙනෙනවා, සෞඛ්‍ය අමාත්‍යාංශය එවැනි මතයක් ඇති කිරීම සඳහා තමයි මේ කටයුතු කරන්නේ කියලා. එතකොට රටේ ජනතාව තේරුම් ගන්නවා, "දැන් කොරෝනා ඉවරයි, දැන් ඩෙංගු තිබෙන්නේ, ඩෙංගුවලින් තමයි මේ මැරෙන්නේ" කියලා. එවැනි මතයක් ඇති කිරීම සඳහා තමයි මේ වැඩ පිළිවෙළ යොදාගෙන තිබෙන්නේ. යම් දේශපාලන වුවමනාවකට එසේ කටයුතු කරනවාද කියලාත් සැකයක් තිබෙනවා. කෙසේ වෙතත්, මේ රෝග දෙකම ඉතා භයානකයි. එය වැඩි වශයෙන් වැලඳෙන්නේ අපේ රටේ ජනතාවට. එදා බදුල්ල, බණ්ඩාරවෙල ප්‍රදේශවල ඩෙංගු රෝගය තිබුණේ නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමියනි. ඒ ප්‍රදේශවල තිබෙන ශීත කාලගුණයත් එක්ක මදුරු කීටයන් වර්ධනය වීමක් සිදු වුණේ නැහැ. නමුත් අද අනුවර්තනය වීමක් වෙලා, බදුල්ල, බණ්ඩාරවෙල වැනි ශීත ප්‍රදේශවලත් ඩෙංගු මදුරුවන් වර්ධනය වන තත්ත්වයක් තිබෙනවා. අපරාදේ, ඒක වළක්වා ගන්න තිබුණා. එසේ වළක්වා ගන්න නොහැකි වීමට ප්‍රධාන හේතුව තමයි ඒ සඳහා -ප්‍රමාණවත් නොවුණා වුණත්- විද්‍යාත්මකව පත් කර තිබුණු කාර්ය මණ්ඩලය වෙනත් කාර්යන්වලට යොදවලා, 'එදා ආණ්ඩුව දීපු පත්වීම්' කියලා ඔවුන්ගේ පත්වීම් ස්ථිර නොකර දේශපාලන වශයෙන් ගත්තා වූ ක්‍රියාමාර්ගය. එහි ප්‍රතිඵලය නිසා අද ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයකුට මේ යෝජනාව ඉදිරිපත් කරන්න සිදුවෙලා තිබීම ඉතාම ඛේදනීයයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, මේ අයගේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න, මැදිහත් වෙන්න ඔබතුමියට පුළුවන්. ඔවුන්ට පත්වීම් ලිපියක් දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ තනතුර රැකියා ලක්ෂයට අනුයුක්ත කරලා, ඒ හරහා බඳවා ගැනීමේ කටයුතු කරන්න හදනවා. ඒක කරන්න යන්න එපා. ඔවුන් දැනටමත් වැටුපක් ලබන, ඒ ලැබෙන වැටුපට එහා ගිය මහා දැවැන්ත කැප කිරීමක් කරන, ඒ ලැබෙන වැටුපට එහා ගිය සමාජයීය වගකීමක් ඉටු කරන සේවක මඩුල්ලක්. අන්න එතැන යම් විසඳුමක් තිබෙන බව අපට පෙනෙනවා. ඊට එහා ගිය, අමාත්‍යාංශයීය මට්ටමේ විවිධ ක්‍රියාකාරකම් ඇති. ඒ සඳහා සාධනීයව මැදිහත් නොවීමේ ප්‍රතිඵලය තමයි අද මේ උග්‍ර වෙලා තිබෙන්නේ කියන කාරණය හුවා දක්වන්න යම් කිසි උත්සාහයක යෙදෙනවා.

කොරෝනා මරණ සහ ඩෙංගු මරණ එකිනෙක සංසන්දනය කිරීම කොයි තරම් සුදුසු ද කියලා හිතන්න වෙනවා. මේ ඩෙංගු මරණ හා කොරෝනා මරණ සංසන්දනය කරනකොට, කොරෝනාවලට එහා ගිහිල්ලා ඩෙංගු මරණ වැඩි වෙලා තිබෙනවාය කියන කාරණය තමයි දැන් වෛද්‍යවරුත් නිතරම කියන්නේ. අපට ඒ ගැන යම් සැකයක් තිබෙනවා. ගරු ඇමතිතුමියනි, විශේෂයෙන්ම ආණ්ඩුව මේ කරන්න හදන්නේ, ජනතාව නොමඟ යවලා, "කොරෝනා සියයට 100ක් ඉවරයි, දැන් මේ සිදු වෙන්නේ ඩෙංගු මරණ" කියන කාරණය පෙන්වා දෙමින් වෙනත් වූ වැඩ පිළිවෙළක් කියන කාරණය තමයි අපි දකින්නේ. එහෙම කරනවා නම් ඒක නවත්වන්න. එහෙම නොවී සමාජයට යථාර්ථය පෙන්වා දෙන්න. එහෙම කළොත් කාලීනව ඔබේ ආණ්ඩුව ගන්නා වූ ඒ වැඩ පිළිවෙළ තුළ මේ රට යහපත් මඟකට ගන්න පුළුවන්. එතකොට සමාජයේ පිරිස් ඒ පිළිබඳව විශ්වාසය තියාගෙන කටයුතු කරයි. කවුද ඇත්ත කියන්නේ කියන එක තමයි අද රටට තිබෙන බරපතළ ප්‍රශ්නය.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, වර්තමාන ආණ්ඩුව දිහා බැලුවාම පෙනෙන කාරණයක් තමයි, සමහර ඇමතිවරුන්ගේ දෙබිඩි පිළිවෙත් -සමහර හැසිරීම් - නිසා රටේ මහ ජනතාව තුළ ලොකු අවිශ්වාසයක් ගොඩනැඟී තිබීම. විදුලිය අර්බුදය ගත්තත්, විදුලිබල ඇමතිවරයා එකක් කියනවා; බලශක්ති ඇමතිවරයා තව එකක් කියනවා. අවසානයේ ඒකෙන් රටේ ජනතාව දුක් විඳිනවා; පීඩනයට පත් වෙනවා. රටේ ජනතාව තමයි කළුවරේ ඉන්නේ. හැබැයි, අපි ටීවී එකෙන් ආණ්ඩුවේ අයගේ කථා ටික බලනකොට හිතෙනවා, එහෙම වෙන්නේ නැහැ කියලා. එම නිසා, මේ ආණ්ඩුව නියෝජනය කරන රාජ්‍ය ඇමතිවරියක් හැටියට ඔබතුමිය ඉතාම කාලෝචිතව ඇත්ත කියන්න. ඇත්ත කියලා, ඒ ඇත්ත රටේ ජනතාවට තේරුම් කරලා දීලා, රටේ ජනතාවට සහයෝගයක් දීලා, ඒ සඳහා ඔවුන්ගේ මැදිහත් වීමක් ලබා ගැනීම සඳහා කටයුතු කළොත් ඕනෑම වසංගතයකින්, ඕනෑම රෝගයකින් මේ රටේ ජනතාව බේරා ගන්න පුළුවන් තැනට අපට යන්න පුළුවන්. මේ විධියට කරුණු වසන් කරලා ගන්නා වූ ක්‍රියාමාර්ග තුළ අවසානයේ වඩ වඩාත් ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ මේ රටේ ජනතාව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයයි.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය අමාත්‍යතුමිය. පිළිතුරු කථාව කිරීම සඳහා ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු අනුප පස්කුවල් මන්ත්‍රීතුමා අද ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මොකද, අපි අවුරුදු දෙකක් තිස්සේ කොවිඩ් වසංගතයත් එක්ක ඔට්ටු වුණා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු මැදිහත්වීම යටතේ ඉතාම සාර්ථක එන්නත්කරණ වැඩ පිළිවෙළක් හරහා අද අපිට කොවිඩ් වසංගතය

මර්දනය කර ගන්න හැකියාව ලැබී තිබෙන බව මම සතුටින් මතක් කරන්න ඕනෑ.

පසුගිය අවුරුදු දෙකක කාලය පුරා විවිධ කොවිඩ් ප්‍රභේදත් එක්ක රට lock down කරලා, ජන සංචරණය සීමා වීම තුළ ඩෙංගු ව්‍යාප්තියේත් යම් කිසි අඩු වීමක් අපි දැක්කා. විශේෂයෙන්ම අපි දන්නවා, ඩෙංගු රෝගය බෝ වෙන්නේ මදුරුවා හරහා බව. මදුරුවන් බෝ වන ස්ථානවල කසළ ඒක රාශි වීමේ යම් කිසි අඩු වීමක් වුණා, දීර්ඝ කාලීනව රට වසා තිබීම තුළ. ඒ නිසා වෙන්න ඇති ඩෙංගු රෝගීන්ගේ ප්‍රමාණය අඩු වුණේ. හැබැයි අපි දන්නවා, ඊයේ වෙනකොට -2022 මේ දක්වා- ඩෙංගු රෝගීන් 9,957දෙනෙක් වාර්තාවෙලා තිබෙන බව. එයින් 7,702දෙනෙක් ජනවාරි මාසයේත්, 2,255දෙනෙක් පෙබරවාරි මාසයේත් වාර්තා වෙලා තිබෙනවා. මා ළඟ තිබෙනවා, 2022 වසරේ සතිපතා වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් විස්තර. ජනවාරි 3 ඉඳලා ජනවාරි 9 දක්වා සතිය තුළ රෝගීන් 2,057දෙනෙක් වාර්තා වෙලා තිබෙනවා. 2021 දී ඒ සංඛ්‍යාව 484යි. හැබැයි, එදා ඉඳලා දැන් වෙනකොට රෝගීන් වාර්තා වීම සතිපතා අඩු වීමක් අපි දකිනවා. මම මේ වාර්තාව ඇමුණුම 1 වශයෙන් **සභාගත*** කරනවා.

මේ වෙනකොට ඩෙංගු රෝගීන්ගෙන් සියයට 50.4ක් බස්නාහිර පළාතෙන් තමයි වාර්තා වෙන්නේ. සියයට 12.6ක් වයඹ පළාතෙන් වාර්තා වෙනවා. ඊළඟට දකුණු පළාතෙන් සියයට 8.6ක් වාර්තා වෙනවා. දිස්ත්‍රික්ක අනුව වාර්තා වුණු රෝගීන් සංඛ්‍යාවත්, එහි ප්‍රතිශත පිළිබඳ විස්තරත් මම සභාගත කළ වාර්තාවේ තිබෙනවා.

වර්ෂ 2019 දී ඩෙංගු ලෙස සැක කරන රෝගීන් 105,049දෙනෙක් වාර්තා වුණා. 2020 සහ 2021 වර්ෂවල පිළිවෙළින් රෝගීන් 31,162දෙනෙක් සහ 35,924දෙනෙක් වාර්තා වෙලා තිබෙනවා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමන්ලා කිව්වා, මැරෙන රෝගීන්ගේ ප්‍රමාණය වැඩි නිසා අපි තොරතුරු වසන් කරනවා කියලා. මේ අවුරුද්දේ මරණ 6ක් වගේ තමයි වාර්තා වෙලා තිබෙන්නේ. ගිය අවුරුද්දේ මරණ 26ක් වාර්තා වෙලා තිබෙනවා. මම කලින් කිව්වා වගේ, අපි ගෝලීය වසංගතයකට -කොවිඩ් වසංගතයට- මුහුණ දුන්නා. පසුගිය දෙවසර තුළ වාර්තා වන ඩෙංගු රෝගීන්ගේ පැහැදිලි අඩුවක් නිරීක්ෂණය වුණා. නමුත් 2021 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ ඉඳලා වාර්තා වන රෝගීන්ගේ පැහැදිලි සහ ශීඝ්‍ර වර්ධනයක් නිරීක්ෂණය වුණා. 2021 අවුරුද්දේ දිස්ත්‍රික්ක මට්ටමින් ගත්තොත් මාසිකව වැඩියෙන්ම රෝගීන් වාර්තා වුණේ කොළඹ දිස්ත්‍රික්කයෙන්. එලෙස වාර්තා වුණු රෝගීන් සංඛ්‍යාව 11,666ක්. දෙවනුව ගම්පහ දිස්ත්‍රික්කයෙන් 6,628කුත්, තුන්වනුව මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 3,522කුත්, හතරවනුව කළුතරින් 2,902කුත්, පස්වනුව කුරුණෑගලින් 1,870කුත්, හයවනුව නුවරින් 1,524කුත් වශයෙන් රෝගීන් වාර්තා වුණා. ඒ සම්බන්ධ තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම 2 වශයෙන් ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා මා මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඒ විධියට දිස්ත්‍රික්ක මට්ටමින් ඩෙංගු රෝගීන් වාර්තා වෙලා තිබෙනවා. ඩෙංගු මර්දනය සඳහාම ජාතික ඩෙංගු මර්දන ඒකකයක් මීට වසර ගණනාවකට කලින් ස්ථාපිතවෙලා තිබෙනවා. මේ ජාතික ඩෙංගු මර්දන ඒකකයේ හොඳ ආවේක්ෂණ පද්ධතියක්

-surveillance system- තිබෙනවා. ඔවුන්ට ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් වාර්තා වන රෝගීන් සහ වැඩියෙන්ම රෝගීන් වාර්තා වන ස්ථාන නියාමනය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව තමයි ඔවුන් සතියෙන් සතිය රෝගීන්ගේ වැඩිවීම පිළිබඳව කියන්නේ. ඒ අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමින්, ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් තොරතුරු ගන්න හොඳ පද්ධතියක් තිබෙනවා.

මේ ඩෙංගු වාහක මදුරුවන් බෝ වෙන්නේ පැහැදිලි ජලය සහිත ස්ථානවල. ඒ වාගේම කීට විද්‍යා සමීක්ෂණ අනුව නිවාස, රජයේ සහ පෞද්ගලික ආයතන සහ පොදු ස්ථානවල ඇති ජලය ඒක රාශි වන විවිධ භාජන සහ වෙනත් ස්ථානවල මේ ඩෙංගු වාහක මදුරු කීටයන් සිටින බව තමයි හොයා ගෙන තිබෙන්නේ. මේ අතර නිවාසවලින් ඉවත දමන ද්‍රව්‍ය, ජලය රැස් කර තබා ගන්නා භාජන, උද්‍යාන අලංකරණය සඳහා භාවිත කරන ද්‍රව්‍ය, තාවකාලිකව ඉවත් කළ ද්‍රව්‍ය, ටයර් යනාදිය ප්‍රමුඛ වනවා. ඒ තොරතුරු ඇතුළත් සිතියමක් ඇමුණුම 3 ලෙස ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම සඳහා මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඉදිකිරීම් පරිශ්‍ර, ආගමික සිද්ධස්ථාන, ධීවර වරාය ආශ්‍රිත පාවිච්චි නොකරන හෝ අයිතිකරුවන් නොමැති බෝට්ටු සහ වෙනත් පොදු ස්ථාන ඩෙංගු මදුරුවන් බෝ විය හැකි වැදගත් ස්ථාන ලෙස හඳුනා ගෙන තිබෙනවා. ඩෙංගු රෝගය වයිරස් රෝගයක්. ඊට නිශ්චිත ප්‍රතිකාරයක් නැහැ. අද ලෝකය විවිධ අත්හදා බැලීම් කළාට ඩෙංගු රෝගය වැළැක්වීම සඳහා සාර්ථක එන්නතක් තවම හොයා ගෙන නැහැ, කොවිඩ් - 19 වයිරසයට එන්නතක් හොයා ගත්තාට. ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය සඳහා පවතින සාර්ථකම උපක්‍රමය වන්නේ ඩෙංගු රෝගය බෝ කරන මදුරුවන් බෝ වීම වැළැක්වීමයි.

මැලේරියා මර්දනය කළා වාගේ insecticides spray කරලා, ඩෙංගු රෝගය පාලනය කරන්න බැහැ. මොකද, ඩෙංගු මදුරුවා බෝ වන්නේ ජලය රැඳෙන කුඩා ස්ථානවල. විශේෂයෙන්ම ඉවත දමන අපද්‍රව්‍ය තුළ ඩෙංගු මදුරුවන් බෝ වනවා. ඒ නිසා ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝ වන ස්ථාන සලකා බැලීමේදී එවැනි මදුරු පාලනයක් සෞඛ්‍ය අංශවල මැදිහත් වීමෙන් පමණක් සාර්ථක කර ගන්න බැහැ. ඩෙංගු රෝගයේ ආරම්භක අවස්ථාවලදී අපි දැක්කා, මරණ හුඟක් වාර්තා වෙනවා. හැබැයි, අද වනකොට clinical management ඉතා හොඳට කෙරෙන නිසාත්, ඩෙංගු මර්දනය සඳහාම වෙන් වෙච්ච රෝහල් තිබෙන නිසාත්, ඒ සඳහා අවශ්‍ය පුහුණුව අපේ විශේෂඥ වෛද්‍යවරුන්ට ලබා දීලා තිබෙන නිසාත් අද ඩෙංගු රෝගයෙන් මැරෙන සංඛ්‍යාව හුඟක් අඩුවෙලා තිබෙනවා.

මට කලින් කථා කළ ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කරුණු ගණනාවක් කිව්වා. ඩෙංගු මෙන්ම දැන් කොවිඩ්වලින් සිදු වන මරණත් අඩුවෙලා තිබෙනවා. දැනට මරණ 20ත්, 30ත් අතර ප්‍රමාණයක් තමයි වාර්තා වෙන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය කිසිදු විටික අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න සූදානම් නැහැ. මොකද, අපි ජීවිතත් එක්ක තමයි කටයුතු කරන්නේ. ඒ නිසා මේ තොරතුරු -දත්ත- සත්‍යයි කියන එක මම වගකීමෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

සෞඛ්‍ය අංශවලට විතරක් බැහැ, මේ මදුරුවා බෝ වන ස්ථාන පාලනය කරන්න. ඒ නිසා තමයි 2021 නොවැම්බර් මස 24 වැනි

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ]

දින ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ ඩෙංගු රෝගය මර්දනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේදී ඒ ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, එහි ප්‍රතිඵලයක් ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ අත්සනින් යුතුව "ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය සඳහා බහු පාර්ශ්වික ප්‍රවේශය ශක්තිමත් කිරීම" යන මාතෘකාව යටතේ අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් වුණේ. එය 2021 දෙසැම්බර් මාසයේ 13වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත වුණා. අනතුරුව මේ සම්බන්ධයෙන් 2022 ජනවාරි මස 12වැනි දින ජනාධිපති ලේකම්තුමා විසින් "ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය සඳහා බහුපාර්ශ්වික ප්‍රවේශය ශක්තිමත් කිරීම" යන මැයෙන් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. මම ඒ චක්‍රලේඛය ඇමුණුම 4 හැටියට මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මම කලින් කිව්වා වාගේ දෛනික ඩෙංගු රෝගීන් වාර්තා වීම සහ ඩෙංගු වාහක මදුරුවන් බෝ වීම පිළිබඳව ජාතික ඩෙංගු මර්දන ඒකකය විසින් නිතිපතා නියාමනය කරනවා. ඒ අනුව ඩෙංගු රෝගය පැතිරීමේ අවදානම වැඩි දිස්ත්‍රික්ක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස සහ ගම් වශයෙන් හඳුනාගෙන අවශ්‍ය අවස්ථාවලදී විශේෂ මදුරු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඒ අනුව 2021 වර්ෂයේ නොවැම්බර් මස 8 සිට 13 දක්වාත්, 2022 වර්ෂයේ ජනවාරි මස 04 දින සිට 10 දක්වාත් තෝරා ගත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසවල විශේෂ මදුරු මර්දන වැඩසටහන් දියත් කරලා තිබෙනවා. ඉහත සඳහන් කළ ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයට ප්‍රතිචාර ලෙස පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය විසින් විශේෂ මදුරු මර්දන වැඩසටහනක් මුළු දිවයිනම ආවරණය වන පරිදි 2022 ජනවාරි මස 20 සහ 21 දිනවල දියත් කළ අතර, ඒ සඳහා ජාතික ඩෙංගු මර්දන ඒකකයේ සහ පළාත් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හරහා සෞඛ්‍ය අංශයේ සක්‍රිය දායකත්වය ලබා දීලා තිබෙනවා.

ඩෙංගු රෝගකාරක මදුරුවන්ගේ ජීවන රටාව සහ හැසිරීම සලකා බලන කළ මේ ආකාරයේ මදුරු මර්දන වැඩසටහන් ඩෙංගු රෝග අවදානම අධික ප්‍රදේශවලට විශේෂ අවධානය යොමු කරමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වසර පුරා පැවැත්වීමේ අවශ්‍යතාව තිබෙන බව අපි මතක් කරන්න ඕනෑ. මේ මදුරුවා දෂ්ට කරන්නේ විශේෂයෙන්ම උදේ කාලයේ, දවල් කාලයේ සහ සවස් කාලයේ. රාත්‍රියට ඒ මදුරුවා දෂ්ට කරන්නේ නැහැ.

ඊළඟට, නිවෙස්වල සහ වෙනත් ස්ථානවල එක්රැස් වන කසල සහ අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමේ ස්ථාවර ක්‍රමවේදයක් පළාත් පාලන මට්ටමින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවක් තිබෙන බව මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේම, මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ තවත් කරුණක් තිබෙනවා. අතිගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය කාලයේ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින්, ග්‍රාම නිලධාරිගේ නායකත්වයෙන් ස්වේච්ඡාවෙන් ජනතාව ඒක රාශි වෙලා ගෙයින් ගෙට ගිහිල්ලා, මදුරුවන් බෝ වන තැන් හඳුනාගෙන ඒ මදුරුවන් විනාශ කිරීමේ ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා.

පසුගිය රජය කාලයේ ඩෙංගු මර්දනය සඳහා ඩෙංගු මර්දන සහායක හැටියට යම් පිරිසක් බඳවා ගත්තා. මෙතැන තිබෙන ගැටලුව තමයි, මේ අයගෙන් බහුතරයකට ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් නැති එක. මම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා එක්කත් දැන් කථා කළා. මේ අයගෙන් අධ්‍යාපන සුදුසුකම් සපුරන අය සෞඛ්‍ය අමාත්‍යාංශයට බඳවා ගන්නත් අවශ්‍ය කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, මේ අය අතර GCE (O/L) අසමත් අය තමයි බහුතරයක් ඉන්නේ. ඒ අය බහු කාර්ය සාධක බලකායට බඳවාගෙන ඒ හරහා ඩෙංගු මර්දනයට යොදා ගන්නත් අමාත්‍යාංශ අනුමැතිය ලැබිලා තිබෙනවා කියලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා කිව්වා. ඒකත් මම මේ වෙලාවේදී මතක් කරනවා.

ඩෙංගු මදුරුවා මර්දනයේදී රටේ ජනතාවගේ සහයෝගය ඉතාම වැදගත් වෙනවා. පළාත් පාලන ආයතනවල සහයෝගයත් මේ සඳහා වැදගත් වෙනවා. හැම ආයතනයක්ම සතියකට දවසක් තමන්ගේ පරිශ්‍රයේ මදුරුවන් බෝ වන තැන් සොයා බලා ඒවා විනාශ කිරීම තුළින් අපට මේ ඩෙංගු රෝගය පාලනය කර ගැනීමේ හැකියාව තිබෙන බවත් මතක් කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතාම වැදගත් කාලීන යෝජනාවක් ඉදිරිපත් කරමින් රටේ ජනතාවගේ අවධානය මේ සඳහා යොමු කිරීමට මැදිහත්වීම පිළිබඳව. ඒ වාගේම, මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානය යොමු කරවීමට කටයුතු කිරීම පිළිබඳවත් මගේ ස්තුතිය පුද කරනවා. ඩෙංගු මර්දනය සඳහා සහයෝගය දක්වන ජාතික ඩෙංගු මර්දන ඒකකයේ සියලු දෙනාටත්, විශේෂයෙන්ම සෞඛ්‍ය නොවන අංශ, පළාත් පාලන ආයතන ඇතුළු ඒ වෙනුවෙන් සහයෝගය ලබාදෙන සියලු දෙනාටමත් හදපිරි ස්තුතිය පිරිනැමීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. අපි නැවතත් බහු පාර්ශ්වීය ප්‍රවේශය හරහා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින්, ග්‍රාම නිලධාරි ඇතුළු ඒ වසම භාරව සිටින රාජ්‍ය නිලධාරින් සහ ස්වේච්ඡා කණ්ඩායම් එක්ක නිවෙස් කරා ගිහිල්ලා, මේ මදුරුවන් බෝ වන තැන් විනාශ කිරීම හරහා පුළුවන් වෙනවා ඩෙංගු රෝගය මර්දනය කරන්න. ඒ බවත් මතක් කරමින්, මට මේ කාලය වෙන් කරදීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.19ට, 2022 පෙබරවාරි 23 වන බදාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.19 மணிக்கு பாராளுமன்றம், 2022 பெப்ருவரி 23, புதன்கிழமை மு. ப. 10.00 மணிவரை ஒத்திவைக் கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.19 p.m. until 10.00 a.m. on Wednesday, 23rd, February, 2022.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.